# දෙවැනි කොටස

# දෙවැනි කොටස
# ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

**පිටුව**


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 85 |
| 3. | බැංකු විදු පියෙස | 89 |
| 4. | සන්නිවේදන | 89 |
| 5. | ව්‍යවහාර මුදල් | 91 |
| 6. | දේශීය මෙහෙයුම් කටයුතු | 93 |
| 7. | ආර්ථික පර්යේෂණ | 96 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 100 |
| 9. | පහසුකම් කළමනාකරණ | 103 |
| 10. | මූල්‍ය කටයුතු | 104 |
| 11. | මූල්‍ය පාරිභෝගික සබඳතා | 105 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 106 |
| 13. | විදේශ විනිමය | 108 |
| 14. | විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම් | 112 |
| 15. | අධිපති ලේකම් | 113 |
| 16. | මානව සම්පත් | 114 |
| 17. | තොරතුරු තාක්ෂණ | 120 |
| 18. | අභ්‍යන්තර විගණන | 123 |
| 19. | ජාත්‍යන්තර මෙහෙයුම් | 123 |
| 20. | නීති හා අනුකූලතා | 126 |
| 21. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 127 |
| 22. | ගෙවීම් සහ පියවීම් | 129 |
| 23. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 131 |
| 24. | රාජ්‍ය ණය | 132 |
| 25. | ප්‍රාදේශීය සංවර්ධන | 136 |
| 26. | නිරාකරණ හා බලගැන්වීම් | 141 |
| 27. | අවදානම් කළමනාකරණ | 142 |
| 28. | ලේකම් දෙපාර්තමේන්තුව | 144 |
| 29. | ආරක්ෂක සේවා | 145 |
| 30. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 145 |
| 31. | සංඛ්‍යාන | 146 |
| 32. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය | 150 |

# I. ගිණුම්කරණ සහ මූල්‍ය

**2021 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව**

**1. හැඳින්වීම**

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩල අනු කමිටුවකි. මෙම කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු වලට අදාල ප්‍රතිපත්ති පිළිබඳව මුදල් මණ්ඩලයට උපදේශන ලබා දීම සිදු කරයි. කමිටුවේ නිර්දේශ මුදල් මණ්ඩලයට නිතිපතා වාර්තා කරනු ලබයි.

**2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය**

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපතීත්වය මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු විසින් දරනු ලබන අතර, සෙසු සාමාජිකයන් ලෙස විගණන වෘත්තීයවේදීහු දෙදෙනෙකු කටයුතු කරති.

2021 වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

i) ආචාර්ය රාණි ජයමහ - සභාපතිනිය

ii) එච්. එම්. ඒ. ජයසිංහ මහතා - සාමාජික (2021.09.30 දක්වා)

iii) ඒ. අයි. මොහොට්ටි මහත්මිය - සාමාජිකා

iv) ඒ. අයි. ප්‍රනාන්දු මහතා - සාමාජික (2021.12.22 සිට බල පැවැත්වෙන පරිදි)

මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධුරය දරනු ලබන අතර, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කමිටුවේ සහකාර ලේකම් ධුරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සපයයි. මූල්‍ය දෙපාර්තමේන්තුව භාර සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුකූලතා නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී වෙති. කමිටුව විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සාකච්ඡා සඳහා සහ විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍යතා පරිදි රැස්වීම් වලට ආරාධනා කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සඳහා පත් කළ විගණන ආයතනයේ හවුල්කරු ද ආරාධිතව කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වරක් රැස්විය යුතු ය. කමිටුවේ ලේකම් විසින් සභාපතිනියගේ අනුමැතිය සහිතව මුදල් මණ්ඩලයේ, බාහිර විගණකයන්ගේ හෝ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ ඉල්ලීම පරිදි කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපතිනිය ඇතුලුව සාමාජිකයින් දෙදෙනෙකි.

**3. 2021 වසර තුළ සහ 2021 මූල්‍ය වර්ෂයට අදාළව ක්‍රියාත්මක කළ කාර්යයන්**

කමිටුව 2021 වර්ෂය තුළ රැස්වීම් දහහතරක් (14) පවත්වන ලදී. වර්ෂය තුළ සහ ඊට අදාලව කමිටුව විසින් ඉටු කළ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

**(අ) මූල්‍ය වාර්තාකරණය සහ බාහිර විගණනය**

කමිටුව විසින්,

i) 2020.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත KPMG ආයතනය විසින් ඉදිරිපත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර,

ii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

iii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවට අනුකූලව විගනකාධිපතිගේ වාර්තාව සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර,

iv) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

v) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව,

vi) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් පහක (05) (විශ්‍රාම අරමුදල, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල, නව විශ්‍රාම අරමුදල, නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල) මූල්‍ය ප්‍රකාශන,

vii) 2020.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

viii) ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් KPMG ආයතනයේ විගණන සැලැස්ම,

ix) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා KPMG ආයතනය විසින් නිකුත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය,

x) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

xi) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

සමාලෝචනය කරන ලදී.

**(ආ) අභ්‍යන්තර පාලනයන්**

කමිටුව විසින්,

i) කමිටුව වෙත වාර්තා කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සහ ක්‍රියාවලීන් සමාලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) අදාල පාර්ශවකරුවන් විසින් කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

**(ඇ) අභ්‍යන්තර විගණනය**

කමිටුව විසින්,

i) අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන් සහ නිර්දේශයන්,

ii) නව සංචිත කලමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන්,

iii) ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය,

iv) 2022 - 2024 කාලපරිච්ඡේදය සඳහා වන උපාය මාර්ගික විගණන සැලසුම සහ 2022 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලසුම,

සමාලෝචනය කරන ලදී.

**2021 මූල්‍ය වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරකම් වාර්තාව**

**1. හැඳින්වීම**

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) යනු මුදල් මණ්ඩලය (Monetary Board) විසින් පත් කරන ලද අනුකමිටුවකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් සඳහා පුළුල් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සතු වන අතර, එය බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහතික කිරීමට මුදල් මණ්ඩලයට සහාය වේ.

**2. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය**

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ මුලසුන හොබවන්නේ, මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ස්වාධීන මුදල් මණ්ඩල සාමාජිකයෙකු විසිනි. එහි සාමාජිකත්වය, මෙම කමිටුවට පත්වීමට පෙර අවම වශයෙන් වසරක කාලයක් මූල්‍ය සේවා අංශයට සම්බන්ධ නොවී සිටියා වූත්, අදාළ විශේෂිත දැනුම් සහ කුසලතාවලින් යුක්ත වූත්, ස්වාධීන බාහිර විශේෂඥයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

2021 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) සංජීව ජයවර්ධන මහතා, ජනාධිපති නීතිඥ - මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික (සභාපති)

ii) නයෝමාල් ගුණවර්ධන මහතා (ස්වාධීන බාහිර සාමාජික)

iii) සුසන්ත රත්නායක මහතා (ස්වාධීන බාහිර සාමාජික 01.01.2021 සිට 09.08.2021 දක්වා)

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ලේකම් තනතුර මුදල් මණ්ඩල ලේකම් විසින් හොබවන අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී) මෙහි සහකාර ලේකම් තනතුර දරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (Risk Management Department) මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවට ලේකම් පහසුකම් සපයයි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති සහ සියලුම නියෝජ්‍ය අධිපතිවරුන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කමිටුවේ (Business Continuity Planning Committee) සභාපති, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී) සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි හෝ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, අවම වශයෙන් සෑම කාර්තුවකට වරක් හෝ ඊට වැඩි වාර ගණනක් කමිටු රැස්වීම් පැවැත්වේ. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ රැස්වීම් කමිටුවේ ලේකම් විසින් කැඳවනු ලැබේ. රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකු වන අතර එයට අනිවාර්යයෙන්ම සභාපති ඇතුළත් විය යුතුය.

**3. 2021 මුදල් වර්ෂය තුළ ක්‍රියාකාරකම්**

**2021 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වූ අතර සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.**

i) දෙපාර්තමේන්තු අවදානම් ලේඛන සමාලෝචනය කර මෙහෙයුම් අවදානම් අවම කිරීම කඩිනම් කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ii) වසංගත ආශ්‍රිත අවදානම නිසා මතු විය හැකි ව්‍යාපාර අඛණ්ඩතා අවදානම, සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ අවදානම ඇතුළු අවදානම් අවම කර ගනිමින් බැංකුවේ සේවා අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහා ක්‍රියාකාරීව නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

iii) සංශෝධනය කරන ලද මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy) සමාලෝචනය කර, එය බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයට (Operational Risk Management Guidelines) ඇතුළත් කිරීම සඳහා අනුමත කරන ලදී.

iv) ආයතනගත අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිරීක්ෂණ සමාලෝචනය කර, අදාළ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

v) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වල (ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල) අවදානම් සමාලෝචනය කර තක්සේරු කරන ලද අතර, අදාළ ආයෝජන නිර්දේශිත පරාමිතීන් තුළ පවතින බව සහතික කරන ලදී.

vi) අභ්‍යන්තර ආයෝජන අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල සඳහා වන ආයෝජන මාර්ගෝපදේශ, සේවක අර්ථසාධක අරමුදල සඳහා වන ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය අවදානම් කළමනාකරණ දෘෂ්ටි කෝණයකින්, සමාලෝචනය කර සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

vii) ජාත්‍යන්තර සංචිත සඳහා උපාය මාර්ගික වත්කම් වෙන් කිරීම සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා කේපීඑම්ජී වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } බීඑෆ්/ජී/සීබීඑස්එල්/1/21/1 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2022 මාර්තු 29 දින |

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද මුදල් මණ්ඩලයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මුදල් මණ්ඩලය යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් වැදගත් විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරනු ලබන පාර්ශවයන් මම දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ :

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2021 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| | සටහන | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|---|
| වත්කම් | | | |
| විදේශීය මූල්‍ය වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 8 | **512,762,452** | 403,307,304 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | **-** | 40,564,323 |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 9 | **8,818,244** | 703,435,463 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | **54,022,836** | 3,370,353 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 11 | **188,045,837** | 158,958,185 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **-** | 1,702,247 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | | **763,649,369** | 1,311,337,875 |
| දේශීය මූල්‍ය වත්කම් | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 12 | **1,377,820,347** | 714,531,527 |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 13 | **567,532,312** | 2,728,412 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 14 | **150,128,800** | 153,061,900 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 15 | **1,671,218** | 1,615,356 |
| බැංකු සඳහා දෙන ලද ණය | 16 | **90,572,746** | 111,487,526 |
| අනෙකුත් වත්කම් | 17 | **34,063,770** | 23,097,189 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | | **2,221,789,193** | 1,006,521,910 |
| මුළු මූල්‍ය වත්කම් | | **2,985,438,562** | 2,317,859,785 |
| විදේශීය මූල්‍ය නොවන වත්කම් | | | |
| රන් | 18 | **35,151,981** | 76,220,055 |
| මූල්‍ය නොවන වත්කම් | | | |
| තොගය | 19 | **4,928,533** | 6,301,819 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **961,456** | 651,804 |
| දේපල පිරියත සහ උපකරණ | 20 | **19,235,994** | 20,455,452 |
| අස්පෘශ්‍ය වත්කම් | 21 | **561,632** | 108,252 |
| මුළු මූල්‍ය නොවන වත්කම් | | **60,839,596** | 103,737,382 |
| මුළු වත්කම් | | **3,046,278,158** | 2,421,597,167 |
| බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | | |
| විදේශීය මූල්‍ය බැරකම් | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 22 | **13,701** | 208,337,221 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 10 | **1,139,323** | 574,182 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 23 | **104,764,616** | 63,864,652 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 24 | **670,065,243** | 509,925,278 |
| අනිකුත් | 25 | **357,295,676** | 74,870,325 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | | **1,133,278,559** | 857,571,658 |
| දේශීය මූල්‍ය බැරකම් | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 26 | **300,704,162** | 129,601,521 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 27 | **1,392,301** | 1,460,512 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 28 | **101,062,880** | 209,507,898 |
| සංසරණයෙහි පවතින මුදල් | 29 | **1,005,099,066** | 834,807,859 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 30 | **19,163,882** | 14,742,792 |
| මුළු දේශීය මූල්‍ය බැරකම් | | **1,427,422,291** | 1,190,120,582 |
| මුළු මූල්‍ය බැරකම් | | **2,560,700,850** | 2,047,692,240 |
| අනිකුත් බැරකම් | | | |
| විලම්භිත ප්‍රදාන | 31 | **1,178** | 789 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 32 | **17,929,737** | 25,385,193 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 33 | **4,027,349** | 1,353,373 |
| මුළු අනිකුත් බැරකම් | | **21,958,264** | 26,739,355 |
| මුළු බැරකම් | | **2,582,659,114** | 2,074,431,595 |
| හිමිකරු ප්‍රාග්ධනය | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 50,000,000 |
| අනෙකුත් සංචිත | 34 | **315,128,226** | 282,012,023 |
| රඳවාගත් ලාභ | | **98,490,818** | 15,153,549 |
| මුළු හිමිකරු ප්‍රාග්ධනය | | **463,619,044** | 347,165,572 |
| මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය | | **3,046,278,158** | 2,421,597,167 |

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2022 මාර්තු 23 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති

ඩී.එස්.එල්. සිරිමාන්න - ප්‍රධාන ගණකාධිකාරී

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### ආදායම් ප්‍රකාශය

| | සටහන | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම:** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | 11,815,701 | 26,254,216 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය | 37 | 41,859,703 | 23,524,861 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය | | 14,855,788 | 6,524,368 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | 68,531,192 | 56,303,445 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 38 | (5,609,176) | (5,293,852) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | 39 | 2,282,695 | (2,046,205) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | (3,326,481) | (7,340,057) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය | | 34,041,805 | 7,123,733 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම** | | 99,246,516 | 56,087,121 |
| **ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 36 | 68,612,928 | 25,342,029 |
| මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/ (පාඩුව) | | (387,202) | 197,559 |
| පොළී වියදම | 38 | (8,469,897) | (8,320,294) |
| දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ අයකිරීම් | 39 | (808,696) | (259,194) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම** | | 58,947,133 | 16,960,100 |
| අනිකුත් ආදායම් | 40 | 16,280,370 | 1,589,329 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 174,474,019 | 74,636,550 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 41 | | |
| - වැටුප් සහ වේතන | | (7,116,223) | (5,298,938) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | (1,717,811) | (707,129) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | | (1,891,272) | (851,435) |
| | | (10,725,306) | (6,857,502) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | (526,675) | (452,353) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | (2,780,250) | (2,396,894) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 42 | (2,279,122) | (1,497,040) |
| **මුළු මෙහෙයුම් වියදම්** | | (16,311,353) | (11,203,789) |
| **බදු වලට පෙර ලාභය** | | 158,162,666 | 63,432,761 |
| බදු | 43 | - | - |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | | 158,162,666 | 63,432,761 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය | | 158,162,666 | 63,432,761 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම** | | | |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 34 | (16,108,192) | 9,910,943 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව) | 34 | (11,641,542) | 3,547,766 |
| | | (27,749,734) | 13,458,709 |
| **පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවන අයිතම** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණය මත වූ ශුද්ධ ලැබීම් | | - | 3,671,689 |
| අනෙකුත් විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්(වියදම)/ආදායම | 32 | 1,293,721 | (13,394,058) |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය | 34 | 55,862 | 108,379 |
| | | 1,349,583 | (9,613,990) |
| අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම) | | (26,400,151) | 3,844,719 |
| **මුළු විස්තීරණ ආදායම** | | 131,762,515 | 67,277,480 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

| | ආයක ප්‍රාග්ධනය රු. 000 | අනිකුත් සංචිත රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| 2020 ජනවාරි 1 දිනට ශේෂය | 50,000,000 | 212,493,432 | 41,691,960 | 304,185,392 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | 63,432,761 | 63,432,761 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | 418,783 | (422,163) | (3,380) |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | (13,394,058) | (13,394,058) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | - | 7,123,733 | (7,123,733) | - |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | - | - | (284,802) | (284,802) |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය | - | 9,910,943 | - | 9,910,943 |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 43,356,467 | (43,356,467) | - |
| පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 638,355 | (638,355) | - |
| 2019 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | - | - | (24,008,977) | (24,008,977) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | (141) | (141) |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | - | 742,476 | (742,476) | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ප්‍රාග්ධන ආයෝජනවල වෙළඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | 108,379 | - | 108,379 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | 3,547,766 | - | 3,547,766 |
| දේපළ පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ | - | 3,671,689 | - | 3,671,689 |
| 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය | 50,000,000 | 282,012,023 | 15,153,549 | 347,165,572 |
| **2021 ජනවාරි 1 දිනට ශේෂය** | **50,000,000** | **282,012,023** | **15,153,549** | **347,165,572** |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | **-** | **-** | **158,162,666** | **158,162,666** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | **-** | **369,008** | **(369,008)** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | **-** | **-** | **1,293,721** | **1,293,721** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | **-** | **34,041,805** | **(34,041,805)** | **-** |
| ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම | **-** | **-** | **(291,870)** | **(291,870)** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ අලාභය | **-** | **(16,108,192)** | **-** | **(16,108,192)** |
| රඳවාගත් ලාභයෙන් වෙළඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **23,574,367** | **(23,574,367)** | **-** |
| පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම් | **-** | **2,859,208** | **(2,859,208)** | **-** |
| 2020 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම | **-** | **-** | **(15,016,745)** | **(15,016,745)** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | **-** | **-** | **(72)** | **(72)** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම | **-** | **757,613** | **(757,613)** | **-** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ ලාභය | - | **55,862** | **-** | **55,862** |
| අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල රජයේ සුරැකුම්පත් වල වෙළෙඳපොළ ප්‍රත්‍යාගණනය මත වූ අලාභය | **-** | **(11,641,542)** | **-** | **(11,641,542)** |
| බැහැර කිරීම් මත උපලබ්ධි වූ ප්‍රත්‍යාගණන ලාභ | **-** | **(791,926)** | **791,570** | **(356)** |
| 2021 දෙසැම්බර් 31 දිනට | **50,000,000** | **315,128,226** | **98,490,818** | **463,619,044** |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම්: | | | |
| ලැබුණු පොලිය - විදේශීය මුදල් | | **16,510,461** | 29,058,738 |
| ලැබුණු පොලිය - දේශීය මුදල් - අනිකුත් | | **2,433,655** | 1,448,144 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **14,468,586** | 6,721,927 |
| උපලබ්ධි වූ විනිමය අලාභය | | **(13,003,097)** | (10,303,437) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,572,512** | 1,445,544 |
| | | **21,982,117** | 28,370,916 |
| වියපැහැදම්: | | | |
| ගෙවන ලද පොලිය - විදේශීය මුදල් | | **5,841,243** | 5,574,007 |
| ගෙවන ලද පොලිය - දේශීය මුදල් | | **6,571,438** | 6,863,137 |
| සේවකයින්ට ගෙවීම් | | **8,295,030** | 6,476,946 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **498,361** | 2,631,670 |
| | | **21,206,072** | 21,545,760 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 44 | **776,045** | (6,825,156) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් : | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම | | **(3,542,041)** | (3,068,543) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **5,534** | 5,767 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම | | **338,246** | 134 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම | | **(108,445,017)** | 166,209,573 |
| | | **(111,643,278)** | 163,146,931 |
| වියපැහැදම් : | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ අඩුවීම | | **(755,979,008)** | (57,023,608) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **22,242,111** | (901,434) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම | | **218,313,967** | (202,532,008) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම | | **489** | (1,590) |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **686,469** | 348,150 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **72,928** | 126 |
| කල්බදු වත්කම් මිලදී ගැනීම් | | **9,113** | 4,838 |
| රන් සංචිතයේ ශුද්ධ අඩුවීම | | **(38,743,707)** | (121,876,566) |
| මූල්‍ය සහ අනෙකුත් ආයතනවල ආයෝජන | | **-** | 6,489 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන්/ (අයකරගත්) ණය හා අත්තිකාරම් | | **(30,118,054)** | 111,353,276 |
| | | **(583,515,692)** | (270,622,327) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | **471,872,414** | 433,769,258 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් | | | |
| ලැබීම් : | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **390,975,631** | 697,310,625 |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **(220,684,424)** | (540,469,916) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **170,291,207** | 156,840,709 |
| වියපැහැදම් : | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු | 45 | **1,172,364,801** | 479,681,618 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්) | 46 | **(171,102,641)** | 124,980,099 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතු | | **1,001,262,160** | 604,661,717 |
| සංසරණ මුදල් ශුද්ධ අඩුවීම | | **(830,970,953)** | (447,821,008) |
| වියපැහැදම් : | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(145,925,443)** | 2,658,806 |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **72** | 141 |
| විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම | | **7,547,179** | 329,689 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **15,000,000** | 24,000,000 |
| | | **(123,378,192)** | 26,988,636 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **(707,592,761)** | (474,809,644) |
| මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | | **(234,944,302)** | (34,215,230) |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **28,871,146** | 16,861,445 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **403,577,642** | 420,931,427 |
| දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන් | 8 | **197,504,486** | 403,577,642 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 83 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2022 මාර්තු 23 වැනි දින අනුමත කරන ලදී.

### 1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- නිල විදේශ සංචිතය කළමනාකරණය කිරීම.
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය.
- පියවීම් පහසුකම් සඳහා ප්‍රතිපාදන හා ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම.
- ආර්ථික දත්ත සම්පාදනය, බෙදාහැරීම සහ විශ්ලේෂණය.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජයේ හා එහි නියෝජිතයන් හෝ බැංකුකරු ලෙස කටයුතු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ට ජංගම ගිණුම් පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

### 2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

### 2.1. අනුකූලතා ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

### 2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.
- අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකමින් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.
- සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

### 2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

### 2.4 ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලු අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

### 2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

**2.6 හිලව් කිරීම**

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

**2.7 සංසන්දනාත්මක තොරතුරු**

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

## 3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

**3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්ණායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි. බැංකුවේ ණය අලාභ ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මගින් විස්තර කර ඇත.

**3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 32 හි දැක්වේ.

**3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය**

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. විනිශ්චයන්වලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත. ණය යෝජනා ක්‍රමයන් සාධාරණ අගයට ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මගින් විස්තර කර ඇත.

**3.4 කොවිඩ්-19 පොදු බලපෑම**

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී බැංකුව විසින් කොවිඩ්-19න් ඇති වූ බලපෑම සැලකිල්ලට ගනු ලැබීය. විනිශ්චයන් සඳහා යොදා ගනු ලබන විශේෂ අයිතමයන් නොවෙනස්ව පැවතුන ද, කොවිඩ්-19 හි බලපෑම හේතුවෙන් අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවිය.

ඒ අනුව මූලික වශයෙන් බැංකු සඳහා දෙන ලද ණය ශේෂය සහ අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී මෙකී අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු බැංකුව විසින් යොදා ගනු ලැබීය.

කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් පරාසයක විහිදුණු සහන හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇති වඩාත් වැදගත් සහන ක්‍රියාමාර්ගය ලෙස ක්‍රියාත්මක කළ නව ණය යෝජනා ක්‍රම හැඳින්විය හැක. ඒ අනුව බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනුරුද අදියර I, II, III හා ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම මැයෙන් වන ප්‍රතිමූල්‍ය හා ණය යෝජනා ක්‍රම සහනදායි පොළී අනුපාත යටතේ මාස 6ක් වසර 2ක් අතර වන කල් පිරීම් කාල සීමාවක් සහිතව වසංගත තත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය ලබා දීමේ කොන්දේසියට යටත්ව බලපත්‍රලාභී වානිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකු තුළින් ක්‍රියාත්මක කරන ලදී.

තක්සේරු කිරීමේ ශිල්පිය ක්‍රම හා තක්සේරු යෙදවුම් අදාළ හා සුදුසු බවට විශේෂයෙන් තහවුරු කිරීම සඳහා නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් හා විනිශ්චයන් තක්සේරු ශිල්පීය ක්‍රම තුළ යොදා ගනු ලැබේ. එවන් තක්සේරු ශිල්පක්‍රම භාවිතයෙන් වත්කමක සාධාරණ අගය මිනුම් කරනු ලබයි. ඒ අනුව ඉහත සඳහන් කළ ණය යෝජනා ක්‍රම වල මූලික

හඳුනාගැනීමේ සාධාරණ අගය ගණනය කිරීමේදී ණය ආපසු ගෙවීම් කොන්දේසි හා වෙළඳපොළ පොලී අනුපාත යනාදී තීරණාත්මක උපකල්පනයන් හා විනිශ්චය යොදා ගන්නා ලදී.

පෙර කාලපරිච්ඡේද වල යොදාගත් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු මූලික අපේක්ෂිත ණය අලාභ ආකෘතිය, ක්‍රම හා ක්‍රමවේදය ස්ථාවර හා නොවෙනස්ව පැවතිය ද බැංකුව විසින් කොවිඩ්-19 බලපෑම, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලියේ යෙදවුම්, උපකල්පනයන් හා ඉදිරි දැක්මක් පවතින සාර්ව ආර්ථික විචල්‍යයන් තුළින් හඳුනාගෙන ඇත. ඊට අමතරව කොවිඩ්-19 ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික විචල්‍යයන්හි සිදුවූ චලනයන් හේතුවෙන් ඒවා යෙදවුම් ලෙස යොදා ගන්නා අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ ඇතිවන්නා වූ අනපේක්ෂිත සංඛ්‍යානමය වෙනස්වීම් අවම කර ගැනීම සඳහා බැංකුව විසින් සාමාන්‍යකරණය කරන ලද ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික විචල්‍යයන් භාවිතා කරන ලදී.

කෙසේ වෙතත් බැංකු තක්සේරුවට අනුව මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයට කොවිඩ්-19 මගින් බලපෑමක් ඇතිවී නොමැති අතර එම වත්කම් සුදුසු වටිනාකමට 2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශ වල තක්සේරු කර ඇත.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම

මෙම මූල්‍ය වර්ෂය තුළ“ ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| මුදල් වර්ගය | 2021 රු. | 2020 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **145.5851** | 143.4225 |
| කැනේඩියානු ඩොලර් 1 | **158.6150** | 146.4840 |
| යූරෝ 1 | **227.8832** | 227.7256 |
| ජපන් යෙන් 1 | **1.7417** | 1.8055 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **280.9312** | 272.6200 |
| ස්ටර්ලින් පවුම් 1 | **271.2270** | 254.8200 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **200.4338** | 186.4082 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | **31.5294** | 28.6661 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 5.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 50 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරික්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම් තුළින් (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

**5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්**

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

**5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම**

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනුලබනසියළුමූල්‍යවත්කම්හාවගකීම්වෙළෙඳාම්දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

**5.3.2 වර්ගීකරණය**

**මූල්‍ය වත්කම්**

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලූ මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

**ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම**

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.
- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

**ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොලිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුව.**

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොලිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත්, මුදලේ කාලීන වටිනාකමෙහි අගයත් "මූලික මුදල මත වන පොලිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකඟතාවයකදී පොලියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකඟතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොලිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

**ප්‍රතිවර්ගීකරණය**

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

### 5.3.3. ඉවත් කිරීම්

**මූල්‍ය වත්කම්**

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සම්මුච්චිත ලාභය හෝ අලාභය

යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොලිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරැකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

**මූල්‍ය බැරකම්**

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

### 5.3.4. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ. බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/ BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ "පළමු අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය

උපකරණ "දෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) "තෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හැඳින්වේ.

**අපේක්ෂිත ණය අලාභ මැනීම**

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමග විස්තර කර ඇත.

**ණය පැහැර හැරීමේ සම්භාවිතාව**

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලූම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

**ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය**

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මගහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

**පැහැර හැරීමකදී වන අලාභය**

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

**ආර්ථික සාධක ගැලපීම**

යම් කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිත දත්ත යොදා ගනී.

**ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම**

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක හෝ ඊට වැඩි අගයකින් වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

**ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැලකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා
- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

**අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම**

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් : අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.

- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් : මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.
- ණය ඇපකර ගිවිසුම : වෙන්කිරීමක් ලෙස.

**ලියා හැරීම**

ණය දීමක් හෝ ණය සුරැකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ "මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ" යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

**5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්**

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ දරණ ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/පාඩුව ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

**5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්**

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරැකුම්පත් හා ණය සුරැකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරැකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරීම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොලී ආදායම සඵල පොලී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

**5.6 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ**

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුණින් යුතු ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත කොන්දේසි අනුව නිශ්චිත දිනයන්හිදී මූලික මුදල හා ඒ මත පොලිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

**5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙනුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශ වලින් ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

**5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)**

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. සමඟ වූ පංගුව ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජා.මු.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මු.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**5.9 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 45 සහ සටහන් 46 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**5.10 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදීගනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

**5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනී.

**5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි. මෙසේ නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරනු ලැබේ.

**5.13 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

**5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

**5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

**5.16 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වාර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**5.17 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මු.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

**වට්ටම් අනුපාතය** - ශ්‍රී.ලං.ම. බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන, නිශ්චිත කාලයක් සඳහා අදාළ වන දිගු කාලීන උද්ධමන ඉලක්ක හා අපේක්ෂිත මූර්ත පොළී අනුපාතයට බැංකුවේ උපදේශන විගණන කමිටුව මඟින් අනුමත කළ පරිදි සියයට 1ක අවදානම් අධිභාරයක් එකතු කළ අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර එය, ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

**5.18 රන්**

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

**5.19 මුදල් තොග**

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**5.20 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

**5.21 දේපළ, පිරියත සහ උපකරණ**

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වු නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් අනතුරුව හඳුනාගන්නා සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඪාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 3කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේ දී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

**5.22 කල්බදු**

යම් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද යන්න හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව විසින් නිර්ණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වේ. යම් ගිවිසුමක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතියක් ලබාදේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් ජා.මූ.වා.ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය යොදා ගනු ලැබේ.

**බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.**

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම ආරම්භයේදී පිරිවැයට මනිනු ලැබේ. මෙහිදී පිරිවැය ලෙස සලකනුයේ කල්බද්ද ආරම්භ වන දින හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් ගලපන ලද ආරම්භක කල්බදු වගකීමට බැංකුව විසින් දරන ලද මූලික සෘජු පිරිවැය හා අදාල කල්බදු ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය එකතු කළ විට ලැබෙන අගයයි.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු වාරය අවසන් වන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් හානිකරන අලාභ අඩුකරන අතර කල්බදු වගකීමේ නැවත මැනීම් ගැළපීමද සිදුකරනු ලැබේ.

කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදී පහත සඳහන් කල්බදු ගෙවීම් සලකා බලනු ලැබේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්;
- දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම සහතික කිරීම් යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂා කරන අගය; හා
- බැංකුව විසින් මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල, බැංකුවට කල්බදු වාරය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවක් ඇති විට, එසේ කල්බදු වාරය දීර්ඝ කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම කාලය තුළදී ගෙවීමට අපේක්ෂිත කල්බදු ගෙවීම් හා කල්බදු වාරය අවසන් වීමට පෙර බැංකුව විසින් කල්බද්ද අවසන් කිරීමට ක්‍රියාත්මක වේ නම් ඒ සඳහා අදාල වන දඩ ගෙවීම්.

කල්බදු වගකීම සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එනමුදු යම් දර්ශකයක හෝ අනුපාතිකයක වෙනස්වීමක් මත වන අනාගත කල්බදු වාරිකවල වන වෙනසක්, අවශේෂ වටිනාකම සහතික කිරීම යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂිත අගයේ සිදුවන වෙනසක්, කල්බදු වාරය දීර්ඝ කිරීමේ අවස්ථාවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බැංකුවේ අදහස වෙනස්වීමක්, කල්බදු වාරය අවසන් වීමට පෙර කල්බද්දක් අවසන් කිරීම වෙනුවෙන් බැංකුව විසින් ගෙවිය යුතු දඩයක් හා ප්‍රධාන ස්ථාවර ගෙවීම්වල සිදුවන වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම් නැවත මැනීමට සිදු වේ.

ඉහත අයුරින් නැවත මනින ලද කල්බදු වගකීමෙහි වන වෙනස්වීම අදාළ වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ. අදාල වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශුන්‍ය වේ නම් එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් දේපල, පිරියත හා උපකරණ (සටහන 20) හා විවිධ බැරකම් හා උපචිතයන් (සටහන 33) තුළ දක්වා ඇත.

### 5.23 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඩාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හාණිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමඟින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක ඵලදායී ජීව කාලයක් තුළ සෘජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 5.24 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

### 5.25 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සළකුණු දක්වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් එම වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කිරීම සිදු කරනු ලබයි.

වත්කම් හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීන වූ මුදල් ගලා ඒම් ඇති වත්කම් කුඩා වත්කම් සමූහවලට කාණ්ඩගත කරනු ඇත.

"වත්කමක අයකරගත හැකි වටිනාකම" එම වත්කමෙහි "භාවිතයේ පවතින වටිනාකම" හෝ සාධාරණ අගයෙන් විකිණීමට දරණ පිරිවැය අඩුකොට ගන්නා වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක භාවිතයේ පවතින වටිනාකම වනුයේ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ එකී වත්කමේ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුවේ කාල අගය හා එම වත්කමටම විශේෂ වූ අවදානම් පිළිබිඹු කරනා පූර්ව බදු වට්ටම් අනුපාතයකින් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගයයි.

වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාළ වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

### 5.26 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

### 5.27 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

### 5.28 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි

සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 32 හි හෙළිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

### 5.29 නිශ්චිත දායක සැලසුම්

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

### 5.30 ප්‍රදානයන්

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදාහරිනු ලැබේ.

### 5.31 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පවතින බවට තහවුරු කෙරෙන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ එහි ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙළිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

### ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය

### 5.32 ආදායම සහ වියදම

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

#### 5.32.1 පොලී ආදායම් සහ වියදම්

පොලිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

#### 5.32.2 ලාභාංශ

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

#### 5.32.3 විවිධ ආදායම් හා වියදම්

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ඨාවෙන් වත්කමේ ධාරණ අගය සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම්, ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

#### 5.32.4 සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

#### 5.32.5 ආදායම් බදු වියදම

1949 අංක 58 දරණ මුදල් නීති (සංශෝධිත) පනතේ 118 වගන්තිය සහ 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි

නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අහෝසිකරන ලදී.

**5.33 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්**

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ජා.ගි.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන "සෘජු ක්‍රමය" භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල්/මුදල් විධානයන්ගේ ගලායෑම් ගැළපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

## 6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

පහත ප්‍රමිතීන් මත වූ සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2021 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාළ කර නොගන්නා ලදී. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

**6.1 භාරක ගිවිසුම - ගිවිසුමක් සම්පූර්ණ කිරීමේ පිරිවැය (ජා.ගි.ප්‍ර. 37ට කරන ලද සංශෝධන)**

ජා.ගි.ප්‍ර. 37ට කරන ලද සංශෝධනවලට අනුකූලව 'ගිවිසුමක් සම්පූර්ණ කිරීමේ පිරිවැය' පහත පිරිවැයන්ගෙන් සමන්විත වේ.

- වර්ධක පිරිවැය උදා- සෘජු ශ්‍රමය සහ අමුද්‍රව්‍ය; සහ
- වෙනත් සෘජු වියදම් වෙන් කිරීම - උදා -ගිවිසුමක් සම්පූර්ණ කිරීමේ දී භාවිතා කරන දේපළ පිරියත සහ උපකරණ අයිතමයන් සඳහා ක්ෂයවීම් ගාස්තු වෙන් කිරීම.

මේ යටතේ දැනටමත් 'සම්පූර්ණ පිරිවැය' ප්‍රවේශය යොදා ගන්නා සමාගම් වලට බලපෑමක් නැති නමුත් 'වර්ධක පිරිවැය' ප්‍රවේශය යොදා ගන්නා සමාගම්වලට විශාල සහ බොහෝ විට වැඩි ප්‍රතිපාදන වෙන්කිරීමට සිදුවනු ඇත.

2022 ජනවාරි 1 දිනට හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාලසීමාවන් සඳහා මෙම සංශෝධන අදාළ වනුයේ, සංශෝධන මුලින්ම අදාළ වන දිනයේ පවතින ගිවිසුම්වලටය, සංශෝධන මූලිකව අදාළ වන දිනයේදී, සංශෝධන මගින් ඇති වූ සමුච්චිත බලපෑම, රඳවාගත් ඉපයීම් හෝ වෙනත් ප්‍රාග්ධන අයිතමයන්හි ආරම්භක ශේෂය ගැලපීමක් ලෙස හඳුනා ගැනේ. සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර නැත.

**6.2 දේපළ පිරියත සහ උපකරණ: අපේක්ෂිත භාවිතයට පෙර ආදායම (ජා.ගි.ප්‍ර. 16ට කරන ලද සංශෝධන)**

මෙම සංශෝධන යටතේ, දේපළ, පිරියත සහ උපකරණ ඒවා භාවිතයට ගැනීමට පෙර විකිණීමෙන් ලද මුදල, එම අයිතමයන් නිෂ්පාදනයට දරණ ලද වියදම සමග ගලපා ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත යුතුය. ඒකී නිෂ්පාදන පිරිවැය හඳුනාගැනීම හා මැනීම ජා.ගි.ප්‍ර. 2 'තොගය' අනුකූලව සිදු කළ යුතුය.

එම නිසා,

- දේපළ, පිරියත සහ උපකරණ භාවිතයට ගැනීමට පෙර ඒවා නිෂ්පාදනය හා විකිණීම ආශ්‍රිතව ඇති පිරිවැය සහ
- දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ගොඩනැගීමේ පිරිවැය.

සමාගම විසින් වෙන් කර හඳුනාගත යුතුය.

මෙම සංශෝධන 2022 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා කලින් යොදා ගැනීමට අවසර දී ඇත.

මෙම ජා.ගි.ප්‍ර. 16ට කරන ලද සංශෝධන අතීත ගිණුම් වර්ෂවලට බලපාන පරිදි වෙනස් කර ඇති අතර බැංකුව විසින් සංශෝධන මුලින්ම අදාළ කරගනු ලබන මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් කරන සන්සන්දනාත්මක කාලපරිච්ඡේදය ආරම්භයේ හෝ ඉන්පසුව භාවිතය සඳහා පවතින දේපළ, පිරියත සහ උපකරණ අයිතම සඳහා පමණක් අදාළ වේ.

**6.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම (ජා.ගි.ප්‍ර. 1 සහ ජා.මූ වා.ප්‍ර.(Practice Statement 2) සඳහා කරන ලද සංශෝධන)**

ජා.ගි.ප්‍ර. 1 හි ප්‍රධාන සංශෝධනයන්හි ඇතුළත් වන්නේ

- සමාගමක සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට වඩා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාවය;
- ප්‍රමාණාත්මක නොවන ගනුදෙනු, වෙනත් සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රමාණාත්මක නොවන බැවින් ඒවා හෙළි නොකළ යුතු බව පැහැදිලි කිරීම හා
- ප්‍රමාණාත්මක ගනුදෙනු, වෙනත් සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළ සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගමක මූල්‍ය ප්‍රකාශනවලට ප්‍රමාණාත්මක නොවන බව පැහැදිලි කිරීම

මෙම සංශෝධන 2023 ජනවාරි 1 සිට බලපැවැත්වෙන නමුත් කලින් යොදා ගත හැක.

**6.4 ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම (ජා.ගි.ප්‍ර. 8ට කරන ලද සංශෝධන)**

මෙම සංශෝධන මගින් ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා නව අර්ථ දැක්වීමක් හඳුන්වා දෙන අතර ඒවා මිනුම් අවිනිශ්චිතතාවයට යටත් වන මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රමාණයන් බව පැහැදිලි කෙරේ.

එසේම, ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මඟින් දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බැංකුව විසින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සකස් කිරීම ඔස්සේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු අතර වන සම්බන්ධය මෙම සංශෝධන මඟින් පැහැදිලි කෙරේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ගොඩනැගීමේදී පහත කරුණු දෙකම ඇතුළත් කෙරේ.

- මිනුම් ක්‍රමයක් තෝරා ගැනීම (ඇස්තමේන්තු කිරීම හෝ තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය) උදා ජා.මු.වා.ප්‍ර. 9 'මූල්‍ය උපකරණ' අනුව අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව මැනීමට භාවිතා කරනු ලබන ඇස්තමේන්තු ක්‍රමය; හා
- තෝරාගත් මිනුම් ක්‍රමය යොදන විට භාවිතා කළ යුතු යෙදවුම් තෝරා ගැනීම උදා - ජා.මු.පා.ප්‍ර. 37 'ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්' අනුව වගකීම් සඳහා ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා අපේක්ෂිත මුදල් ගලායෑම්

මෙම සංශෝධන 2023 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන අතර, කලින් යොදා ගැනීමට අවසර ලබා දී ඇත.

බැංකුව විසින් සංශෝධන අදාළ කර ගනු ලබන පළමු වාර්ෂික වාර්තාකරණ කාලසීමාව ආරම්භයේ හෝ ඉන්පසුව සිදුවන ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන ලෙස යොදා ගනු ලැබේ.

### 6.5 ජා.මු.වා.ප්‍ර. 2018-2020 සඳහා වාර්ෂික වැඩි දියුණු කිරීම්

### 6.6 කොවිඩ් -19 සහ බැඳුණු කුලී සහන 2021 ජූනි 30 න් ඔබ්බට ( ජා.මු.වා.ප්‍ර. 16ට කරන ලද සංශෝධන)

## 7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

### 7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ස්වෛරී සුරැකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මඟින් ද්‍රවශීලතා කළමනාකරණය සිදුකරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මඟින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

## 8. මුදල් සහ මුදල් සමානයන්

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| බැංකු සමඟ ඇති ශේෂයන් | **23,385,534** | 93,379,318 |
| බැංකු සමඟ ඇති කාලීන තැන්පතු | **49,430,045** | 270,722,623 |
| එක්දින ස්ථාපනය කිරීම් | **124,669,823** | 39,462,616 |
| මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී | **19,084** | 13,085 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන් | **197,504,486** | 403,577,642 |
| සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.1) | **315,345,334** | - |
| අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 8.2) | **(85,368)** | (270,338) |
| **එකතුව** | **512,762,452** | 403,307,304 |

**8.1** 25.6 සටහනෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී.ලං.ම.බැ. හා පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්විපාර්ශවික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළඳ කටයුතුවලදී, සෘජු ආයෝජනවලදී සහ දෙපාර්ශවය මඟින් එකඟවන වෙනත් කාරණයක් සඳහා යොදාගත හැකිය.

**8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය**

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **90,277** | **180,061** | **270,338** | 219,331 | 2,627 | 221,958 |
| වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්) | **(38,268)** | **(146,702)** | **(184,970)** | (129,054) | 177,434 | 48,380 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **52,009** | **33,359** | **85,368** | 90,277 | 180,061 | 270,338 |

**9. විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්**

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| **ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්** | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් (සටහන 9.1) | **-** | 40,564,323 |
| | **-** | 40,564,323 |
| **අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්** | | |
| - විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන් | **8,818,244** | 703,435,463 |
| | **8,818,244** | 703,435,463 |
| **විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව** | **8,818,244** | 743,999,786 |
| අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.2) | **995** | 2,098,721 |

**9.1** ලාභ හෝ පාඩුව තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද විදේශීය සුරැකුම්පත් ආයෝජන තුළ ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකුව මගින් පාලනය කරනු ලබන සංචිත කළමනාකරණය සහ උපදේශන වැඩසටහන (RAMP)හි කරන ලද ආයෝජන ඇතුළත් වේ.

**9.2 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය**

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 | අදියර I<br>රු. 000 | අදියර II<br>රු. 000 | එකතුව<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **36,546** | **2,062,175** | **2,098,721** | 81,259 | 19,635 | 100,894 |
| වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්) | **(35,551)** | **(2,062,175)** | **(2,097,726)** | (44,713) | 2,042,540 | 1,997,827 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **995** | **-** | **995** | 36,546 | 2,062,175 | 2,098,721 |

**10. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

**10.1** පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම්<br>රු. 000 | වගකීම්<br>රු. 000 | කාල්පනික අගය<br>රු. 000 | වත්කම්<br>රු. 000 | වගකීම්<br>රු. 000 | කාල්පනික අගය<br>රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **54,022,803** | **1,130,519** | **197,002,554** | 3,368,784 | 573,774 | 281,690,071 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward) | **33** | **8,804** | **229,487** | 1,569 | 408 | 1,025,245 |
| එකතුව | **54,022,836** | **1,139,323** | **197,232,041** | 3,370,353 | 574,182 | 282,715,316 |

**10.2** ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමග හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රට තුළට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

**10.3** ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

**10.4** විනිමය අනුපාත අවදානම සහ කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ග යක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමග එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

**10.5** ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

**10.6** සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

## 11. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| **ලාභ/අලාභ මත සාධාරණ අගයට මිනුම් කළ** | | |
| ජා.මූ.අ. පංගුව (සටහන 11.1) | **162,603,548** | 157,793,346 |
| | **162,603,548** | 157,793,346 |
| **ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ** | | |
| විශේෂ ගැනුම් හිමිකමේ දැරීම (සටහන 11.2) | **24,800,563** | 491,874 |
| ජා.මූ.අ. තැන්පතු (සටහන 11.3) | **216,785** | 208,077 |
| කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය | **424,944** | 464,890 |
| අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 11.4) | **(3)** | (2) |
| | **25,442,289** | 1,164,839 |
| | **188,045,837** | 158,958,185 |

### 11.1 ජා.මූ.අ. පංගුව

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශීය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී. (වර්තමානයේ ජා.මූ.අ. සාමාජිකයින් ගණන 190 කි.)

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමග රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

**i.)** **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

**ii.)** **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

**iii.)** **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද (ජා.මූ.අ කොවිඩ් -19 තත්වයට ප්‍රතිචාර වශයෙන් තාවකාලිකව මෙය පංගුවෙන් සියයට 245ක් දක්වා 2021 වර්ෂය අවසාන තෙක් වැඩි කරන ලදී.) සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**iv.)** **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ. ඇ.එ.ජ. ඩොලර් බිලියන 650 කට

සමාන, සාමාන්‍ය වි.ගැ.හි. වෙන්කිරීමක් ජා.මූ.අ සාමාජිකයන් මෙන්ම වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ සහභාගීවන්නන්හට ඔවුන්ගේ පවතින පංගුවට සමානුපාතිකව 2021 අගෝස්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී. මෙම සාමාන්‍යවි.ගැ.හි වෙන් කිරීමෙන් ශ්‍රී ලංකාව ලද කොටස වි.ගැ.හි මිලියන 554.8 ක් විය.

### 11.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මූ.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිණි. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

### 11.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

### 11.4 ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| අදියර 1 | | |
| ජනවාරි 1 දිනට ශේෂය | 2 | 4 |
| වර්ෂය තුළ ආපසු හැරවුම් | 1 | (2) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 3 | 2 |

## 12. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 1,351,378,149 | 637,959,075 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 25,876,232 | 74,904,469 |
| ලැබිය යුතු පොළී | 565,966 | 1,667,983 |
| | 1,377,820,347 | 714,531,527 |

## 13. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් | 567,297,000 | 2,728,000 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී | 235,312 | 412 |
| | 567,532,312 | 2,728,412 |

## 14. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

## 15. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

### 15.1 ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | 2021 කොටස් ගණන | 2021 ධාරණ අගය රු.000 | 2020 කොටස් ගණන | 2020 ධාරණ අගය රු.000 |
|---|---|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **2,986,824** | **653,414** | 2,986,824 | 597,246 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **500,000** | **-** | 500,000 | - |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **48,244** | **1,017,804** | 48,244 | 1,018,110 |
| | | | **1,671,218** | | 1,615,356 |

**15.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2021 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත. එම ආයෝජනවල සාධාරණ අගය, බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන දිනට ආයෝජිත සමාගම් විසින් හෙළිදරව් කරන ලද විගණනය නොකල නවතම මූල්‍ය වාර්තාවල සඳහන් කොටසක ශුද්ධ වත්කම් අගය අනුව ගණනය කරනු ලැබේ. ඒ අනුව, මෙහි දැක්වෙන දිනයන්හි පැවති කොටසක ශුද්ධ වත්කම් අගය ඉහත ගණනය කිරීම් සඳහා යොදාගන්නා ලදී.

| | |
|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | - 2021 දෙසැම්බර් 31 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. 218.77 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | - 2021 නොවැම්බර් 30 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. -4.82 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | - 2021 දෙසැම්බර් 31 |
| කොටසක ශුද්ධ වත්කම් අගය | - රු. 21,097.00 |

### 16. බැංකු සඳහා දෙන ලද ණය

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.1) | **90,621,674** | 111,641,894 |
| අඩු කළා: බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 16.2) | **(48,928)** | (154,368) |
| | **90,572,746** | 111,487,526 |

### 16.1 බැංකු සඳහා දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **20,368** | 22,563 |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය (සටහන) 16.1.1) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **89,707** | 10,994 |
| ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම (සටහන 16.1.2) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **-** | 4,934,335 |
| - අනෙකුත් | **-** | 11,185 |
| සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකම (සටහන 16.1.3) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **60,373,446** | 72,901,250 |
| - අනෙකුත් | **9,245,265** | 10,701,621 |
| සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම් (සටහන 16.1.4) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **8,644,208** | 16,277,700 |
| - අනෙකුත් | **3,173,742** | 6,782,246 |
| සෞභාග්‍යා ණය පහසුකම (සටහන 16.1.1) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **6,850,588** | - |
| - අනෙකුත් | **2,211,334** | - |
| ශ්‍රී.ලං.ම.බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **13,016** | - |
| | **90,621,674** | 111,641,894 |

16.1.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන ලද උතුරු නැගෙනහිර හානිවූ නිවාස ප්‍රතිසංස්කරණ ණය ක්‍රමය යටතේ වූ රු.මි 82.05ක ශේෂයක්ද සෞභාග්‍යා ණය යෝජනාක්‍රමය යටතේ වූ රු.මි. 9,061.92 ක ශේෂයක් ද එම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලද ණය යෝජනා ක්‍රමයන් ද ශ්‍රී ලංකා මහා බැංකුවට අවශෝෂණය කිරීමේදී බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වල සටහන් කරන ලදී.

16.1.2 ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම: රජයෙන් ලැබිය යුතු හිඟ මුදල් ඇති කොන්ත්‍රාත්කරුවන්/ සැපයුම්කරුවන්ගේ අරමුදල් අවශ්‍යතා සංතෘප්ත කිරීම සඳහා වාණිජ බැංකු වෙත අරමුදල් සැපයීම සඳහාම කැප වූ ණය යෝජනා ක්‍රමයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 83 කොටස ප්‍රකාරව මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. 2021 දෙසැම්බර් 31 දින වන විට මෙම ණය පහසුකම සම්පූර්ණයෙන් නැවත අය කරගෙන තිබිණි.

16.1.3 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීමට පහසුකම් සැපයීමක් ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 83 කොටස ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කොවිඩ්-19 පැතිර යාමෙන් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර වෙත ණය ලබාදීම යන කොන්දේසියට යටත්ව ලබා දෙන ලදී.

16.1.4 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම: කොවිඩ්-19 පැතිර යාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම අංශයේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සහ රටේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නව ප්‍රතිමූල්‍ය ණය පහසුකම සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයන් ද යටතේ දියත් කරන ලදී.

### 16.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2021 | | | | 2020 | | |
|---|---|---|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | අදියර 3 | එකතුව | අදියර 1 | අදියර 2 | එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **6,215** | **148,153** | **-** | **154,368** | - | 35 | 35 |
| වර්ෂය තුළදී අය කිරීම් / (ආපසු හැරවුම්) | **8.220** | **(120,676)** | **13,016** | **(105,440)** | 6,215 | 148,118 | 154,333 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **14,435** | **21,477** | **13,016** | **48,928** | 6,215 | 148,153 | 154,368 |

### 17. අනිකුත් වත්කම්

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| මූල්‍ය වත්කම් | | |
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **16,490,667** | 13,319,452 |
| අඩුකළා: අභ්‍යන්තර අරමුදලෙහි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.1) | **(280)** | (79,572) |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | **16,490,387** | 13,239,880 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ආයෝජන | **5,380,169** | - |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.2) | **(150)** | - |
| | **5,380,019** | - |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | **5,592,375** | 5,569,225 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **4,087,983** | 597,774 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | **2,258,932** | 1,649,540 |
| අඩුකළා: අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.3) | **(2,226,887)** | (183,276) |
| | **9,712,403** | 7,633,263 |
| | **31,582,809** | 20,873,143 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | **2,480,961** | 2,224,046 |
| | **34,063,770** | 23,097,189 |

### 17.1 අභ්‍යන්තර අරමුදල්හි අයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2021 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|
| | අදියර 1 | අදියර 2 | එකතුව | අදියර 1 | අදියර 2 | එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **48** | **79,524** | **79,572** | 15,617 | 16 | 15,633 |
| වර්ෂය සඳහා අයකිරීම්/(ආපසු හැරවුම්) | **(9)** | **(79,283)** | **(79,292)** | (15,569) | 79,508 | 63,939 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **39** | **241** | **280** | 48 | 79,524 | 79,572 |

### 17.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙහෙයවන ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනයන්

| | 2021 | 2020 |
|---|---|---|
| | අදියර 01 | අදියර 01 |
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **-** | - |
| වර්ෂය තුළදී අය කිරීම් | **150** | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **150** | - |

### 17.3 අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

| | 2021 | 2020 |
|---|---|---|
| | අදියර 03 | අදියර 03 |
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | **183,276** | 175,275 |
| වර්ෂය තුළදී අය කිරීම් | **-** | 8,001 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය ශේෂයන් අවශෝෂණය කිරීම | **2, 043,611** | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | **2,226,887** | 183,276 |

### 18. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව භෞතිකව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රවපරිවර්තනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 19. තොග

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **1,788,014** | 2,294,967 |
| සංසරණය සඳහා ඇති කාසි | **2,821,514** | 3,519,159 |
| මාර්ගස්ථ කාසි | **-** | 31,876 |
| මාර්ගස්ථ නෝට්ටු | **253,168** | 440,203 |
| | **4,862,696** | 6,286,205 |
| අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(2,446)** | (45,000) |
| | **4,860,250** | 6,241,205 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **68,124** | 60,306 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **159** | 308 |
| මුළු තොගය | **4,928,533** | 6,301,819 |

2021 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 2,780.25 (2020 - රු.මිලියන 2,396.89) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස සටහන් කර ඇත.

## 20. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිම් ඉදිකිරීම් | එකතුව 2021 | එකතුව 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට ශේෂය | 19,166,963 | 1,584,031 | 1,383,500 | 561,293 | 1,073,355 | 71,125 | 57,490 | 129,010 | **24,026,767** | 20,698,837 |
| එකතු කිරීම් | - | 51,196 | 25,984 | 50,500 | 74,548 | 9,114 | 247 | 82,234 | **293,823** | 264,225 |
| බැහැර කිරීම් | (992,900) | (58,508) | (31,985) | - | (6,363) | - | (320) | (1,262) | **(1,091,338)** | (641) |
| මාරු කිරීම් | - | 38,759 | 17,181 | - | - | - | - | (55,940) | **-** | - |
| ප්‍රත්‍යාගණන කළ වත්කම් මත සමුච්චිත ක්ෂය මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | **-** | (754,570) |
| ප්‍රත්‍යාගණන ලාභය | - | - | - | - | - | - | - | - | **-** | 3,814,078 |
| වත්කම් භාවිත කිරීමේ හිමිකම් නැවත ගණනය කිරීම | - | - | - | - | - | - | - | - | **-** | 4,838 |
| බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය | - | - | - | - | - | (11,190) | - | - | **(11,190)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | 18,174,063 | 1,615,478 | 1,394,680 | 611,793 | 1,141,540 | 69,049 | 57,417 | 154,042 | **23,218,062** | 24,026,767 |

| සමුච්චිත ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | වත්කම් භාවිතා කිරීමේ හිමිකම | අනිකුත් | නොනිම් ඉදිකිරීම් | එකතුව 2021 | එකතුව 2020 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | - | 1,095,846 | 1,085,491 | 434,939 | 902,948 | 12,883 | 39,208 | - | **3,571,315** | 3,888,146 |
| වර්ෂය සඳහා ක්ෂය | 230,320 | 81,044 | 79,412 | 28,447 | 77,745 | 6,501 | 376 | - | **503,845** | 438,256 |
| බැහැර කිරීම් | (11,221) | (33,291) | (31,443) | - | (5,947) | - | - | - | **(81,902)** | (517) |
| ප්‍රත්‍යාගණන කළ වත්කම් මත සමුච්චිත ක්ෂය මාරු කිරීම් | - | - | - | - | - | - | - | - | **-** | (754,570) |
| බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය | - | - | - | - | - | (11,190) | - | - | **(11,190)** | - |
| දෙසැම්බර් 31 දිනට අගය | 219,099 | 1,143,599 | 1,133,460 | 463,386 | 974,746 | 8,194 | 39,584 | - | **3,982,068** | 3,571,315 |
| ශුද්ධ පොත් අගය | 17,954,964 | 471,879 | 261,220 | 148,407 | 166,794 | 60,855 | 17,833 | 154,042 | **19,235,994** | 20,455,452 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2020 දෙසැම්බර් 31 දිනට වරලත් තක්සේරුකරු ඒ.ඒ.එම්. ෆාතිහු මහතා විසින් සිදු කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට පවතින මෙම ඉඩම් හා ගොඩනැගිලිවල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයන් හා සසඳන කළ සැලකිය යුතු වෙනසකට භාජනය වී නොමැති බව බැංකුවේ අදහසයි.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 680.89 (2020 - රු.මිලියන 348.15) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2021 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 1,929.55 ක් වේ (2020 රු. මිලියන 1,753.86).

**තක්සේරුකරණ ප්‍රවේශය සහ සින්නක්කර ඉඩම්, ගොඩනැගිලි සහ කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ඉඩම්වල ඇති ගොඩනැගිලි තක්සේරු කිරීමේදී යොදාගත් සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්**

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම් | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.) | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.) | ඇස්තමේන්තුගත මාසික කුලිය (රු.) | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් | දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය (රු.000) |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 15,750,000 | 11,000 - 18,500 | - | - | - | 10,437,567 |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 13,200,000 | - | 7,000,000 | 35% | 16.66 | 783,407 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය | 14,400,000 | - | 10,000,000 | 35% | 16.66 | 1,077,180 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 3,600,000 | 3,000 - 12,000 | - | - | - | 2,660,026 |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 10,000,000 | 4,000 - 11,000 | - | - | - | 1,709,163 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,000,000 - 4,000,000 | 4,000 - 9,500 | - | - | - | 360,397 |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 150,000 - 750,000 | 3,000 - 9,500 | - | - | - | 222,786 |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,350,000 | 5,000 - 8,750 | - | - | - | 334,193 |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 270,000 | 5,000 - 12,500 | - | - | - | 231,605 |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 4,500 - 9,500 | - | - | - | 90,783 |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 7,000 | - | - | - | 21,960 |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 2,000 - 8,500 | - | - | - | 199,050 |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 11,750 - 12,000 | - | - | - | 45,946 |

**ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය**

| | ධාරණ අගය 2021 රු. 000 | ධාරණ අගය 2020 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **10,855,725** | 11,334,725 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,798,976** | 7,520,445 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **300,263** | 311,793 |
| | **17,954,964** | 19,166,963 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 7,273.50 ක් වේ (2020 - රු.මි. 7,607.42).

## 21. අස්පෘශ්‍ය වත්කම්

| | 2021 | | | 2020 |
|---|---|---|---|---|
| | අස්පෘශ්‍ය වත්කම් | නොනිමි අස්පෘශ්‍ය වත්කම් | එකතුව | |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පරිගණක මෘදුකාංග : පිරිවැය:** | | | | |
| ජනවාරි 01 දිනට අගය | **1,005,040** | 83,925 | 1,088,965 | 1,004,915 |
| එකතු කිරීම් | **72,928** | 403,023 | 475,951 | 84,050 |
| වර්ෂය තුළදී මාරු කිරීම් | **5,573** | (5,573) | - | - |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,083,541** | 481,375 | 1,564,916 | 1,088,965 |
| **ක්‍රමක්ෂය** | | | | |
| ජනවාරි 01 දිනට අගය | **980,713** | - | 980,713 | 966,869 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **22,571** | - | 22,571 | 13,844 |
| දෙසැම්බර් 31 දිනට අගය | **1,003,284** | - | 1,003,284 | 980,713 |
| **ශුද්ධ පොත් අගය:** | | | | |
| දෙසැම්බර් 31 දිනට අගය | **80,257** | 481,375 | 561,632 | 108,252 |

වර්ෂය තුළ දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 78.50 (2020 - රු.මි. 0.13) මුළු වටිනාකමකින් යුතු අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2021 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද එහෙත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 957.20 (2020 රු. මි. 952.13)ක් වේ.

## 22. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **7,380** | 208,322,721 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **6,321** | 14,500 |
| | **13,701** | 208,337,221 |

## 23. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය සහ පකිස්ථානය එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. එක් එක් සහභාගීවන රටවල ශුද්ධ පියවුම් තත්ත්වය ඔවුන්ගේ මාස දෙකක් තුළ දෛනික හිඟ ශේෂය මත ගණනය කරනු ලබන අතර එකී පියවීම් ඊලග මාසයේ වැඩ කරන දින 4ක් තුළ සිදුකරනු ඇත. මෙයට අදාළ පොළී අනුපාතිකය 2021 වර්ෂය තුළ 0.09%ත් 0.15% (2020 වර්ෂය තුළදී 1.5% සහ 1.62%) ත් අතර පරාසයක් තුළ පැවතිනි.

## 24. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | සටහන | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|---|
| පොළිය දරන ණය | 24.1 | **253,476,993** | 256,873,113 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | 24.2 | **266,944,782** | 107,810,345 |
| පංගු බැරකම් | 24.3 | **75,425,522** | 73,194,079 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | 24.4 | **74,217,946** | 72,047,741 |
| | | **670,065,243** | 509,925,278 |

**24.1** පොළී දරණ ණය, ජා.මූ. අරමුදලෙන් ලබාගන්නා විස්තිර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ. විස්තිර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මූ.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මූ.අ. 2016 ජුනි හිදි විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මූ. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තිර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තීර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.20), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.40), පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252.00) හයවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.10) සහ හත්වන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.

මිලියන 164.00) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජූලි, 2017 දෙසැම්බර්, 2018 ජුනි, 2019 මැයි සහ නොවැම්බර් 2019 යන මාස වලදී ලබාදී ඇත. හත්වන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. බිලියන 1.31 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොලී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොලී අනුපාතයට (වර්තමානයේ දී වාර්ෂිකව 0.05%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

| | සඵල පොලී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|---|---|
| විස්තීර්ණ ණය පහසුකම (EFF) | **0.077** | **2029** | **253,476,993** | 256,873,113 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **253,476,993** | 256,873,113 |

**24.2** **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයක් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 11 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

**24.3** **පංගු බැරකම:** අංක 11.1 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**24.4** **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්:** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

## 25. අනෙකුත්

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 25.1) | **99** | 92 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 25.2) | **16,599** | 15,437 |
| දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (සාර්ක්) හුවමාරු පහසුකම යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවිය යුතු මුදල (සටහන 25.3) | **-** | 74,803,653 |
| DST විශේෂ ඩොලර් ගිණුම 2 (සටහන 25.4) | **1,484,824** | - |
| මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහබැංකුවට (Bangaladesh Bank) වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.5) | **40,161,167** | - |
| මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.6) | **315,452,000** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **180,987** | 51,143 |
| | **357,295,676** | 74,870,325 |

### 25.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2019 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.13 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී සිදුකල බෙදාහැරීම් වලින් අනතුරුව 2020 දෙසැම්බර් 31 දිනට මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004කි. 2021 වර්ෂය තුළදී කිසිදු ගණුදෙනුවක් සිදුනොවූ බැවින් 2021 දෙසැම්බර් 31 දිනටද මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004 කි.

### 25.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 20.24 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.83ක් බෙදාහරින ලද අතර 2021 වර්ෂය තුළදී කිසිදු බෙදාහැරීමක් සිදු නොකළ බැවින් 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.082 කි.

**25.3 දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (සාර්ක්) හුවමාරු පහසුකම යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවිය යුතු මුදල**

2019-22 කාල පරිච්ඡේදය සඳහා දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (සාර්ක්) රටවල් සඳහා වන මුදල් හුවමාරු පහසුකම් විධිවිධාන යටතේ ශ්‍රී.ලං.ම.බැ. සහ ඉන්දියානු මහ බැංකුව, 2020 ජූලි 24 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී.

එම ගිවිසුම යටතේ, මාස 03ක කාලයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් මිලියන 400ක මුදලක් 2020 ජූලි 31 දින ශ්‍රී ලංකාවට ලැබුණු අතර එය සාර්ක් සංගමයේ පවතින රාමුවේ සඳහන් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 03ක් සඳහා 2020 නොවැම්බර් 02 දින නැවත ලබාගන්නා ලදී. අදාළ මූලික ණය මුදල සහ නැවත ලබාගත් ණය මුදල යන ද්විත්වයටම, අදාළ ණය මුදල් ලබාදුන් දිනයේ පවතින මාස 03ක් සඳහා වන USD LIBOR අගයට පදනම් අංක 200ක් එක් කල පොළී අනුපාතයක් අදාල වන අතර ගිවිසුම වලංගු කාල පරිච්ඡේදය තුළ අදියර කිහිපයකින් ණය ලබාගැනීමට ද ඉඩ සලසා ඇත.

මෙම හුවමාරු පහසුකම 2021 පෙබරවාරි 2 දින සම්පූර්ණයෙන් ගෙවා දමන ලදී.

**25.4 DST විශේෂ ඩොලර් ගිණුම 2**

මෙම ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන අතර ඇ.එ.ජ. මුදලින් භාණ්ඩාගාරයට බැර කරනු ඇත.

2021 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලද මුදල් සහ චීන සංවර්ධන බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම (FTFF) භාවිතා කරමින් රජය වෙනුවෙන් ණය ගෙවීම් සිදු කරන ලදී. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.48 කි.

**25.5 බංගලාදේශ මහ බැංකුව (Bangaladesh Bank) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහ බැංකුවට ගෙවීමට ඇති මුදල**

ශ්‍රී.ලං.ම.බැ. සහ බංගලාදේශ මහ බැංකුව 2021 අගෝස්තු 03 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව, 2021 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 200ක මුදලක්, ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට අදියර 03ක් යටතේ මාස 03 කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලද අතර එය සමාන කාලයක් සඳහා අවස්ථා දෙකකදී නැවත ලබාගැනීමේ හැකියාවකින් යුතු වේ. ඒ අනුව, ඉහත ගිවිසුම අත්සන් කරන ලද අවස්ථාවේදී මහ බැංකු දෙක අතර ඇතිකරගත් අන්‍යෝන්‍ය එකඟතාවය මත පළමු මාස 03ක කාලය අවසන් වූ පසුව, 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී නැවත ලබාගැනීමේ පළමු අවස්ථාව ක්‍රියාත්මක කරන ලදී. අදාළ මූලික ණය මුදල සහ නැවත ලබාගත් ණය මුදල යන ද්විත්වයටම, අදාළ ණය මුදල ලබාගත් දිනයේ හෝ නැවත ලබාගැනීමක් ක්‍රියාත්මක කරන දිනයේ පවතින මාස 06ක් සඳහා වන USD LIBOR අගයට පදනම් අංක 200ක් එක් කළ පොළී අනුපාතයක් අදාළ වේ.

2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස ඉහත සඳහන් කළ පරිදි 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී යළි ලබාගත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 200 දැක්වෙන අතර එහි දෙවන ලබාගැනීම, මහ බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත 2022 පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදුකිරීමට නියමිතව ඇත.

**25.6 පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා (People's Bank of China) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල**

ශ්‍රී.ලං.ම.බැ. සහ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා 2021 මාර්තු 19 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව, 2021 දෙසැම්බර් මාසයේදී සීමා සහිත භාවිතයක් සඳහා (සටහන 8.1) චීන යුආන් බිලියන 10ක මුදලක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන මුදලක්) ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට, වසරක කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලදී. 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස ඉහත සඳහන් කළ චීන යුආන් බිලියන 10ක මුදල දැක්වෙන අතර එහි දෙවන ලබාගැනීම, බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත 2022 දෙසැම්බර් මාසයේදී සිදුකිරීමට නියමිතව ඇත.

**26. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු**

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශ්වයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොළී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 221,738,927 | 81,586,946 |
| - අනිකුත් | 67,657,247 | 37,099,649 |
| | 289,396,174 | 118,686,595 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 21 | 27 |
| - අනිකුත් | 11,307,967 | 10,914,899 |
| | 11,307,988 | 10,914,926 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | 300,704,162 | 129,601,521 |

**27. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු**

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | 160,511 | 160,469 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | 1,231,790 | 1,300,043 |
| | 1,392,301 | 1,460,512 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

## 28. ප්‍රති මිලදී ගැනීමේ එකගතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | **101,062,880** | 209,507,898 |
| | **101,062,880** | 209,507,898 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකගතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකගතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ද නිත්‍ය තැන්පතු පහසුකම යොදාගනී. මෙම පහසුකම දෛනික ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියේදී ද්‍රවශීලතා අවශ්‍යතාවයන් ලබාගැනීමට නොහැකිවන, ඒ සඳහා සහභාගී වන ආයතන සඳහා අදාළ වේ. මෙය එක්දින පදනම යටතේ පමණක් සිදුවන සුරැකුම් රහිතව පවතින පහසුකමක් වේ.

## 29. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,709** | 5,709 |
| සත 5 | **23,267** | 23,267 |
| සත 10 | **39,236** | 39,236 |
| සත 25 | **121,246** | 121,246 |
| සත 50 | **185,147** | 185,147 |
| රුපියල් 1 | **1,023,087** | 989,834 |
| රුපියල් 2 | **1,587,838** | 1,524,255 |
| රුපියල් 5 | **5,168,455** | 4,902,340 |
| රුපියල් 10 | **7,673,980** | 7,122,933 |
| රුපියල් 20 | **40,955** | - |
| සමරු කාසි | **598,953** | 591,807 |
| | **16,471,504** | 15,509,405 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,694** | 26,694 |
| රුපියල් 5 | **37,191** | 37,191 |
| රුපියල් 10 | **1,249,128** | 1,253,137 |
| රුපියල් 20 | **7,235,137** | 6,264,415 |
| රුපියල් 50 | **7,086,604** | 5,954,707 |
| රුපියල් 100 | **27,472,139** | 24,351,138 |
| රුපියල් 200 | **126,412** | 127,051 |
| රුපියල් 500 | **52,284,157** | 45,522,962 |
| රුපියල් 1,000 | **160,770,610** | 150,266,367 |
| රුපියල් 2,000 | **2,950,509** | 3,327,026 |
| රුපියල් 5,000 | **729,384,000** | 582,162,785 |
| | **988,627,562** | 819,298,454 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **1,005,099,066** | 834,807,859 |

## 30. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| වෙන්කිරීම් සහ අයකිරීම් | **3,791,015** | 1,230,135 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **-** | 2,905,314 |
| වානිජ බැංකු සඳහා ගෙවිය යුතු මුදල් | **431,145** | - |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 30.1) | **11,592,360** | 9,852,650 |
| විස්කම් ණය යෝජනා ක්‍රමය යටතේ දායක වූ බැංකු සඳහා ඇති ගෙවීම් | **1,683,468** | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන් (සටහන 30.2) | **8,701** | 9,189 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **1,657,193** | 745,504 |
| | **19,163,882** | 14,742,792 |

**30.1** අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළීය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

### 30.2. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2021 රු. 000 | 2020 රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයන් හි ශේෂය | **8,701** | 9,189 |
| | **8,701** | 9,189 |

## 31. විලම්භිත ප්‍රදානයන්

| | 2021 | 2020 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 01 වන දිනට | **789** | 5 |
| වර්ෂය තුළදී එකතු කිරීම් | **3,089** | 785 |
| වර්ෂය තුළ ක්‍රමක්ෂය | **(2,700)** | (1) |
| දෙසැම්බර් 31 දිනට | **1,178** | 789 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

මෙම එකතු කිරීම් අතර, Bank of Korea හි Knowledge Partnership Program මඟින් 2021 වසරේදී ලබාදුන් රු. මිලියන 0.66 ක් සහ 2020 වසරේදී ලබාදුන් රු. මිලියන 0.78 ක පර්යේෂණ ප්‍රදානයන් දෙකක් අන්තර්ගත වන අතර, මෙම ප්‍රදානයන් ඉදිරියේදී ශ්‍රී.ලං.ම.බැ. සේවක සේවිකාවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිත දේශීය පුහුණු වැඩසටහන්වල වියදම් දරාගැනීම සඳහා භාවිතා කරනු ඇත. තවද, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල යටතේ ලබාදුන් රු. මිලියන 2.32 ක මුදල, තිරසාර මුල්‍යනය සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා භාවිතා කරන ලදී.

## 32. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වු වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන්, දෙමව්පියන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය වන රු.මි. 66,279.21 (2020 - රු.මි. 70,241.23) ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 53,334.41 (2020 - රු.මි. 48,961.82) ඉක්මවා යන අතර වාර්තාකරණ කාලය අවසානයේදී රු.මි. 12,944.80 (2020-රු.මි. 21,279.42) ක හිඟයක් පෙන්නුම් කරයි.

2021 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/ (වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 47,559,244 | 2,047,071 | 10,151,236 | 1,537,384 | 801,139 | 379,276 | 3,803,864 | 66,279,214 |
| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම | (32,417,106) | (5,636,082) | (7,502,019) | (2,685,027) | (1,256,886) | (325,318) | (3,511,976) | (53,334,414) |
| **ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 15,142,138 | (3,589,011) | 2,649,217 | (1,147,643) | (455,747) | 53,957 | 291,888 | 12,944,799 |

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

| | 2021<br>රු. 000 | 2020<br>රු. 000 |
|---|---|---|
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **15,142,138** | 16,989,328 |
| සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(3,589,011)** | (2,464,375) |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | **2,649,217** | 4,660,286 |
| වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | **(455,747)** | 825,451 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (දළ අගය) | **379,276** | 353,689 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (දළ අගය) | **3,803,864** | 5,020,814 |
| | **17,929,737** | 25,385,193 |

2021 දෙසැම්බර් 31 දිනට

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2021 ජනවාරි 01 දිනට | 16,989,329 | (2,464,375) | 4,660,286 | (895,516) | 825,451 | 18,494 | 2,145,748 | 21,279,417 |
| ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්) | 1,444,093 | (53,181) | 364,126 | (86,665) | 5,855 | 31,478 | 262,381 | 1,968,087 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය | 2,157,568 | (752,427) | (421,712) | (165,462) | (889,978) | 3,986 | (1,225,696) | (1,293,721) |
| දායක ගෙවීම් | (5,448,852) | (319,028) | (1,953,483) | - | (397,075) | - | (890,545) | (9,008,983) |
| 2021 දෙසැම්බර් 31 දිනට | 15,142,138 | (3,589,011) | 2,649,217 | (1,147,643) | (455,747) | 53,958 | 291,888 | 12,944,800 |

| පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2021 ජනවාරි 01 දිනට | 47,170,831 | 3,223,066 | 10,827,211 | 1,932,117 | 1,713,506 | 353,689 | 5,020,814 | 70,241,234 |
| පොළී පිරිවැය | 4,009,521 | 273,961 | 920,313 | 164,230 | 145,648 | 30,064 | 426,769 | 5,970,506 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | - | 156,290 | - | - | - | 29,906 | 87,410 | 273,605 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,926,130) | (11,321) | (560,527) | (39,986) | - | (21,590) | (277,412) | (3,836,966) |
| බැඳීම් මත ආයුගණන ලාභ | (694,978) | (1,594,925) | (1,035,761) | (518,977) | (1,058,015) | (12,793) | (1,453,717) | (6,369,166) |
| 2021 දෙසැම්බර් 31 දිනට | 47,559,244 | 2,047,071 | 10,151,236 | 1,537,384 | 801,139 | 379,276 | 3,803,864 | 66,279,214 |

| සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2021 ජනවාරි 01 දිනට | 30,181,502 | 5,687,441 | 6,166,925 | 2,827,633 | 888,055 | 335,195 | 2,875,066 | 48,961,817 |
| පොළී ආදායම | 2,565,428 | 483,432 | 524,189 | 240,349 | 75,485 | 28,492 | 244,381 | 4,161,756 |
| සේවායෝජක දායකත්වය | 5,448,852 | 319,028 | 1,953,483 | - | 397,075 | - | 890,545 | 9,008,983 |
| සේවාදායක දායකත්වය | - | - | 31,998 | 10,546 | 64,308 | - | 7,417 | 114,269 |
| අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ | (2,926,130) | (11,321) | (560,527) | (39,986) | - | (21,590) | (277,412) | (3,836,966) |
| සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර | (2,852,546) | (842,498) | (614,049) | (353,515) | (168,037) | (16,779) | (228,021) | (5,075,445) |
| 2021 දෙසැම්බර් 31 දිනට | 32,417,106 | 5,636,082 | 7,502,019 | 2,685,027 | 1,256,886 | 325,318 | 3,511,976 | 53,334,414 |

| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 564.00 |
| EIB ගිවිසුම් B | යුරෝ | 10.00 | සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා අංශ ද ඇතුළත්ව සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 |

| | | | | |
|---|---|---|---|---|
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශය නගා සිටුවීමට ණය පහසුකම් සපයා දීම | 1,199.82 |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා පවතින ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම | 100.00 |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම | 1,399.73 |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම | 3,213.20 |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 232.39 |
| වියළි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හරහා වැඩි ආදායමක් ඉපැයීමට අවස්ථාවක් සැලසීම | 252.95 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.එ.ජ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන් සඳහා අරමුදල් හා පුහුණුව සපයා දීම | 113.13 |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම | 487.66 |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 1,049.84 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම | 1,049.84 |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 135.69 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම | 135.69 |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 302.04 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් තවදුරටත් වැඩි කිරීම | 302.04 |
| ''තරුණ දිරිය'' NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය | රුපියල් | 288.48 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීය මට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 288.48 |
| වියළි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.89 |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම | 1,564.75 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම | 7,016.86 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරගකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී | 125.85 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal | | | | 854.05 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Youth | | | | 14.45 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Income Generation | | | | 106.42 |

**(ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

| ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම | 964.87 |
| ස්වශක්ති ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,000.00 | නව හා වත්මන් ව්‍යවසායකයින්ට මූල්‍ය සහනාධාර සැපයීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම | 4,273.60 |
| "අත්වැල" ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නගා පිහිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) | රුපියල් | 2,000.00 | රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම | 1,687.52 |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 1,031.00 | විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 5,449.54 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Agribusiness | ඇ.එ.ජ. ඩොලර් | 30.29 | කෘෂි නිෂ්පාදනවල නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණාත්මක බව හා අගය එකතු කිරීම, වැඩි දියුණු කිරීම | 419.48 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Youth | | | | 359.31 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Youth | | | | 132.26 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Agribusiness | | | | 11.98 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Income Generation | | | | 38.19 |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P FI Bulk Loan. | | | | 58.85 |
| කුඩා කෘෂි ව්‍යාපාර, හවුල්කාර වැඩසටහන RFFI Bulk Loan. | | | | - |
| කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Promoter Bulk Loan. | | | | - |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI II) | රුපියල් | 950.00 | ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ යෞවනයන් සඳහා නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරයන් වැඩි දියුණු කිරීමට සහාය දීම | 491.13 |
| සැපයුම් දාමය නැවත පණ ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය (SCREL) | රුපියල් | 500.00 | ලියාපදිංචි තේ නිෂ්පාදනය කරන්නන්ගේ ප්‍රතිව්‍යුහගත ණය සැලසුම් අවසන් කිරීම සඳහා පවතින ව්‍යාපාරයන් නගා සිටුවීම සහ සැපයුම් දාමය නැවත පණගැන්වීම සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවීමට නියමිත හිඟමුදල් පියවීම | 201.75 |

## 56. වාර්තාකරණ දිනට පසු ඇතිවූ සිදුවීම්

පහත දැක්වෙන අයිතමය හැර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තා කරන දිනට පසු ඇති නොවීය.

සටහන 48.3 හි හෙළිදරව් කර ඇති අන්දමට, විදේශ මුදල් වලින් වූ බැංකුවේ වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේ ඇති විනිමය අනුපාතිකය ප්‍රකාරව පරිවර්තනය කොට ඇත.

මූල්‍ය ප්‍රකාශවල සටහන 48.3 හි දක්වා ඇති විනිමය අනුපාතිකයන්, වාර්තාකරණ දිනට පසු රුපියලට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ශක්තිමත් වී ඇති අතර, එය විදේශ මුදලින් ඇති වත්කම් හා වගකීම් පසුව රුපියලට පරිවර්තනය කරන විට දී එම වත්කම් හා වගකීම් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වාර්තාකර ඇති අගයන් සමග සැසඳීමේදී වෙනස්වනු ඇත.

## 2. බැංකු අධීක්ෂණ

මෙරට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) අඛණ්ඩ අධීක්ෂණය, කාලීන පරීක්ෂා කිරීම සහ බැංකු පනතේ සහ මුදල් නීති පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු සඳහා නියාමන නිකුත් කිරීම සඳහා විශේෂිත බලතල සහිතව, මුදල් නීති පනතේ 28 වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල තැන්පත්කරුවන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු වේ.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු නියාමනය සහ අධීක්ෂණය සිදු කිරීම, බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණශීලී නියාමන සකස් කිරීම සහ නිකුත් කිරීම, බලපත්‍රලාභී බැංකු වල අඛණ්ඩ අධීක්ෂණය සහ කාලීන ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, සහ ප්‍රධාන විධායක කාර්යයන් හි නිරත වන නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ අනුමත කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම, අවශ්‍ය තැන්හි දී මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ දැනුම්වත් කිරීම් සිදු කිරීම සහ ශක්‍යතා වර්ධනය යන ආදිය සිදු කරනු ලබයි.

2021 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. මෙයට අමතරව, විදේශීය බැංකු වල නියෝජිත කාර්යාල 3ක් ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. තවද, ඉන්දියාවේ අයි සී අයි සී අයි බැන්ක් ලිමිටඩ් හට ශ්‍රී ලංකාව තුළ නියෝජිත කාර්යාලයක් පිහිටුවීම සඳහා මුදල් මණ්ඩලය විසින් 2021 මාර්තු මස දී අනුමැතිය ලබා දෙන ලද අතර, එකී නියෝජිත කාර්යාලයේ මෙහෙයුම් කටයුතු 2022 ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. මෙරට ක්‍රියාත්මක බලපත්‍රලාභී බැංකු සහ නියෝජිත කාර්යාලයන්ගේ නාමලේඛනය ඇමුණුම II-1 හි දක්වා ඇත.

2021 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1. විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

බලපත්‍රලාභී බැංකු විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් සහන නොනවත්වා ලබා දෙන අතරම, බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික විචක්ෂණශීලී නියාමන නිකුත් කිරීමට කටයුතු කරන ලදී. 2021 වසරේ දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ගයන් කිහිපයක් ලුහුඬින් පහත දක්වා ඇත. මෙකී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි දක්වා ඇත.

(අ) බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ නියාමනයන්

(ආ) බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව

(ඇ) බලපත්‍රලාභී බැංකුවල ප්‍රතිසාධන සැලසුම් පිළිබඳ නියාමනයන්

(ඈ) බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයන් වෙත ප්‍රමුඛතා පදනමින් ණය ලබා දීමේ ඉලක්ක නියම කිරීම

(ඉ) බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කිරීම

(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් විදේශ විනිමය ඉදිරි විකුණුම් හා මිලට ගැනීම් සීමා කිරීම

(උ) බලපත්‍රලාභී බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි සිදු කරන ආයෝජන සීමා කිරීම

(ඌ) උකස්කර මත ලබා ගන්නා නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත සහ බලපත්‍රලාභී බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත පිළිබඳ නියාමනයන්

(එ) සංචාරක ක්ෂේත්‍රය සඳහා සහ කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ලබා දුන් සහනයන් දීර්ඝ කිරීම

(ඒ) කොවිඩ්-19 ව්‍යාප්තිය මධ්‍යයේ බැංකු සේවා පවත්වාගෙන යාම

(ඔ) ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් ආයතනය පිළිගත් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස නම් කිරීම

(ඕ) බලපත්‍රලාභී බැංකු වල වාර්ෂික බලපත්‍ර ගාස්තු

### 2.2 නව බැංකු පනත කෙටුම්පත් කිරීම

බලපත්‍රලාභී බැංකුවල නෛතික සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව බැංකු පනතක් හඳුන්වා දීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. යෝජිත නව බැංකු පනතට සමානුපාතිකත්වය සඳහා විභේදිත නියාමන රාමුවක් හඳුන්වා දීම, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ, මූල්‍යමය දණ්ඩනයන්/දඩ පැනවීම, සංස්පර්ශිත අවදානම අවම කිරීම සඳහා බැංකුවලට සීමා නිර්ණ පැනවීම, අත්පත්කර ගැනීම්, මිලට ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සඳහා ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වේ. මෙම නව පනත 2022 වසර අවසන් වන විට ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කර සිටී.

## 2.3 මුදල් මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ලබා දුන් අනුමැතීන්

### (අ) බලපත්‍රලාභී බැංකු ඒකාබද්ධ කිරීම, අත්පත් කර ගැනීම් හා වසා දැමීම්

2018 වසරේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC) සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB) යන බැංකු ද්විත්වය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියට අදාළ කටයුතු 2021 වසරේදීත් පවත්වාගෙන යන ලදී.

### (ආ) බලපත්‍රලාභී බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක

2021 වර්ෂය අවසන් වන විට දී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක සඳහා වන ඉල්ලීම් 586ක් සලකා බැලූ අතර ඉන් 484ක් සඳහා අනුමැතීන් ලබා දී ඇත. විචක්ෂණශීලී හේතූන් මත ඉන් ඉල්ලීම් 102ක් ප්‍රතික්ෂේප කරන ලදී. (සංඛ්‍යා සටහන II-1). ඒ අනුව 2021 දෙසැම්බර් මස වන විට බැංකු ශාඛා 3,621ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,783ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 6,342ක් ක්‍රියාත්මක විය.

**II-1 සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක සඳහා ලබා දුන් අනුමැතීන්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | ඉල්ලීම් | අනුමැතීන් |
| **විවෘත කිරීම් සහ ස්ථාපනය කිරීම්** | **428** | **366** |
| ශාඛාවන් | 32 | 13 |
| ස්වයංක්‍රීය සේවා සපයන යන්ත්‍ර | 205 | 166 |
| ශිෂ්‍ය ඉතුරුම් ඒකක | 0 | 0 |
| ජංගම බැංකුකරණ ඒකක සහ ජංගම රථ | 0 | 0 |
| වෙනත් බැංකුකරණ ඒකක | 35 | 35 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් | 156 | 152 |
| **ප්‍රතිස්ථාපන කිරීම්** | **111** | **80** |
| ශාඛාවන් | 94 | 67 |
| ස්වයංක්‍රීය සේවා සපයන යන්ත්‍ර | 12 | 8 |
| වෙනත් | 5 | 5 |
| ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් සහ අත්හිටුවීම් | 7 | 5 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් ස්වයංක්‍රීය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අවලංගු කිරීම හා අත්හිටුවීම | 7 | 5 |
| බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් සඳහා ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම් සහ අත්හිටුවීම් | 33 | 28 |
| මුළු එකතුව | **586** | **484** |

### (ඇ) වෙනත් නියාමන අනුමත කිරීම්

2021 වසර තුළ දී වෙනත් නියාමන අනුමැතීන් 502ක් ලබා දී ඇත. (සංඛ්‍යා සටහන II-2)

### (ඈ) නියාමන ක්‍රියාමාර්ග

2021 වර්ෂයේ දී බලපත්‍රලාභී බැංකු විසින් බැංකු පනත හා එම පනත යටතේ නිකුත් කළ නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා 18ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළ බැංකුවලට නියම කරන ලදී.

**II-2 සංඛ්‍යා සටහන**

**වෙනත් නියාමන අනුමත කිරීම්**

| අනුමැතියේ ස්වභාවය | අනුමැතීන් සංඛ්‍යාව |
|---|---|
| අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් පත් කිරීම හා ධුරයේ අඛණ්ඩව රැඳී සිටීම හා විදේශ විනිමය ව්‍යාපාර කටයුතුවල නිරත වන පුද්ගලයන්ගේ යථා යෝග්‍යතාව පරීක්ෂා කිරීම | 268 |
| සේවා බාහිරින් ලබා ගැනීමේ කටයුතු | 32 |
| වෙළඳපළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපළ බැහැර කිරීම | 18 |
| දෙවන පෙළ ප්‍රාග්ධනයෙහි ණයකර ඇතුළත් කිරීම | 8 |
| උපරිම ණය අත්තිකාරම් සීමා ප්‍රමාණය ඉක්මවා යාම | 5 |
| අතහැර දැමූ දේපල ප්‍රතිපූරණයන් | 1 |
| කොටස් හිමිකම සඳහා ප්‍රමාණාත්මක අයිතිය ලබා ගැනීම | 1 |
| විදේශික සේවකයන් සඳහා නව වීසා බලපත්‍ර ලබා ගැනීම/වීසා බලපත්‍ර අළුත් කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම | 20 |
| වෙනත් අනුමත කිරීම් | 149 |
| මුළු එකතුව | **502** |

## 2.4 අඛණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) බැංකු පද්ධතියේ දිගුකාලීන පැවැත්ම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අවදානම් කලින් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් ලෙස හා තැන්පත්කරුවන්ගේ අරමුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් එක් එක් බැංකුවේ කටයුතු පිළිබඳව නිරන්තර අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය, අඛණ්ඩ අධීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබේ.

(ආ) බැංකු විසින් ජාලගත මාධ්‍ය පාදක කරගත් FinNet පද්ධතිය ඔස්සේ සතිපතා/මාසිකව/කාර්තුමය/වාර්ෂිකව, සපයන්නා වූ කාලීන මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු පදනම්ව නිරන්තර අධීක්ෂණයන් සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, නව ගිණුම්කරණ ප්‍රමිත SLFRS 9 - මූල්‍ය උපකරණ හා නව වර්ගීකරණ විධාන අනුව නියාමන අවශ්‍යතා (2021 අංක 13 සහ 14 දරන බැංකු පනත් විධාන) හඳුන්වාදීම සම්බන්ධයෙන් ද සලකා බලමින්, මූල්‍ය දත්ත තාර්කික කිරීම සහ ඒකාබද්ධ කිරීම අරමුණු කරගනිමින්, දැනට පවතින ජාලගත මාධ්‍ය පාදක කරගත් අඛණ්ඩ සුපරීක්ෂණ වාර්තා කිරීමේ පද්ධතිය සමාලෝචනය කරමින් පවතී. ඒ අනුව FinNet පද්ධතිය හරහා නව වාර්තා 2ක් හඳුන්වා දුන් අතර තවත් වාර්තා 2ක් සංශෝධනය කරන ලදී.

(ඇ) විදේශ විනිමය අරමුදල් රැස්කිරීම/ලබා ගත් ණය දීර්ඝ කිරීම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් මුහුණ දුන් අභියෝග හා ණය සහන මගින් ඇති වූ ද්‍රවශීලතා ආතතීන් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට විශේෂ වාර්තා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා වාර්තා සැකසීම සඳහා අවශ්‍ය බැංකු

ක්ෂේත්‍රයේ සමුච්චිත දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන සමග බෙදා ගැනීම ද සිදු කරන ලදී. තවද කාර්තුමය පදනමින් බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳව මුදල් මණ්ඩලය දැනුම්වත් කරන ලද අතර බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳ ඉදිරිපත් කිරීම් 13ක් ද විවිධ රැස්වීම්/සමුළු සඳහා සකස් කරන ලදී.

(ඈ) බැංකුවල කාර්යමණ්ඩලය/බාහිර පාර්ශවයන් විසින් කරන ලද වංචා, බැංකුවල කාර්යමණ්ඩලයේ විෂමාචාර ක්‍රියා වැනි කරුණු සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්/මහජනතාව හෝ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව කටයුතු සිදු කරන ලදී. තවද 2021 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ආසන්න වශයෙන් 2012 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අදාළ ඉල්ලීම් 22ක් සම්බන්ධයෙන් කටයුතු සිදු කරන ලදී.

(ඉ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොලී යෝජනා ක්‍රමයට අදාළව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු රැස්කිරීම හා කාර්තුමය වශයෙන් මුදල් අමාත්‍යාංශය වෙත එම තොරතුරු ලබාදීම සඳහා පහසුකම් සලසන ලදී. තවද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ විශේෂ පොලී යෝජනා ක්‍රමයට අදාළ අක්‍රමිකතා හඳුනා ගැනීම සඳහා විශේෂ දුරස්ථ පරීක්ෂණ 2ක් සිදු කරන ලද අතර එම අක්‍රමිකතා නිවැරදි කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබාදෙන ලදී.

(ඊ) බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී හඳුනාගන්නා ලද නියාමන ගැටලු නියමිත කාලරාමු තුළ දී විසඳාගැනීමේ ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කිරීම ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

## 2.5 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) 2021 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ විෂය පථය ආවරණය වන පරීක්ෂණ සහ පසු විපරම් පරීක්ෂණ ඇතුළුව ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් 22ක් පවත්වන ලදී. මේ අතරින් 2021 අප්‍රේල් මස සිට සැප්තැම්බර් මස දක්වා කාලය තුළ සිදු කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 12ක්, කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල රට තුළ පැතිරීම හේතුවෙන් බැංකු වෙත යෑමට ඇති සීමා සැලකිල්ලට ගනිමින් දුරස්ථ පදනමින් පවත්වන ලදී.

(ආ) ඉහත කරුණු වලට අමතරව, අපනයන ආදායම් සහ විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ, විදේශ මුදල් ගනුදෙනු, ටෙලිග්‍රැෆික් පැවරුම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් සිදු කරන ලද මුදල් ආපසු ගැනීමේ ගනුදෙනු සහ කොවිඩ්-19 සහන යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සහන කාලය තුළ දී බැංකු විසින් සිදු කරන ලද ණය සහ අත්තිකාරම් ගිණුම් වර්ගීකරණයට අදාළ කරුණු තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු කිහිපයක සීමිත විෂය පථයක් සහිත ස්ථානීය පරීක්ෂණ 11ක් පවත්වන ලදී. මෙම ස්ථානීය පරීක්ෂණවල සොයාගැනීම් මත පදනම්ව, අවශ්‍ය පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට/අධිපති/ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත වාර්තා ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු හෝ මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු වෙත දැනුම් දෙන ලදී. 2020 වර්ෂයේ දී බැංකු 4ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ වාර්තා 2021 දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව 2020 වසරේ පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ සියලු වාර්තා 2021 වසරේ පළමු මාස 3 තුළ සම්පූර්ණ කරන ලදී. ඊට අමතරව, 2021 වසරේ දී, බැංකු 3ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 3ක අතුරු වාර්තා සහ දුරස්ථ පදනමින් බැංකු 5ක පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 5ක් ද ඇතුළුව බැංකු 11ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 14ක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර මෙම වසරට අදාළ අනෙකුත් ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මේ වන විට නිම කෙරෙමින් පවතී.

(ඇ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ අවදානම මත පදනම් වූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ 4ක් පවත්වන ලද අතර, එහි දී පරීක්ෂණ විෂය පථය බැංකු සමූහ තුළ පවතින ආයතන දක්වා ව්‍යාප්ත කරන ලදී. ඒ අනුව ඒකාබද්ධ පදනමින් කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණයක පරීක්ෂණ වාර්තාව 2021 වසරේ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අනෙකුත් පරීක්ෂණ වාර්තා 3 මේ වන විට නිම කෙරෙමින් පවතී.

(ඈ) 2021 වර්ෂය තුළ දී, බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය පදනම් කර ගනිමින්, අභ්‍යන්තර අරමුණු සඳහා පමණක් බලපත්‍රලාභී බැංකු 30ක ශ්‍රේණිගත කිරීම් සිදු කරන ලද අතර, මෙහි දී බැංකුවල කාර්යක්ෂමතාව, තිරසාරත්වය සහ සමස්ත තක්සේරුව පෙන්නුම් කරන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සංරචකයන්ගේ එකතුවක් යොදා ගන්නා ලදී. ඒ අනුව බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය පදනම් කර ගනිමින්, ඒ ඒ බලපත්‍රලාභී බැංකු සඳහා ලබා දුන් ශ්‍රේණිගත කිරීම් සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් බැංකු ක්ෂේත්‍රයේ කාර්යසාධනය පිළිබඳව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන කාලීන වාර්තාව සමග ඉදිරිපත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නියෝග ප්‍රකාරව 2021.10.01 සිට බලපත්‍රලාභී බැංකුවල සිදු කරන ව්‍යවස්ථාපිත පරීක්ෂණ බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශක රාමුව අනුව සිදු කිරීම ආරම්භ කරන ලදී. එසේම සියලු බලපත්‍රලාභී බැංකු සඳහා ලබා දුන් ශ්‍රේණිගත කිරීම් ප්‍රමාණාත්මක සංරචක පදනම් කර ගනිමින් කාර්තුමය වශයෙන් නැවත ඇගයීම සිදු කරන ලදී.

## 2.6 බැංකු අංශයේ දැනුම්වත්භාවය හා ධාරිතා වර්ධනය

### (අ) ධාරිතා වර්ධනය

බැංකු අංශයේ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම මෙන්ම, තම කාර්යමණ්ඩලය සඳහා පුහුණු හා සංවර්ධන අවස්ථා සැලසීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2021 වසරේදීත් අඛණ්ඩව කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් බහුතරයක් අතථ්‍ය (virtual) ක්‍රම යොදා ගනිමින් පැවැත්වූ අතර, බැංකුකරණය සහ මූල්‍ය, නියාමන අනුකූලතාව, අවදානම් කළමණාකරණය, තාක්ෂණික/සයිබර් ආරක්ෂණ අවදානම, දේශගුණික විපර්යාස අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර මූල්‍ය වැනි ක්ෂේත්‍ර මෙමගින් ආවරණය විය. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම වසරේදීත් විවිධ කමිටු රැසක සාමාජිකත්වය දරමින් අඛණ්ඩව සේවය සැපයීමට කටයුතු කර ඇත.

### (ආ) බැංකු සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම

මහ බැංකු අධිපතිතුමා මුලසුන දරමින් ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය, බැංකු ක්ෂේත්‍රය, රෙගුලාසි හා අධීක්ෂණ රාමුව යන කාරණා මහ බැංකුව හා බැංකු ක්ෂේත්‍රය අතර නිරන්තර සාකච්ඡාවට ලක් කිරීමේ අරමුණින් මාසිකව පවත්වනු ලබන බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් පැවැත්වීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ලේකම් කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, 2021දී මාසික රැස්වීම් 11ක් සහ විශේෂ රැස්වීම් 2ක් භෞතිකව/අතථ්‍ය ක්‍රම යොදා ගනිමින් පවත්වන ලදී. මීට අමතරව, බැංකු අංශයේ කාර්යසාධනය, ආර්ථිකයේ මෙන්ම දේශීය සහ ගෝලීය නියාමන රාමුවන් හි ඇති වූ වර්ධනයන් සහ මෙකී සුවිශේෂී තත්ත්වයන් හමුවේ නියාමකයින්ගේ අපේක්ෂාවන් පිළිබඳ අවබෝධයක් ඇති කිරීමේ අරමුණින්, බැංකු සභාපතිවරුන්ගේ රැස්වීමක් ද සංවිධාන කෙරිණි.

බැංකු අංශයේ තිරසාර බව සහතික කර ගැනීම හා නිසි අධීක්ෂණය හා කාලීන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණින් ඒ ඒ බැංකුවලට විශේෂිත වූ ගැටලු සාකච්ඡා කිරීම උදෙසා අදාළ බලපත්‍රලාභී බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩල, කමිටු සඳහා නිරන්තර රැස්වීම් පැවැත්විණි. මීට අමතරව, බැංකුවල විගණනයන් හිදී විශේෂයෙන් සැලකිය යුතු කරුණු හා කොවිඩ්-19 පැතිරීම මධ්‍යයේ ගිණුම්කරණ ප්‍රමිතීන් ඒකාකාරීව යොදාගැනීම සම්බන්ධව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවල බාහිර විගණන ආයතන හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සමඟ සාකච්ඡා පවත්වා ඇත.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව, සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සඳහා සහ සාමාජික ආයතන අතර සහයෝගීතාවයට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය අංශ නියාමකයින්ගේ ප්‍රධානීන්ගෙන් සැදුම්ලත් මූල්‍ය පද්ධති අධීක්ෂණ සභාවේ (Financial System Oversight Council - FSOC) රැස්වීම් දෙකක් සංවිධානය කරන ලදී.

**ඇමුණුම II-1**

**2021.12.31 දිනට බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පී එල් සී
2. ලංකා බැංකුව
3. බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4. කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
5. සිටි බැන්ක් එන් ඒ
6. කොමර්ෂල් බැන්ක් ඔෆ් සීලෝන් පී එල් සී
7. ඩොයිෂේ බැන්ක් ඒ ජී
8. ඩී එෆ් සී සී බැන්ක් පී එල් සී
9. හබීබ් බැන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බැන්ක් පී එල් සී
11. ඉන්දියන් බැන්ක්
12. ඉන්දියන් ඕවර්සීස් බැන්ක්
13. එම් සී බී බැන්ක් ලිමිටඩ්
14. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
15. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී
16. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී එල් සී
17. මහජන බැංකුව
18. පබ්ලික් බැන්ක් බර්හාඩ්
19. සම්පත් බැන්ක් පී එල් සී
20. සෙලාන් බැන්ක් පී එල් සී
21. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
22. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
24. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී එල් සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
5. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
6. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**විදේශ බැංකු වල නියෝජිත කාර්යාල**

1. දෝහා බැන්ක් කිව් පී එස් සී
2. ජේ පී මෝගන් චේස් බැන්ක් එන් ඒ
3. එම් යූ එෆ් ජී බැන්ක් ලිමිටඩ්

## 3. බැංකු විදු පියෙස

1981 සැප්තැම්බර් 15 දින පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කේන්ද්‍රය වන බැංකු විදු පියෙස මූල්‍ය සේවා අංශයේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ උපායමාර්ගික කාර්යභාරය අඛණ්ඩව ඉටු කරමින් 2021 වර්ෂයේ දී සිය 40 වන වසරට පියමං කළේය. කොවිඩ්-19 වසංගතය අඛණ්ඩව ව්‍යාප්තවීම හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුවද මූල්‍ය අංශයේ ඉල්ලීම් සපුරාලීම සඳහා වසර තුළ දී පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් සහ අනෙකුත් වැඩසටහන් සියල්ලම උසස් තත්ත්වයෙන් යුතුව පැවැත්වීම කෙරෙහි 2021 වර්ෂයේ දී බැංකු විදු පියෙසෙහි විශේෂ අවධානය යොමු විය.

වෘත්තීයවේදීන්ගේ තාක්ෂණික හා මෘදු කුසලතා වර්ධනය සහතික කිරීම සඳහා බැංකු හා මූල්‍ය අංශයට අදාළව පුළුල් පරාසයක ක්ෂේත්‍ර ආවරණය වන පරිදි බැංකු විදු පියෙස විසින් පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වන ලදී. අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සහ ජර්මනියේ මහ බැංකුව වන Deutsche Bundesbank ඇතුළු පිළිගත් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගිත්වයෙන් සිදු කළ වැඩසටහන් ද මේ අතර වේ. තවද, ප්‍රමිතිගත සහතික පත්‍ර පාඨමාලා ව්‍යාප්ත කිරීමේ අරමුණින් "මූල්‍ය වෙළඳපොළ" පිළිබඳ නව සහතිකපත්‍ර පාඨමාලාවක් ද බැංකු විදු පියෙස විසින් පවත්වන ලදී. 2021 වර්ෂයේ දී, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහාය ඇතිව ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍යනය (Sustainable Finance) ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී කුසලතා සංවර්ධන හවුල්කරුවකු ලෙසද බැංකු විදු පියෙස කටයුතු කළේය. බැංකු විදු පියෙස විසින් 2021 වර්ෂය තුළ දී පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් 48ක්, බාහිර පාර්ශ්ව ඉල්ලීම් මත සකස් කළ විශේෂ වැඩසටහන් 27ක් හා විශ්වවිද්‍යාල හා පාසල් සිසුන්ට මෙන්ම වර්තමාන ආර්ථික ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ මාතෘකා පිළිබඳව මහජනතාවට විවෘත වූ වැඩසටහන් 43ක් ලෙස වැඩසටහන් 118ක් පවත්වන ලදී. බැංකු විදු පියෙසෙහි සම්බන්ධීකරණයෙන් මංගත ක්‍රමවේදයන් ඔස්සේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සඳහා වර්ෂය තුළ දී පුද්ගලයන් 4,741ක් සහභාගි වූ අතර මහජනතාවට විවෘත වූ වැඩසටහන් සඳහා පුද්ගලයන් 6,802ක් සහභාගි විය. මීට අමතරව ආර්ථික විද්‍යාව හදාරන උසස් පෙළ සිසුන්ගේ දැනුම වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් "තක්ෂිලාව" හා "අරිවුට්රු" නම් රූපවාහිනී වැඩසටහන් මාලා දෙකක් ද බැංකු විදු පියෙස විසින් සම්බන්ධීකරණය කරන ලදී.

බැංකු විදු පියෙස සිය 40 වන සංවත්සරය නිමිත්තෙන් 2021 වසරේ දී විශේෂ වැඩසටහන් කිහිපයක් සංවිධානය කළේය. "දැනුම පරතරය පියවීම හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයේ විශ්වාසය රැකගැනීම" යන මාතෘකාව යටතේ පැවැත්වූ සාංවත්සරික දේශනය හා "ඩිජිටල් මූල්‍ය පරිවර්තනය" පිළිබඳ විශේෂයෙන් සැලසුම් කරන ලද දේශනය එවැනි වැඩසටහන් දෙකක් වන අතර මෙම වැඩසටහන් බොහෝ දෙනෙකුගේ ප්‍රසාදය දිනාගනිමින් ඒ ක්ෂේත්‍රය හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ මෙන්ම මහජනතාවගේ ද සැලකිය යුතු අවධානයකට ලක් විය. 2021 වසරේ දී ප්‍රථම වරට බැංකු විදු පියෙස විසින් විද්වත් මණ්ඩල කතිකාවක් (Expert Panel Discussion) හඳුන්වා දෙනු ලැබූ අතර එහි පළමු කතිකාව ලෙස 2022 වසර සඳහා රජයේ අයවැය ඉදිරිපත් කිරීමෙන් පසුව ඒ සම්බන්ධව සංවිධානය කරන ලද අයවැය පිළිබඳ සම්මන්ත්‍රණය පැවැත්විය. මෙහි විශේෂත්වය වනුයේ මහ බැංකුවේ සම්බන්ධීකරණය යටතේ පැවැත්වූ අභිනව අයවැය සම්මන්ත්‍රණය වීමයි. මීට අමතරව සිය 40 වන සංවත්සරය හා සමගාමීව නවීන විශේෂාංග ඇතුළත් කරමින් නවීකරණය කරන ලද බැංකු විදු පියෙසේ වෙබ් අඩවිය ද එළි දක්වන ලදී (www.cbs.cbsl.lk). මෙම තාක්ෂණික වැඩිදියුණු කිරීම්වලට සමගාමීව බැංකු විදු පියෙසෙහි වෙබ් අඩවිය 2022 වසරේ මුල් කාලයේ දී ආයතනික කළමනාකරණ පද්ධතිය සමඟ ද සම්බන්ධ වනු ඇති අතර එමගින් බැංකු විදු පියෙසට මෙතෙක් පුද්ගල මැදිහත් වීමක් අවැසි ක්‍රියාදාමය, ස්වයංක්‍රීයව, ආරක්ෂිතව හා පහසුවෙන් සිදු කළ හැකි වනු ඇත.

බැංකු විදු පියෙස විසින් එහි පවත්වනු ලබන වැඩසටහන්වල අන්තර්ගතය, දේශන පවත්වන ආකාරය හා අනිකුත් සේවාවන් වර්ධනය කිරීමේ අරමුණෙන් සිදු කරන පසු ඇගයුම් ක්‍රියාවලිය එම අරමුණ ඉටු කරගැනීම සඳහා විද්‍යාත්මකව උපයෝගී කර ගන්නා ලදී. අනාගත පුහුණු වැඩසටහන් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ හා මූල්‍ය අංශයේ ප්‍රවීණයින්ගෙන් සමන්විතව පිහිට වූ පීඨ උපදේශන කමිටුවේ (Faculty Advisory Committee) සහාය අඛණ්ඩව ලබා ගනිමින් පුළුල් උපදේශන හුවමාරු ක්‍රියාවලියක් සිදුකරන ලදී. එමෙන්ම බැංකු විදු පියෙස මූල්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා සොයාබැලීම් හා විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කිරීම අරමුණු කරගනිමින් සකස් කරන ලද පුහුණු අවශ්‍යතා සමීක්ෂණයක් මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයින් සහ මානව සම්පත් වෘත්තිකයින් ආවරණය වන පරිදි පුළුල් ලෙස සිදු කරන ලදී. එම ක්‍රියාවලිය තුළින් ලබාගත් තොරතුරු සහ සමීක්ෂණයේ ප්‍රතිඵල මත 2022 වසර සඳහා වූ වැඩසටහන් නාමාවලිය සකස් කෙරුණි. ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ අඛණ්ඩව හා ඵලදායීව සම්බන්ධ වීමේ ප්‍රතිඵලයක් ලෙස, බැංකු විදු පියෙස විසින් මූල්‍ය අංශයෙන් ඔබ්බට ගොස් ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍ර ගණනාවක් වෙත සිය පුහුණු වැඩසටහන් ප්‍රසාරණය කිරීම සඳහා අඩිතාලම ද, 2021 වසරේ දී සකස් කරන ලදී.

## 4. සන්නිවේදන

2021 වර්ෂය වෙත ද බලපෑම් ඇති කළ කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ පනවන ලද සංචරණ සහ වෙනත් සීමා හමුවේ උද්ගත වූ අභියෝගාත්මක තත්ත්වයන් යටතේ, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය හමු සම්බන්ධීකරණය, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම යනාදිය මගින් සිය පාර්ශ්වකරුවන් වෙත කලට වේලාවට තොරතුරු බෙදා හැරීම මගින් මහ බැංකුවේ ප්‍රධාන සහ අනෙකුත් අරමුණු සඳහා අඛණ්ඩ සහයෝගය ලබා දුනි.

### 4.1 ප්‍රධාන කාර්යයන්

සමස්තයක් ලෙස, සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් මුදල් ප්‍රතිපත්තිය, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ කටයුතුවලට අදාළව මුදල් මණ්ඩලය ගත් තීරණ විස්තර

කරමින් මාධ්‍ය නිවේදන 1961ක් ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුගත වෙමින්, භාෂාත්‍රයෙන් ම නිකුත් කෙරිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතුවල විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා භාවිත කෙරෙන එක් ප්‍රධාන මෙවලමක් වන්නේ මාධ්‍ය බැවින් මහ බැංකුව විසින් කෙරෙන්නේ කුමක්ද සහ එසේ කරන්නේ ඇයි ද යන්න පිළිබඳව මහජනතාව වෙත සන්නිවේදනය කිරීමේ අරමුණින් මාධ්‍ය හමු 14ක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ඉදිරි ගමන්මග සන්නිවේදනය කිරීමට 2021 ජනවාරි සහ ඔක්තෝබර් මස පවත්වන ලද "පෙර දැක්මඃ 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති" සහ ඉදිරි දින දර්ශනයට අනුව සංවිධානය කරන ලද, අඩකටත් වඩා ප්‍රමාණයක් මංගතව පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡා 8ක් ද මීට ඇතුළත් විය.දේශීය පර්යේෂණායතන විසින් පුවත්පත්වල පළ කෙරෙන ප්‍රතිපත්තිමය අනුපාත පිළිබඳ අනාවැකි පුරෝකථන සහ ඒ පිළිබඳ ඔවුන්ගේ මතය සාරාංශගත කොට මුදල් මණ්ඩල රැස්වීම්වලට පෙර ඉදිරිපත් කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ සහභාගීත්වයෙන් අඛණ්ඩ ව සිදු විය. එසේ ම මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය කොතරම් දුරට මහජනයා විසින් ග්‍රහණය කර ගන්නවා ද සහ මහජන අපේක්ෂාවන් කෙතෙක් දුරට එමගින් ඉටු වනවා ද යන්න මැන ගැනීමට ද එය ඉවහල් වේ. මුදල් ප්‍රතිපත්ති නිවේදනය කෙරෙන සෑම මාධ්‍ය හමුවකින් ම සතියකට පසු ඉදිරිපත් කෙරෙන මුදල් ප්‍රතිපත්ති සමීපතා වාර්තාව මගින් මුදල් ප්‍රතිපත්ති විවරණයෙන් ප්‍රකාශිත මූලික පණිවුඩ සන්නිවේදනය වීමේ ඵලදායිතාව මැන ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණ කෙරෙහි මාධ්‍ය දක්වන ප්‍රතිචාර නිසි ලෙස තක්සේරු කිරීම බලාපොරොත්තු වේ.නිවැරදි මුදල් ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රයත්නයට සන්නිවේදන දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දීම මෙම කටයුතුවල අරමුණ වේ. නොසැලකිලිමත්කම නිසා හෝ සිතාමතා හෝ ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධයෙන් පළ වන සාවද්‍ය මාධ්‍ය වාර්තා නිවැරදි කිරීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අවස්ථාවන්හි නිසි පියවර ගනු ලැබිණි. එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මහජනතාවගේ අවබෝධය ඉහළ නැංවීමට සහ වෙළෙඳපොළ අපේක්ෂාවන්ට මඟ පෙන්වීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්ති විවරණය නිවේදනය කිරීමෙන් සතියක් පමණ ඇතුළත කාර්තුමය පදනමක් මත ආර්ථික පර්යේෂණ, ප්‍රාදේශීය සංවර්ධන සහ බැංකු විදු පියස යන දෙපාර්තමේන්තුවල සහයෝගයෙන් ප්‍රාදේශීය මට්ටමින් මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මංගත දැනුවත් කිරීමේ වැඩසටහන් ද පැවැත්වීමට කටයුතු කරන ලදී. 2021 වසරේ දී මාතර, ත්‍රිකුණාමලය, අනුරාධපුර සහ කිළිනොච්චි යන ප්‍රාදේශීය කාර්යාලවල දී එවැනි වැඩසටහන් හතරක් පැවැත්විණි.

සමාජ මාධ්‍ය අධීක්ෂණ ඒකකය පිහිටුවීම ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව සමාජ මාධ්‍ය තුළ පෙනී සිටීම ශක්තිමත් කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කෙරෙන සියලු සමාජ මාධ්‍ය ගැටලු සඳහා පිළියම් යෙදීමේ ක්‍රියාවලිය සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් වඩාත් විධිමත් කෙරිණි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා දෙන පණිවුඩ ජනගහණයේ නූතන තාක්ෂණය හා බැඳී සිටින ප්‍රජාව කරා ගෙන යාම වර්ධනය කිරීමට 2021 වසරේ දී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රචාරණ වේදිකා මංගත පුවත් වෙබ් අඩවි දක්වා වර්ධනය කරන ලදී. තවද, මූල්‍ය ආයතන සම්බන්ධව මහ ජනතාවගේ පැමිණිලි යොමු කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ ඒ කාර්යය සඳහා වෙනම වෙබ් පිටුවක් හඳුන්වා දීමට ද සන්නිවේදන දෙපාර්තමේන්තුව කටයුතු කළේය.

## 4.2 වෙනත්

විදේශීය ප්‍රේෂණ, ඩිජිටල් ආර්ථිකය වැනි පුළුල් පරාසයක පවතින මාතෘකා ගණනාවක් ආවරණය කරමින් අමතර මාධ්‍ය හමු කිහිපයක් ද පැවැත්වීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. තවද, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ප්‍රචාරණ දැන්වීම් ඇතුළුව පුවත්පත් දැන්වීම් නිකුත් කරනු ලැබූ අතර, 2021 වසර තුළ දී, කලින් කලට, අනෙකුත් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන්ට අනුව ගැසට් නිවේදන නිකුත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී. විදුලි පැවරුම් (විනිමය) අනුපාතික, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ (SLIBOR) අනුපාතික සහ ප්‍රතිපත්ති අනුපාතිකවලට අදාළව කෙටි පණිවුඩ සේවාව හරහා තත්කාලීන දැනුම් දීම් ද සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තවද මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ ඉලක්ක ප්‍රේක්ෂක ප්‍රජාව වෙත තම පණිවුඩය රැගෙන යාමට ප්‍රචාරණයේ ක්‍රමවේද වැඩිදියුණු කරන ලදී. වාණිජ බැංකු ඔස්සේ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරුව ප්‍රවර්ධනය කිරීම සඳහා පුවත්පත් ප්‍රචාරණ දැන්වීම් සහ අවිධිමත් මාර්ගවලින් කෙරෙන විදේශීය ප්‍රේෂණවලින් වැළකී සිටින මෙන් මහජනතාවගෙන් ඉල්ලීම් කෙරෙන පුවත්පත් දැන්වීම්වලට අමතරව, විකල්ප මංගත පුවත් වෙබ් අඩවි සහ ගුවන් විදුලි කෙටි දැන්වීම් මගින් ද ඒවා ප්‍රචාරණය කරමින් සන්නිවේදන දෙපාර්තමේන්තුව තම කාර්යයන් සමුදාය ප්‍රසාරණය කළේය.

අධික ණයගැතිභාවය මැඩපැවැත්වීමේ අරමුණින් ගෘහ අංශයේ මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව, ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු විදු පියස ඒකාබද්ධව පුළුල් ලෙස, මාධ්‍ය භාවිත කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන්වල විෂය පථය වැඩි දියුණු කළේය. මෙම කර්තව්‍යයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ද සහයෝගයෙන් සජීවී ගුවන් විදුලි සාකච්ඡාවක් සහ කෙටි දැන්වීම් මාලාවක් ඇතුළු ගුවන් විදුලි වැඩසටහන් පවත්වා ගෙන යන ලදී. ඊට අමතරව, රූපවාහිනී සාකච්ඡා, අත්පත්‍රිකා වැඩසටහනක්, පෝස්ටර සහ ස්ටිකර් වැඩසටහනක්, පුවත්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකු වාර සඟරාවල ලිපි පළ කිරීම, මෙම කාර්යය සඳහා ම වෙන් කළ සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සහ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම ද මූල්‍ය සාක්ෂරතා දැනුවත්භාවය ඇති කිරීමේ වැඩසටහනෙහි කොටසක් විය. එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව මහ බැංකු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ලේඛන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා භාෂා ත්‍රිත්වයෙන් ම වැඩසටහන් පවත්වන ලදී.

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් "ව්‍යවහාර මුදල් නිකුතුව සහ කළමනාකරණයේ සැත්තෑ වසරක ගමන්මග"

යන මැයෙන් ව්‍යවහාර මුදල් පිළිබඳ විශේෂ ග්‍රන්ථයක් පළ කරනු ලැබූ අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂිකා (විශ්‍රාමික) ශෙලෝමි එච්. ගුණවර්ධන මෙනෙවිය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරු (විශ්‍රාමික) ඩබ්. එම්. කේ. වීරකෝන් මහතාගේ සම කර්තෘත්වයෙන් එළි දුටුවේය. මෙම ග්‍රන්ථය මහ බැංකුවෙහි ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ අලෙවි කවුළුව, රාජගිරියේ පිහිටි බැංකු විදු පියසෙහි අලෙවි සැල සහ ප්‍රාදේශීය කාර්යාලවල අලෙවි කවුළු මගින් අලෙවි කරන ලදී. වසංගත කාලය තුළ ක්‍රියාත්මක කරන ලද සංචරණ සීමා සහ රට වසා දැමීමේ තත්ත්වයන් හේතුවෙන් ප්‍රකාශන අලෙවි කවුළු වරින් වර වසා දමනු ලැබුව ද, 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව ඇතුළුව, ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රකාශන තොග අලෙවි සිදු කිරීම සඳහා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය ඔස්සේ පොත් අලෙවි සැල් වෙත පහසුකම් සලසා දෙනු ලැබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රට වසා දැමීමේ තත්ත්වයන් හමුවේ වුව ද මහජනතාවට කාලීනව මෙම ප්‍රකාශන වෙත පිවිසීමට හැකියාව ලැබුණි. කාර්යක්ෂම ගනුදෙනු තහවුරු කිරීමට සහ මුදල් භෞතික වශයෙන් හැසිරවීම අවම කිරීම සඳහා ණයපත්, හරපත් සහ QR කේත ගෙවීම් වැනි විකල්ප ගෙවීම් ක්‍රම ආර්ථික ඉතිහාස කෞතුකාගාර අලෙවි කවුළුව වෙත හඳුන්වා දෙනු ලැබිණි. එසේම, උසස් පෙළ සඳහා ආර්ථික විද්‍යාව ඉගැන්වෙන පාසල්වලට සහ රට පුරා ඇති මහජන පුස්තකාලවලට විවිධ මහ බැංකු ප්‍රකාශනවල පිටපත් නොමිලේ බෙදා දීම ද සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව උසස් පෙළ ආර්ථික විද්‍යාව ඉගැන්වෙන පාසල් අතර 2020 වාර්ෂික වාර්තාව ද බෙදා හැරිණි.

වසංගතයෙන් එල්ල වූ අභියෝග හමුවේ වුව ද, සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප සහ වීඩියෝ ඒකකය මගින් 2021 වසරේ දී මහ බැංකුවේ සියලු අවස්ථා නොකඩවා ආවරණය කෙරුණු අතර, එවැනි අවස්ථාවල වීඩියෝ පටිගත කිරීම් කලට වේලාවට මහ බැංකුවේ ආයතනික වෙබ් අඩවිය සහ YouTube වෙත ඇතුළත් කිරීම ඇතුළුව, සියලු ආශ්‍රිත සේවා සැපයිණි. 2020 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව, සටහන, නිව්ස් සර්වේ සහ වයිප්පහම් වැනි වාර සඟරා, ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාන-2021, ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2021 ඇතුළුව, මහ බැංකුවේ සියලු මුද්‍රණ අවශ්‍යතා සඳහා මහ බැංකුවේ ප්‍රසම්පාදන අංශයෙන් පහසුකම් සැලසුණු අතර, 2021 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු මුද්‍රණ වැඩ කටයුතු බාහිර මුද්‍රණකරුවන් ගෙන් සපයා ගැනුණි.

### 4.3 අභ්‍යන්තර සන්නිවේදනය

මහ බැංකු නිලධාරීන් මුදල් සහ මූල්‍ය අංශයේ වත්මන් කටයුතු සම්බන්ධව මෙන්ම, දේශීය සහ ජාත්‍යන්තර වේදිකා තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අනෙකුත් අංශ සම්බන්ධව ද මනා දැනුවත්භාවයකින් සිටින බව තහවුරු කිරීමට අභ්‍යන්තර සන්නිවේදනය ශක්තිමත් කෙරිණි. භාෂාත්‍රයෙන් ම පළ වූ ජාතික පුවත්පත්වලින් උපුටා ගත් ලිපි සහ මහජන මතයන් මාසික පදනමක් මත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා සාරාංශගත කෙරිණි. එසේ ම මංගත ව පළ කෙරෙන මහ බැංකුවට අදාළ ප්‍රවෘත්තිවල සාරාංශයක් ද විද්‍යුත් තැපැල මගින් දිනපතා ඉහළ කළමනාකාරීත්වය වෙත යැවීම ද සිදු විය. නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශනය වන "කවුළුව" ඩිජිටල්මය ආකාරයෙන් ප්‍රකාශයට පත් කෙරුණු අතර, මහ බැංකු කාර්යමණ්ඩලයේ අභ්‍යන්තර වෙබ් අඩවිය වෙත ද එය ඇතුළත් කෙරිණි.

ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ ආර්ථික පරිසරය තුළ නව සමාජ ආර්ථික ප්‍රවණතා පිළිබඳ සිය දැනුම සහ වෘත්තීමය තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා මහ බැංකු නිලධාරීන්ට අවශ්‍ය සහාය ලබා දීම පිණිස අවශ්‍ය දැනුම අත්පත් කර ගෙන ඒවා බෙදා හැරීම සඳහා පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී. පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ආර්ථික විද්‍යාව, කළමනාකරණය සහ මූල්‍යය යන විෂයයන්ට අදාළ මාතෘකා මත පළ වූ ප්‍රකාශනවල පුළුල් පරාසයක් කරා ප්‍රවේශය සපයන පොත්පත්, වාර්තා, ජර්නල සහ විවිධ මංගත දත්ත පද්ධතිවලින් සමන්විත එහි සංචිතය ඉහළ දැමුවේය. ඊට අමතරව, පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් කාර්ය මණ්ඩලයට මහ බැංකු කටයුතු හා සම්බන්ධ විෂයයන්ට අදාළ මංගත තොරතුරුවලට ළඟා වීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණින් මංගත මූලාශ්‍ර කිහිපයක (නිද. www.centralbanking.com, www.economist.com) දායකත්වය ලබා ගෙන තිබුණි. පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය Fortune Magazine, Time Magazine, South Asia Economic Journal, The Economist වැනි ජාත්‍යන්තර ජර්නලවල දායකත්වය මුද්‍රිත ස්වරූපයෙන් ද, Asia Monitor, Payment Cards and Mobiles Payment, Journal of Financial Crimes, Financial Regulation and Compliance, Money Laundering Control, Journal of Human Resources යනාදියෙහි දායකත්වය මුද්‍රිත සහ විද්‍යුත් ස්වරූප යන දෙයාකාරයෙන් ම ද ලබා ගෙන ඇත. Current Contents, News from the Local Press, Central Banking.com, News Desk යනාදී විද්‍යුත් නිවේදන සකස් කිරීම ද පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් අඛණ්ඩව සිදු කෙරිණි. එමෙන්ම, ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු හා සම්බන්ධ සටහන් සහ වාර්තා අභ්‍යන්තර ජාලය ඔස්සේ කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් අතර, පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය ලේඛනාරක්ෂක කටයුතු සඳහා ද දෛනික පුවත්පත් සියල්ලෙහි වාර්තාවක් සකස් කරයි.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 49 වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය හා අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මුදල් නිකුත් කිරීම සහ කළමනාකරණය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ මෙම ව්‍යවස්ථාපිත බැඳීමට අදාළ කාර්යයන් හැසිරවීමේ වගකීම මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. 2021 වර්ෂය තුළ දී, කොවිඩ්-19 හේතුවෙන් හටගත් අභියෝග මධ්‍යයේ වුව ද, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් රට තුළ පැවති මුදල් ඉල්ලුමට සරිලන පරිදි ගුණාත්මකභාවයෙන් යුතු ව්‍යවහාර මුදල් අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් පවත්වා ගන්නා අතරම ව්‍යාජ මුදල් මුද්‍රණය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ද අනුගමනය කරමින් රටෙහි මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීමට සිය දායකත්වය අඛණ්ඩව ලබා දුනි.

## 5.1 ව්‍යවහාර මුදල් කළමනාකරණය

ගුණාත්මක තත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයට නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම සහ භාවිතයට නුසුදුසු (සේවා අනිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම ව්‍යවහාර මුදල් කළමනාකරණයට අයත් ප්‍රධාන කාර්යයන් වේ. ඵලදායී ව්‍යවහාර මුදල් කළමනාකරණයක් සහතික කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ පහත කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

### (අ) ව්‍යවහාර මුදල් මුද්‍රණය හා ටංකනය

2021 වසර සඳහා වන ඉල්ලුම සපුරාලීමට සහ ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමට රුපියල් බිලියන 262.4ක් වටිනා නව මුදල් නෝට්ටු මිලියන 185ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ඇණවුම් කරන ලදී. 2021 වසරේදී සංසරණය සඳහා වන කාසි ඇණවුම් නොකරන ලදී.

### (ආ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

රට තුළ කොවිඩ්-19 පැතිරීම මධ්‍යයේ ඇති වූ මුදල් සඳහා වූ අනපේක්ෂිත ඉල්ලුමට විසඳුම් ලබා දෙමින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව නව සාමාන්‍ය තත්ත්වයට සාර්ථකව අනුගත වීමට සමත් විය.

2021 වසරේ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු අතර භාවිතයට සුදුසු (සේවා නිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු සෘජුවම හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම සිදු කරන ලද අතර එමගින් පෙර වසරට සාපේක්ෂව ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම අඩු විය. ඒ අනුව ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 දී රුපියල් බිලියන 390.9ක වටිනාකමකින් යුත් මුදල් සංසරණයට නිකුත් කරනු ලැබූ අතර, එහි රුපියල් බිලියන 172.7ක වටිනාකමක් ඇති භාවිතයට සුදුසු (සේවා නිසි) නෝට්ටු ද, රුපියල් බිලියන 217.3ක වටිනාකමකින් යුත් නව මුදල් නෝට්ටු ද, රුපියල් බිලියන 0.9ක වටිනාකමකින් යුතු කාසි ද ඇතුළත් විය.

**II-3 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි නිකුතුව**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| භාවිතයට සුදුසු නෝට්ටු | 504.6 | 467.0 | 526.5 | 467.1 | 172.7 |
| නව නෝට්ටු | 123.3 | 328.4 | 248.7 | 229.5 | 217.3 |
| කාසි (අ) | 1.4 | 1.1 | 1.0 | 0.7 | 0.9 |
| **එකතුව** | **629.3** | **796.5** | **776.2** | **697.3** | **390.9** |

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

### (ඇ) ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය මූලික කරගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් සිදු කරනු ලබන ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම සිදු කරනු ලබයි. එමෙන්ම, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටුවල ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම සඳහා හානි වූ ව්‍යවහාර මුදල් නෝට්ටු ඇතුළු භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් භාර ගෙන සංසරණයෙන් ඉවත් කිරීම ද සිදු කරනු ලබයි.

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සාපේක්ෂව පහළ අගයක පවත්වා ගැනීම හා සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු වාණිජ බැංකු අතර සෘජුව හුවමාරු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම හේතු කොට ගෙන වාණිජ බැංකු මගින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කරනු ලබන භාවිතයට සුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රමාණය, පෙර වසර හා සසඳන විට 2021 වර්ෂයේ දී පහළ අගයක් වාර්තා කළේය.

**II-4 සංඛ්‍යා සටහන**

**ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු**

| අයිතමය | වටිනාකම (රු. බිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| භාවිතයට සුදුසු නෝට්ටු | 464.2 | 524.1 | 606.9 | 445.0 | 144.6 |
| භාවිතයට නුසුදුසු නෝට්ටු | 119.9 | 229.6 | 132.1 | 95.4 | 76.1 |
| **එකතුව** | **584.1** | **753.7** | **739.0** | **540.4** | **220.7** |

සටහන : බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කරන ලද කාසිවල වටිනාකම සැලකිය යුතු අගයක් නොවේ.

### (ඈ) සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීමේ ව්‍යවස්ථාපිත බලය ක්‍රියාවට නංවමින්, 2021 වර්ෂය තුළ රුපියල් බිලියන 44.3ක් වටිනා භාවිතයට නුසුදුසු ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 108.2ක් (II-5 සංඛ්‍යා සටහන) ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් විනාශ කරන ලදී.

**II-5 සංඛ්‍යා සටහන**

**සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම**

| නෝට්ටු | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| නෝට්ටු ගණන (මිලියන) | 177.1 | 343.8 | 235.0 | 127.3 | 108.2 |
| වටිනාකම (රු. බිලියන) | 94.2 | 252.2 | 139.8 | 62.2 | 44.3 |

## 5.2 අනෙකුත් කටයුතු

### (අ) ව්‍යවහාර මුදල් කවුළු මෙහෙයවීම

2021 වර්ෂය තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් කවුළු හරහා හානි වූ මුදල් නෝට්ටු රුපියල් මිලියන 93ක් හුවමාරු කිරීම මගින් මහජනතාව වෙත තම සේවාව සපයන ලදි. මීට අමතරව, මහජනතාව සඳහා ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පිහිටුවා ඇති විශේෂ හුවමාරු කවුළුව හරහා රුපියල් මිලියන 655ක වටිනාකමින් යුත් ව්‍යවහාර

මුදල් නෝට්ටු හා රුපියල් මිලියන 39.1ක වටිනාකමින් යුත් කාසි නිකුත් කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී.

**(ආ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මෙහෙයවීම**

රටේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන්, ආර්ථික ඉතිහාස කෞතුකාගාරය හරහා පෙර වර්ෂවල දී මෙන් මහජනතාව වෙත සාමාන්‍ය පරිදි සිය සේවාවන් සැපයීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට අසීරු විය. එසේ වුවද, ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි පිළිබඳ පුළුල් දැනුම්වත්භාවයක් ලබා දීම තුළින් ද, සමරු මුදල් නෝට්ටු, කාසි හා අනෙකුත් සංග්‍රාහක අයිතම අලෙවි කිරීමෙන් ද, ඒ හා සබැඳි ඉදිරිපත් කිරීම් මගින් ද, 2021 වර්ෂය තුළ දී ආර්ථික ඉතිහාස කෞතුකාගාරය හරහා පුද්ගලයින් 3,663 දෙනෙක් වෙත සිය සේවය සලසන ලදී.

**(ඇ) ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශයේ සහයෝගය ඇතිව ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ සිදුවීම් අවම කිරීම සහ ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ආරක්ෂා කිරීම උදෙසා අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු 1,065ක් සහතික කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී. අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු අනුපාතිකය, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු 0.8ක් වූ අතර එය අනෙකුත් බොහෝ රටවල ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ වාර්තා සමග සසඳන විට අවම මට්ටමක පවතී. අධිකරණමය නඩු විභාගයන් සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධව තීරණාත්මක සාක්ෂි වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව, සහතික 63ක් නිකුත් කරන ලද අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ අධිකරණමය නඩු විභාග 3ක් සඳහා එම වර්ෂය තුළ දී සහභාගී වන ලදී.

**(ඈ) සමරු කාසි නිකුත් කිරීම**

ශ්‍රී ලංකාව සහ මහජන චීන සමූහාණ්ඩුව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 65 වැනි සංවත්සරය සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ 100 වැනි සංවත්සරය නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේ දී රුපියල් 1000 මුහුණත වටිනාකමින් යුත් රත්‍රන් සහ රිදී සමරු කාසි දෙකක් නිකුත් කරන ලදී.

**(ඉ) ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා අවසර ලබා දීම**

ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියට අනුව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය තුළ දී ප්‍රතිනිෂ්පාදන ඉල්ලීම් 2ක් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

### 5.3 වැඩිදියුණු කිරීම් සහ නව ව්‍යාපෘති

**(අ) මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීම**

ව්‍යවහාර මුදල් මෙහෙයුම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ප්‍රසම්පාදනයේ පළමු අදියර අවසන් වීමත් සමඟ මේ සම්බන්ධයෙන් උනන්දු වූ පාර්ශ්ව විසින් ඉදිරිපත් කළ යෝජනා ඇගයීම නිමා කර, දෙවන අදියර ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය හරහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ව්‍යවහාර මුදල් නෝට්ටු සැකසීමේ ධාරිතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි කිරීම ඇතුළු මෙහෙයුම් ගැටලු කිහිපයක් විසඳීමට අපේක්ෂා කරනු ලැබේ.

## 6. දේශීය මෙහෙයුම් කටයුතු

### 6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනතෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අදාළ වන ප්‍රධාන කාර්යයන් කිහිපයක වගකීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ඒ අනුව, 2021 වසරේ දී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන කාර්යයන් අතරට විවිට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යෑම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත නියාමනය කිරීම, රජය, රාජ්‍ය නියෝජිත ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස ක්‍රියාකිරීම, තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ඍජු අලෙවි සහභාගිකරුවන් වෙත දවස ඇතුළත පියවීමේ පදනමින්, දවස ඇතුළත ද්‍රවශීලතා ණය පහසුකම් ලබා දීම සහ බලයලත් මුදල් තැරුව්කරුවන් නියාමනය කිරීම ඇතුළත් වේ.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

#### 6.2.1 විවට වෙළඳපොළ කටයුතු

දැනට ක්‍රියාත්මක වන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) අඩු විචල්‍යතාවකින් අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවිට වෙළඳපොළ කටයුතු සිදු කරන ලදී.

**(අ) මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, සුදුසු විවට වෙළඳපොළ කටයුතු හරහා වෙළඳපොළ සහභාගිත්ව ආයතනයන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගනිමින් සාධක ගණනාවක් මත පදනම්ව දෛනිකව දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ඇස්තමේන්තු කරයි. දේශීය මුදල් වෙළඳපොළෙහි දෛනික ද්‍රවශීලතාව ඇස්තමේන්තු කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තියට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ඇති බලපෑම මෙන්ම, සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කරන විදේශ විනිමය සම්බන්ධ

ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිතවල සිදු වන වෙනස්වීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමග සිදු කරන ගනුදෙනු වැනි ද්‍රවශීලතාව කෙරෙහි බලපාන ස්වායත්ත සාධක ද සැලකිල්ලට ගනු ලබයි.

**(ආ) වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත නිර්දේශ ලබා දීම**

මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දත්ත දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත ලබා දෙනු ලබයි. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් දේශීය මුදල් වෙළෙඳපොළෙහි සහ විදේශ විනිමය වෙළෙඳපොළෙහි දෛනිකව සිදු වන වෙනස්වීම් සහ ඇස්තමේන්තුගත ද්‍රවශීලතා මට්ටම, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම, මුදල් වෙළඳපොළ සහභාගිත්ව ආයතන අතර පවත්නා ද්‍රවශීලතා ව්‍යාප්තිය, වෙළඳපොළට සුදුසු සංඥාවන් ලබා දීමේ අවශ්‍යතාව යනාදී සාධක සැලකිල්ලට ගනිමින් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව කළමණාකරණය කිරීමට, වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ දී සලකා බැලිය යුතු ක්‍රියාමාර්ග යෝජනා කරන ලදී.

**(ඇ) විවට වෙළඳපොළ වෙන්දේසි පැවැත්වීම**

සමස්ත ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම් සඳහා උපකාර කිරීමට, අවශ්‍යතාව අනුව ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම මෙන්ම ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම සඳහා වෙන්දේසි පැවැත්වීය. එවැනි වෙන්දේසි, මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමට උපකාරී වේ.

**(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

2021 අගෝස්තු මස මැදදී එතෙක් පැවති ලිහිල් මුදල් ප්‍රතිපත්තියේ සිදු කරන ලද වෙනස් වීමත් සමඟ දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා එක්දින, කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පැවැත්වීය. ඒ අනුව, එක් දිනකට ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා එක් දින ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි, සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කිරීමට කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පවත්වන ලද අතර මෙම වෙන්දේසිවල පියවීම් කටයුතු ද එදිනම සිදු කළේය. සැලකිය යුතු කාලසීමාවකට ද්‍රවශීලතාව අතිරික්තව පවතින බව පෙනීගිය අවස්ථාවල දී එම අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ අරමුණු සහිතව දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි ඊළඟ ව්‍යාපාර දිනයේ දී පියවීමේ පදනම මත පැවැත්වීය.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

ඇතැම් වාණිජ බැංකුවල පැවති සැලකිය යුතු ද්‍රවශීලතා හිඟය සැලකිල්ලට ගනිමින් වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම සඳහා දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීය.

**(iii) ස්ථිර පදනම මත වන වෙන්දේසි**

2021 වසරේ දී මුදල් වෙළඳපොළහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව ස්ථිර පදනමින් අවශෝෂණය කිරීම සඳහා ස්ථිර පදනම මත සහභාගීත්ව ආයතනයන්ට භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි පවත්වන ලදී.

**II-6 සංඛ්‍යා සටහන**
**2021 වසරේ දී පවත්වන ලද විවට වෙළඳපොළ වෙන්දේසි**

| වෙන්දේසි වර්ගය | පැවැත්වූ වෙන්දේසි සංඛ්‍යාව | රු. බිලියන | |
|---|---|---|---|
| | | ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය | පිළිගත් මුළු ලංසු ප්‍රමාණය |
| ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි | | | |
| එක් දින | 46 | 1,594.0 | 1,182.7 |
| කෙටි කාලීන | 47 | 870.0 | 423.0 |
| දිගු කාලීන | 11 | 180.0 | 60.0 |
| ප්‍රතිවිකුණුම් වෙන්දේසි | | | |
| දිගු කාලීන - වාණිජ බැංකු සඳහා | 2 | 250.0 | 203.5 |
| ස්ථිර පදනම මත වන වෙන්දේසි | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම | 5 | 55.0 | 14.4 |

**(ඈ) නිත්‍ය පහසුකම් සැපයීම**

මුදල් වෙළඳපොළ සහ විවට වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතන සඳහා තමන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට නිත්‍ය පහසුකම් සැපයීය. ඒ අනුව, සහභාගීත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කළ අතර, දිනය අවසානයේ ද්‍රවශීලතා හිඟයක් සපුරා ගැනීමට එම ආයතනවලට දෛනික පදනමින් නිත්‍ය ණය පහසුකම ලබා දෙන ලදී. 2021 වසර තුළ දී, එලෙස නිත්‍ය තැන්පතු පහසුකම් වශයෙන් රු. බිලියන 29,450.3ක් තැන්පත් කර ඇති අතර නිත්‍ය ණය පහසුකම් වශයෙන් රු. බිලියන 30,095.2ක් ලබා දී ඇත.

**II-7 සංඛ්‍යා සටහන**
**2021 දී නිත්‍ය පහසුකම් සැපයීම**

රු. බිලියන

| නිත්‍ය පහසුකම | අවමය | උපරිමය | සාමාන්‍යය | මුළු වටිනාකම |
|---|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම | 59.3 | 266.6 | 122.2 | 29,450.3 |
| නිත්‍ය ණය පහසුකම | 0.01 | 534.6 | 124.9 | 30,095.2 |

### 6.2.2 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වාගෙන යෑම හා අධීක්ෂණය කිරීම

මුදල් නීති පනතේ දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අනුව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම් මත මහ බැංකුවේ ඊට අදාළ පියවීම් ගිණුමෙහි පවත්වා ගත යුතු අවම සංචිත ප්‍රමාණය තීරණය කෙරේ. ව්‍යවස්ථාපිත සංචිත

අනුපාතයට අනුව සංචිත පවත්වාගෙන යෑම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඊට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව, 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වූ සංචිත පවත්වාගෙන යෑමේ කාල පරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය එවකට පැවති සියයට 2.00 සිට සියයට 4.0 දක්වා ප්‍රතිශතාංක දෙකකින් ඉහළ නංවමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2021 අගෝස්තු 19 දින මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

### 6.2.3 බැංකු අනුපාතය

මුදල් නීති පනතේ 86 සහ 87 වන වගන්ති ප්‍රකාරව බැංකු ආයතන වෙත "අවසන් ණය ලබා දෙන්නා" ලෙස මහ බැංකුව විසින් හදිසි අවශ්‍යතා සඳහා ණය නිකුත් කිරීමේ අනුපාතය බැංකු අනුපාතයයි. බැංකු අනුපාතය, නිත්‍ය ණය පහසුකම් අනුපාතයට අනුකූලව ඊට පදනම් අංක 300ක ඉහළ ආන්තිකයක් ගන්නා පරිදි ස්වයංක්‍රීය ලෙස ගලපා ඇත. 2021 අගෝස්තු මැද භාගයේ දී හඳුන්වා දුන් දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමත් සමඟ 2021 අගෝස්තු 19 සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු අනුපාතය සියයට 9.00 දක්වා ඉහළ නංවන ලදී. කෙසේවුවද, 2021 වර්ෂය තුළ දී බැංකු ආයතන සඳහා බැංකු අනුපාතය යටතේ හදිසි ණය මුදල් සපයා නොමැත.

## 6.3 වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ රජය සඳහා වන කාර්යයන්

### 6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම්

මහ බැංකුවේ පවත්නා පියවීම් ගිණුම් හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් මූල්‍ය පද්ධතිය හා සම්බන්ධ වී පවතී. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ පවතින පොදු ලෙජර් ගිණුම් මගින් ගෙවීම් හා පියවීම් මෙන්ම තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල ගෙවීම් හා පියවීම් නිරවුල්තාවය සඳහා පහසුකම් සැපයීමත් සිදු වේ. තවද ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සංචිත පවත්වාගෙන යෑම සඳහා ද මෙම ගිණුම් භාවිතා කෙරේ. 2021 වසර අවසානයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 දෙනෙකු වෙනුවෙන් තත්කාලීන දළ පියවීම් පද්ධතියට අදාළව පොදු ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

### 6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු ලෙස මහ බැංකුවේ කාර්යයන් ඉටු කිරීමේ දී රජය වෙනුවෙන් රාජ්‍ය දෙපාර්තමේන්තු, රජයේ ආයතන, නියෝජිතායතන සහ ඇතැම් විදේශීය ආයතන සඳහා බැංකු පහසුකම් සැපයීම ද දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු වන අතර, ඊට අදාළව ගිණුම් 49ක් පවත්වාගෙන යනු ලැබීය. 2021 වර්ෂයේ දී එම ගිණුම් හරහා සිදු වූ සමස්ත ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 87ක්ම අයත් වූයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්ගේ ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම් සඳහාය.

මුදල් නීති පනතේ 89 වන වගන්තිය ප්‍රකාරව මහ බැංකුව විසින් අදාළ මුදල් වර්ෂය සඳහා වන රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10කට නොවැඩි මුදලක් රජයට තාවකාලික අත්තිකාරම් ලෙස සපයනු ලැබේ. සය මසකට නොවැඩි කාල සීමාවක් තුළ නැවත ගෙවිය යුතු වන චක්‍රීය ණය පහසුකමක් ලෙස මෙම අත්තිකාරම් රජය විසින් භාවිතා කෙරේ. 2021 වසර සඳහා වන රජයේ ඇස්තමේන්තුගත ආදායම හා පදනම්ව 2021 වසර ආරම්භයේ දී රුපියල් බිලියන 198.44ක් දක්වා රුපියල් බිලියන 43.72කින් තාවකාලික අත්තිකාරමේ භාවිතා කළ හැකි උපරිම ප්‍රමාණය ඉහළ නංවන ලදී. කෙසේ වුවද, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද එම වසර සඳහා වන සංශෝධිත රජයේ අයවැය ලේඛනයට අනුව මෙම තාවකාලික අත්තිකාරමේ භාවිතා කළ හැකි උපරිම ප්‍රමාණය රුපියල් බිලියන 152.04ක් දක්වා පහත හෙළමින් සංශෝධනය විය. ඒ අනුව 2020 වසර අවසානයේ දී පැවැති තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය වූ රුපියල් බිලියන 154.72ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී පැවති තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 152.04ක් විය. 2022 වසර සඳහා වූ රජයේ අයවැය ලේඛනය අනුව 2022 වසර සඳහා තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 225.05ක් වූ අතර, ඒ අනුව 2022 වසර ආරම්භයේ දී රුපියල් බිලියන 73.01ක අතිරේක මුදල් ප්‍රමාණයක් රජය වෙත ලබා දෙන ලදී.

## 6.4 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඍජු සහභාගීත්ව අලෙවිකරුවන් සඳහා ලබා දෙන ලදී. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ගාස්තුවකින් තොරව මෙම පහසුකම් සැපයෙන අතර, අදාළ දිනය තුළ දී සුරැකුම්පත්වල වර්තමාන වෙළඳපොළ මිල ගණන් වෙනස් වීමෙන් අදාළ සුරැකුම්පත්හි මිලෙහි විය හැකි උච්ඡාවචනයකින් ඇති විය හැකි අලාභය අවම කිරීම සඳහා යම් ගැළපීමක් (haircut) අන්තර්ගත කරමින් අදාළ සුරැකුම්පතෙහි නිල මිල ගණන් තීරණය කරයි.

2021 වසර තුළ දී දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබා දුන් සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 50,777.0ක් සහ එහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 215.2ක් විය. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් භාවිතය පෙර වසරේ පැවති සමස්ත වටිනාකම වූ රුපියල් බිලියන 15,843.0ක් සහ දෛනික සාමාන්‍යය වූ රුපියල් බිලියන 66.9ක් හා සැසඳීමේ දී ඉහළ යෑමක් පෙන්නුම් කරයි.

### 6.5 බලයලත් මුදල් තැරුව්කරුවන් අධීක්ෂණය

මුදල් තැරුව්කරුවන් විසින් මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් යන වෙළඳපොළවල අතරමැදිකරණ කාර්යයන් සිදු කරනු ලබයි. දේශීය මුදල් වෙළඳපොළ තුළ මුදල් තැරුව්කරුවන්ගේ වෘත්තීමය ක්‍රියාකාරීත්වය සහතික කිරීම පිණිස ශ්‍රී ලංකාවේ බලයලත් මුදල් තැරුව්කරුවන් නියාමනය කිරීමේ බලය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරමින් මුදල් නීති පනතේ 10 (සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 සහ 2016 යන වසරවල දී නිකුත් කළ මුදල් තැරුව්කරන රෙගුලාසි අවලංගු කරමින්, 2018 අංක 1 දරන මුදල් රෙගුලාසි නිකුත් කර ඇත. ඉහත රෙගුලාසි යටතේ 2021 වසර අවසානය වන විට සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කර ඇති අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරුව්කරුවන්" ලෙස නම් කර ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් බලයලත් මුදල් තැරුව්කරුවන් සඳහා වන වාර්ෂික අධීක්ෂණ කටයුතු 2021 වසර තුළ දී දුරස්ථව සිදු කළේය.

## 7. ආර්ථික පර්යේෂණ

මුදල් මණ්ඩලයට සහ මහ බැංකුවෙහි අධිපතිට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම පිණිස මෙන්ම මහජනතාව වෙත මුදල් හා බැංකු සහ පොදු උනන්දුවක් දක්වන වෙනත් ආර්ථික විෂයන් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සඳහා, දත්ත සම්පාදනය කිරීමේ සහ ආර්ථික පර්යේෂණ සිදු කිරීමේ කාර්යභාරය 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද අභියෝග මධ්‍යයේ වුව ද, කාලීන ආර්ථික ගැටලු පිළිබඳව පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කරමින් සාර්ව ආර්ථික ස්ථායීතාව ස්ථාපිත කිරීමේ අරමුණින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ මුදල් මණ්ඩලය වෙත පූර්වෝපායික සහ විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය නිර්දේශ ලබා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව 2021 වසරේ දී සිය කාර්යයන් අඛණ්ඩව සිදු කළේය. තවද, ආර්ථික හා මූල්‍ය කටයුතු පිළිබඳ රජයේ උපදේශක ලෙස මහ බැංකුවේ කාර්යභාරය ඉටු කිරීමේදී, රජය වෙත ඉදිරිපත් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත අඛණ්ඩව පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන ලබා දෙන ලදී. ඒ අනුව, පවතින සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ගැටලු පිළිබඳව මහ බැංකුව විසින් අඛණ්ඩව රජය දැනුවත් කළ අතර ආර්ථිකයේ ඇතැම් අංශ ශක්තිමත් කිරීම මෙන්ම සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශ රජයට ඉදිරිපත් කරන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව නියමිත කාලය තුළ ව්‍යවස්ථාපිත ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත් කළ අතර, මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වෙත සංඛ්‍යාලේඛන සහ අනෙකුත් සාර්ව ආර්ථික තොරතුරු සපයමින් පුළුල් පිරිසක් සමඟ දැනුම බෙදා ගැනීමේ වැඩසටහන්වල නිරත විය. තවද, පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම සහ කාලීන වැදගත්කමක් ඇති විෂයන් පිළිබඳ දැනුම බෙදාගැනීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තම දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව තුළ පර්යේෂණවල නිරත වීම ප්‍රවර්ධනය කිරීමේ කාර්යය අඛණ්ඩව සිදු කළේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විදේශීය මහ බැංකු සහ ජාත්‍යන්තර ආයතන සමඟ සමීප සහයෝගීතාවයක් ඇති කර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන භූමිකාවක් ඉටු කරන ලදී.

### 7.1 ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ව්‍යවස්ථාපිත අරමුණ පෙරදැරිව, පූර්වෝපායික සහ කාලීන මුදල් ප්‍රතිපත්ති තීරණ වෙත එළඹීම උදෙසා මුදල් මණ්ඩලයට සහාය වීම සඳහා ප්‍රක්ෂේපන සහ පුරෝකථන සිදුකරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය ආර්ථිකයේ, මුදල්, විදේශීය, මූර්ත සහ රාජ්‍ය මූල්‍ය යන අංශවල මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාවලට අදාළ දත්ත සම්පාදනය, අධීක්ෂණය හා විශ්ලේෂණය අඛණ්ඩව සිදු කරන ලදී. වසර තුළදී, මුදල් ප්‍රතිපත්ති කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනවල සහාය ඇතිව ආර්ථික සහ මුදල් තත්ත්වය පිළිබඳ ඉදිරි දැක්මකින් යුතු විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරමින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට වඩාත් දැනුම්වත් තීරණ ගැනීමට සහ මුදල් මණ්ඩලය වෙත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ සුදුසු තීරණ ගැනීමට අදාළ නිර්දේශ ලබා දීමට හැකි වන පරිදි පූර්ව දින දර්ශනයෙහි ඇතුළත් වූ මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් 8ක් සහ විශේෂ මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ *'සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම'* සම්පාදනය කිරීම සම්බන්ධීකරණය කළ අතර, එමගින් මහ බැංකුව සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම සඳහා අවශ්‍ය වන කෙටි කාලීන ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජය සහ මහ බැංකුව මගින් යෝජනා කරනු ලැබූ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අඛණ්ඩව විශ්ලේෂණය කර ඒවායේ ආර්ථික බලපෑම්, විශේෂයෙන්ම මුදල් අංශය මත ඇතිවිය හැකි බලපෑම්, ඉස්මතු කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විවිධ ආර්ථික ගැටලු සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීමට අවශ්‍ය සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත විශ්ලේෂණ සහ වාර්තා සැපයුවේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින්, වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටු රැස්වීම් අටක් සම්බන්ධීකරණය කරමින් කීර්තිමත් වෘත්තිකයන්, විද්වතුන් සහ පෞද්ගලික අංශය නියෝජනය කරන්නන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සමන්විත මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව සඳහා අඛණ්ඩව පහසුකම් සපයන ලදී. තවද, මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ සහ සන්නිවේදන ක්‍රියාවලිය අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ආකෘති මත පදනම් වූ

පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය විධිමත් කිරීම මගින් සිය ආකෘතිකරණ සහ පුරෝකථන හැකියාව අඛණ්ඩව ඉහළ නංවා ගැනීමට කටයුතු කරන ලදී. උද්ධමන අපේක්ෂා මැදි කාලීනව අපේක්ෂිත උද්ධමන පරාසය තුළ පාලනය කර ගැනීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශ්වයන් වෙත කෙරෙන සන්නිවේදනය වැඩිදියුණු කිරීම සහ මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මුදල් මණ්ඩල තීරණ මහජනතාව වෙත දැනුම් දීමේ පුවත්පත් නිවේදන 8ක් නිකුත් කළ අතර, මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය සාකච්ඡා සඳහා පහසුකම් සැලසීය. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය තත්කාලීනව පුළුල් පරාසයක් වෙත ළඟා කරවීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ මෙම මාධ්‍ය සාකච්ඡා, මංගත ක්‍රමවේද සහ සමාජ මාධ්‍ය ඔස්සේ සජීවීව විකාශය කරන ලදී. තවද, වැඩි පිරිසක් වෙත ළඟා වීම සඳහා මුදල් ප්‍රතිපත්ති නිවේදනයෙන් පසුව මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සම්බන්ධීකරණය කරන වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව පවත්වනු ලබන මංගත සැසි, විශේෂයෙන්ම සිංහල සහ දෙමළ මාධ්‍යයෙන්, පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සම්පත්දායකත්වය ලබා දෙන ලදී. මේ අතර, වසර තුළදී මුදල් සහ පොලී අනුපාතික සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීම සහ බෙදා හැරීම තවදුරටත් වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව, දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ මාසික සමීක්ෂණය, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පිළිබඳ මාසික සමීක්ෂණ 2021 වසරේ දී සිදු කරන ලදී.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

අභියෝගාත්මක සහ අවදානම් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ, විශේෂයෙන්ම විදේශීය අංශය සම්බන්ධයෙන් සැලකීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර වෙළඳාම, විදේශ මූල්‍ය, විනිමය අනුපාතික සහ දළ නිල සංචිත සම්බන්ධ සංඛ්‍යා දත්ත එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට විදේශීය අංශය පිළිබඳ සුදුසු සහ කාලෝචිත ප්‍රතිපත්ති උපදෙස් සහ නිර්දේශ අඛණ්ඩව ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විනිමය අනුපාතිකය මත ඇති වන පීඩන නිතිපතා ඇගයීමට ලක් කරන ලද අතර, විදේශීය අංශයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළු විදේශීය අංශයේ ප්‍රවණතා සහ ගැටලු පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අඛණ්ඩව ඉදිරිපත් කිරීම් සහ දත්ත ලබා දීම් සිදු කරන ලදී. මුදල් නීති පනතේ 114 වන වගන්තිය අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉල්ලීම පරිදි, යෝජිත විදේශ ණය ලබා ගැනීමට පෙර, එම ණය මගින් මුදල් තත්ත්වය මත ඇතිවන බලපෑම අඛණ්ඩව විශ්ලේෂණය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන ලේඛනයේ 6වන සංස්කරණ (BPM6) ආකෘතිය අනුව ගෙවුම් තුලන හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ද, ජාත්‍යන්තර සංචිත දත්ත සටහන මාසික පදනම මත ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශ ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත ඍජු ආයෝජන දත්ත, විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය වෙත ද කාලානුරූපීව ඉදිරිපත් කරන ලදී. විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සහ වඩාත් කාලීන තොරතුරු ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සම්බන්ධයෙන් වූ මාසික සමීක්ෂණ, පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය සහ නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ ආදී අංශ රැසක් ආවරණය කෙරෙන සේවා වෙළඳාම පිළිබඳ වූ සමීක්ෂණ ඇතුළු සමීක්ෂණ රැසක් සිදු කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, බැංකු පද්ධතිය හරහා කුඩා මට්ටමින් සිදු වන විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් වන අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය (ITRS) ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධති ව්‍යාපෘතිය 2022 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. තවද, රට වෙතට ගලා එන විදේශ විනිමය ශක්තිමත් කිරීමේ හදිසි අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් විදේශ විනිමය ලැබීම් වර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද විදේශ විනිමය ගලා ඒම් ශක්තිමත් කිරීමේ කාර්ය සාධක බලකායේ ලේකම් කාර්යාලය වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියා කළ අතර ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත එහි ප්‍රගතිය යාවත්කාලීන කිරීමට පහසුකම් සැලසීම සඳහා එම කාර්ය සාධක බලකායන් සම්බන්ධීකරණය කරන ලදී.

## 7.3 පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන

මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර වෙළඳාම සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධයෙන්, මුදල් මණ්ඩලය, රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීමේ කාර්යභාරය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඉටු කරන ලදී. විශේෂයෙන්ම, වසංගතයෙන් බාධා ඇති වූ ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ස්ථාවර කිරීමට බලධාරීන්ට සහාය වීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය නිර්දේශ පූර්වෝපායිකව සකස් කළේය. මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ වන ව්‍යවස්ථාපිත භූමිකාවට අනුකූලව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, පිළිවෙළින්, මුදල් හා විදේශීය අංශ සම්බන්ධයෙන් දැනට පවතින සහ අපේක්ෂිත තත්ත්වයන් හා අවදානම් පිළිබඳව ගරු මුදල් අමාත්‍යවරයා වෙත රහස්‍ය වාර්තා ඉදිරිපත් කළ අතර දේශීය හා විදේශීය අංශයේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා ගත යුතු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රජයට යෝජනා කළේය. මුදල් නීති

පනතේ 116(1) වගන්තිය අනුව ආර්ථිකයේ ප්‍රවණතා සහ මතු විය හැකි අවදානම් ඇතුළත් *සැප්තැම්බර් 15 රහස්‍ය වාර්තාව* ද ප්‍රතිපත්ති යෝජනා සමග, ව්‍යවස්ථාපිතව දක්වා ඇති දිනය වන විට මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික අවහිරතාවලට හේතු, සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවට එවැනි අවහිරතාවන්ගෙන් විය හැකි බලපෑම් සහ ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා රජය වෙත නිර්දේශ කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණ ඇතුළත් රහස්‍ය වාර්තා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, මුදල් ප්‍රතිපත්ති කමිටුව මෙන්ම, මුදල් මණ්ඩල විදේශ ණය අධීක්ෂණ කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය අංශ ස්ථායිතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩල, පුහුණු කටයුතු කමිටුව සහ පුස්තකාල උපදේශන කමිටුව ඇතුළු අභ්‍යන්තර කමිටු ගණනාවක සාමාජිකත්වය දරමින් අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදේශන අඛණ්ඩව ලබා දුන්නේය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි සහ ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි නිරීක්ෂකයෙකු ලෙස ද අඛණ්ඩව කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අවශ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණ ලබා දීමේ අරමුණින් මුදල් මණ්ඩල රැස්වීම්වලට නිරන්තරයෙන් සහභාගි වූ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ සහාය ඇතිව, සාර්ව ආර්ථික ප්‍රවණතා, ගැටලු සහ කාලීනව වැදගත් වන විෂයන් පිළිබඳව විශ්ලේෂණය කිරීම් සිදු කරමින් වෙනත් නිත්‍ය සහ විශේෂ සැසිවාර මෙන්ම අභ්‍යන්තර කමිටු රැස්වීම් සහ මූල්‍ය ආයතනවල සභාපතිවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් සඳහා සහභාගි විය. තවද, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය සහ අතිගරු ජනාධිපතිතුමා සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු ඇතුළු කමිටු සහ මණ්ඩල ගණනාවක මහ බැංකුව නියෝජනය කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෝ සිය සේවය බාහිර ආයතන වෙත ලබා දුන්හ. විශේෂයෙන්ම, අලිමංකඩ ලුණු ලේවායේ උතුරු කොටස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන ව්‍යාපෘති කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරී කමිටුව, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව, තීරුබදු නීර්ණය කිරීමේ කමිටුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන හා තොරතුරු පිළිබඳ උපදේශන කමිටුව, සමාජ ආර්ථික සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ ජාතික කමිටුව, පොහොර මිල තීරණය කිරීමේ කමිටුව, ගෑස් සහ තිරිඟු පිටි සඳහා මිල සූත්‍රය හඳුන්වා දීමේ කමිටු, වසංගත තත්ත්වයෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම සඳහා වන විශේෂ කමිටු, ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවේ තෙල් ප්‍රසම්පාදනය හා සම්බන්ධ ණය පිරිවැය පිළිබඳ මූලික අධ්‍යයනයක් සිදු කිරීම සඳහා වන කමිටුව, වසර 13ක අධ්‍යාපනය සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ උපදේශන කමිටුව සහ ජීවන වියදම පාලනය කිරීම සඳහා වන කමිටුව යනාදී කමිටු ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් නියෝජනය කරන ලදී. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීහු, සාර්ථක වීමේ විභවයක් ඇති කර්මාන්ත (Winning industries), ඉන්ධන මිලකරණ යාන්ත්‍රණ, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන්හි හැසිරීම සහ ප්‍රතිපත්ති නියම කිරීම්, කාබනික කෘෂිකර්මාන්තය වෙත යොමු වීමේදී වන ආර්ථිකමය බලපෑම්, කංසා වගාව නීතිගත කිරීම සහ බලශක්ති ක්ෂේත්‍රයේ අවශ්‍යතා ඇතුළු කාලීන අවශ්‍යතා පිළිබඳ විශ්ලේෂණ ක්‍රියාකාරීව සිදු කළහ. තවද, කොළඹ වරාය නගරය ඉදි කිරීමෙන් වන ආර්ථිකමය බලපෑම් සහ එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය නෞකාවෙන් සිදු වූ ව්‍යසනයේ බලපෑම ඇතුළු විවිධ කරුණු සම්බන්ධයෙන් තාක්ෂණික විශේෂඥ වාර්තා සැපයීම මගින් බාහිර පාර්ශ්ව වෙත සහය ලබා දෙන ලදී.

## 7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය ද ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනත යටතේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් වන, එහි ප්‍රමුඛතම ප්‍රකාශනය, 2020 සඳහා වන මහ බැංකු වාර්ෂික වාර්තාව නිල භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. නැවත ඉහළ ගිය වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ මෙහෙයුම් දුෂ්කරතා සහ අභියෝග මධ්‍යයේ වුව ද, 2021 වසරේ අප්‍රේල් මස අවසානයේදී වාර්ෂික වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, එය මහජනතාව වෙත ද ඉදිරිපත් කරන ලදී. 2021 වසරේ ඔක්තෝබර් මාසයේදී අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයෝගයද ඇතිව *මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2021 සුවිශේෂ සිදුවීම් සහ 2022 අපේක්ෂා* නමැති මහ බැංකුවේ අනෙක් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශනය ද සම්පාදනය කර එළිදක්වන ලදී. 2021 වසරේ ඔක්තෝබර් 01 වන දින මහ බැංකු අධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද *සය මාසික පෙර දැක්ම* ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, විශේෂයෙන්ම ආර්ථික ක්‍රියාකාරකම්වලට අවහිරතා ඇති වන විට විවිධ බාහිර පාර්ශ්වයන්ගෙන් එල්ල විය හැකි සෘණාත්මක සමපේක්ෂණ සඳහා ප්‍රතිචාර දැක්වීමට සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ක්‍රමවේද හරහා සාමාන්‍ය ජනතාවට කාලානුරූපීව නිවැරදි ආර්ථික, මූල්‍ය සහ ප්‍රතිපත්තිමය තොරතුරු බෙදා හැරීමට කැපවිය. මෙම ක්‍රියාවලියේ දී, මහ බැංකුවේ මංගත පුස්තකාලය තුළ දෛනික, සතිපතා සහ මාසික සංඛ්‍යාන දත්ත යාවත්කාලීන කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ අතර, මුදල් ප්‍රතිපත්ති විවරණ සහ විදේශීය අංශයේ ප්‍රවණතා පිළිබඳ මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන ලදී. ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සම්පාදිත සංඛ්‍යාන දත්ත මුද්‍රා හරින ලද අතර, සාමාජික රටක විනිවිදභාවය සහ විවෘතභාවය වැඩි දියුණු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සඳහන් කර ඇති විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයන්ට අනුගතව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

නිරන්තරයෙන්ම කටයුතු කරන ලදී. තවද, වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය සහ නිල විදේශ සංචිතවල විනිමය සංයුතිය යන දත්ත ගබඩා සඳහා දත්ත සම්පාදනය කරන ලදී.

## 7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

මහ බැංකුවේ පර්යේෂණ අංශය ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව තුළ පර්යේෂණ පසුබිමක් අඛණ්ඩව ප්‍රවර්ධනය කළ අතර, එමගින් කාලීන වැදගත්කමක් සහිත විෂයයන් පිළිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණ කටයුතු පවත්වාගෙන ගියේය. පර්යේෂණ ආශ්‍රිත කාර්යයන් සඳහා වගකීම දරන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර කමිටුවක් ලෙස කටයුතු කරන පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් වසර පුරා දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් සිදු කරමින් පර්යේෂකයන්ට මග පෙන්වීම ඇතුළු පර්යේෂණ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගි විය. 2021 වසරේ අප්‍රේල් මාසයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි පර්යේෂකයන් විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අතථ්‍ය සම්මන්ත්‍රණයේදී අප රටෙහි අත්දැකීම් ඇසුරින් "*Economic Modelling and Forecasting - Practices in Central Banks*" යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. 2021 වසරේ ජූනි මාසයේදී පවත්වන ලද දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ පර්යේෂණ සමුළුවේදී "*The COVID-19 Pandemic in the SAARC Countries*: *Policy Responses and its Impact*" යන මැයෙන් තවත් පර්යේෂණ පත්‍රිකාවක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි නිලධාරියෙකු විසින් ඉදිරිපත් කරන ලදී. අඛණ්ඩව දෙවන වසරටත් ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සහයෝගීතාව ඇතිව 2021 වසරේ සැප්තැම්බර් මාසයේදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් "*Emerging Issues for Macroeconomic Stability*" යන තේමාව යටතේ ඒකාබද්ධ වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ පාර්ශ්වකරුවන් සමඟ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සිය ඒකාබද්ධ පර්යේෂණ කාර්යයන් මංගත සම්මන්ත්‍රණයෙහිදී ඉදිරිපත් කළ අතර, එම පර්යේෂණ පත්‍රිකා දැනටමත් පාර්ශ්වකරුවන් විසින් සමාලෝචනය කළ පිළිගත් ජාත්‍යන්තර සඟරාවල ප්‍රකාශයට පත්කර හෝ ප්‍රකාශයට පත් කිරීමට සලකා බලමින් හෝ සිටිනු ලැබේ. තවද, 2021 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී පවත්වන ලද ආසියානු සංවර්ධන බැංකු ආයතනය විසින් සත්කාරකත්වය දරන ලද අතථ්‍ය සම්මන්ත්‍රණවලදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය දේශීය හා ජාත්‍යන්තර සමුළුවල ඔවුන්ගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කළේය. මේ අතර, 2021 වසරේදී පර්යේෂණ උපදේශක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ මහ බැංකුවේ ප්‍රධාන පර්යේෂණ සඟරාව වන *මාණ්ඩලික පත්‍රිකාවේ* වෙළුම් දෙකක් ප්‍රකාශයට පත් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී. පර්යේෂණ උපදේශක මණ්ඩලයේ සාමාජිකයින් විසින් විශ්වවිද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි සිසුන් සඳහා අධීක්ෂණ සේවා සපයන ලද අතර, මහ බැංකුවේ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයේ අවශ්‍යතා සපුරාලීම සඳහා පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා අඛණ්ඩව ඇගයීමට ලක් කරන ලදී.

වසර තුළදී, සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහාය ඇතිව, මහ බැංකුව තුළදීත් ඉන් පිටතදීත්, උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ ආර්ථික විද්‍යා දැනුම වැඩිදියුණු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය ප්‍රවීණතා හුවමාරු කර ගැනීම අඛණ්ඩව සිදු කළේය. එවැනි සහයෝගීතා තුළින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් අතර පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන් ද විය. මහ බැංකු වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පැවැත්වූ ප්‍රධාන ප්‍රසිද්ධ දේශනයක් වූයේ *2020 වසරේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන ශ්‍රී ලංකා ආර්ථිකයේ තත්ත්වය, අභියෝග සහ ඉදිරි දැක්ම* යන මැයෙන් භාෂා ත්‍රිත්වයෙන්ම මංගත ක්‍රමවේද ඔස්සේ පවත්වන ලද දේශනයයි. පුද්ගල සහභාගීත්වයකින් යුතු දැනුම්වත් කිරීමේ වැඩසටහන්වලට අමතරව, මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන්, මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශීය අංශයේ ප්‍රතිපත්ති සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සම්බන්ධයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මංගත ක්‍රමවේද ඔස්සේ අධ්‍යාපන වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. එමෙන්ම, අ.පො.ස. උසස් පෙළ ආර්ථික විද්‍යා සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ අභිවෘද්ධිය පිණිස බැංකු විදු පියෙස විසින් සංවිධානය කරන ලද, පිළිවෙළින්, සිංහල සහ දෙමළ භාෂාවලින් විකාශය වූ *තක්ෂිලාව* සහ *අරිවුටෘ* යන වාර්ෂික රූපවාහිනී අධ්‍යාපනික දේශන මාලාව සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කාර්ය මණ්ඩලයේ දායකත්වය ලබා දෙන ලදී.

## 7.6 ජාත්‍යන්තර සම්බන්ධතා

බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන සමඟ සම්බන්ධතා පවත්වා ගන්නා මූලික ආයතනය ලෙස, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රජය සහ මහ බැංකුව වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානය සහ අග්නිදිග ආසියානු මහ බැංකු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා පහසුකම් සැලසීය. විශේෂයෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, IV වන වගන්තිය යටතේ වන උපදේශනය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මෙහෙයුම සහ 2021 ජූලි මාසයේ මංගත ක්‍රම ඔස්සේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යමණ්ඩල හා සම්බන්ධ වීම මෙන්ම දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අධිපතිවරුන්ගේ 41වන සහ 42වන මංගත කණ්ඩායම් රැස්වීම් සඳහා පහසුකම් සැලසූ අතර අග්නිදිග ආසියානු මහ බැංකු විධායක කමිටුවේ

සහ මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම්වලට සහභාගී විය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ තොරතුරු ලබා දෙමින් සහ අදහස් හුවමාරු කර ගනිමින්, රජය සහ ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වැනි ප්‍රධාන බහුපාර්ශ්වික සංවර්ධන බැංකු අතර සම්බන්ධීකරණ කටයුතු සඳහා සහාය විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජාතීන්ගේ ආසියා ශාන්තිකර ආර්ථික හා සමාජීය කොමිසමේ 77වන සැසිවාරය සහ එක්සත් ජාතීන්ගේ වෙළඳ හා සංවර්ධන කටයුතු පිළිබඳ සමුළුවේ අමාත්‍ය මණ්ඩල සමුළුවේ 15වන සැසිවාරය සඳහා විදේශ අමාත්‍යවරයා විසින් පත් කරන ලද නියෝජිත කණ්ඩායම නියෝජනය කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් වසර තුළ දී මංගත ක්‍රමවේද ඔස්සේ පැවති ආයෝජක රැස්වීම්වලදී අවශ්‍ය කෙරෙන තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා දුන් අතර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ඇතුළු ආර්ථිකයේ බාහිර පාර්ශ්වකරුවන් සමඟ අඛණ්ඩ සාකච්ඡා පවත්වා ගෙන යන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (සේ.අ.අ. දෙපාර්තමේන්තුව) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ (සේ.අ.අ. පනතේ) ප්‍රතිපාදන යටතේ මුදල් මණ්ඩලයට එහි බලතල ක්‍රියාත්මක කිරීමට, රාජකාරීන් ඉටුකිරීමට සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලබයි. සේ.අ.අ. පනතේ විධිවිධානවලට අනුව, පනතේ සාමාන්‍ය පරිපාලනය කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර, අරමුදල් කළමනාකරණය සඳහා වූ සියලු බලතල, කාර්යයන් සහ වගකීම් අරමුදලේ භාරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත.

සේ.අ.අ. පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු සහ අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම එක්රැස් කිරීම, අරමුදලෙහි මුදල්වල භාරය දැරීම, එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගැනීම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරනු ලැබූ තැනැත්තන් හට පනත යටතේ හිමි ප්‍රතිලාභ ගෙවීම, පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සැකසීම, එහි පිටපතක් කම්කරු විෂය සම්බන්ධ ඇමතිතුමා වෙත ලබා දීම සහ එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම යන කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

2021 වසරේ දී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර, කම්කරු කොමසාරිස්වරයා සමඟ ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වල සාරාංශයක් පහත දැක්වේ.

### (අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්

2021 වසරේ දායක මුදල් ලැබීම් රු.බිලියන 150.7 සිට පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 165.7 දක්වා සියයට 9.9කින් ඉහළ ගිය අතර, අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවූ ප්‍රතිලාභ ද රු.බිලියන 118.2ක් දක්වා වැඩි වූ අතර, එය 2020 වසරට සාපේක්ෂව සියයට 7.7ක වැඩි වීමකි (සංඛ්‍යා සටහන II-8). ඒ අනුව, 2021 වසරේ දී ශුද්ධ දායක මුදල් ලැබීම් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු), 2020 වසරේ පැවති රු.බිලියන 41.0 හා සැසඳීමේ දී රු.බිලියන 47.5 ක් ලෙස දැක්විණි.

### (ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2021 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රු.බිලියන 3,166.1ක් වූ අතර, එය 2020 වසර අවසානයේ වූ රු.බිලියන 2,824.3 හා සසඳන විට සියයට 12.1ක වර්ධනයක් විය. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2020 වසරේ රුපියල් බිලියන 2,767.8ක්ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම (සාමාජික ශේෂ) 2021 අවසන් වනවිට රු.බිලියන 3,066.9 දක්වා සියයට 10.8කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-8).

**II-8 සංඛ්‍යා සටහන**

**අරමුදල පිළිබඳ තෝරා ගත් මූලික දත්ත**

| අයිතමය | 2020 | 2021(අ) | වෙනස(%) |
|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 2,824.3 | 3,166.1 | 12.1 |
| සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (රුපියල් බිලියන) | 2,767.8 | 3,066.9 | 10.8 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 19.8 | 19.8 | - |
| දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 2.6 | 2.3 | (11.5) |
| දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 17.2 | 17.5 | 1.7 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 150.7 | 165.7 | 9.9 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 109.7 | 118.2 | 7.7 |
| ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන) | 41.0 | 47.5 | 15.9 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 197,401 | 179,681 | (9.0) |

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඇ) අරමුදලෙහි ආයෝජන කටයුතු

සේ.අ. අරමුදලෙහි අරමුදල් කළමනාකරණ කටයුතු සම්බන්ධ තීරණ සේ.අ.අ. ආයෝජන කමිටුව විසින් ගනු ලබයි. මෙම කමිටුව මගින් දෛනිකව අරමුදලේ මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගනිමින් ද්‍රවශීලතා මට්ටම තක්සේරු කිරීම හා ආයෝජන අවස්ථා ඇගයීම සිදු කරනු ලබයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව විසින් මාසිකව ආයෝජන කටයුතු

අධීක්ෂණය කරනු ලබන අතර මුදල් මණ්ඩලය අනුමත කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මූලික කර ගනිමින් උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය මග පෙන්වීම් සපයනු ලබයි. තවද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් අරමුදල් ආයෝජන සම්බන්ධ ගනුදෙනු සහ ආයෝජන කළඹ පිළිබඳව මුදල් මණ්ඩලය මාසිකව දැනුම්වත් කරනු ලබන අතර, එමගින් ආයෝජන කටයුතුවල අධීක්ෂණය ශක්තිමත් කරනු ලබයි.

යථෝක්ත වර්ෂයේ දී, ඉතා අඩු පොලී අනුපාතිකයක් සහ කොවිඩ්-19 වසංගතය මගින් ඇති වූ අස්ථාවරභාවයන් මධ්‍යයේ අරමුදලෙහි ආයෝජන කටයුතු පවත්වාගෙන යන ලදී. එහිදී, අරමුදලෙහි උපායමාර්ගික අරමුදල් වෙන් කිරීමට අනුකූල වෙමින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් එහි අරමුදල්වලින් බහුතර ප්‍රමාණයක් රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය කරන ලදී. අඩු පොලී අනුපාතිකයන් මගින් සමස්ත ආයෝජන කළඹ මත ඇති වන බලපෑම සමනය කරනු පිණිස, සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් කෙටි හා මධ්‍ය කාලීන රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කරන ලද අතරම, අඩු පොලී අනුපාත තත්ත්වයක් තුළ සාමාජිකයන්ට සාධාරණ පොලී අනුපාතිකයක් ලබා දීමේ අවශ්‍යතාවය සලකා බලා දිගු කාලීන රාජ්‍ය සුරැකුම්පත් වලද (වසර 5ට වඩා වැඩි) ආයෝජනය කරන ලදී. එමෙන්ම, දේශීය කොටස් වෙළෙඳපොළ තුළ පැවති ධනාත්මක තත්ත්වයන්හි වාසිය ලබා ගනිමින් තෝරාගත් කොටස් විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමට ද පියවර ගන්නා ලදී. පැවති අඩු පොලී අනුපාත තත්ත්වය මෙන්ම, අරමුදලෙහි ණය අවදානම අඩු කිරීම සඳහා ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත සමාගම්හි ආයෝජනය කිරීමේ වැදගත්කම ද සැලකිල්ලට ගත යුතු වූ බැවින් මෙම කාලය තුළ දී පැවති සාංගමික ණයකරවල ආයෝජන අවස්ථා සීමාසහිත විය.

ඒ අනුව, 2021 වසර අවසාන වනවිට පැවති ආයෝජන කළඹ රුපියල් බිලියන 3,173.3ක් වූ අතර, එහි සංයුතිය සියයට 93.2ක් රාජ්‍ය සුරැකුම්පත් ද, සියයට 3.8ක් සමාගම් කොටස් ද, සියයට 0.8ක් සාංගමික ණයකර ද, සියයට 1.8ක් ස්ථාවර තැන්පතු සහ ඉතිරි සියයට 0.4 ප්‍රති විකුණුම් ගිවිසුම්වලින් ද සමන්විත විය.

**(ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්**

සේ.අ.අ. දෙපාර්තමේන්තුව 2021 අවසානයේ පැවති සාමාජික ශේෂයන් මත සියයට 9.00ක පොලී අනුපාතයක් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, පසුගිය වසර 10 තුළ දී මෙන්ම, සේ.අ. අරමුදලට, එහි සාමාජිකයින් වෙත ඉහළ පොලියක් ගෙවීමට හැකි විය.

**(ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම**

**(i) සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම**

සක්‍රීය සාමාජිකයින්ට අරමුදලෙහි ලියාපදිංචි වී ඇති ඔවුන්ගේ සේවායෝජකයන් හරහා වසරකට දෙවරක් සාමාජික ගිණුම් ප්‍රකාශ බෙදා හරිනු ලැබේ. ඒ අනුව, 2020 වසරේ පළමු භාගයට සහ දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශ 2021 වසරේ දී බෙදා හරින ලදී (සංඛ්‍යා සටහන II-9).

**II-9 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශ**

| කාලපරිච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශ සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2020 පළමු අර්ධ වර්ෂය | 69,998 | 1,999,486 |
| 2020 දෙවන අර්ධ වර්ෂය | 77,912 | 2,451,346 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් සහතිකපත් නිකුත් කිරීම**

2021 වසර තුළ දී සේ.අ. අරමුදලෙහි නිවාස ණය සුරැකුම් ක්‍රමය යටතේ රුපියල් මිලියන 5,423ක ප්‍රමාණයකින් යුතු වූ නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ගේ ගිණුම් ශේෂ මත ණය සුරැකුම්පත් 9,068ක ප්‍රමාණයක් සහභාගීවන ණය ලබා දෙන ආයතන වෙත නිකුත් කරන ලදී (සංඛ්‍යා සටහන II-10). තවද, 2020 වසර තුළ සාමාජිකයන් විසින් නොගෙවූ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,573කට ආසන්න මුදලක් 2021 වසරේ දී අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, සහභාගීවන ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

**II-10 සංඛ්‍යා සටහන**

**නිවාස ණය සුරැකුම් පහසුකම්**

| වසර | සහතිකපත් නිකුත් කරන ලද ගණන | අනුමත කරන ලද නිවාස ණය මුදල (රුපියල් මිලියන) | සහභාගීවන ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2017 | 10,998 | 4,946 | 2,485 |
| 2018 | 10,036 | 4,974 | 2,759 |
| 2019 | 10,022 | 5,097 | 3,164 |
| 2020 | 8,537 | 4,497 | 3,321 |
| 2021 | 9,068 | 5,423 | 3,573 |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii) පූර්ව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය**

2012 අංක 02 දරන සේ.අ.අ. (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද රෙගුලාසි අනුව, පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයක්, හඳුන්වා දෙන ලදී. ඒ අනුව, සාමාජික ගිණුම් ශේෂ රු.300,000ට වැඩි සහ සේවා කාලය වසර 10කට වැඩි කාලයක් සේ.අ. අරමුදලට දායක මුදල් ගෙවනු ලබන සක්‍රීය සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් රු. මිලියන 2ක උපරිමයකට යටත්ව, සියයට 30ක මුදලක් නිවාස ඉදිකිරීම් හෝ වෛද්‍ය ප්‍රතිකාර සඳහා ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත. මෙම ක්‍රමය සඳහා සාමාජිකයින්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ක්‍රමය යටතේ 2021 වසර තුළ දී ප්‍රතිලාභීන් 16,554 ක් වෙත රුපියල් බිලියන 8.8 ක්

නිදහස් කර ඇති අතර, 2021 වසර අග වනවිට රුපියල් බිලියන 107.1 ක මුදලක් ප්‍රතිලාභ ලාභීන් 197,057ක් වෙත ගෙවා ඇත.

**(iv) සේ.අ.අ. ජංගම සේවාවන්**

සේ.අ.අ. දෙපාර්තමේන්තුවට පැමිණීමෙන් සාමාජිකයෙකු හට ලබාගත හැකි සේවාවන් සියල්ලක්ම පාහේ ලබා දෙමින් 2021 වසරේ දී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් ජංගම සේවා වැඩසටහනක් පවත්වන ලදී. සේ.අ.අ. ශේෂ ප්‍රකාශ නිකුත් කිරීම, සේ.අ.අ. සාමාජික දත්ත සංශෝධනය, අවිනිශ්චිත ගිණුම්හි පැවති ශේෂ නිරවුල් කිරීම, සේ.අ.අ. ගිණුම් තොරතුරු සංශෝධනය, කෙටි පණිවිඩ හා අන්තර්ජාලය හරහා සාමාජික ශේෂ පිරික්සුම පිළිබඳ දැනුම්වත් කිරීම යන සේවාවන් මෙහිදී සපයන ලදී. තවද, විද්‍යුත් මාධ්‍ය හා ඍජු හර කිරීම භාවිතයෙන් දායක මුදල් බැර කිරීමේ ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම හා සමස්ත සේ.අ.අ. ක්‍රියාපටිපාටි පිළිබඳ උපදේශනයන් ද සිදු කරන ලදී. කෙසේවෙතත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි සේ.අ.අ. ජංගම සේවා පැවැත්වීම සීමා කරන ලදී.

**(v) විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් සේවක අර්ථසාධක දායක මුදල් රැස්කිරීම**

2021 වසර සේ.අ.අ. දෙපාර්තමේන්තුව සඳහා කැපී පෙනෙන වසරක් වූයේ, පවතින විද්‍යුත් දත්ත වාර්තා රැස්කිරීමේ සහ විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා නවීකරණය කරන ලද නිල වෙබ් අඩවිය හරහා නව යාන්ත්‍රණයක් හඳුන්වා දුන් බැවිනි. එමගින් සේවායෝජකයින්ට සේ.අ.අ. නිල වෙබ් අඩවිය හරහා ඔවුන්ගේ විද්‍යුත් දත්ත වාර්තා ඉදිරිපත් කිරීමට සහ 'LankaPay Online Payment Platform (LPOPP) හරහා නියෝජිත වාණිජ බැංකු හරහා මාර්ගගතව ගෙවීමට හෝ චෙක්පතක් මගින් හෝ ඍජු හර ක්‍රමය යටතේ ඊට අදාළ දායක මුදල් ගෙවීමට හැකියාව ලබා දී ඇත. 2021 වර්ෂය අග වන විට ලංකා බැංකුව, මහජන බැංකුව සහ කොමර්ෂල් බැංකුව මෙකී පහසුකම සම්බන්ධයෙන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වූ බලපත්‍රලාභී වාණිජ බැංකු වේ. නව ක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ නිවැරදි ලෙස දායක මුදල් ගෙවා පැය 24ක් ඇතුළත සාමාජික ගිණුම් යාවත්කාලීන වීමයි. තවද, මෙම ක්‍රමය යටතේ සේවායෝජකයන් හට තමන් සේ.අ.අ. වෙත යොමු කරන දායකත්ව විස්තර වාර්තාවේ දත්ත, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ දත්ත සමඟ ස්වයංක්‍රීයව සන්සන්දනය වීමෙන් එහි නිරවද්‍යතාවය සහතික වීමේ පහසුකම ද ලැබී ඇත. මෙම ක්‍රමය තුළින් නිරවද්‍ය සේ.අ.අ. දත්ත සමුදායක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියෙහි සැලකිය යුතු දියුණුවක් වනු ඇති අතර එමගින් අනාගතයේ දී අදාළ සේවායෝජකයින්ට සිය සාමාජිකයින්ගේ තොරතුරු සංශෝධන සඳහා වන අවශ්‍යතාවයක් මතු නොවනු හෝ අවම වනු ඇත.

2021 වසර අවසාන වනවිට, ආසන්න වශයෙන් සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 88ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 10,069 සිට 11,260 දක්වා වැඩි වූ අතර, අදාළ ගෙවීම් මාසික සමස්ත දායක මුදලෙන් සියයට 88ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි. මීට අමතරව, ප්‍රමාදයකින් තොරව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සඳහා සාමාජිකයන්ගේ තොරතුරුවල ඇති විෂමතාවයන් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගැනීමේ වැදගත්කම පිළිබඳව සේවායෝජකයින් දැනුම්වත් කිරීම, විද්‍යුත් ක්‍රමය මගින් දායක මුදල් ගෙවීම සහ ඒ තුළින් සේ.අ.අ. පාර්ශ්වකරුවන් හට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ තවදුරටත් දැනුම්වත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

**(vi) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

2021 වසර තුළ රට තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ බාධා වීම් හමුවේ සුළු පසුබෑමක් ඇති වුව ද, සාමාජිකයින් 18,758ක් ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස භාවිතා කරන ජාතික හැඳුනුම්පත් අංකය සහ එහි විස්තර අනුව නැවත ලියාපදිංචි කරන ලදී. ඒ අනුව, 2021 වසර අවසන් වනවිට අරමුදලේ නැවත ලියාපදිංචි වූ මුළු සාමාජිකයන් සංඛ්‍යාව 1,656,019කි.

තවද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ (පු.ලි.දෙ.) දත්ත ගබඩාවට ලබා ගත් ප්‍රවේශය මත පදනම්ව, 2022 දී ක්‍රියාකාරී සාමාජිකයින් වැඩි සංඛ්‍යාවක් ආවරණය වන පරිදි සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා 2021 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් මූලික පියවර කිහිපයක් ගන්නා ලදී.

**(vii) සාමාජිකයින්ට ලබා දෙන වෙනත් සේවා**

2021 වසරේ දී පැවති, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශයට එහි කටයුතු සිදු කර ගැනීම වඩාත් අභියෝගාත්මක විය. වසර තුළ දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවායෝජක පැමිණීම් 96,561 ක් වාර්තා වූ අතර, දුරකථන ඇමතුම් හරහා පුද්ගලයින් 50,071 දෙනෙක් ද ඊමේල් හරහා සාමාජිකයින් 11,059 දෙනෙක් ද විමසීම් සිදු කර ඇත. තවද, සාමාජිකයින්, සේවායෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපි ප්‍රමාණය 76,759ක් විය.

2021 වර්ෂයේ දී, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ වාර්තා සංශෝධන අංශය සාමාජිකයින්ගේ නම සහ ජාතික හැඳුනුම්පත් විස්තර නොගැළපීම්, ගිණුම් අංක නිවැරදි කිරීම සහ අදාළ සාමාජිකයින්ගේ නිවැරදි ගිණුම් ශේෂයන් යාවත්කාලීන කිරීම සඳහා වාර්තා සංශෝධන 33,400ක් සිදු කර ඇත. පු.ලි.දෙ. හි දත්ත ගබඩාවට ප්‍රවේශය ලැබීමත් සමඟ, විශේෂයෙන් සාමාජිකයින්ගේ අනන්‍යතා සත්‍යාපන කිරීමේ වාර්තා සංශෝධන අදියරේ දී, තම සාමාජිකයින්ට කඩිනමින් සේවයක් සැපයීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුවට හැකි විය.

**(ඊ) ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය**

සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ හා ධාරිතා සංවර්ධන අංශය සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිය නවීකරණය සඳහා ලෝක බැංකුව විසින් යෝජිත මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියේ මෙහෙයවන්නා ලෙස කටයුතු කිරීමට සහ දැනට සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වෙමින් පවතින ඕනෑම නව්‍යතා සම්පාදනයක් වෙනුවෙන් අවශ්‍ය සහාය දැක්වීමේ අරමුණින් 2021 අප්‍රේල් මස ස්ථාපනය කරන ලදී.

2021 වර්ෂයේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය එහි සාමාජිකයින්ට මාර්ගගතව දායක මුදල් ගෙවීමේ වේදිකාවක් ද සමගින් සාර්ථකව නැවත දියත් කිරීමට සමත් විය. 2022 වසර තුළ ජංගම දුරකථන පදනම් කරගත් ගෙවීම් ද්වාරයකින් සාමාජිකයින්ට පහසුකම් සපයනු ලැබීම සඳහා මෙම වේදිකාව තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කරමින් පවතී.

2021 අවසාන කාර්තු දෙක තුළ සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් සිය ව්‍යාපෘති කළමනාකරු වශයෙන් කටයුතු කිරීම සඳහා තෝරා ගනු ලැබූ ඉන්දියාවේ ප්‍රයිස්වෝටර් හවුස් කූපර්ස් ආයතනය සමඟ ගිවිසුම්ගත වීමේ කටයුතු අවසන් කිරීම සඳහා ක්‍රියා කරන ලදී. සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම, නවෝත්පාදන හඳුන්වා දීම සහ අවසානයේ දී වැඩිදියුණු කළ සාමාජික සේවා අන්තර්ගත නවීනතම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුමක් හඳුන්වාදීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මෙම උපදේශන වැඩපිළිවෙළ සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 9. පහසුකම් කළමනාකරණ

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු කාර්යාල පරිශ්‍රයන් නිසි පරිදි පවත්වාගැනීම සහ අලුත්වැඩියාවන් සිදු කිරීම මගින් වඩා යහපත් වූ කාර්යාල වටපිටාවක් නිර්මාණය කිරීමේ සිය මූලික වගකීම සමාජය තුළ පැතිර පැවති වසංගත තත්ත්වය හමුවේ පවා ගෙවීගිය 2021 වසර තුළ තවදුරටත් ඉටු කරන ලදී. එම අරමුණු තවදුරටත් සාක්ෂාත් කරගනුවස්, සිය දිවියේ තෙවන දශකය පසුකරන මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ල තුළ පිහිටි වැසිකිළි පද්ධතීන් නවීකරණය කිරීමත් පැන්ට්‍රි ඒකක ප්‍රතිස්ථාපනය කිරීම, හඳුනාගත් ස්ථානවල දියවරනය කිරීම, හඳුනාගත් යාන්ත්‍රික සහ විදුලි පද්ධතීන් ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු කඩිනමින් ඉටුකිරීමේ වැඩ පිළිවෙලක් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී දියත්කරන ලදි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව සතු වටිනා සම්පතක්වන ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සතුව ඇති සන්නිවේදන පද්ධතිය නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත වඩාත් ස්ථායි සේවයක් සපයන පද්ධතියක් බවට පර්වර්තනය කිරීම මෙම වසර තුළ සම්පූර්ණ කිරීමට හැකි විය. ගෙවී ගිය වසර තුළ අභිනවයෙන් හඳුන්වාදුන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නව දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය ඉඩපහසුකම් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සැපයීමට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිය මූලික කාර්යක් ලෙස සලකා ඉටු කිරීමට පියවර ගන්නා ලදී. දෙපාර්තමේන්තුව යටතේ දැනට පවතින සියලු රථ වාහන අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ පවතින සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් හැකි උපරිම අයුරින්, එහි ප්‍රධාන ගොඩනැගිල්ල තුළින් ලබා දීමට හැකි වීම සාධනීය ඉදිරි පියවරක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ තීරණයකට අනුව යමින්, මහ බැංකුව සතුව පැවති ලොයිඩ් ගොඩනැගිල්ල, අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා රජය වෙත පවරා දීම මෙම වසර තුළ සිදුවිය. එම ගොඩනැගිල්ල තුළ පවත්වාගෙන ගිය සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අංශයන් කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව සතු වයිට්එවේස් ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීම එම ගොඩනැගිල්ල කුලී පදනම මත ලබාගෙන සිටි පාර්ශ්වය ඉන් අර්ධ වශයෙන් ඉවත් වීමත් සමඟ සිදු කරන ලදී.

රාජගිරියේ පිහිටි බැංකු අධ්‍යයන කේන්ද්‍රය තුළ ඉදිකරන ලද සවරින් අධ්‍යයන කේන්ද්‍ර ගොඩනැගිල්ල සඳහා ආරක්ෂණ කැමරා පද්ධතියක් සහ පිවිසුම් පාලන පද්ධතියක් ස්ථාපනය කිරීම 2021 වසර තුළ නිම කරන ලදී. කාලීන අවශ්‍යතා හඳුනාගෙන, නවීන අභ්‍යන්තර ස්වයංක්‍රීය දුරකථන හුවමාරු පද්ධතියක් මාතර පිහිටි මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලයේ ස්ථාපනය කිරීම සිදු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය සේවක සුභසාධනය අරමුණු කොටගෙන පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනයන්හි අලුත්වැඩියා සහ නවීකරණ කටයුතු නොකඩවා සිදුකරගෙන ගිය අතර නුවරඑළිය නිවාඩු නිකේතනයේ පැවති පැන්ට්‍රි ඒකක ප්‍රතිස්ථාපනය පසුගිය වසර තුළ සිදු විය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාකාරිත්වය ප්‍රාදේශීය මට්ටමින් වඩාත් ශක්තිමත් කරමින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් එහි ප්‍රවාහන අවශ්‍යතා සඳහා බාහිර ප්‍රවාහන සැපයුම්කරුවන් (රියදුරු සහිත වාහන) සපයාදීම සිදු විය. ඊට සමගාමීව, නැවත නව වාහන මිලදී ගැනීම සිදුවනතෙක්, දැනට මහ බැංකුව සතුව පවතින සියලු රථවාහන අවශ්‍ය අලුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු සිදු කිරීම මගින් ඉහළ ධාවන තත්වයකට උසස්කිරීම සිදු කරන ලදී. තව ද, මහ බැංකුවේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තු මගින් නම්කරන ලද සේවකයින් සඳහා විශේෂ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කළ අතර ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින් සඳහා ම වෙන් වූ කාර්යාල ප්‍රවාහන පහසුකම් ක්‍රියාත්මක කිරීම මගින් වඩා ආරක්ෂාකාරී වටපිටාවක් හා සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.

ගෙවී ගිය වසර පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉතා අභියෝගකාරී වසරක් වූයේ වසංගත තත්ත්වය නිසා ගමනාගමනය සීමා කිරීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා

ගැනීමට සිදු වීම හේතුවෙනි. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහ එහි පැමිණෙන අමුත්තන් සඳහා කොවිඩ්-19 ආශ්‍රිත විශේෂ සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී.

තව ද, සිරිත් පරිදි, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩ ව සිදු කර ගෙන යනු ලබන අත්‍යවශ්‍ය සේවාවන්, ප්‍රවාහන සේවාවන් සහ සන්නිවේදන පහසුකම් උක්ත කාල පරාසය තුළ සාර්ථක ලෙස සැපයීම සිදු විය.

## 10. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2002 වර්ෂයේ සිට මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රාමුව අදාළ කර ගන්නා ලදී. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 17 හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුලත් වේ.

### 10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරන මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2020 වසරේ දෙසැම්බර් මාසය හා 2021 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම උදෙසා පිළියෙල කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්ත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම උදෙසා අවශ්‍ය වන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූල වීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කර ඇත. 2021 වර්ෂයේ දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ 11 වන කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

### 10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිඝණකගත අයවැය සැකසුම් පද්ධතියක්" මගින් පිළියෙල කරන ලදී. 2022 වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2021 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2022 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2021 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

### 10.3 අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම

(අ) 2021 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය සිදු කරන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2021 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 5,730 ක් සිදු කරන ලද අතර, ඉන් 5,540ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 190ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) ආසන්න වශයෙන්, 2021 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහ රු. බිලියන 617.94ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 3,412ක් සහ රු. බිලියන 1,396.55ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 631ක් සිදු කර ඇත. මීට අමතරව විදේශීය වශයෙන් ලැබුණු ණයක් සහ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කළ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් විදේශීය බැංකු දෙකක් සමග බැංකු එකඟතා ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී.

### 10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථ සාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමණාකරණය කිරීම සඳහා 2016 මාර්තු මස සිට මෙහෙයුම් ඇරඹූ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කරන ලද වෙන්වූ ඒකකය මගින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන බැංකුවෙහි කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8ක් සහ වෙනත් අරමුදල් 4ක්, නිරාකරණය හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ව්‍යාපෘති අරමුදල් ඇතුළත් අභ්‍යන්තර අරමුදල් 17ක් කළමණාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. මෙම අරමුදල් කළමණාකරන ක්‍රියාවලිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය/ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායිකව වත්කම් ආයෝජනයන් සඳහා වෙන්කිරීම් වෙනුවෙන් වූ ක්‍රියාපටිපාටීන් මගින් පාලනය වේ. තවද, මෙම ක්‍රියාවලිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණ කටයුතු භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මගින් මෙම ආයෝජන කාර්යයන් අධීක්ෂණය කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2021 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6ක 2020 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2021 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 151.7 දක්වා වර්ධනය විය.

**II-11 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ තත්ත්වය - (රු. බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2020 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය | 75.3 | 64.9 |
| නිරාකරණ හා බලගැන්වීම් | 70.9 | 60.4 |
| ප්‍රාදේශීය සංවර්ධන | 5.4 | 6.3 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා | 0.06 | 0.06 |
| **එකතුව** | **151.7** | **131.7** |

### 10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මේ හා සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2021 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 741ක් සහ බැහැර කිරීම් 346ක් සමගින් 2021 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

### 10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමණාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2021 වසර තුළ දී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2021 වසර තුළ දී රු. බිලියන 1.14ක වටිනාකමකින් යුත් 1,000ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

### 10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම් සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2021 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල 152ක්, සහ තාක්ෂණික ඇගයීම් කමිටු 75ක්, නියෝජනය කර ඇත.

## 11. මූල්‍ය පාරිභෝගික සබඳතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනයන්ගේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් 2020 අගෝස්තු මස දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන පිළිබඳව මහජනයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි/දුක්ගැනවිලි සහ විමසීම් සම්බන්ධව කටයුතු සිදු කරන අතරතුර මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් නව රෙගුලාසි හඳුන්වාදීම සඳහා කටයුතු 2021 දි ආරම්භ කරන ලදී. මසකට පැමිණිලි 500ක සාමාන්‍යයක් සහිතව 2021 වසර තුළ දී මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි/දුක්ගැනවිලි 6,186ක ප්‍රමාණයක් ලැබී ඇත. මෙම පැමිණිලි අතුරින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාමාර්ග ගත යුතු බවට නිර්ණය කළ පැමිණිලිවලින් සියයට 94ක් අදාළ මූල්‍ය ආයතනය හෝ අධීක්ෂණ දෙපාර්තමේන්තුව/කාර්යාංශය වෙත ඉදිරිපත් කර ඇත. තවද, මෙම පැමිණිලි/දුක්ගැනවිලි අතුරින් බොහොමයක් කොවිඩ්-19 වසංගතය නිසා කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින් හට සිදු වූ බලපෑම හේතුවෙන් ඉල්ලුම් කළ ණය සහන, ණය ප්‍රතිලේඛන ගත කිරීම, ඉහළ පොලී අනුපාතික, පිළිගත නොහැකි/සදාචාරාත්මක නොවන ක්‍රියාවන් සහ ණය පහසුකම් කලින් පියවීම සම්බන්ධයෙන් විය. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් 2021 අගෝස්තු මාසයේදී පැමිණිලි ඉදිරිපත් කිරීමේ සරල

ආකෘති පත්‍රයක් හඳුන්වා දුන් අතර මෙමගින් පැමිණිලි/ දුක්ගැනවිලිවල සම්පූර්ණත්වය තහවුරු කරන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය ද කාර්යක්ෂම කරනු ඇත. තවද, මෙමගින් මූල්‍ය පාරිභෝගිකයින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලිවල තොරතුරු ස්වයංක්‍රීයව වාර්තා වීමට ඉඩ සැලසෙන අතර එය ප්‍රතිපත්තිමය තීරණ සඳහා අවශ්‍ය කරනු ලබන දත්ත විශ්ලේෂණය කිරීමට ද ප්‍රයෝජනවත් වනු ඇත.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව වෙනත් අදාළ දෙපාර්තමේන්තුවල සහය ද ඇතිව 2021 මැයි මාසයේ දී බාහිරින් ලබා ගත් කාර්ය මණ්ඩලයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය (Contact Center) පිහිටුවන ලදී. මෙම නව සබඳතා මධ්‍යස්ථානය, නවීන තාක්ෂණයකින් යුක්ත ඇමතුම් මධ්‍යස්ථානයක මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය උපාංගවලින් සමන්විත වේ. ඒ අනුව, මෙම සබඳතා මධ්‍යස්ථානය වෙතින් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරී කාලය තුළ භාෂා ත්‍රිත්වයෙන්ම සේවා ලබා ගත හැකි වන අතර එම මධ්‍යස්ථානයට ලැබෙන සියලුම දුරකථන සංවාද පටිගත වීමේ පහසුකම් ද සහිත වේ. තවද, මහජනයා හට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පහසුවෙන් සහ කාර්යක්ෂමව දුරකතනයෙන් සම්බන්ධ වීමේ හැකියාව ලබා දීමේ අරමුණින් ක්ෂණික ඇමතුම් අංක 1935 හඳුන්වා දුන් අතර එමගින් ශ්‍රී ලංකාවේ ඕනෑම දුරකතන ජාලයකින් ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධ විය හැක. ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය මගින් මාසිකව දුරකථන ඇමතුම් 5,000 කට අධික ප්‍රමාණයකට පිළිතුරු සපයනු ලැබේ. තවද, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පාරිභෝගිකයින්ගේ දැනුම සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම් ඉස්මතු කරමින් අන්තර්ජාල පෝස්ටරයක් (Web Poster) ප්‍රකාශයට පත් කරන ලද අතර සම්මන්ත්‍රණ, වෙබිනාර් (webinar) සහ සම්මුඛ පරීක්ෂණ ඇතුළු පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 12. මූල්‍ය බුද්ධි ඒකකය

කොවිඩ්-19 ගෝලීය වසංගතයත් සමග පැන නැගුණු අභියෝග රාශියක් මධ්‍යයේ, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය එහි දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් සමග එක්ව, ශ්‍රී ලංකාව තුළ ඵලදායී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ යාන්ත්‍රණය ප්‍රධාන නීති තුනක් මත ගොඩනගා ඇත. එනම්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත වේ. අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවා ඇති අතර එම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි රටේ ප්‍රමුඛ නියාමකයා ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි පාලන තන්ත්‍රය යටතේ බොහෝ මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් වෙත ළඟා වී මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ (මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ සහ න්‍යෂ්ටික අවි මූල්‍යකරණය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්) වලට අනුකූල වීම සඳහා ක්‍රියාකර ඇත.

මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කර්තව්‍යයන් අතරට වර්තමාන වෙළඳපල වර්ධනයන් සහ ජාත්‍යන්තර හොඳම භාවිතයන්ට අනුකූලව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි වීම සඳහා අදාළ පනත්, රෙගුලාසි සහ රීති සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම; උපායමාර්ගික සහ මෙහෙයුම් විශ්ලේෂණ පැවැත්වීම හරහා සුදුසු නීති බලාත්මක කිරීමේ ආයතන සහ අධීක්ෂණ අධිකාරීන් වෙත මූල්‍ය බුද්ධි තොරතුරු බෙදා හැරීම; ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහිව සටන් කිරීම සඳහා මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් තුළ අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම; සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනාවන්හි ඉලක්කගත මූල්‍ය සම්බාධකවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

### 12.1 මූල්‍ය බුද්ධි කළමනාකරණය

ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ වාර්තාකරණ සහ අනෙකුත් වාර්තාකරණ අවශ්‍යතා සපුරාලීමට සහාය වීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති වෙබ් පාදක පද්ධතියක් වන ‘LankaFin’ හරහා වාර්තාකරණ ආයතන විසින් අනිවාර්ය අවශ්‍යතා අනුව, 2021 වර්ෂය තුළ සැක කටයුතු ගනුදෙනු ඇතුළු මූල්‍ය ගනුදෙනු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම අඛණ්ඩව සිදු කර ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කරුවන් සහ මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් විසින් දේශීය හා විදේශීය වශයෙන් රු. මිලියන 1.0 සහ ඊට වැඩි හෝ විදේශ මුදල් වලින් එයට සමාන වන මුදල් සහ ඉලෙක්ට්‍රොනික අරමුදල් මාරු කිරීම් පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත දිගින් දිගටම වාර්තා කරන ලදී.

2021 වසර තුළ, වාර්තාකරණ ආයතන විසින් මුදල් ගනුදෙනු වාර්තා මිලියන 5.7ක් සහ ඉලෙක්ට්‍රොනික මුදල් හුවමාරු වාර්තා මිලියන 9.2ක් වාර්තා කර ඇත. මීට අමතරව, වාර්තාකරණ ආයතන විසින් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වැනි වගන්තිය අනුව මූල්‍ය බුද්ධි ඒකකය වෙත සැක සහිත ගනුදෙනු වාර්තා 4,696ක් ඉදිරිපත් කරන ලදී. ලැබුණු සැක සහිත ගනුදෙනු වාර්තා වල ක්‍රියාකාරී සහ උපායමාර්ගික විශ්ලේෂණයන්ගෙන් පසුව, වැඩිදුර විමර්ශන සඳහා ඉන් 1,830ක් නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. සැක සහිත

ගනුදෙනු වාර්තා 2,220ක් අඛණ්ඩව අවේක්ෂණ ක්‍රියාවලිය යටතේ තබා ඇති අතර, 641ක් මූලික විශ්ලේෂණය සහ වැඩිදුර අධ්‍යයනය සඳහා තබා ඇත. ඉතිරි සැක සහිත ගනුදෙනු වාර්තා විශ්ලේෂණ ක්‍රියාවලියේ දී සැක කටයුතු ගනුදෙනු තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු හෙළි නොවූ බැවින්, වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී.

විශ්ලේෂණ සහ බෙදාහැරීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතන වෙත 'goAML' මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ වාර්තාකරණ සහ විශ්ලේෂණ පද්ධතිය හඳුන්වා දෙන ලදී. 2021 දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් පද්ධතිය හැඩගස්වන ලද අතර පද්ධතියේ ප්‍රධාන වාර්තාකරණ කාර්යයන් ආරම්භ කරන ලදී. 'goAML' හි ගනුදෙනු වාර්තා කිරීමේ සීමාවට යටත් වූ සහ සැක සහිත ගනුදෙනු වාර්තාකරණයෙහි සජීවී මෙහෙයුම් 2022 පෙබරවාරි මාසයේ දී ආරම්භ කෙරේ.

## 12.2 නීතිමය රාමුව සහ ආයතනික අනුකූලතාවය

රටේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීමේ පාලන තන්ත්‍රයේ සඵලතාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සඳහා ව්‍යවස්ථාදායක සංශෝධන ආරම්භ කරන ලද අතර 2021 තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපවත්වීමේ සම්මුති පනතට සංශෝධන සිදු කිරීමට සහාය විය. මෙම සංශෝධන 2022 අවසන් වන විට බලාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 15 (2) වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, 2021 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ සැකයන් මත පුද්ගලයන් 28 දෙනෙකුගේ ගිණුම් 163ක සහ සිද්ධීන්/නඩු 17කට අදාළ ආයතන 8ක ගනුදෙනු අත්හිටුවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව රු. මිලියන 77.0 (බැර ශේෂයන්), රු. මිලියන 0.9 (අති අයිරා) සහ එක්සත් ජනපද ඩොලර් 12,200 වසර තුළ අත්හිටුවන ලදී. මීට අමතරව, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් විසින් පරීක්ෂණ පැවැත්වීමට තවදුරටත් කල් ඉල්ලා සිටි බැවින්, පසුගිය වසරවල අත්හිටුවූ නඩු 64 කට සම්බන්ධ ගිණුම් 1,000 කට ආසන්නව මාස දෙකක කාල පරතරයකින් දීර්ඝ කරන ලදී.

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වර්ෂයේ දී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අධීක්ෂණ ක්‍රියාවලිය සහ ආයතනික අනුකූලතාවය ශක්තිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරන ලදී. මෙම මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ III කොටසෙහි අන්තර් ගත වේ. තවද, ඵලදායී අධීක්ෂණ සහ බලාත්මක කිරීම, ස්ථානීය සහ පිටත නිරීක්ෂණ සහ අනුකූලතා සමාලෝචන රැස්වීම් පැවැත්වීම මගින් වාර්තාකරණ ආයතනයන්හි අනුකූලතාවය වැඩි දියුණු කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩ පියවර ගන්නා ලදී. රට තුළ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් අවදානම් පාදක කරගත් එතැන් පරීක්ෂණ පැවැත්වීමේ සීමාවන් තිබියදීත්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා අවදානම් මත පදනම් වූ ස්ථානීය පරීක්ෂණ 2ක්, අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ ස්ථානීය පරීක්ෂණ 7ක්, එතැන් පරීක්ෂණ 7ක් සහ පසු විපරම් විතැන් පරීක්ෂණ 4ක් පවත්වන ලදී. මීට අමතරව, වාර්තාකරණ ආයතනවල මෙන්ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සම්බන්ධයෙන් තෝරාගත් අවදානම් සංරචක මත තේමාත්මක සමාලෝචන 7ක් පවත්වන ලදී. එසේම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි අනුකූලතාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අදිටනින්, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය හා සම්බන්ධව කටයුතු කරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සංඛ්‍යාව වැඩි කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

දඩ පැනවීම, අනතුරු ඇඟවීමේ ලිපි සහ හේතු පැහැදිලි කිරීමේ ලිපි නිකුත් කිරීම, කාලානුරූපී ක්‍රියාකාරී සැලසුම් නිකුත් කිරීම සහ පසු විපරම් රැස්වීම් පැවැත්වීම වැනි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහි නොගැලපීම් සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් නියාමන ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කරන ලදී. එපමණක් නොව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වසර සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු හතරක් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් පහක් සඳහා රුපියල් මිලියන 10.5ක මූල්‍ය දණ්ඩන නියම කරන ලදී. මෙම දණ්ඩන පනවන ලද්දේ එක්සත් ජාතීන්ගේ සම්බාධක සම්බන්ධව අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග, ගනුදෙනුකරු හඳුනාගැනීම තහවුරු කර ගැනීම, සැකකටයුතු ගනුදෙනු වාර්තා කිරීම සහ අවදානම් පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හා බැඳුනු ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි.

## 12.3 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ජාතික අවදානම් තක්සේරුව

මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශවල නිර්දේශ අංක 1ට අනුකූල වීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 දී ලෝක බැංකුවේ සහය ඇතිව සහ පුද්ගලික සහ රාජ්‍ය පාර්ශ්වකරුවන්ගේ නියෝජිතායතන 66ක සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ දෙවන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම් තක්සේරුව පැවැත්වීම ආරම්භ කරන ලදී. මාර්ග ගත Webex වේදිකාව භාවිතා කරමින් ශ්‍රී ලංකා ජාතික අවදානම් තක්සේරුවෙහි නිල ආරම්භය සනිටුහන් කරමින් ලෝක බැංකුව සිය හඳුන්වාදීමේ සැසිය 2021 ජූලි 15 වන දින පවත්වන ලදී. ඉන් අනතුරුව ක්‍රියාකාරී කණ්ඩායම් සඳහා වැඩමුළු 13ක් පවත්වන ලදී.

### 12.4 දේශීය හා ජාත්‍යන්තර සහයෝගිතාව

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත අනුව, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය හට දේශීය හෝ විදේශීය රාජ්‍යයක මූල්‍ය බුද්ධි ඒකකයක් හෝ නියෝජිතායතනයක් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් වලට එළඹිය හැක. ඒ අනුව, 2021 දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් දේශීය නියෝජිතායතන කිහිපයක් සහ විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම ආරම්භ කරන ලදී.

මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා පැසිෆික් සමූහය සමඟ ඒකාබද්ධව අපරාධ තුළ පවත්නා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා වූ ක්‍රමවේදය අධීක්ෂණයට ලක් කරයි. වසංගතය හේතුවෙන්, ආසියා පැසිෆික් සමූහය විසින් 2021 ජූලි මාසයේ දී එහි වාර්ෂික සැසිය මාර්ගගතව පවත්වන ලද අතර 2021 නොවැම්බර් මාසයේ දී විශේෂ සැසියක් මාර්ගගතව පැවැත්විණි. තවද, අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම් 2021 ජූනි, ජූලි, සැප්තැම්බර් සහ නොවැම්බර් මාසවල දී පවත්වන ලදී. ශ්‍රී ලංකාව පිළිබඳ 6 වැනි පසු විපරම් අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව 2021 සැප්තැම්බර් මාසයේ පැවති මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම්හි දී සාකච්ඡා කරන ලදී. මෙම ප්‍රගති වාර්තාවේ දී ශ්‍රී ලංකාව 2015 දී අර්ධ වශයෙන් අනුකූල ලෙස ශ්‍රේණිගත කරන ලද 'මුදල් කුරියර්' පිළිබඳ නිර්දේශ 32 සහ 'අනෙකුත් ජාත්‍යන්තර සහයෝගිතා ආකෘති' පිළිබඳ නිර්දේශ අංක 40, එම තත්වයෙන් උසස් කරන ලෙස ඉල්ලා ඇත. නිර්දේශ අංක 32හි ශ්‍රේණිගත කිරීම 'අර්ධ වශයෙන් අනුකූල'සිට 'විශාල ලෙස අනුකූල' දක්වා උසස් කිරීමට සාමාජිකත්වය එකඟ වූ අතර නිර්දේශ අංක 40හි ශ්‍රේණිගත කිරීම එලෙසම පවතී. මේ අනුව, මූල්‍ය කාර්ය සාධන බලකාය විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශ 40න්, 2021 අවසානය වන විට, ශ්‍රී ලංකාවට අදාළව නිර්දේශ 7ක් අනුකූල ලෙසද, 25ක් විශාල වශයෙන් අනුකූල ලෙසද, 7ක් අර්ධ වශයෙන් අනුකූල ලෙස ද එක් නිර්දේශයක් අනුකූල නොවන ලෙස ද ඇගයීමට ලක් වී ඇත.

මූල්‍ය බුද්ධි ඒකකය විසින් එග්මන්ට් (Egmont) කණ්ඩායමෙහි සාමාජිකයින්ගෙන්, එනම් සාමාජිකයින් 166 දෙනෙකුගෙන් සමන්විත ගෝලීය මූල්‍ය බුද්ධි ඒකක සංගමයෙන්, විමර්ශන සිදු කිරීමට සහ ඔවුන්ගේ විමර්ශන පිළිබඳ බුද්ධි තොරතුරු රැස් කිරීමට සාමාජික රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට සහාය ලබා ගනී. 2021 වසර තුළදී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙතින් කරන ලද ඉල්ලීම් 33කට ප්‍රතිචාර දක්වා ඇති අතර, සිදුවෙමින් පවතින විමර්ශනවලට අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙත ඉල්ලීම් 22ක් ඉදිරිපත් කරන ලදී. 2021 එග්මන්ට් සැසිය නියමිත පරිදි පැවැත්වුණේ නැත. කෙසේ වෙතත්, ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම්, මූල්‍ය බුද්ධි ඒකකයන්හි ප්‍රධානීන්ගේ රැස්වීම සහ ප්‍රාදේශීය රැස්වීම් මාර්ගගතව පැවැත්වුණු අතර මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීන් මෙම රැස්වීම්වලට සහභාගී විය.

### 12.5 ආයතනික ධාරිතා ගොඩනැගීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිවීම පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට දරන ප්‍රයත්නයන් අඛණ්ඩව කරගෙන යමින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2021 වර්ෂය තුළ දැනුවත් කිරීම්/පුහුණු වැඩසටහන් 50ක් සඳහා සම්පත් ආධාර ලබා දුන් අතර, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, නීති බලාත්මක කිරීමේ ආයතන සහ අධීක්ෂණ අධිකාරීන් වෙතින් සහභාගිවන්නන් 3,000කට වැඩි පිරිසකට පහසුකම් සපයා ඇත. මෙම වැඩසටහන් මුහුණට මුහුණ මෙන්ම මාර්ගගත ක්‍රමවේද හරහා ද පවත්වන ලදී. තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවිධිමත් මුදල් සම්ප්‍රේෂණ ක්‍රම හා බැඳුනු අවදානම සම්බන්ධව පුවත්පත් රූසක සහ විවිධ සමාජ මාධ්‍ය ජාලා හි දැන්වීම් රාශියක් පළ කරන ලදී.

## 13. විදේශ විනිමය

විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ හා නියාමනය කිරීමේ අරමුණ පෙරදැරිව, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව 2017 නොවැම්බර් 20 වන දින ස්ථාපනය කරන ලදී. විදේශ විනිමය දෙපාර්තමේන්තුව ප්‍රතිපත්ති, ප්‍රාග්ධන ගනුදෙනු, මෙහෙයුම් හා විමර්ශන යන අංශ හතරකින් සමන්විත වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

(අ) විදේශ විනිමය පනත යටතේ මුදල් ඇමතිවරයා නියම කර ඇති පරිදි විදේශ විනිමය ගනුදෙනු සඳහා පරිසීමිත වෙළෙඳුන් හා වෙනත් පුද්ගලයින් පත් කිරීම.

(ආ) විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළඳුන් හට නියමයන් නිකුත් කිරීම හා බලයලත් වෙළඳුන් එකී නියම, රෙගුලාසි හා විධාන වලට අනුගත වීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

(ඇ) විදේශ විනිමය කටයුතු හා විදේශ විනිමය ගණුදෙනු පවත්වාගෙන යාම සඳහා රෙගුලාසි හා විධාන සකස් කිරීම හා නියමයන් නිකුත් කිරීම මගින් විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඈ) විදේශ විනිමය පනත යටතේ පොදු අවසරයන් ප්‍රදානය කර නොමැති විශේෂ අරමුණු සඳහා අවසර ලබා දීම.

(ඉ) පවත්නා විදේශ විනිමය ප්‍රතිපත්ති වල ඵලදායීතාවය නිර්ණය කිරීම හා විදේශ විනිමය වෙළෙඳපොලේ සිදුවන වර්ධනයන් හා සමගාමීව නව ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය හඳුනා ගැනීම හා එම ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.

(ඊ) විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූල නොවන අවස්ථාවන්ට අදාළව විමර්ශන කටයුතු සිදු කිරීම.

(උ) විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ වැඩිදුර පැහැදිලි කර ගැනීම සඳහා ලැබෙන ඉල්ලීම්වලට පිළිතුරු ලබා දීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශයන් සඳහා විදේශ විනිමය රෙගුලාසි සහ ප්‍රතිපත්ති වලට අදාළ කොටස් සකස් කිරීම.

කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් පසුව නිර්මාණය වූ අභියෝගාත්මක පරිසරය හමුවේ විදේශ විනිමය මෙරටට ගලා ඒම ආකර්ෂණය කර ගැනීමේ සහ හදිසි විදේශ විනිමය ගලා යාම් සීමා කිරීමේ වැදගත්කම හඳුනාගෙන දේශීය, විදේශ විනිමය වෙළෙඳපලේ පීඩනය ලිහිල් කිරීම සඳහා පිළියම් ලෙස 2021 වර්ෂය තුළ දී ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. 2021 වර්ෂය තුළ දී ගත් එම ක්‍රියාමාර්ගවල සාරාංශය පහතින් දැක්වේ.

## 13.1 නව නියෝග, නියම සහ විධාන නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම

විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති නියෝග, නියම හා විධාන පිළිබඳව පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන ප්‍රතිචාර විමර්ශනය කොට, විදේශ විනිමය ප්‍රතිපාදන තවදුරටත් සරල හා පැහැදිලි වන අයුරින් 2021 වසරේ මුල් භාගයේ දී සංශෝධිත නියෝග, නියම හා විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, නව ආමුඛ ප්‍රේෂණ දිරි ගැන්වීමේ අරමුණ සහිතව, විදේශ විනිමය පනත යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නියෝග නවයක් නිකුත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව පහසුකම් සලසනු ලැබීය.

තවද, කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඇති විය හැකි අහිතකර බලපෑම හා විනිමය අනුපාතයට ඇති වී ඇති පීඩනය අවම කිරීමේ අරමුණින්, අමාත්‍යවරයා විසින් නියමයන් හයක් නිකුත් කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

තව දුරටත්, එකී නියෝගයන් හා නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් වෙළඳුන් හට විධානයන් විසි නවයක් නිකුත් කරන ලදී. එකී නියම, නියෝග හා විධාන මෙම වාර්තාවේ III වන කොටසේ දක්වා ඇත.

## 13.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබා දීම

විශේෂ අවසර පත්‍ර පිළිබඳ තොරතුරු II-12 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-12 සංඛ්‍යා සටහන**

**විදේශ විනිමය පනත යටතේ ලබාදුන් විශේෂ අවසර**

| අරමුණ | අවසර ගණන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන |
|---|---|---|
| නේවාසික සමාගම් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා | 2 | 23.5 |
| නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/සමාගම් ඇපකර සඳහා | 3 | 54.38 |
| බලයලත් වෙළෙඳුන්/නේවාසික සමාගම් හට විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා | 4 | අ/නො |

අ/නො - අදාළ නොවේ

**(අ) මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ යෙදීම සඳහා පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ එම මෙහෙයුම් කටයුතු නවතා දැමීම.**

i. 2021 වසර තුළ දී විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා සීමිත සමාගම් සඳහා නව බලපත්‍ර දෙකක් නිකුත් කරන ලදී.

ii. මුදල් හුවමාරු කරන්නන් තිදෙනෙකුගේ මෙහෙයුම් කටයුතු 2021 වසර තුළ දී නවතා දමන ලදී.

iii. එක් එක් පරිසීමිත වෙළෙන්දා වෙත මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතවීම සඳහා බලපත්‍ර නිකුත් කර ඇති ආකාරය පිළිබඳ විස්තර II-13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-13 සංඛ්‍යා සටහන**

**2021.12.31 වන විට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා බලයලත් පරිසීමිත වෙළෙඳුන්**

| ආයතන කාණ්ඩය | අවසරලත් ව්‍යාපාරික කටයුතු | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ අඛණ්ඩව නියැලෙන සීමිත සමාගම් (මුදල් හුවමාරු කරන්නන්) | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම | 65* |
| | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම | 08 |
| සංචාරක හෝටල් | විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම | 03 |
| **එකතුව** | | **76** |

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 76 ක් ඇතුළුව සමාගම් 65ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 76න්, 63ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 13ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

එපරිදි, 2021 දෙසැම්බර් 31 වන විට, බලයලත් වෙළෙඳුන් 26ක් සහ පරිසීමිත වෙළෙඳුන් 76ක් (පරිසීමිත වෙළෙඳුන්ගේ ප්‍රධාන ශාඛා පමණක්) මෙහෙයුම් කටයුතුවල නිරත වී ඇත. අනුමත විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමට අවසරලත් බලයලත් වෙළෙඳුන් (එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු) සහ අදාළ අවසරදීමේ සඳහන් කර ඇති අරමුණු සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ පරිසීමිත වෙළෙඳුන් පිළිවෙළින් ඇමුණුම II-2 සහ ඇමුණුම II-3 හි සඳහන් වේ.

**(ආ) සංක්‍රමණිකයින්ගේ අරමුදල් මාරු කිරීම**

ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විගාමික දීමනාව නිදහස් කිරීමේ අරමුණ සඳහා සහ විගාමිකයන්ට උරුම වූ මුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 787ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී. කෙසේ වෙතත් 2022 ජූලි මස 01 දක්වා ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු අත්හිටුවමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය හේතුවෙන් මෙම ගිණුම හරහා මුදල් මාරු වීම සීමා විය.

## 13.3 නේවාසික ආයෝජකයන් උදෙසා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති රෙගුලාසිවලට අනුව, ප්‍රතිමුඛ ආයෝජන සිදු කිරීම සඳහා විදේශ විනිමය පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශන නොමැති බවට තහවුරු කරමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නේවාසිකව ආයෝජකයන් වෙත නිෂ්කාශන ලිපි 13ක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

## 13.4 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය

i. සියලුම බලයලත් වෙළෙඳුන් ඔවුන් විසින් පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුම්වලට අදාළ තොරතුරු, එකී විදේශ මුදල් ගිණුම්වලට අදාළව නිකුත් කර ඇති විධානයන්ට අනුකූල වෙමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් මෙම තොරතුරු කළමනාකරණය වෙත ඉදිරිපත් කරන අතර, අවශ්‍ය වූ විටෙක විශ්ලේෂණයක් ද සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත ප්‍රකාශන සඳහා ලබා දෙනු ලැබේ. තවද, බලයලත් වෙළෙඳුන් විසින් සපයන ලද තොරතුරුවලින් යම් යම් අනුකූල නොවන අවස්ථා අනාවරණය වූයේ නම්, එවැනි අවස්ථා විදේශ විනිමය පනතේ නියමයන් ප්‍රකාරව වැඩිදුර විමර්ශන සඳහා යොමු කෙරේ.

ii. විදේශ විනිමය අධීක්ෂණ පද්ධතිය හරහා පෝරම 1හි වාර්තා කර ඇති විදේශීය මුදල් විකුණුම් සහ පෝරම 2හි වාර්තා කර ඇති විදේශීය මුදල් මිලදී ගැණුම් ආශ්‍රිතව උත්පාදනය කරන ලද වාර්තා නිසි විශ්ලේෂණයක් සහිතව කළමනාකරණය වෙත යොමු කරනු ලැබේ.

iii. ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු කාඩ්පත් (EFTCs) පිළිබඳ ගනුදෙනු මාර්ගගත වාර්තාකරණ පද්ධතිය හරහා අධීක්ෂණය කරනු ලබන අතර, කිසියම් සැක කටයුතු ගනුදෙනු අනාවරණය වුවහොත් වැඩිදුර විමර්ශන සඳහා යොමු කෙරේ.

iv. 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති වලට අනුව ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් ලැබීම සහ පරිවර්තනය කිරීම, මෙම දෙපාර්තමේන්තුව විසින් දැඩිව අධීක්ෂණය කරනු ලැබේ. එවැනි කාර්යයක් සඳහා, අපනයන ඉපැයීම්වලට අදාළ දත්ත මාසික පදනමින් බලයලත් වෙළෙන්ඳුන්ගෙන් රැස් කරන අතර, තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කරන තෙක් අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරනු ලැබේ. තවද, මෙම රීතින්ට අනුකූල වීමට අපොහොසත් වූ අපනයනකරුවන්ගේ විස්තර ද බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලබන අතර එවැනි අනුකූල නොවීම් වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම සඳහා වැඩිදුර විස්තර රැස් කරනු ලැබේ.

v. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, උපදෙස් සහ නියෝග යටතේ වන අනුකූල නොවීම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන් සහ අනෙකුත් පුද්ගලයින් සම්බන්ධයෙන් නව විමර්ශන තිස් අටක් (38) ආරම්භ කරන ලදී.

vi. තවද, (2021 ට පෙර ආරම්භ කරන ලද විමර්ශන 15ක් සහ 2021 දී ආරම්භ කරන ලද විමර්ශන 2ක් ඇතුළුව) විමර්ශන 17ක් විදේශ විනිමය පනතෙහි දක්වා ඇති විමර්ශන ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන වර්ෂය තුළ දී අවසන් කරන ලදී.

vii. එලෙසම, විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ දත්ත/සාක්ෂි ලබා දීමෙන් නීති බලාත්මක කිරීමේ බලධාරීන්ට, නඩු පැවරීම් සහ නීතිමය කටයුතු සඳහා සහාය විය.

## 13.5 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ආරම්භ කිරීම.

බලයලත් වෙළෙඳුන්ගෙන් දත්ත ග්‍රහණය කර ගැනීමේ අරමුණින් විස්තීර්ණ දේශ සීමා සහ විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් (එනම් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතියක්) හඳුන්වා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් 2021 වර්ෂය තුළ දී අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම යෝජිත යාන්ත්‍රණය මගින්, විදේශ විනිමය විකුණුම්/මිලදී ගැනීම් සහ රට තුළට විදේශ විනිමය ගලාඒම්/පිටතට ගලායෑම් පිළිබඳ සියලුම දත්ත ග්‍රහණය කර ගැනීම තුළින්, විදේශ විනිමය ගනුදෙනු අඛණ්ඩව අධීක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. තවදුරටත්, අපනයන දත්ත ඵලදායී ලෙස ග්‍රහණය කර ගැනීමේ අරමුණෙන්, තොරතුරු තාක්ෂණය මත පදනම් වූ අපනයන ඉපැයුම් අධීක්ෂණ පද්ධතියක් ගොඩනගා ඇත. අපනයන නැව්ගත තොග පිළිබඳව ශ්‍රී ලංකා රේගුව සතු තොරතුරු, බලයලත් වෙළෙඳුන් සතුව පවතින අපනයන ආදායම් ලැබීම් පිළිබඳ තොරතුරු හා සම්බන්ධ කිරීමේ අරමුණෙන් එම පද්ධතිය සැලසුම් කර ඇත.

## 13.6 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ නව විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධව වසර තුළ දී දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පවත්වන ලදී. තවද, විදේශ විනිමය නියෝග, නියම

හා විධාන සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පුවත්පත් දැන්වීම් 07ක් සහ මහජන දැන්වීම් 04ක් නිකුත් කරන ලදී. තවද, නව විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරුණු විමසීම් වලට නොකඩවා පිළිතුරු ලබාදීම ද සිදු කරන ලදී.

**ඇමුණුම II-2**

## 2021 දෙසැම්බර් 31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව

| | |
|---|---|
| බලපත්‍රලාභී වාණිජ බැංකු | |
| 1 | අමානා බැන්ක් පී.එල්.සී. |
| 2 | ලංකා බැංකුව |
| 3 | බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් |
| 4 | කාගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5 | සිටි බැන්ක් |
| 6 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 7 | ඩොයිෂ් බැන්ක් ඒ.ජී. |
| 8 | ඩී එෆ් සී සී බැන්ක් ලිමිටඩ් |
| 9 | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 10 | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. |
| 11 | ඉන්දියන් බැන්ක් |
| 12 | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 13 | එම්.සී.බී. බැන්ක් ලිමිටඩ් |
| 14 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් |
| 15 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. |
| 16 | පැන් ඒෂියා බැන්කින් කොපරේෂන් පී.එල්.සී. |
| 17 | මහජන බැංකුව |
| 18 | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 19 | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 20 | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 21 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක් |
| 22 | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 23 | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කොපරේෂන් ලිමිටඩ් |
| 24 | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
| 25 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 26 | සණස සංවර්ධන බැංකුව |

**ඇමුණුම II-3**

## 2021 දෙසැම්බර් 31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව විදේශ විනිමය ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළඳුන්

| | |
|---|---|
| මුදල් හුවමාරුකරුවන් | |
| 1 | ඒ. එච්. එම් ට්‍රේඩින් (පුද්) සමාගම |
| 2 | ඒ. ඕ ලක්ෂ්මි ජුවලර්ස් (පුද්) සමාගම |
| 3 | ආබ්ඩීන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 4 | අබිලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 5 | ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම |
| 6 | අරුණ ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 7 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 8 | බ්‍රේෂීයා ග්‍රාමීන් (පුද්) සමාගම |
| 9 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 10 | කැපිටල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 11 | කාර්ලෝ ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම |
| 12 | සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 13 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 14 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 15 | දැඩිගම ගෲප් (පුද්) සමාගම |
| 16 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම |
| 17 | දයා ඕතොරයිස්ඩ් මනි චේන්ජර් (පුද්) සමාගම |
| 18 | ඩෙල්ටා සරත් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම |
| 19 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාල්ල |
| 20 | ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාලු කොටුව |
| 21 | ජෝර්ජ් මයිකල් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම |
| 22 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 23 | ගොල්ඩන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 24 | ගෝල්ඩ් ලංකා ජුවලරි (පුද්) සමාගම |
| 25 | හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම |
| 26 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 27 | ජයස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් |
| 28 | ජෙයා ෆොරෙක්ස් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 29 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම |
| 30 | කේසර් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 31 | කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 32 | එම්. පී මනි චේන්ජර් (පුද්) සමාගම |
| 33 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - යාපනය |
| 34 | මයුරි මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| 35 | මිඩිනා මිනි මාර්කට් (පුද්) සමාගම |
| 36 | මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 37 | නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - යාපනය |
| 38 | නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - කිලිනොච්චි |
| 39 | නිව් ලංකා ගෝල්ඩ් හවුස් (පුද්) සමාගම |
| 40 | නිව් නටාෂා (පුද්) සමාගම |
| 41 | නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්) සමාගම |
| 42 | පර්ල් එක්සි (පුද්) සමාගම |
| 43 | රෆීක්ස් ජෙම්ස් (පුද්) සමාගම |
| 44 | රිම්හා ජුවෙලරි (පුද්) සමාගම |
| 45 | රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම |
| 46 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 47 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 48 | රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - අලුත්ගම |
| 49 | රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - කොළඹ 01 |
| 50 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම |
| 51 | සාරාංගා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 52 | ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |

| | |
|---|---|
| 53 | සෝනම් ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 54 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 55 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 56 | තමාෂා ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 57 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - කොළොම්බු සිටි සෙන්ටර් |
| 58 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆෙස් මෝල් |
| 59 | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - නුවර |
| 60 | යුනික් ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 61 | වසන්තාස් ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 62 | වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 63 | වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |

### විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීම හා විකිණීමට අවසර ඇති පරිසීමිත වෙළඳුන්

| | |
|---|---|
| මුදල් හුවමාරුකරුවන් | |
| 64. | අරුජිනා ජුවෙලරි (පුද්) සමාගම |
| 65. | සිටි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 66. | ක්‍රවුන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 67. | දේවි ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 68. | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම |
| 69. | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 70. | මෙට්‍රෝ ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 71. | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01 |
| 72. | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06 |
| 73. | පුෂ්පා මනි චේන්ජර් (පුද්) සමාගම |
| 74. | රවී ෆොරෙක්ස් (පුද්) සමාගම |
| 75. | තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල |
| 76. | යුනිවර්සල් මනි චේන්ජර්ස් (පුද්) සමාගම |
| බලපත්‍රලාභී මූල්‍ය සමාගම් | |
| 77. | ඒෂියා ඇසට් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 78. | බිම්පුත් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 79. | සිටිසන් ඩිවලොප්මන්ට්ස් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 80. | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී |
| 81. | එල්. බී ෆයිනෑන්ස් පී. එල්. සී |
| 82. | සෙන්කඩගල ෆයිනෑන්ස් පී. එල්. සී |
| 83. | සිංහපුත්‍ර ෆයිනෑන්ස් පී. එල්. සී |
| 84. | සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පී. එල්. සී |
| ව්‍යවහාර විදේශ මුදල් මිලදී ගැනීමට, අවසර ඇති පරිසීමිත වෙළඳුන් | |
| සංචාරක හෝටල් | |
| 85. | පර්ල් සිටි හොටෙල් |
| 86. | ෂැන්ග්‍රිලා හොටෙල්- කොළඹ |
| 87. | ෂැන්ග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා |
| අනෙකුත් ආයතන | |
| 88. | එම්.එම්. බී. එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්) සමාගම |
| 89. | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව |

# 14. විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්

විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව 1949 අංක 58 දරණ මුදල් නීති පනතෙහි විධිවිධාන යටතේ 2021.11.03 දින පිහිටුවන ලදී. අලුතින් පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන අරමුණ වන්නේ, විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට තුළට ගලා ඒම පහසු කිරීම සහ එය වඩා විධිමත් කිරීමයි.

2021 සහ 2022 වසරේ මුල් කාලය තුළ විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ ප්‍රේෂණවල ළඟාකර ගතහැකි උපරිම මට්ටම සහතික කරගැනීම සඳහා පහත ක්‍රියාකාරකම්වල නිරත වෙමින් කටයුතු කරන ලදී.

## 14.1 සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා දිරිදීමනා ක්‍රම හඳුන්වා දීම

(අ) 2021 වසරේ අයවැය යෝජනා මගින් ලබා දුන් එ.ජ. ඩොලරයක් සඳහා රුපියල් 2.00ක් වූ දිරිදීමනාවට අමතරව, 2021 දෙසැම්බර් මස සිට විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් මෙරටට ප්‍රේෂණය කර ශ්‍රී ලංකා රුපියල්වලට මාරු කරනු ලබන සෑම එ.ජ. ඩොලරයකට ම රුපියල් 8.00ක අමතර දිරිදීමනාවක් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, මහ බැංකුව විසින් විනිමය අනුපාතකයෙහි ඉහළ නම්‍යශීලීභාවයක් සඳහා ඉඩ හැරීමත් සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවරිතනය කිරීමේදී එ.ජ.ඩොලරයක් සඳහා ලබාදුන් රුපියල් 8.00ක දිරි දීමනාව 2022 මාර්තු මාසයේ සිට අත්හිටුවන ලදී.

(ආ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් විසින් ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමේ දී සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී දරනු ලබන ගනුදෙනු පිරිවැය වෙනුවෙන් රුපියල් 20,000ට වැඩි එක් ගනුදෙනුවකට රුපියල් 1,000ක් දක්වා වූ මුදලක් ප්‍රතිපූරණය කිරීම සඳහා වන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

## 14.2 බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා විදේශගතවන සේවා නියුක්තිකයින් දිරිමත් කිරීම

මීට අදාළව, බත්තරමුල්ලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුඩා බැංකු ශාඛා පහක් විවෘත කිරීමට පහසුකම් සලසන ලදී. විදේශ විනිමය පුද්ගලික ගිණුම් සඳහා ප්‍රමුඛතාව ලබාදෙන සහ සීමිත මූල්‍ය සේවාවන් සහිත මෙම 'කුඩා බැංකු ශාඛා' විශේෂයෙන්ම ඉදිරියේ දී විදේශ රැකියා සඳහා යන සේවකයන්ගේ පහසුව සඳහා ස්ථාපිත කරන ලදී. විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමිකයන් පිටත්ව යාමට පෙර ඔවුන්ගේ සියලු ම බැංකු අවශ්‍යතා සපුරාලීමට මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් විධිමත් බැංකු මාර්ග ඔස්සේ ඔවුන්ගේ ප්‍රේෂණ රට තුළට ගලා ඒමට පහසුකම් සැලසෙනු ඇත.

### 14.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

අ) විදේශ රැකියා සඳහා යොමුවන ශ්‍රමිකයින් ඉලක්ක කරගත් දිරිදීමනා ක්‍රම සහ විධිමත් ක්‍රම ඔස්සේ මුදල් හුවමාරු කිරීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පුවත්පත්, ගුවන්විදුලි වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමාජ මාධ්‍ය සහ ප්‍රවෘත්ති වෙබ් අඩවි වැනි විවිධ ක්‍රම හරහා පවත්වන ලදී.

ආ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් සඳහා හඳුන්වා දී ඇති දිරිදීමනා ක්‍රම පිළිබඳව මැදපෙරදිග වෙසෙන විදේශගත ශ්‍රී ලාංකිකයන් සහ විනිමය හුවමාරු මධ්‍යස්ථාන නියෝජිතයින් දැනුම්වත් කිරීමට මෙන්ම මෙම ක්ෂේත්‍රයේ පවත්නා ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීමටත් අදාළ දැනුම්වත් කිරීම්වල දී ලැබෙන ප්‍රතිචාරවලට අනුව විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් සඳහා දැනට පවත්නා හා යෝජිත දිරිදීමනා ක්‍රම විධිමත් කිරීමත් අරමුණු කරගෙන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ අන්තර් ක්‍රියාකාරී සැසි භෞතිකව හා මාර්ගගත ක්‍රම ඔස්සේ පවත්වන ලදී.

### 14.4 අදාළ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණ කටයුතුවල නියැලීම

අ) විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම, විදේශිකයන් සඳහා වන දිගුකාලීන නේවාසික වීසා කාණ්ඩවල නිර්ණායක සංශෝධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

ආ) ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව කම්කරු අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් සිටියි.

ඇ) තවද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විදේශ මුදල් රට තුළට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්, පැමිණිලි සහ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවලද නිරත වී ඇත.

ඉදිරියට ද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව අනෙකුත් අදාළ බලධාරීන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව විදේශ සේවා නියුක්තිකයන්ගේ සුභසාධනය වැඩි දියුණු කිරීම සඳහා නව යෝජනා ක්‍රම හඳුන්වාදීමේ ක්‍රියාවලියට පුළුල් ලෙස සම්බන්ධ වනු ඇත. මේ සම්බන්ධයෙන්, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය, විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපොළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, බැංකු අංශය සහ අනෙකුත් විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වැනි අදාළ පාර්ශ්වයන් සමඟ අඛණ්ඩව කටයුතු කරනු ඇත. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීමට අමතරව, අඩු පොලී ණය වැනි බැංකු පහසුකම් සහ ඉහළ තීරුබදු සහන මෙම දිරිදීමනා ක්‍රමවලට ඇතුළත් වේ.

## 15. අධිපති ලේකම්

නිරතුරුවම වෙනස් වන මූල්‍ය හා ආර්ථික වාතාවරණයන් මධ්‍යයේ, මෑත ඉතිහාසයේ මුහුණ දීමට සිදුවූ කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයන් හා මතුවූ ආර්ථික අභියෝග ජයගැනීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කිරීම හා විශේෂිත ක්‍රමවේදයන් යෙදවීම සඳහා මහ බැංකු අධිපතිතුමා වෙත අවශ්‍ය කෙරෙන මෙහෙයුම් හා තාක්ෂණික සහායයන් ලබා දීමේ අරමුණින්, 2015 පෙබරවාරි 9 වැනි දිනෙන් පසුව "අධිපති ලේකම් කාර්යාලය" වශයෙන් ලේකම් දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ අධිපති කාර්යාලයේ කටයුතු, 2021 සැප්තැම්බර් 24 වැනි දින සිට "අධිපති ලේකම් දෙපාර්තමේන්තුව" නමින් නැවත දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කරන ලදි.

මෙසේ පිහිටුවනු ලැබූ අධිපති ලේකම් දෙපාර්තමේන්තුව, දේශීය ආර්ථිකය කෙරෙහි කොවිඩ්-19 වසංගතයේ බලපෑම අවම කිරීම වැනි අභියෝගාත්මක ආර්ථික ඉලක්ක සපුරා ගැනීම උදෙසා නැඹුරු වූ අධිපතිතුමාගේ කාර්යයන් පහසුවෙන් කරලීම සඳහා අවශ්‍ය ඉහළ මට්ටමේ ලේකම් කටයුතු හා සහායක සේවාවන්, ආයතනික සහ සන්ධාන සේවාවන් මෙන්ම අධිපතිතුමා විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙත පවරන ලද කාර්යයන්හි පසු විපරම් කටයුතු මෙන්ම බැංකු, අනෙකුත් ආයතන මෙන්ම මහජනතාව සමඟ සම්බන්ධතාව ඵලදායී හා ඉහළ මට්ටමකින් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම වැනි කාර්යයන් ඉතා කාර්යක්ෂම ලෙස ඉටුකරන ලදී.

රාජකාරී කටයුතු සඳහා අධිපතිතුමා හමුවීමට පැමිණෙන නිලධාරීන් හා අමුත්තන් සඳහා සහ අධිපතිතුමාගේ රැස්වීම් සඳහා කාල වේලාවන් වෙන් කිරීම හා ඒවා කාලානුරූපීව කළමනාකරණය කිරීමත් ඒ සඳහා අවශ්‍ය ලිපිගොනු සකස් කිරීමත්, අනෙකුත් දෙපාර්තමේන්තුවල කාර්යයන් නිරන්තරයෙන් අධිපතිතුමාගේ අවධානයට යොමුකිරීම, පවරන ලද කාර්යයන්හි පසු විපරම් කටයුතු සිදු කිරීම යනාදිය අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයන්ය. ලෝකයේ අනෙකුත් මහ බැංකු අධිපතිවරුන්, අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකාවේ වෙසෙන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, බැංකු හා මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන්, මාධ්‍ය ආයතන ප්‍රධානීන්, ඉහළ පෙළේ ව්‍යාපාරිකයින්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල නියෝජිතයින් සහ අනෙකුත් විදේශීය නියෝජිතයින් සමඟ මහ බැංකු අධිපතිතුමා විසින් හමුවීම් ගණනාවක් පවත්වන ලදී. එවැනි සියලුම හමුවීම් සම්බන්ධව සංවිධාන කටයුතු හා ඊට අදාළ ප්‍රතිඵලයන්, අදාළ පාර්ශ්වයන්ට සන්නිවේදනය කොට ඒවා අධිපතිතුමාගේ නියමයන්ට අනුකූල ලෙස සිදුවන්නේ දැයි

පසු විපරම් කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුවට එහි කාර්යයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය කාරණයක් ලෙස බැංකු, මූල්‍ය හා ආර්ථික යන ක්ෂේත්‍රවල දේශීය මෙන්ම විදේශීය ක්‍රියාකාරීන් සමග සබඳතා ඇති කර ගැනීම හා එම සබඳතා මනාව පවත්වාගෙන යනු ලැබීය. විශේෂයෙන්, නැගී එන ආර්ථිකයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය වර්ධනය වෙමින් පවත්නා කාලවකවානුවක, ගෝලීය හවුල්කරුවන් සමඟ පවත්නා සම්බන්ධතාවයන් කළමනාකරණය සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබීය. ඒ සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් ගෝලීය ආයෝජකයින් සමග මනා සම්බන්ධතා පවත්වාගෙන යමින්, ඔවුන්ට නිවැරදි තොරතුරු සැපයීම හා අධිපතිතුමා සමඟ රැස්වීම් සංවිධානය කිරීම ද සිදු කරන ලදී. එහිදී, දුරකථන හා විද්‍යුත් සම්මන්ත්‍රණ, විද්‍යුත් සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය හරහා ගෝලීය ආයෝජකයන් සමග සිදු කෙරෙන සාකච්ඡා ආදිය පවතින වසංගත තත්ත්වය ද සැලකිල්ලට ගනිමින් නවීන සන්නිවේදන ක්‍රමවේදයන් ඔස්සේ සිදු කරනු ලැබීය.

අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් අධිපතිතුමාට මෙන්ම එතුමාගේ විශේෂිත අමුත්තන්ට සහ මහ බැංකුවේ විශේෂ ආරාධිත අමුත්තන්ට සත්කාර සේවාවන් ලබා දීම ද සිදු කරනු ලැබීය. මෙම කාලපරිච්ඡේදය තුළ දී , අධිපතිතුමාගේ දේශීය හා විදේශීය නිල සංචාරයන්ට අදාළ සියලුම කටයුතු අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබීය. මෙයට අමතරව, අධිපතිතුමන් සහභාගී වූ විදේශීය ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් ද ඇතුළත්ව අධිපතිතුමා විසින් ප්‍රධාන ආරාධිතයා ලෙස හෝ ප්‍රධාන දේශකයා වශයෙන් සහභාගී වූ ජාත්‍යන්තර නිල සංචාරයන් සියල්ලක්ම ද දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබීය. අධිපතිතුමාගේ මෙම විදේශ නිල සංචාර සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සත්කාර පහසුකම් සපයනු ලැබූ අතරම, එම විදේශ රැස්වීම් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දීම ද, ඒ සඳහා අවශ්‍ය වූ විද්‍යුත් මාධ්‍ය ඉදිරිපත් කිරීම් සකස් කර දීම ද සිදු කරනු ලැබීය. දේශීය මුදල් වෙළඳපොළේ සහ විදේශ විනිමය වෙළඳපොළේ තොරතුරු එසැනින් වඩාත් යාවත්කාලීනව, දිනපතා මෙන්ම විදේශවල සිටින විට දී ද අධිපතිතුමාගේ අවධානයට ලක් කිරීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙයට අමතරව අධිපතිතුමා සහ නියෝජ්‍ය අධිපතිවරුන් විසින් දායකත්වය සපයන නිල උත්සව සංවිධානය කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

මහ බැංකුවේ ආයතනික කළමනාකාරීත්ව කමිටුව, මූල්‍ය ප්‍රතිපත්ති උපදේශක කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශක කමිටුව යනාදියෙහි කමිටු රැස්වීම් හා බැංකු ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම් හා බැංකු නොවන මූල්‍ය ආයතන ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම් යනාදිය සඳහා අධිපතිතුමාට අවශ්‍ය තොරතුරු සපයා දීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙයට අමතරව 2021 ඔක්තෝබර් මස 1 වැනි දින ප්‍රකාශයට පත් කළ "සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම" සකස් කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය සහාය ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සපයා දෙන ලදී.

රාජ්‍ය ව්‍යවසායයන් හි ප්‍රධානීන්, ප්‍රධාන අපනයනකරුවන් සහ ආනයනකරුවන් ඇතුළු අනෙකුත් ව්‍යාපාරික ප්‍රජාව සමඟ පැවැත් වූ හමුවීම්වලට ද අධිපතිතුමා සහභාගී වූ අතර, ඒවාට අවශ්‍ය තොරතුරු හා දත්ත සැපයීම මෙන්ම සංවිධාන කටයුතු ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එලෙසම, විදේශීය ආයෝජකයින් සඳහා අවශ්‍ය කාලීන තොරතුරු සැපයීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් අදාළ දෙපාර්තමේන්තුවල සහාය ඇතිව සිදු කරන ලදී.

අධිපතිතුමා විසින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙත නිකුත් කරනු ලැබූ උපදෙස් කලට වේලාවට නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබඳව ස්ථාපනය කර ඇති විද්‍යුත් පද්ධති භාවිතයෙන් ඉතා සමීප ලෙස පසු විපරම් කිරීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබීය. මීට අමතරව, මූල්‍ය සමාගම්, සේවක අර්ථසාධක අරමුදල හා බැංකු කටයුතු සම්බන්ධ මහජන විමසීම් හා ආර්ථිකය සම්බන්ධව මහජනතාව විසින් කරනු ලැබූ විමසීම්වලට පිළිතුරු සැපයීම සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සහාය විය.

## 16. මානව සම්පත්

මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක විය හැකි ඉහළ ඵලදායිතාවයකින් යුත්, අභිප්‍රේරිත, කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ පවත්වා ගැනීම, සහතික කිරීමයි. ඉහත පරමාර්ථවලට අනුකූලව, මානව සම්පත් දෙපාර්තමේන්තුව මගින් යෝග්‍ය මානව සම්පත් කළමනාකරණ පරිචයන් අනුගමනය කරමින් මානව සම්පත් කළමනාකරණ උපායමාර්ගික සහ මෙහෙයුම් කාර්යයන් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලැස්මෙහි උපායමාර්ගයන්ට අනුකූලව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මානව සම්පත් සංවර්ධනය උදෙසා නව සේවක බඳවා ගැනීම්, උසස්වීම්, දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරුකිරීම්, සේවක වැටුප්, පුහුණු කිරීම් සහ නිපුණතා සංවර්ධනය, සේවක අභිප්‍රේරණය, කාර්ය සාධන ඇගයීම සහ දුක් ගැනවිලි සම්බන්ධයෙන් සොයා බැලීම වැනි විවිධ ක්‍රියාකාරකම් 2021 වර්ෂය තුළ සිදු කරන ලදී. තව ද, මානව සම්පත හා මානව සම්පත් සංවර්ධනය හා සම්බන්ධ සියලු කරුණු සහ ආයතනික සහාය කාර්යයන් සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ ගැනීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතනික කළමනාකරණ කමිටු, පුහුණු කමිටු සහ පුහුණු අනු කමිටුවල රැස්වීම් පැවැත්වීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. එමෙන්ම බැංකුවෙහි කාර්මික සාමය සහ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කොට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්වය, සේවකයින් සහ වෘත්තිය සමිති සමඟ සුහද සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ සංගම්වල ගැටලු ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී මැනෙවින් සලකා බලන ලදී.

2021 වසරේ දී පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය සමඟ සෞඛ්‍ය බලධාරීන් විසින් වරින් වර පනවන ලද සංචරණ සීමාවන්ට යටත්ව, සේවකයන් සඳහා ආරක්ෂිත සේවා පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා මෙන්ම බැංකුවේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගනු ලැබීය. ඒ අනුව මහ බැංකු සේවකයන්හට "නිවසේ සිට වැඩ කිරීමට" පහසුකම් සැලසීම සහ රාජකාරී සිදු කිරීම් පිළිබඳ මෙන්ම අදාළ සෞඛ්‍ය බලධාරීන් විසින් විටින් විට නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූලව පිළිපැදිය යුතු සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාමාර්ග පිළිබඳව මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කිරීම ද සිදු කරන ලදී. තව ද, සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුව කොවිඩ්-19 වසංගතයට මහ බැංකු සේවකයන් නිරාවරණය වීමේ හැකියාව සහ අවදානම තක්සේරු කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන ලද අතර අවශ්‍ය අවස්ථාවල දී එමඟින් අදාළ තොරතුරු රැස්කර ගන්නා ලදී. එලෙසම, ශ්‍රී ලංකා මහබැංකු සේවකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම සඳහාත් කාර්යයන් බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යෑම උදෙසාත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහල සමඟ එක්ව ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්හට, කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන යටතේ තෙවන (Booster) එන්නත් මාත්‍රාව ලබා දීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු සම්පාදනය කරන ලදී.

මහ බැංකුවේ මානව සම්පත් ව්‍යුහය සහ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ සිදුකරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

## 16.1 මානව සම්පත් ව්‍යුහය

2021 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,357ක් වූ අතර එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 715කින්, කළමනාකරණ සහකාර පන්තියේ නිලධාරීන් 503කින් සහ කාර්යාල සහායක පන්තියේ සේවකයින් 139කින් සමන්විත විය. එකී සමස්ත සේවක සංඛ්‍යාවෙන් 714ක් පුරුෂ හා 643ක් ස්ත්‍රී වූ අතර එය පිළිවෙළින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 53ක් සහ සියයට 47ක් විය. 2021 වසර අවසානය වන විට මහ බැංකු සේවකයකුගේ සාමාන්‍යය වයස අවුරුදු 39ක් විය.

## 16.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා මහ බැංකුව, ඉහළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ නිපුණතාවලින් හෙබි විවිධ දක්ෂතා ඇති කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. 2021 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන් සතු අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-14 හි දැක්වේ.

## 16.3 මානව සම්පත් කළමනාකරණය

### (අ) බඳවා ගැනීම්

2021 වසරේ දී සාමාන්‍ය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික පන්තියේ හඳුනාගත් පුරප්පාඩු පිරවීම සඳහා මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණිය (පරිවාස) සඳහා ඇතුළත් කර ගැනීමේ අරමුණින් කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සහ ඊට සමාන්තරව අභ්‍යන්තර අයදුම්කරුවන් පරිවාස මාණ්ඩලික නිලධාරීන් ලෙස උසස් කිරීම සිදු කරන ලදී. එමෙන්ම, මහ බැංකුවේ විශේෂිත කෙටිකාලීන කුසලතා අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කොන්ත්‍රාත් පදනම මත ඉංග්‍රීසි - දෙමළ පරිවර්තකයින් සහ ඉංග්‍රීසි - සිංහල පරිවර්තකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. 2021 වසරේ දී, පාර්ශ්වික බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ නොතාරිස් ලිපිකරුවෙකු මහ බැංකුවට බඳවා ගන්නා ලදී.

තව ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් බැංකු සහකාර (පුහුණු) සහ කනිෂ්ඨ පුද්ගලික සහකාර (ඉංග්‍රීසි සහ සිංහල) තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ද ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

### (ආ) කාර්යසාධන කළමනාකරණය

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. කාර්යසාධන ඇගයීමේ ක්‍රියාවලිය යටතේ කාර්යසාධන ඇගයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා සහ තාක්ෂණික නිපුණතා පදනම්ව ළඟා කරගත් කාර්යසාධනය ප්‍රමාණනය කර ඒ සඳහා අගයන් ලබා දෙමින් එක් එක් සේවකයාගේ කාර්යසාධන ඇගයීම සිදු කරනු ලැබීය. මාණ්ඩලික පන්තියේ III (2) ශ්‍රේණිය දක්වා සේවක

**II-14 සංඛ්‍යා සටහන**

**2021.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව**

| සේවක පන්ති | අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව දරන්නන් | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධි | ශාස්ත්‍රපති උපාධි, ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි සහ ප්‍රථම උපාධි | ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි හා වෘත්තීය සාමාජිකත්ව | ශාස්ත්‍රපති උපාධි පමණක් | ප්‍රථම උපාධි පමණක් | වෘත්තීය සාමාජිකත්ව පමණක් | එකතුව |
| මාණ්ඩලික පන්තිය | 25 | 132 | 164 | 75 | 45 | 3 | 201 | 14 | 659 |
| කළමනාකරණ සහකාර පන්තිය | - | 4 | 23 | 17 | 13 | 28 | 44 | 30 | 159 |
| කාර්යාල සහායක පන්තිය | - | - | - | - | - | - | 7 | - | 7 |
| **එකතුව** | **25** | **136** | **187** | **92** | **58** | **31** | **252** | **44** | **825** |

උසස්වීම් පටිපාටියේ සැපිරිය යුතු එක් නිර්ණායකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

තව ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය ද සිදු කරන ලදී. එමගින් වසරේ පළමු අර්ධ වර්ෂය තුළ දී සේවකයන්ගේ කාර්යසාධන මට්ටම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට අවස්ථාව ලැබිණි.

**(ඇ) උසස්වීම්**

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය සහ සේවා අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවක උසස්වීම් පටිපාටිය යටතේ, සේවක උසස්වීම් සඳහා පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2021 වර්ෂයේ දී කාර්ය මණ්ඩල සාමාජිකයන් 224 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී. එහි දී දෙපාර්තමේන්තු ප්‍රධානීන් සිව්දෙනෙකු සහකාර අධිපතිවරුන් ලෙස ද, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් සයදෙනෙකු අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද, මාණ්ඩලික පන්තියේ III (1) ශ්‍රේණියේ නිලධාරීන් සයදෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද උසස් කරන ලද අතර සේවකයන් 208 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී.

**(ඈ) පුහුණු සහ කුසලතා සංවර්ධනය**

වෙනස් වන පරිසරයක් තුළ බැංකුවේ අරමුණු ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයේ කුසලතා සහ දැනුම වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලිය අතිශයින් වැදගත් වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වූ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙල යටතේ ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා තම නිලධාරීන් දිරිමත් කරමින් ඒ සඳහා අදාළ පිරිවැය දරන අතර දැනුම, ප්‍රවීණත්වය සහ කුසලතාවය ඉහළ නැංවීමට සහාය වීම සඳහා දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට නිලධාරීන්හට පහසුකම් සලසන ලදී.

මේ සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පැන නගින මානව ප්‍රාග්ධන සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම, එම අවශ්‍යතා සපුරාලීම සඳහා උපායමාර්ග සකස් කිරීම, පුහුණු සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන අතර කාර්ය මණ්ඩලයට අවශ්‍ය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සහ දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට අවස්ථා සලසා දීම සිදු කරනු ලබයි.

ඒ යටතේ, 2021 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ඕස්ට්‍රේලියාවේ පිළිගත් විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට සහ එක් නිලධාරියෙකු සඳහා අර්ධකාලීන පදනමින් දේශීය විශ්වවිද්‍යාලයක ශාස්ත්‍රපති උපාධිය ආරම්භ කිරීමට පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2017 වසරේ සිට 2021 වසර අවසානය දක්වා කාලසීමාව තුළ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙල යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති/සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාව II-15 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

**II-15 සංඛ්‍යා සටහන**

**මහ බැංකු අනුග්‍රාහකත්වය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති/සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාව**

| වර්ෂය | පශ්චාත් උපාධි අධ්‍යයනය | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ආචාර්ය උපාධි | | ශාස්ත්‍රපති උපාධි | | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද |
| | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද | ආරම්භ කරන ලද | සම්පූර්ණ කරන ලද | | |
| 2017 | 6 | 6 | 9 | 18 | 15 | 24 |
| 2018 | 8 | 1 | 8 | 14 | 16 | 15 |
| 2019 | 4 | 1 | 7 | 7 | 11 | 8 |
| 2020 | 2 | 5 | 6 | 8 | 8 | 13 |
| 2021 | 1 | 4 | 1 | 6 | 2 | 10 |
| එකතුව | 21 | 17 | 31 | 53 | 52 | 70 |

ලොව පුරා පවතින වසංගත තත්ත්වය සැලකිල්ලට ගනිමින් 2020 මාර්තු 12 වන දින සිට නැවත දැනුම් දෙන තුරු කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා මහ බැංකු සේවක සහභාගිත්වය මහ බැංකුව විසින් අධෛර්යමත් කරන ලදී. ඒ වෙනුවට, අනෙකුත් මහ බැංකු සහ පිළිගත් විදේශීය හා දේශීය ආයතන විසින් 2021 වසරේ දී පවත්වනු ලැබූ මාර්ගගත පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට නිලධාරීන්හට පහසුකම් සලසන ලදී. ඒ අනුව, මාර්ගගත කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන් 529 ක් සඳහා සහභාගී වීමට මහ බැංකු නිලධාරීන් 1,229 දෙනෙකුට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසා දෙනු ලැබීය.

මේ අතර, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් බාහිර දේශීය පුහුණු ආයතන මගින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන් 44 කට සහභාගි වීම සඳහා නිලධාරීන් 208 දෙනෙකුට ද, බැංකු විදු පියෙස මගින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන් 46කට සහභාගී වීම සඳහා නිලධාරීන් 450 දෙනෙකුට ද පහසුකම් සලසන ලදී.

මීට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු සේවකයන්ට දීර්ඝ අර්ධකාලීන දේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට පහසුකම් සලසන ලද අතර, වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA) සුදුසුකම ලබා ගැනීම සඳහා වූ අනුග්‍රහයන්ද අඛණ්ඩව ලබාදෙන ලදී. තව ද, පිළිගත් දේශීය ආයතන විසින් පිරිනමනු ලබන සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා සහ අනෙකුත් සුදුසුකම් ලබා ගැනීමටත් පහසුකම් සලසන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ අනෙකුත් මහ බැංකුවල කාර්ය මණ්ඩල අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා ද මානව සම්පත් දෙපාර්තමේන්තුව පහසුකම් සලසන ලද අතර ඒ අනුව "විදේශ විනිමය ප්‍රතිපත්ති සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය" යන මාතෘකාව යටතේ සාර්ව ආර්ථික ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහනක් 2021 වසරේ දී කොරියානු මහ බැංකුව සමඟ පවත්වන ලදී.

**(ඉ) දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම්**

බැංකුවේ සමස්ත අරමුණු වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සලසන අතරම සේවකයන්ට මහ බැංකුවේ විවිධ ක්ෂේත්‍ර/කාර්යයන් පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථා සලසා දීම සඳහා මහ බැංකුව මගින් වාර්ෂිකව දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලබයි. කෙසේ වුව ද, වාර්ෂික ස්ථාන මාරු කිරීම් යෝජනා ක්‍රමය යටතේ එන වැඩවාර සටහන මත පදනම්ව කාර්යාල සහායක පන්තියේ සේවකයන් 12 දෙනෙකු දෙපාර්තමේන්තු අතර මාරු කිරීම හැර කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේ දී දෙපාර්තමේන්තු අතර වාර්ෂික ස්ථාන මාරු කිරීම් ක්‍රියාත්මක නොවීය. මාණ්ඩලික පන්තියේ සහ කාර්යාල සහායක පන්තියේ සේවකයන් සඳහා වාර්ෂික ස්ථාන මාරු කිරීම් 2022 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී.

**(ඊ) කාර්මික සාමය**

මානව සම්පත් දෙපාර්තමේන්තුව, කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සලසා දීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, 2021 වසර තුළ දී සේවක ප්‍රතිලාභ, උසස්වීම්, පුහුණුවීම්, සුභසාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය සම්බන්ධයෙන් පැවති ඇතැම් ගැටලු විසඳා ගැනීම සඳහා කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති අතර රැස්වීම් තුනක් පවත්වන ලදී.

## 16.4 නව දෙපාර්තමේන්තු පිහිටුවීම

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වන වගන්තියේ විධිවිධාන සහ 2021 සැප්තැම්බර් 23 වන දින පැවති අංක 33/2021 දරන මුදල් මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණයට අනුව 2021 සැප්තැම්බර් 24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුවේ අධිපති ලේකම් දෙපාර්තමේන්තුව (GSD) පිහිටුවීමට කටයුතු කරන ලදී. එසේ ම, මුදල් මණ්ඩලය විසින් 2021 ඔක්තෝබර් 27 වන දින පැවති අංක 36/2021 රැස්වීමේ දී එළඹි තීරණයට අනුව 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව (FRFD) පිහිටුවීමට කටයුතු කරන ලදී.

## 16.5 2021 වසර තුළ අධිපතිතුමා සහභාගි වූ රැස්වීම්

(අ) අධිපතිතුමා විසින් සිදු කරන ලද විදෙස් සංචාර

i. 2021 ඔක්තෝබර් 20 වන දින සිට 23 වන දින දක්වා කාලය තුළ කටාර් රාජ්‍යයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අනෙකුත් ආයෝජකයන් සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

ii. 2021 නොවැම්බර් 03 වන දින සිට 09 වන දින දක්වා කාලය තුළ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායි හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අනෙකුත් ආයෝජකයන් සමඟ පැවති රැස්වීම් සඳහා සහභාගී වීම.

(ආ) අධිපතිතුමා විසින් මාර්ගගතව සහභාගී වූ රැස්වීම්

i. 2021 ජනවාරි 15 වන දින පැවති ශ්‍රී ලංකාවේ ඇමරිකානු වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද "ආර්ථික ඉදිරි දැක්ම 2021" පිළිබඳව පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

ii. 2021 ජනවාරි 19 වන දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විධායක අධ්‍යක්ෂක ආචාර්ය සර්ජිත් හල්ලා සමඟ පැවති සාමූහික දුරකථන සංවාදයට සම්බන්ධ වීම.

iii. 2021 මාර්තු 01 වන දින පැවති දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය (SAARC FINANCE) සංවිධානයේ මහ බැංකු අධිපතිවරුන්ගේ කණ්ඩායම් රැස්වීම සඳහා සහභාගී වීම.

iv. 2021 මාර්තු 22 වන දින එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකාව සඳහා පත් කරන ලද වෙළඳ නියෝජිත ලෝර්ඩ් ඩේවිස් සමඟ පැවති සාමූහික දුරකථන සංවාදයට සම්බන්ධ වීම.

v. 2021 අප්‍රේල් 05 වන දින පැවති G-24 අමාත්‍ය රැස්වීම (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකු (IMF/WB) වසන්ත සෘතුවේදී පැවති රැස්වීම (Spring Meeting)) සඳහා සහභාගී වීම.

vi. 2021 අප්‍රේල් 08 වන දින පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ආසියා පැසිෆික් දෙපාර්තමේන්තුවේ කලාපීය ආර්ථික ඉදිරි දැක්ම රැස්වීම සඳහා සහභාගී වීම.

vii. 2021 අප්‍රේල් 08 වන දින පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකු (IMF/WB) වසන්ත සෘතුවේදී පැවති රැස්වීම (Spring Meeting) සඳහා සහභාගී වීම.

viii. 2021 අප්‍රේල් 13 වන දින පැවති G-24/AFI ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ වට මේස සාකච්ඡාව සඳහා සහභාගී වීම.

ix. 2021 අප්‍රේල් 16 වන දින පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ආසියා පැසිෆික් අධ්‍යක්ෂ සමඟ රැස්වීම සඳහා සහභාගී වීම.

x. 2021 මැයි 24 වන දින පැවති 49 වන ආසියානු නිශ්කාෂණ සංගමයේ (ACU) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වීම.

xi. 2021 ජුනි 21 වන දින පැවති ශ්‍රී ලංකා - මෂ්රෙක් ආයෝජකයන් දැනුවත් කිරීමේ වැඩසටහන (Sri Lanka-Mashreq Non-Deal Roadshow) සඳහා සහභාගී වීම.

xii. 2021 ජුනි 22 වන දින පැවති Franklin Templeton, Bluebag, Goldman AM සහ Wellington සමඟ පැවති ආයෝජක හමුව සඳහා සහභාගී වීම.

xiii. 2021 ජූලි 12 වන දින CNBC ලෝක නාලිකාව සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව සඳහා සහභාගී වීම.

xiv. 2021 අගෝස්තු 10 වන දින ඉන්දියානු සංචිත බැංකුවේ අධිපතිවරයා සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

xv. 2021 සැප්තැම්බර් 17 වන දින පැවති ශ්‍රී ලංකා මහ බැංකුවේ නව අධිපතිවරයා ලෙස වැඩ භාර ගැනීම පිළිබඳ Bloomberg සමඟ සම්මුඛ සාකච්ඡාව සඳහා සහභාගී වීම.

xvi. 2021 සැප්තැම්බර් 25 වන දින ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ පැවති ශ්‍රී ලංකාවේ ණය තිරසාර මට්ටමින් පවත්වා ගැනීම/කාලීන අභියෝග පිළිබඳ වැඩසටහනේ ප්‍රධාන දේශකයා ලෙස සහභාගී වීම.

xvii. 2021 සැප්තැම්බර් 27 වන දින පැවති සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී (CMA) ආයතනයේ මාර්ගගත රැස්වීම සඳහා සහභාගී වීම.

xviii. 2021 සැප්තැම්බර් 30 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව, ආසියානු සංවර්ධන බැංකු ආයතනය (ADBI) සහ ආසියානු පැසිෆික් ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය (APAEA) සමඟ එක්ව පැවති සාර්ව ආර්ථික ස්ථායිභාවය සඳහා පැන නගින ගැටලු පිළිබඳ වැඩමුළුව සඳහා සහභාගී වීම.

xix. 2021 ඔක්තෝම්බර් 01 වන දින CNBC Asia නාලිකාව සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව සඳහා සහභාගී වීම.

xx. 2021 ඔක්තෝම්බර් 07 වන දින පැවති වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳ Bloomberg සමඟ සම්මුඛ සාකච්ඡාව සඳහා සහභාගී වීම.

xxi. 2021 ඔක්තෝම්බර් 11 වන දින පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ රැස්වීම සඳහා සහභාගී වීම.

xxii. 2021 ඔක්තෝම්බර් 11 වන දින පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකු වාර්ෂික රැස්වීම්/G-24 අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වීම.

xxiii. 2021 ඔක්තෝම්බර් 14 වන දින ආයෝජකයන් සමඟ පැවති HSBC නැගී එන ගෝලීය වෙළඳපොළ සමුළුව සඳහා සහභාගී වීම.

xxiv. 2021 නොවැම්බර් 15 වන දින පැවති 42 වන දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය (SAARC FINANCE) සංවිධානයේ මහ බැංකු අධිපතිවරුන්ගේ කණ්ඩායම් රැස්වීම සඳහා සහභාගී වීම.

xxv. 2021 දෙසැම්බර් 02 වන දින ශ්‍රී ලංකාවේ වාර්ෂික සමාලෝචනය පිළිබඳ Fitch ශ්‍රේණිගත කිරීම් සමඟ පැවති සාමූහික දුරකථන සංවාදයට සම්බන්ධ වීම.

xxvi. 2021 දෙසැම්බර් 06 වන දින පැවති අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) අධිපතිවරුන්ගේ මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වීම.

xxvii. 2021 දෙසැම්බර් 06 වන දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ මහ බැංකුවේ අධිපතිවරයා සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

xxviii. 2021 දෙසැම්බර් 07 වන දින මැදපෙරදිග කලාපයේ ශ්‍රී ලංකා තානාපතිවරුන් සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

xxix. 2021 දෙසැම්බර් 13 වන දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වෙසෙන ශ්‍රී ලාංකික වෘත්තිකයන් සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

xxx. 2021 දෙසැම්බර් 17 වන දින සෞදි අරාබි රාජධානියේ පදිංචි ශ්‍රී ලාංකික වෘත්තිකයන් සමඟ පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

### 16.6 උසස් කිරීම්/පත් කිරීම්

i. කේ. ජී. පී. සිරිකුමාර මහතා, ඩී. කුමාරතුංග මහතා, යූ. එල්. මුතුගල මහත්මිය සහ සී. පී. එස්. බණ්ඩාර මහතා 2021 නොවැම්බර් 17 වන දින සිට මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කරමින් සහකාර අධිපතිවරු ලෙස පත් කරන ලදී.

ii. බැංකු විදූ පියසේ අධ්‍යක්ෂ කේ. එම්. අබේකෝන් මහතා 2021 ජනවාරි 19 වන දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

iii. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ බී. එල්. ජේ. එස්. බාලසූරිය මහතා 2021 ජනවාරි 19 වන දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2021 නොවැම්බර් 24 වන දින සිට කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

iv. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආර්. එම්. ජයවර්ධන මහතා 2021 ජනවාරි 19 වන දින සිට කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2021 ජූලි 12 වන දින සිට කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ රාජකාරිවලට අමතරව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

ඉන් අනතුරුව, ඔහු 2021 නොවැම්බර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

v. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩබ්ලිව්. ආර්. එම්. කේ ප්‍රනාන්දු මහතා 2021 ජනවාරි 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලද අතර ඊට අතිරේකව 2021 සැප්තැම්බර් 16 වන දින සිට අධිපති ලේකම් කාර්යාලයට අනුයුක්තව අධිපති ලේකම් ලෙස ද පත් කරන ලදී. ඉන් අනතුරුව, 2021 සැප්තැම්බර් 24 වන දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ රාජකාරියට අමතරව අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

vi. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්. එස්. කේ. ධර්මවර්ධන මහතා 2021 ජනවාරි 19 වන දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2021 නොවැම්බර් 24 වන දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

vii. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආර්. ඩී. ටී. ගුණසේකර මහත්මිය 2021 ජනවාරි 19 වන දින සිට ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

viii. ප්‍රතිපත්ති සමාලෝචන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සී. පී. එස්. බණ්ඩාර මහතා 2021 ජනවාරි 19 වන දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ix. ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩී. එස්. ඩබ්ලිව්. සමරතුංග මහත්මිය 2021 ජනවාරි 19 වන දින සිට බැංකු විද්‍යා පීඨයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

x. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ඒ. එම්. ගුණතිලක මහතා 2021 ජනවාරි 19 වන දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2021 නොවැම්බර් 24 වන දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

xi. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්. ඩී. එස්. එන්. ගුණතිලක මහතා 2021 පෙබරවාරි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2021 අප්‍රේල් 19 වන දින සිට නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

xii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජී. සී. ඒ. ආරියදාස මහතා 2021 පෙබරවාරි 22 වන දින සිට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xiii. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ටී. එම්. ආර්. පී. යටිගම්මන මහත්මිය 2021 අප්‍රේල් 19 වන දින සිට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

xiv. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඊ. ඩබ්ලිව්. කේ. ජේ. බී. ඇහැලේපොල මහතා 2021 අප්‍රේල් 27 වන දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xv. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඩබ්ලිව්. ජී. ප්‍රභාත් මහතා 2021 අප්‍රේල් 27 වන දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xvi. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආර්. ආර්. ජයරත්න මහතා 2021 මැයි 10 වන දින සිට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xvii. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ඒ. අයි. එන්. වික්‍රමසිංහ මහත්මිය 2021 මැයි 10 වන දින සිට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xviii. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ආර්. ඒ. ඒ. පෙරේරා මහතා 2021 ජූලි 27 වන දින සිට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xix. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජේ. පී. ගමලත් මහතා 2021 සැප්තැම්බර් 21 වන දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xx. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර මහතා 2021 සැප්තැම්බර් 21 වන දින සිට මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxi. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඩී. එස්. ටී. වානගුරු මෙනවිය 2021 සැප්තැම්බර් 28 වන දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxii. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය බී. එච්. පී. කේ. තිලකවීර මහතා 2021 නොවැම්බර් 03 වන දින සිට විදේශ ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxiii. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. එන්. එන්. එම්. බණ්ඩාර මහත්මිය 2021 නොවැම්බර් 24 වන දින සිට මහ බැංකුවේ ලේකම් ලෙස පත් කරන ලදී.

xxiv. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩී. එම්. ඩී. බී. දිසානායක මහතා 2021 නොවැම්බර් 24 වන දින සිට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxv. මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි මහත්මිය 2021 නොවැම්බර් 24 වන දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxvi. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එම්. ආර්. විජේවර්ධන මහතා 2021 නොවැම්බර් 24 වන දින සිට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxvii. ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම් ජේ. එම්. අමීර් මහතා 2021 නොවැම්බර් 24 වන දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxviii. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය එච්. කේ. ජේ. ඒකනායක මහත්මිය 2021 නොවැම්බර් 24 වන දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxix. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. ආර්. කරුණාරත්න මහත්මිය 2021 නොවැම්බර් 24 වන දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxx. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්ලිව්. එම්. ප්‍රියංකර මහතා 2021 නොවැම්බර් 24 වන දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxxi. මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්ලිව්. ජී. එස්. එස්. ජේ. කීර්තිරත්න මහත්මිය 2021 දෙසැම්බර් 03 වන දින සිට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxxii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස සේවය කිරීමෙන් අනතුරුව සේවයට වාර්තා කළ ආචාර්ය වයි. එම්. ඉන්ද්‍රරත්න මහත්මිය 2021 දෙසැම්බර් 13 වන දින සිට අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ විශේෂ ව්‍යාපෘති භාර අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxxiii. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී එන්. වයි. ඩී. සී. වීරසිංහ මහතා 2021 දෙසැම්බර් 31 වන දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxxiv. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. එල්. නිහාල් මහතා 2021 දෙසැම්බර් 31 වන දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

### 16.7 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

i. 2021 නොවැම්බර් 30 වන දින දක්වා මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ, ආචාර්ය වයි. එම්. ඉන්ද්‍රරත්න මහත්මිය, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ii. මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ එස්. රණසිංහ මහත්මිය, පරිපාලන සහකාර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

### 16.8 විශ්‍රාම ගැනීම්/සේවයෙන් ඉල්ලා අස්වීම්

2021 වසර තුළ දී, නියෝජ්‍ය අධිපතිවරුන් දෙදෙනෙකු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සිව්දෙනෙකු සහ එක් නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ඇතුළුව නිලධාරීන් 44 දෙනෙකු බැංකු සේවයෙන් විශ්‍රාම ගනු ලැබීය. එක් අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙකු ඇතුළුව නිලධාරීන් 14 දෙනෙකු බැංකු සේවයෙන් ඉල්ලා අස්විය.

## 17. තොරතුරු තාක්ෂණ

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව (තො.තා.දෙ.) කොවිඩ්-19 වසංගතය තුළ තාක්ෂණික අභියෝග සාර්ථකව කළමනාකරණය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා එහි ක්‍රියාකාරී කාර්යභාරය සාර්ථකව හා අඛණ්ඩව සිදුකරන ලදී. තවද මහ බැංකුවට අවශ්‍ය ව්‍යවසාය මට්ටමේ ඒකාබද්ධ යෙදුම් (Enterprise Level Integrated Applications) සහ සුරක්ෂිත යටිතල පහසුකම්

ලබා දෙමින්, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාශීලී භූමිකාව පසුගිය අභියෝගාත්මක කාලය තුළ දී අඛණ්ඩව පවත්වාගෙන යාමට තො.තා.දෙ. සමත් විය.

වසර තුළ, තො.තා.දෙ. විසින් ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් යටතේ සිය සේවාවන් සපයන ලදී. (අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම; (ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම; (ඇ) අති නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් ස්ථාපනයට දායක වීම; (ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම; සහ (ඉ) තොරතුරු තාක්ෂණ සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම.

**(අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම;**

රටේ විදේශ සංචිත කළමනාකරණය කිරීම සඳහා නවීන සංචිත කළමනාකරණ පද්ධතියක් (Reserve Management System) ස්ථාපනය කිරීමේ ක්‍රියාවලියේ දී තො.තා.දෙ. ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. තවද, විදේශ සංචිත නොවන වෙනත් විදේශ මුදල් (Forex) ආශ්‍රිත ගනුදෙනු සැකසීම සඳහා, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ (Payments & Settlements Department) ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සලසමින්, වෙනම පද්ධතියක්, සංචිත නොවන කළමනාකරණ පද්ධතිය (Non Reserve Management System) නමින් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන ලදී. මූල්‍ය දෙපාර්තමේන්තුව (Finance Department) සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව (Public Debt Department) මෙම පද්ධතිය හරහා විදේශ විනිමය ගනුදෙනු කළමනාකරණය කරන අතර ආසියානු නිෂ්කාශන සංගමය (Asian Clearing Union) ආශ්‍රිත ගෙවීම්, විදේශ ණය ගෙවීම්, භාණ්ඩාගාර ගෙවීම් සහ බැංකුව විසින් සිදු කරනු ලබන අනෙකුත් ගෙවීම් ඇතුළු විදේශීය ගෙවීම් වර්ග රාශියක් සැකසීමට අවශ්‍ය මූල්‍ය පණිවිඩ නිර්මාණය සඳහා මෙම පද්ධතිය පහසුකම් සපයයි.

මෙහෙයුම් සහ ප්‍රතිපත්ති තීරණ ගැනීම වැඩිදියුණු කිරීමේ අරමුණින් බැංකුවේ ප්‍රධාන උපායමාර්ගික සැලසුමකින් යෝජිත වූ බලපත්‍රලාභී වාණිජ බැංකු (License Commercial Banks) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (License Specialized Banks) වෙතින් අනෙකුත් රටවල් සමඟ සහ දේශීය විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියක් (International Transaction Reporting System) තො.තා.දෙ මගින් සාර්ථකව නිම කරන ලදී. තවද එය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා තො.තා.දෙ විසින් බැංකු වෙත තාක්ෂණික දැනුම ලබා දෙන ලදී.

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සඳහා නිර්මාණය කරන ලද නව වෙබ්-පාදක පද්ධතිය මගින් සුරැකුම්පත් වෙන් කිරීම, අනුමත කිරීම සහ වාර්තා උත්පාදනය වැඩිදියුණු කරන ලද අතර ඒ මගින් විවෘත වෙළඳපළ මෙහෙයුම් (Open Market Operations) සහ පියවීම් කටයුතු වැඩිදියුණු කරන ලදී.

2022 වසරේ දී මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් වාර්තා කරන තොරතුරු අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් පරිශීලනය කරනු ලබන මධ්‍යම දත්ත සමුදායක පද්ධතියක් වන FinNet පද්ධතිය, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (Sri Lanka Financial Reporting Standars-9) ට අනුකූලව මූල්‍ය තොරතුරු රැස් කිරීම සඳහා තවදුරටත් වැඩිදියුණු කරන ලදී. තවද, මූල්‍ය වාර්තාකරණය සහ නියාමනය තවත් ශක්තිමත් කරමින් බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් (License Micro Finance Companies) ද FinNet පද්ධතිය වෙත ඇතුළත් කරන ලදී.

බැංකු කටයුතු අධ්‍යන කේන්ද්‍රය හි වැඩසටහන් සහ පහසුකම් කළමනාකරණය කිරීම සඳහා ස්වයංක්‍රීය, ආරක්ෂිත සහ භාවිතයට පහසු ආයතන කළමනාකරණ පද්ධතියක් සමඟ බැංකු කටයුතු අධ්‍යන කේන්ද්‍රය (Centre for Banking Studies) සඳහා නව වෙබ් අඩවියක් හඳුන්වා දීමට වසර තුළදී පහසුකම් සපයන ලදී.

තො.තා.දෙ. විසින් සේවක අර්ථසාධක අරමුදල් (Employees Provident Fund (EPF)) දෙපාර්තමේන්තුවට නව වෙබ් යෙදුමක් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා දීම මගින්, සාමාජිකයන්ට සහ සේවා යෝජකයන්ට ලබා දෙන සේවා සහ පහසුකම් වැඩි දියුණු කිරීමේ හැකියාව ලබා දුනි. මෙම වෙබ් යෙදුම නව සහ වැඩිදියුණු කරන ලද EPF වෙබ් අඩවිය සමඟ දියත් කරන ලද අතර, එමගින් විද්‍යුත් අරමුදල් හුවමාරුව සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electric Funds Transfer Switch) ඔස්සේ සේවා යෝජකයන්ට පහසුවෙන් තම දායක මුදල් ගෙවීමට සහ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ (Currency Department) මුදල් කළමනාකරණ පද්ධතිය (Currency Management System(CMS)) පලුදු වූ මුදල් නෝට්ටු විනාශ කිරීමේ යන්ත්‍ර සමඟ ඒකාබද්ධ කරන ලදී. මෙමගින් CMS හි විනාශ වූ මුදල් නෝට්ටු අතින් පරිඝණක ගත කිරීමේ දී සිදු වූ අකාර්යක්ෂමතාව ඉවත් වූ අතර, පලුදු වූ මුදල් විනාශ කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ ආරක්ෂාව වැඩිදියුණු කරන ලදී.

ඉහත සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අමතරව, තො.තා.දෙ. බැංකුවේ මෙහෙවරට වැදගත් වන තවත් නව පද්ධති සහ වැඩිදියුණු කිරීම් කිහිපයක් ආරම්භ කරන ලදී.

ණය සැකසීම විධිමත් කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට (Regional Development Department) අවශ්‍ය වන ප්‍රතිමූල්‍යකරණය, පොළී සහනාධාර සහ ණය ඇපකර යෝජනා ක්‍රම සඳහා නව පරිගණක යෙදුවමක් තො.තා.දෙ. විසින් ආරම්භ කරන ලදී. නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවට (Resolution Enforcement Department) අවශ්‍ය බැංකු සහ මූල්‍ය සමාගම් වෙතින් දත්ත රැස් කිරීම සඳහා තැන්පතු දත්ත එකතු කිරීමේ මෙවලමක් තො.තා.දෙ විසින් සංවර්ධනය කරන ලදී. රටට ලැබෙන අපනයන ආදායම නිරීක්ෂණය කිරීම සඳහා, තො.තා.දෙ විසින් අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතියක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. මෙම ක්‍රමය මගින් භාණ්ඩ හා සේවා අපනයන සඳහා අපනයන ආදායම ආපසු ගෙන්වා

ගැනීම් සහ ඒවායේ පරිවර්තන තත්ත්වය නිරීක්ෂණය කිරීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට (Department of Foreign Exchange) පහසුකම් සැලසේ. කාර්ය මණ්ඩල ණය සැකසීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තො.තා.දෙ විසින් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (Staff Services Management Department) සඳහා නව සහ වැඩිදියුණු කළ වෙබ්-පාදක ණය ප්‍රදානය කිරීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී. තො.තා.දෙ විසින් දෙපාර්තමේන්තු වල විශේෂ දත්ත අවශ්‍යතා සපුරාලන අතර මෘදුකාංග පද්ධති සහ ඒ ආශ්‍රිත ක්‍රියාවලි සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන සඳහා පහසුකම් සලසා ඇත. තවද, තො.තා.දෙ. විසින් දෙපාර්තමේන්තු කිහිපයක භෞතික ලේඛන ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සම්පූර්ණ කිරීමෙන්, ලේඛන හැසිරවීමට අදාළ පුද්ගල වගකීම/එලදායිතාව වැඩි කිරීමෙන් ලේඛන කළමනාකරණ පද්ධතියෙහි (Document Management System) භාවිතය පුළුල් කරන ලදී.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම**

බැංකුවේ භාවිතා වන සියලු තොරතුරු තාක්ෂණ පද්ධති සහ තොරතුරු යටිතල පහසුකම් නවීන තාක්ෂණික ප්‍රගතියට සරිලන පරිදි වසර තුළ දී වැඩිදියුණු කරන ලදී.

විදුලි සංදේශ කර්මාන්ත සංගමයේ (Telecommunications Industry Association (TIA) 942) Rated-3) ප්‍රමිතියට අනුකූල වන පරිදි නව ප්‍රධාන කාර්යාල දත්ත මධ්‍යස්ථානය පිහිටුවීමට අදාළ කටයුතු දිගටම කරගෙන යන ලදී.

ආපදා ප්‍රතිසාධන අංශයේ (Disaster Recovery Unit) ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා, තො.තා.දෙ විසින් නවතම තාක්ෂණයන්ගෙන් සමන්විත නව ඉලෙක්ට්‍රොනික ගිනි පවුරු (Firewall) පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

බැංකුවේ අතථ්‍ය පුද්ගලික ජාලය (Virtual Private Network (VPN)) තොරතුරු තාක්ෂණ ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ද්වි-සාධක සත්‍යාපනය (Two-Factor Authentication) සහ අනෙකුත් ආරක්ෂිත සම්බන්ධතා යාන්ත්‍රණ ඇතුළත් කිරීම මගින් වැඩිදියුණු කරන ලදී.

**(ඇ) නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් ස්ථාපනය කිරීමට දායක වීම**

වසර තුළ ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කිහිපයකට තො.තා.දෙ විසින් තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real Time Gross Settlement) නවීකරණ ව්‍යාපෘතියට සක්‍රියව දායක වෙමින් නව සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ කටයුතු වලට සහභාගී වන ලදී.

තවද, තො.තා.දෙ. විසින් ඉලෙක්ට්‍රොනික වෙළඳ වේදිකාවක් (Electronic Trading Platform), මධ්‍යම සුරැකුම්පත් තැන්පතුවක් (Central Securities Depository) සහ මධ්‍යම ප්‍රති පාර්ශ්වීය (Central Counter Party-CCP) විසඳුමක් සහිත නිෂ්කාශන නිවසක් (Clearing House) පිහිටුවීම සඳහා දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියට විශේෂඥ තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම**

තො.තා.දෙ, බැංකුවේ සියලුම තොරතුරු තාක්ෂණ වත්කම් සුරක්ෂිත කිරීමට පියවර ගත් අතර බැංකුවේ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිතව නිවසේ සිට රාජකාරි කිරීමේ පරිසරයක් සඳහා පහසුකම් සැලසීය.

තවද මෘදුකාංග යෙදුම්වල අභ්‍යන්තරව සිදු කරනු ලබන නිරන්තර අවදානම් තක්සේරු කිරීම්වලට අමතරව, ඕනෑම සයිබර් ආරක්ෂණ තර්ජනයක් සඳහා පද්ධති හොඳින් සූදානම් බව සහතික කිරීම සඳහා මූල්‍ය පණිවුඩකරණ ජාලය ආශ්‍රිත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පිළිබඳ අවදානම් ඇගයීමක් සිදු කරන ලදී. ඉහළ මට්ටමේ ආරක්ෂාවක් සහතික කිරීම සඳහා මූල්‍ය පණිවිඩ ජාලය සහ අනෙකුත් මෙහෙයුම් තීරණාත්මක පද්ධති ඉලක්ක කර ගනිමින් බාහිර තොරතුරු ආරක්ෂණ අවදානම් තක්සේරුවක් ද සිදු කරන ලදී. එයට සමගාමීව ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණ විශ්ලේෂකයක් (Security Information and Event Management) ක්‍රියාත්මක කිරීමත් සමඟ බැංකුවේ සයිබර් ආරක්ෂක ක්‍රමෝපායන් තවත් වැඩි දියුණු කරන ලදී.

බැංකුවේ සේවකයන්ට ව්‍යවසාය මෘදුකාංග යෙදුම් (Enterprise Applications) භාවිතය පිළිබඳ දැනුම සහ මග පෙන්වීම ලබා දීම සඳහා අතථ්‍ය දැනුවත් කිරීමේ (Virtual Awareness) වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**(ඉ) තොරතුරු තාක්ෂණ සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම**

නිවසේ සිට රාජකාරි කිරීමේ විධිවිධාන සඳහා තො.තා.දෙ. මගින් සහය ලබා දුන් අතර, බැංකුවේ දෛනික මෙහෙයුම් අඛණ්ඩව කරගෙන යාමට එනිසා හැකි විය. තවද පරිගණක පද්ධති වෙත ආරක්ෂිතව ප්‍රවේශ වීමේ අවස්ථාව සහතික කරමින් මෘදුකාංග භාවිතය පිළිබඳ කර්මාන්තයේ හොඳම භාවිතයන් භාවිත කිරීමට සේවකයන්ට අවස්ථාව සලසන ලදී. විවිධ අභියෝග මධ්‍යයේ තො.තා.දෙ. අභ්‍යන්තර තාක්ෂණික සේවා කවුළුව (Help Desk) සියලුම සේවා විමසුම් සඳහා එකවර සහය ලබා දීමට සමත් වූ අතර කර්මාන්ත ප්‍රමිතීන්ට සමගාමීව තීරණාත්මක යටිතල පහසුකම් සේවා (99.5%ට වැඩි) ඉහළ මට්ටමක පවත්වා ගෙන ගියේය.

කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිපුණතා නංවාලීම සඳහා සහ බැංකුව තුළ වඩාත් තාක්ෂණික දැනුමක් ඇති සහ නව අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව ඇති සේවක ප්‍රජාවක් ඇති කිරීම සඳහා, තො.තා.දෙ. විසින් දැනුවත් කිරීමේ ඉලෙක්ට්‍රොනික පත්‍රිකා අභ්‍යන්තර පරිගණක ජාලයේ ප්‍රකාශයට පත් කිරීම සහ කාර්ය මණ්ඩලය වෙත විද්‍යුත් තැපැල හරහා ආරක්ෂක උපදේශන පණිවිඩ බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව, තො.තා.දෙ. හි කාර්ය මණ්ඩලය, බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සහ අදාළ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ දියුණුව පිළිබඳ ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර අත්‍යය වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා ක්‍රියාකාරීව සහභාගී වූහ.

## 18. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලයේ දැක්ම, මෙහෙවර, කාර්ය වපසරිය, අධිකාරී බලය, වගකීම, වගවීම සහ ස්වාධීනත්වය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරයි. 2021 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 18.1 අභ්‍යන්තර විගණන සැලසුම්

2022 - 2024 සඳහා උපාය මාර්ගික විගණන සැලස්ම සහ 2022 වසර සඳහා වාර්ෂික විගණන සැලස්ම සකස් කරන ලදී.

### 18.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

(අ) **ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්**

2021 වසරේ දී, ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් සිදු කරන ලදී. සෑම විගණනයක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, විගණන ප්‍රතිඵල සන්නිවේදනය සහ නිරාකරණයන්ට අදාළ කටයුතු කිරීම යන පියවර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිම කිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන කෙටුම්පත් වාර්තා නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තා නිකුත් කිරීම යන පියවර තුනකින් යුතු ක්‍රියාවලිය අනුගමනය කරන ලදී. ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පසු විපරම් කිරීම ද වසර තුළ දී සිදු කරන ලදී.

(ආ) **ප්‍රගතිය වාර්තා කිරීම**

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට වාර්තා කරන ලදී. එමෙන්ම කරන ලද විගණනයන් පිළිබඳ වාර්තා මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හරහා ජාතික විගණන කාර්යාලයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන කටයුතු සඳහා පත් කර ඇති විගණන අධිකාරීට ඉදිරිපත් කරන ලදී.

(ඇ) **අභ්‍යන්තර විගණන වාර්තා මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව සහ මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අභ්‍යන්තර විගණන වාර්තා මුදල් අමාත්‍යාංශයෙහි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙත වසර තුළ දී ඉදිරිපත් කරන ලදී.

### 18.3 දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා 'අභ්‍යන්තර විගණන පහසුකම් සැපයීමේ මාර්ගෝපදේශ' පිළිබඳ ඉදිරිපත් කිරීමක් 2021 වසරේ දී සිදු කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ආරාධිත විගණන වෘත්තිකයෙකු විසින් තොරතුරු තාක්ෂණ විගණනය පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද සිදු කරන ලදී.

### 18.4 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම එමගින් සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සැලසීම ද වසර තුළ දී සිදු කරන ලදී.

## 19. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු

මුදල් නීති පනතේ සක්‍රිය විධිවිධාන ප්‍රකාරව, නිල විදේශ විනිමය සංචිත කළමනාකරණ සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් අධීක්ෂණ කාර්යයන් විධිමත්ව හා සුමටව ක්‍රියාත්මක කිරීමේ කාර්යභාර්ය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### 19.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර සංචිතවල ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ යන අරමුණු සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයට (Investment Policy Statement) සහ ආයෝජන මාර්ගෝපදේශයන්ට (Investment Guideline) අනුකූලව, විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවේ (International Reserves Investment Oversight Committee - IRIOC) නිර්දේශ යටතේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින්, විදේශ සංචිත කළමණාකරණය සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ සංචිත කළමනාකරණය, 2016 වසරේ සිට වත්කම් හා වගකීම් ව්‍යුහයට අනුකූලව ගොඩනැගූ විද්‍යාත්මක රාමුවක් පදනම් කරගෙන සිදු කෙරෙමින් පවතී. මෙම විද්‍යාත්මක රාමුව ගොඩනැගීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතා, ප්‍රාග්ධන සංරක්ෂණය, ආදායම් උත්පාදනය සහ දැරිය හැකි අවදානම් මට්ටම යන කරුණු ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත ප්‍රධාන කාණ්ඩ තුනකට වෙන්කොට ඇති අතර, එම එක් එක් කාණ්ඩය සඳහා වෙන් වෙන් වූ ආයෝජන කාල පරාස, වත්කම් සංයුති හා මුදල් සංයුති ඇතුළත් වේ. එම එක් එක් ආයෝජන කාණ්ඩ යටතේ, විවිධ ආයෝජන කළඹ පවත්වාගෙන යනු ලැබේ.

කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය ලොව පුරා පැතිර යාමත් සමඟ මුහුණ දීමට සිදු වූ පෙර නොවූ විරූ සිදුවීම් හමුවේ, සංචිත කළමනාකරණයේ සාම්ප්‍රදායික අරමුණු වන ද්‍රවශීලතාවය, ආරක්ෂාව සහ ප්‍රතිලාභ යන ක්‍රියාකාරකම් 2020 වසරේ සිට වෙනස් මගකට යොමු විය. දැඩි උච්චාවචනයන් සමඟ ප්‍රාග්ධන වෙළඳපොළේ පැවැති නොසන්සුන්කාරී තත්ත්වයන් හමුවේ ඇති විය හැකිව තිබූ ආතතික තත්ත්වයන් සමස්ත ලෝකයටම සරල යථාර්ථයක් බවට පත් විය. මෙම තත්ත්වය, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණ කටයුතු කෙරෙහි ද බලපෑම් ඇති කළේය. මෙම වසර ඉතිහාසයේ නොවූ විරූ අභියෝගාත්මක වසරක් වූ අතර, ප්‍රශස්ත සංචිත කළමනාකරණ මෙහෙයුම් සීමා වී, පවතින තත්ත්වයට සහ කාලයට අනුරූපී ප්‍රවේශයන් තුළින් සංචිත කළමනාකරණය සිදු කිරීමට සිදු විය. ගෝලීය වසංගත තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ දේශ සීමා වසා දැමීම හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් ම අඩපණ විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රටේ විදේශ අංශයට දරුණු බලපෑමක් ඇති විය. මෙවැනි තත්ත්වයක් යටතේ රටේ ණය ශ්‍රේණිගත කිරීම් ද පහළට සංශෝධනය කෙරිණි.

මෙම වාතාවරණය යටතේ, රටෙහි ප්‍රධාන ආදායම් සහ ණය මූලාශ්‍ර සීමා වීමක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 අප්‍රේල් මාසයේ සිට, විශේෂයෙන් ම රජයේ විදේශ ණය පියවීම සඳහා නිරන්තරයෙන් ම විදේශ සංචිත යොදාගැනීමට මහ බැංකුවට සිදු විය. එම තත්ත්වය ශ්‍රී ලංකාව වැනි නැගී එන ආර්ථිකයකට අතිශය අභියෝගාත්මක කාර්යයක් වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩි අවධානයක් ද්‍රවශීලතා කළමනාකරණය කෙරෙහි යොමු කිරීමට සිදු විය. විදේශ ණය පියවීම් තව දුරටත් පවත්වා ගැනීම සඳහා රජය සහ මහ බැංකුව විසින් පුළුල් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. මහ බැංකු කිහිපයක් සමඟ ප්‍රති මිලදී ගැනීම් (repo) ගනුදෙනුවලට එළඹීම, වත්කම් සංයුතිය වෙනස් කිරීම, මූල්‍ය පහසුකම් සම්බන්ධයෙන් වෙනත් රජයන් සමඟ සාකච්ඡා කිරීම, ණය ගනුදෙනු පියවීම් සඳහා විවිධ ක්‍රමවේද ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ මුදල් හුවමාරු (swap) පහසුකම්වලට එළැඹීම එම ක්‍රියාමාර්ග අතර විය. එවැනි පසුබිමක් තුළ, සම්මත සංචිත කළමනාකරණ ප්‍රතිපත්ති භාවිතයන්ගෙන් බැහැරව, රටම විශේෂිත වූ විදේශ මුදල් අවශ්‍යතා, ප්‍රතිපත්ති සැකසීම් සහ බාහිර තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කරමින් සංචිත කළමනාකරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමට අවධානය යොමු කිරීමට සිදු විය.

මේ අතර, 2014 ජනවාරි මස සිට ක්‍රියාත්මක වූ සංචිත කළමනාකරණ පද්ධතිය වෙනුවට, 2022 ජනවාරි 01 වන දින නව සංචිත කළමනාකරණ පද්ධතියක් (Reserve Management System - RMS) මහ බැංකුව විසින් සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. මෙම නව සංචිත කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 2020 දෙසැම්බරයේ ආරම්භ වූ අතර, මහ බැංකුවේ සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා සංකීර්ණ හා වඩාත් උචිත වූ පද්ධතියක ස්ථාපනය තහවුරු කිරීම සහ ක්‍රියාත්මක කිරීම, එය වැඩිදියුණු කිරීම, ඒකාබද්ධ කිරීම, සැලසුම් කිරීම සහ සමාන්තර පරීක්ෂණ 2021 වසරේ දී සිදු කරන ලදී. කාර්යසාධන සහ අනුකූලතා උපකරණ, සංකීර්ණ ආයෝජන කළඹ විශ්ලේෂණය සහ අවදානම් කළමනාකරණය යන මෙවලම් හඳුන්වාදීමත් සමඟ නව සංචිත කළමනාකරණ පද්ධතිය ඔස්සේ බැංකුවේ සංචිත කළමනාකරණය වැඩි දියුණුවනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

## 19.2 කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම්

විදේශ සංචිත මට්ටම්වල තියුණු පහත වැටීමක් තිබියදීත්, මහ බැංකුව විසින් කළමනාකරණය කරන ලද සංචිත සහ දළ නිල සංචිත සුපුරුදු පරිදි දෛනිකව සම්පාදනය කරන ලද අතර, සම්පූර්ණ ප්‍රතිලාභ ප්‍රවේශය මත පදනම්ව සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය තක්සේරු කර, කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.

නිල සංචිත ගොඩනගා ගන්නා තෙක්, කෙටි කාලීන විදේශ විනිමය ද්‍රවශීලතාවය තුළින් වුව ද, නිල සංචිත සඳහා යම් සහායක් ලබා ගැනීමේ අදහසින්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් කලාපීය මහ බැංකු සමඟ ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම් කිහිපයක් සාකච්ඡා කර, ඒවා ක්‍රියාත්මක කිරීමට අදාළ පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කෙරිණ. ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුමක් වෙත ඇතුළත් වීම දිගු කාලීන ක්‍රියාවලියක් වන අතර, සපයන ලද පාර්ශ්වය සහ ඉල්ලා සිටින පාර්ශ්වය අතර නීතිමය ප්‍රතිපාදන සහ මූල්‍ය කොන්දේසි සම්බන්ධයෙන් සන්නිවේදන සිදු කිරීම සහ සාකච්ඡා වට ගණනාවක් පැවැත්වීමෙන් අනතුරුව මුදල් මණ්ඩලයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම එයට ඇතුළත් වේ. ඒ අනුව, මහ බැංකුව 2021 වසරේ මාර්තු සහ අගෝස්තු මාසවල දී පිළිවෙළින්, චීන මහජන බැංකුව සහ බංග්ලාදේශ බැංකුව සමඟ ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුම් දෙකකට ඇතුළත් විය. බංග්ලාදේශ බැංකුව සමඟ ඇති කර ගත් ද්විපාර්ශ්වික මුදල් හුවමාරු ගිවිසුමේ ප්‍රතිපාදන යටතේ, කාණ්ඩ තුනකින් ඩොලර් මිලියන 200ක් ලබා ගත් අතර, චීන මහජන බැංකුව සමඟ අත්සන් කරන ලද ගිවිසුම යටතේ වසරක කාලයක් සඳහා චීන යුවාන් බිලියන 10ක් (එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5ක් පමණ) 2021 දෙසැම්බර් මාසයේ දී ලබා ගත් අතර, එය පූර්වාරක්ෂණයක් වශයෙන් පවත්වා ගැනුණි. තවද, මුදල් හුවමාරු පහසුකම් සුරක්ෂිත කර ගැනීම ඉලක්ක කර ගනිමින් තවත් කලාපීය මහ බැංකු කිහිපයක් සමඟ ද සාකච්ඡා පවත්වන ලදී.

මේ අතර, අතිශය අභියෝගාත්මක ගෝලීය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුව ද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී සක්‍රීය විදේශ ගනුදෙනුකරුවන්ගේ මුදල් විශුද්ධිකරණයට එරෙහි/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අනුකූලතාවන්ට අදාළ වාර්ෂික ඇගයීම සිදු කරන ලදී.

## 19.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ ප්‍රවණතා

කොවිඩ්-19 වසංගතයෙන් පැන නැගුණු අර්බුද සහ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් අඛණ්ඩව ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සංශෝධන හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන් හමුවේ වුව ද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, වසර තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ශ්‍රී ලංකා රුපියලේ බාහිර අගය ස්ථාවරව තබා

ගැනීම සඳහා අඛණ්ඩව සක්‍රීය ලෙස කටයුතු කළේය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනය සහ විනිමය අනුපාතය සම්බන්ධයෙන් වෙළඳපොළ සමපේක්ෂණ යම්තාක් දුරකට මැඩපැවැත්වීම සඳහා 2021 අප්‍රේල් මස අග සිට එක්සත් ජනපද ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය රු. 200 - රු. 203 පරාසය තුළ පවත්වා ගනිමින් විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට බැංකු අන්‍යෝන්‍ය වශයෙන් එකඟ විය. තවද, 2021 සැප්තැම්බර් මස මුල සිට එක්සත් ජනපද ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය රු. 200 - රු. 203 තුළ තබා ගනිමින් විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට සියලුම බැංකු වෙත අධිපතිතුමා විසින් දෙන ලද උපදෙස් අනුව දේශීය අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළේ සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය නියමිත පරාසය තුළ පැවතුණි. තවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුද විසඳීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නංවන ලද අතර, එම උත්සාහයන් සාර්ථක කර ගැනීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සක්‍රීයව සම්බන්ධ විය. 2021 වසර තුළ දී, නිල විදේශ සංචිත ශක්තිමත් කිරීම සඳහා රුපියල් බවට පරිවර්තනය කරන ලද අපනයන ආදායම සහ රුපියල් බවට පරිවර්තනය කරන ලද සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී.

තොරතුරු බෙදා හැරීම සම්බන්ධයෙන් සැලකීමේ දී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය නිවේදන ගණනාවක් නිකුත් කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවල දී බැංකු සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද පවත්වන ලදී. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ නිරූපිත (indicative) විනිමය අනුපාතිකය ඇතුළුව තවත් ලෝක මුදල් වර්ග පනස් හයක නිරූපිත විනිමය අනුපාතික, දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රධාන මුදල් වර්ග නවයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදුලි පැවරුම් සඳහා වූ මිලදී ගැනීමේ හා විකිණීමේ විනිමය අනුපාතිකයන්ගේ වෙන් වෙන්ව ගෙන ගණනය කරන ලද සාමාන්‍ය අගයයන් ද පළ කරන ලදී. තවද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විනිමය අනුපාතික පිළිබඳ තොරතුරු රාජ්‍ය ආයතනවලට සහ මහජනයා ඇතුළු විවිධ පාර්ශ්වයන් වෙත ඔවුන්ගේ ඉල්ලීම් මත බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සුමට ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීමේ අරමුණින්, සහ ඉහළ මට්ටමේ වෙළඳපොළ පැවැත්මක් තහවුරු කර ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සමපේක්ෂණ හැසිරීම් අඩු කිරීම සඳහා අදාළ මිනුම්දඬු ශක්තිමත් කරන ලද අතර, අවස්ථානෝචිත පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ විනිමය මෙහෙයුම් සඳහා අදාළ වන ශුද්ධ විවෘත විදේශ විනිමය සීමාවන් තාවකාලිකව සංශෝධනය කිරීමටත්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් පියවර ගත්තේය. ඒ අතරම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ විෂමාචාර හෝ වැරදි හැසිරීම් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවල වෙළඳපොළ සහභාගිකරුවන්ට එරෙහිව නිසි නියාමන ක්‍රියාත්මක කරන ලදී.

වෙළඳපොළ පිළිබඳ මතයන් නිරීක්ෂණය කිරීමේ දී, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රමවත් හැසිරීම සහතික කිරීම හා සම්බන්ධව පැවරී ඇති වගකීමට අනුව ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, විනිමය අනුපාතිකයේ අනවශ්‍ය විචලනයන් මැඩ පැවැත්වීම සඳහා නිර්දේශ ලබා දුන් අතර, 2021 වසර පුරාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු මෙන්ම, බාහිර ආයතන විසින් යෝජනා කරන ලද විවිධ ප්‍රතිපත්ති, යෝජනා, රෙගුලාසි සහ අදාළ කරුණු මත ඇති විය හැකි බලපෑම් පිළිබඳව සිය අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ (MOC) ලේකම්වරයා ලෙස අඛණ්ඩව කටයුතු කළ අතර, ඵලදායී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අදාළ සියලු තොරතුරු දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. තවද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින්, දේශීය-විදේශ විනිමය වෙළෙඳපොළ සහ නිල සංචිතයේ වර්ධනයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවට (MPC) සිය නිරීක්ෂණ අදහස් ලබා දෙන ලදී. විශේෂයෙන් ම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ වර්ධනයන් පිළිබඳව මෙන්ම අවධානය යොමු කළ යුතු කරුණු, ඉදිරි දැක්ම සහ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින්, නිරන්තරව කාලෝචිත ආකාරයෙන් මුදල් මණ්ඩලය දැනුවත් කරන ලදී. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ මෑත කාලීන වර්ධනයන් සහ විදේශ විනිමය අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත අවශ්‍ය අවස්ථාවන් හි අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ අතර, අවශ්‍ය සටහන් ද ඉදිරිපත් කරන ලදී. 2021 වසරේ දී, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ වුවද, විදේශ විනිමය සම්බන්ධ ගැටලු විසඳීම සඳහා පාරිභෝගිකයින් ඇතුළු වෙළෙඳපොළ සහභාගිකරුවන් සමඟ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අඛණ්ඩව සම්බන්ධ වූ අතර, ආර්ථිකය හැකිතාක් සුමටව ක්‍රියාත්මක කරවීමට හැකි වන ලෙස තෙල්, ගෑස්, ගල් අඟුරු, ඖෂධ සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු ආනයන අඛණ්ඩව සැපයීම සහතික කිරීමට සහය විය.

එපමණක් නොව, රට තුළට විදේශ විනිමය ගලා ඒම ආකර්ෂණය කර ගැනීම සහ ඒ අනුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළේ ද්‍රවශීලතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව විධිමත් ලෙස බැංකු අංශය හරහා ගලා එන සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීම් කිහිපයක් ලබා දෙන ලදී. විදේශ මුදල් නෝට්ටු ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයකට අමතර රු. 10ක් ලබා දීම වැනි ක්‍රියාමාර්ග රැසක් ඔස්සේ මහජනතාව ද දිරිමත් කරන ලදී. මෙම දිරිගැන්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිසිපරිදි පහසුකම් සපයන ලදී.

මේ අතර, වෙළඳපොළ අධීක්ෂණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කරමින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රාග්ධන වෙළඳපොළ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියට (CMP) ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිය දායකත්වය සහ අදහස් අඛණ්ඩව ලබා දෙන ලදී. එමගින්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ සඳහා

ඉලෙක්ට්‍රොනික වෙළඳ වේදිකාවක් ක්‍රියාත්මක කිරීමෙන්, ස්වාධීන මිල තීරණ යාන්ත්‍රණය සහ වෙළඳපොළ ද්‍රවශීලතාවය වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.

## 20. නීති හා අනුකූලතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ බැඳියාවන් ආරක්ෂා කිරීම මෙන්ම එහි අනුකූලතා මට්ටම සහ පාලන ප්‍රමිතීන් ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ස්ථාපිත කර ඇත්තකි. ඒ අනුව සලකා බැලූ විට, මූල්‍ය අංශයට නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම එනම්, නව නීති සකස් කිරීම, මහ බැංකුවේ පරිපාලනය යටතේ පවතින නීතිවලට උචිත සංශෝධන ගෙන ඒම සහ එහි නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව වෙත පැවරුණු ප්‍රධාන කාර්යභාරය වේ. 2021 වසරේ දී කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මුහුණ පෑමට සිදු වූ අභියෝග හමුවේ පසුබට නොවී, මහ බැංකුව විසින් සිදු කරන ලද පුළුල් පරාසයක විහිදුණු ක්‍රියාකාරකම් රැසක් සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව අඛණ්ඩව දායක වූ අතර ඒවා පහත පරිදි සාරාංශ කළ හැකිය.

නව බැංකු පනත සහ 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට වන සංශෝධනයන් ද ඇතුළුව මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ප්‍රධාන ව්‍යවස්ථාවන් සමාලෝචනය කිරීම සහ හඳුන්වාදීමෙහි ලා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් දායකත්වය සපයන ලදී. මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ රාමුව සඳහා වඩාත් ශක්තිමත් නෛතික පදනමක් සැපයීම සඳහා එවැනි ප්‍රතිසංස්කරණ අත්‍යන්තයෙන්ම අවශ්‍ය වේ. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව යෝජිත බැංකු පනතේ ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා සිදුකෙරුණු දෙවන සාකච්ඡා වටය පසුගිය වසරේ දී නිමාවට පත්විය. මුදල් ව්‍යාපාර පනතට යෝජිත සංශෝධන මගින් මහ බැංකුවේ නිරාකරණ කිරීමේ බලාධිකාරය ඇතුළුව බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් මහ බැංකුව සතු නියාමන සහ අධීක්ෂණ බලතල වැඩි දියුණු කිරීම සිදු වනු ඇත.

ඉහත සඳහන් කළ ප්‍රධාන ව්‍යවස්ථාවන්ට අමතරව, වෙළඳ, නිෂ්කාශනය සහ පියවීම් පිළිබඳ පනත, මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනත සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත යන නව නීති සම්පාදනය කිරීමට ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විශාල වශයෙන් සිය දායකත්වය සපයන ලදී. ඌණ ක්‍රියාකාරී වත්කම් හේතුවෙන් නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල ශේෂ පත්‍රයන් හි පවතින වගකීම්භාරය යම්තාක් දුරකට හෝ ලිහිල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිහිටුවීම සඳහා සංකල්ප මත පදනම් වූ නීතිමය රාමුවක් හඳුන්වාදීම මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනතේ අරමුණ විය. නව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත කෙටුම්පත් කරන ලද්දේ මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරය නියාමනය සහ අධීක්ෂණය සඳහා වෙන්වූ නියාමන අධිකාරියක් පිහිටුවීම සහ අදාළ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහතික කිරීම යන කාරණා මූලික කොට ගෙන ය. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව පසුගිය වසර තුළ ඉහත ක්‍රියාවලියේ අඛණ්ඩව නිරත විය.

මහ බැංකුව විසින් සිදු කරන ලද ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන ව්‍යාපෘතියට පහසුකම් සැලසීමේ අරමුණින් ශ්‍රී ලංකාව සඳහා නව වෙළෙඳ, නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනතක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදී. එහි මූලික අරමුණ වන්නේ රජයේ සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළෙඳපොළවල් සඳහා නවීන පශ්චාත් වෙළඳාම් නිෂ්කාශනය, මධ්‍යම ප්‍රතිපක්ෂ පද්ධති, බහු ව්‍යවහාර මුදල් තථ්‍ය කාලීන දළ පියවීම් පද්ධතිය ආදිය මගින් සහය දක්වන ආරක්ෂිත, නවීන, තරඟකාරී සහ සාධාරණ වෙළඳපොළවල් බවට පරිවර්තනය කිරීම සඳහා ඇවැසි පුළුල් නෛතික හා තාක්ෂණික යටිතල පහසුකම් හඳුන්වාදීම වේ. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව පසුගිය වසර පුරා මෙම ව්‍යාපෘතියේ නිරත විය. ඊට සමගාමීව, 1937 අංක 7 දරන ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනතට සහ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව ශක්තිමත් කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ පිළිබඳ මහජන විශ්වාසය යළි ස්ථාපිත කිරීම සඳහා ඒ යටතේ නිකුත් කර තිබූ අනුනීති සඳහා සංශෝධන ද යෝජනා කරන ලදී.

ඊට අමතරව, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශවයන් විසින් කෙටුම්පත් කරන ලද මහ බැංකුවට සහ මූල්‍ය අංශයට අදාළ ව්‍යවස්ථාවන් කිහිපයක් එනම්, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත, කොරෝනා වෛරස් රෝගය 2019 (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, දත්ත සුරැකීමේ පනත් කෙටුම්පත මෙන්ම විදේශ විනිමය පනත, ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ ලංකා බැංකු ආඥාපනත ආදිය සඳහා යෝජිත සංශෝධනයන් ද සමාලෝචනය කරන ලදී. එහි දී එම ව්‍යවස්ථා හඳුන්වා දීමෙහි ලා බැඳුණු ජාතික වැදගත්කම මෙන්ම මහ බැංකුවේ පවත්නා නියාමන සහ අධීක්ෂණ රාමුවට සහ එවැනි පනත්/සංශෝධනවල ඇති බලපෑම ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සළකා බලන ලදී.

2021 වසර තුළ දී, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ යහපාලනය සඳහා වූ ප්‍රතිපත්ති, එනම් දූෂ්කෘත නිවේදන ප්‍රතිපත්තිය, මහ බැංකු කාර්ය මණ්ඩලය සහ මුදල් මණ්ඩලයේ සාමාජිකයින් සඳහා අදාළ වන චර්යාධර්ම සංග්‍රහයන් සමාලෝචනය කිරීමට කටයුතු කරන ලදී. මේ අතර, මහ බැංකුවේ අනුකූලතා කාර්යයේ කේන්ද්‍රස්ථානය ලෙස නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතුවල නිරත වීමේදී එහි අනුකූලතාව සහතික කිරීම සඳහා, මහ බැංකුවේ විදේශීය සමපාර්ශවයන්ගේ අනුකූලතා අවශ්‍යතා ඉටුකිරීම සඳහා යුහුසුළුව කටයුතු කළ අතර එකී විදේශ සමපාර්ශවයන්ට අදාළ වන ගනුදෙනුකරු හඳුනාගැනීම/ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීම පිළිබඳ වාර්ෂික ඇගයීම් පැවැත්වීමට කටයුතු කරන ලදී.

2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු අධිකාරියක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම ඉටුකිරීම් වස් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ පිහිටුවන ලද තොරතුරු දැනගැනීමේ ඒකකය මගින් 2021 වසර තුළ මහ බැංකුවට

සම්බන්ධ තොරතුරු දැනගැනීම සඳහා වූ ඉල්ලීම් 144ක් සහ අභියාචනා 13ක් සම්බන්ධයෙන් කටයුතු කොට ඇත. තවද, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරියේ මහ බැංකුවේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ද කටයුතු කරන ලදී. කොවිඩ්-19 වසංගතයේ අභියෝගාත්මක බලපෑම් වූ නිරන්තරයෙන් සිදු වූ රට වසා දැමීම්, සංචරණය සීමා කිරීම් සහ නිවසේ සිට රාජකාරි කිරීමට සිදු වීම සහ තවත් බලපෑම් නොතකා, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි ස්ථාපිත තොරතුරු දැනගැනීමේ ඒකකය, පුරවැසියන්ගෙන් සහ ආයතනවලින් ලැබෙන තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන් කඩිනම් ආකාරයකින් කටයුතු කරන ලදී.

කොවිඩ්-19 වසංගතයෙහි හි බලපෑම අවම කිරීම උදෙසා මහ බැංකුව විසින් ගන්නා ලද ඇතැම් ප්‍රතිපත්තිමය මුලපිරීම් වලට එරෙහිව තෙවන පාර්ශ්වයන් විසින් නීති කෘත්‍යයන් රැසක් ආරම්භ කරන ලද බැවින්, 2021 වර්ෂය ශ්‍රී ලංකා මහ බැංකුවට තීරණාත්මක වර්ෂයක් විය. ආර්ථිකයේ බලපෑමට ලක්වූ අංශයන් වෙත ලබා දෙන ලද ණය සහනයන්, අපනයන ආදායම මෙරටට ගෙන්වා ගැනීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද රීති සහ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද මූල්‍ය ආයතනයන් ඈවර කිරීම යනාදිය, 2021 වර්ෂය තුළ දී අධිකරණයන් ඉදිරියේ අභියෝගයට ලක්වූ එවැනි මුලපිරීම් ලෙස දැක්විය හැකිය. අදාළ අධිකාරීන් සමඟ සම්බන්ධ වෙමින් මෙම සියලු නීති කෘත්‍යයන් සාර්ථක අයුරින් මෙහෙයවීමට නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

එමෙන්ම, නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් අනුබද්ධිත දෙපාර්තමේන්තුවල මෙහෙයුම් කටයුතු සඳහා අදාළ වන විධානයන්, රෙගුලාසි, මාර්ගෝපදේශයන්, නියෝග, රීති යනාදී අනු නීති සම්පාදනය වෙනුවෙන් ද සිය සහයෝගය දැක්වීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රටේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සඳහා පවත්වනු ලබන දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විශාල වශයෙන් දායක වී ඇත. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි සම්පත් දායකත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික හා නියාමන රාමුව, තහනම් යෝජනා ක්‍රම, අනවසර මුදල් ව්‍යාපාර, මූල්‍ය කල්බදු සම්බන්ධ ගැටළු, කුලී සින්නක්කර පහසුකම් සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව යනාදී කරුණු කෙරෙහි කේන්ද්‍රගත විය. තවද, නව තථ්‍ය කාලීන දළ පියවීම් පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වූ මෙහෙයුම් සහ තාක්ෂණික ඇගයීම් කමිටුව, ශ්‍රී ලංකාව සඳහා ජාතික මූල්‍ය අන්තර්ගත උපාය මාර්ගයක් සකස් කිරීම සඳහා පිහිටුවන ලද කමිටුව ආදී මහ බැංකුවේ සහ මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම්වලට අදාළ විවිධ විෂය කරුණු සඳහා පිහිටුවන ලද විශේෂ කමිටු රැසකට ද නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් 2021 වසරේ දී සිය දායකත්වය සපයන ලදී.

ඉහත කරුණු සලකා බැලීමේ දී, මහ බැංකුවේ ප්‍රධාන සහායක සහ ආරක්ෂණ දෙපාර්තමේන්තුවක් වශයෙන් නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුව, 2021 වසර තුළ මහ බැංකුවේ සහ මහජනතාවගේ බැඳියාවන් ආරක්ෂා කිරීමේ අරමුණින් ඉතා සාර්ථක සහ සනාථනීය අයුරින් සිය රාජකාරි කටයුතු ඉටු කර ඇති බව අවධාරණය කළ යුතුව ඇත.

## 21. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණුවලින් එකක් වන මූල්‍ය පද්ධති ස්ථායීතාව ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ක්ෂේත්‍රයට බලපෑම් කළ හැකි පද්ධතිමය අවදානම් පිළිබඳ පුළුල් විශ්ලේෂණ මාලාවක් සිදු කරනු ලබයි. එවැනි විශ්ලේෂණ ක්ෂුද්‍ර විචක්ෂණ නියාමනයට සහ අධීක්ෂණයට අනුපූරක වන අතර, එය මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ දී මහ බැංකු විසින් අනුගමනය කරන ප්‍රවේශයකි. මෙම ක්‍රියාවලියේ දී, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතන මගින් සපයනු ලබන දත්ත සහ අවශ්‍ය විට දී වෙනත් මූලාශ්‍ර ගණනාවකින් රැස් කරනු ලබන දත්ත භාවිතා කරමින් පද්ධතිමය අවදානම් විශ්ලේෂණය සිදු කරනු ලබයි. මීට අමතරව, ඕනෑම අහිතකර කම්පනයකට එරෙහිව මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහතික කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සත්‍යානුරූපී අහිතකර අවස්ථා යටතේ ආතති පරීක්ෂාවන් සිදු කරනු ලබයි. මෙම විශ්ලේෂණයන් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා පද්ධතිමය අවදානම අවම කිරීම සහ/හෝ වළක්වා ගැනීම සඳහා මහ බැංකුවේ ඉදිරි දැක්මක් සහිත ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දායක වේ. 2021 වසර තුළ දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

### (අ) සාර්ව විචක්ෂණතා අධ්‍යයන

නියාමනය කරන ලද මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද දත්ත සහ වෙනත් මූලාශ්‍ර වලින් රැස් කරන ලද දත්ත භාවිතා කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික වර්ධනයන්, මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළඳපොළවල් වලින් පැන නගින අවදානම් පිළිබඳව විශ්ලේෂණයන් සිදු කරන ලදී. ගෘහස්ත සහ ආයතනික අංශවලින් මූල්‍ය අංශයට සිදුවන බලපෑම හඳුනාගැනීම සඳහා එම අංශවල ණය විචලනයන්ට අදාළ දත්ත විශ්ලේෂණය කිරීම ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මීට අමතරව, දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උප අංශවල ස්ථායීතාවය සහ ශක්තිමත්භාවය මත පදනම්ව සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් අඛණ්ඩව සම්පාදනය කරන ලද අතර මෙම දර්ශක වල විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීමට ද පියවර ගන්නා ලදී. එවැනි විශ්ලේෂණවල ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි තර්ජන සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පිළිබඳ අනෙකුත් සමකාලීන කරුණු ප්‍රතිපත්ති නිර්දේශ සහිතව අවදානම් තක්සේරු ඇතුළත් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඇතුළු මණ්ඩල පත්‍රිකා ගණනාවක් 2021 වසර තුළ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**(ආ) ආතති පරීක්ෂණ රාමුව**

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් තාක්ෂණික සහාය ද ඇතිව ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණතා අධ්‍යයන රාමුව පුළුල් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කළේය. එම තාක්ෂණික සහාය ඇතිව, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් බැංකු සඳහා නව ගතික නුබුන්වත් ආතති පරීක්ෂණ රාමුවක් (Dynamic Solvency Stress Testing Framework) සකස් කරන ලද අතර එමගින් පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා ක්‍රියාශීලී ප්‍රතිපත්ති සැකසීම පිණිස නිගමන සපයනු ලබයි. මෙම, නව බැංකු නුබුන්වත් ආතති පරීක්ෂණ ආකෘතිය මගින් උපකල්පිත අවස්ථා යටතේ, සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීමෙන් සාර්ව විචක්ෂණතා දෘෂ්ටිකෝණයක් සපයනු ලබයි. ප්‍රධාන අවදානම් මූලාශ්‍ර, සම්ප්‍රේෂණ යාන්ත්‍රණ සහ බැංකු පද්ධතියේ ඇති දුර්වලතා මූර්ත ආර්ථිකයට සම්බන්ධ කරමින් පද්ධතිමය දැක්මක් මෙම සාර්ව විචක්ෂණතා දෘෂ්ටිකෝණය මගින් අවධාරණය කරනු ලබයි. මේ අනුව, මෙම රාමුව තනි ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන අධීක්ෂණ ආතති පරීක්ෂණවලින් වෙනස් වේ. බැංකු නුබුන්වත් ආතති පරීක්ෂණ මහ බැංකුවල සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තියේ අනිවාර්ය අංගයක් ලෙස සැලකේ. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දත්ත එකතු කිරීම සහ දත්ත යටිතල ව්‍යුහය නඩත්තු කිරීම, ව්‍යවහාරික මෙවලම් කට්ටලය භාවිතා කරමින් ආතති පරීක්ෂණ අවස්ථා ජනනය කිරීම සහ බැංකු ශේෂ පත්‍රවලට අපේක්ෂා කරන කම්පන සහ ඒවාට ඔරොත්තු දීමේ හැකියාව සහිත සම්ප්‍රේෂණ යාන්ත්‍රණයන් ඇතුළත් අවදානම් මොඩියුල අන්තර්ගතවන ප්‍රමාණාත්මක මෙවලම් කට්ටලය ක්‍රියාත්මක කිරීමට දායක විය. දත්ත රැස් කිරීම පහසු කිරීම සඳහා බැංකු අංශයේ හැකියාවන් ගොඩනැගීමේ අදහසින්, විස්තරාත්මක පරිශීලක මාර්ගෝපදේශයක් සකස් කර ඇති අතර අතථ්‍ය පුහුණු සැසි කිහිපයක් ද පවත්වන ලදී.

බැංකු අංශය සඳහා ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුවක් පිහිටුවීම ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් තාක්ෂණික සහාය ඇතිව සිදු කළ අතර එමගින් ද්‍රවශීලතා කම්පන සඳහා බැංකු පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කෙරේ. දත්ත හිඟතාවයන් මග හරවා ගැනීමට සහ ද්‍රවශීලතා ආතති පරීක්ෂණ සිදු කිරීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කල් පිරීමේ ඉනිමං ආකෘතිය (Maturity Ladder Template) සංවර්ධනය කරන ලදී. ප්‍රධාන වාර්තාකරණ මුදල් වර්ග වලින් නාමනය කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සහ ඒවායේ අදාල කල්පිරීම්වල ප්‍රති තුලනය කිරීමේ හැකියාව සහ මුදල් ගලා ඒම් සහ යෑම් වල නොගැළපීම් ද මෙම රාමුව මගින් හඳුනා ගනී. 2021 වසර තුළ දී, ද්‍රවශීලතා ආතති පරීක්ෂාව තාක්ෂණික ලෙස ක්‍රියාවට නැංවීම අවසන් කර ඇති අතර, නියමු දත්ත රැස්කිරීමක් මෙන්ම විධිමත් දත්ත රැස්කිරීමේ පළමු වටය ද සිදු කරන ලදී. නියමු ද්‍රවශීලතා ආතති පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල 2022 මුල් භාගයේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

**(ඇ) සමීක්ෂණ සහ දත්ත රැස් කිරීම**

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ අර්ධ වාර්ෂික මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී. මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය යනු මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම සහ දැඩි බලපෑමක් ඇති කළ හැකි සිදුවීම්වල වියහැකියාව පිළිබඳ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ ආකල්ප හඳුනාගැනීමට පවත්වන ඉදිරි දැක්මක් සහිත සමීක්ෂණයකි. මෙම අවදානම් යථාර්ථයක් බවට පත්වුවහොත් මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලියට බාධා එල්ල විය හැකි අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ මහජන විශ්වාසයට ද බලපානු ඇත. තවද, මූල්‍ය පද්ධතියේ දුර්වලතා පිළිබඳ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවහි අභ්‍යන්තර තක්සේරු වලංගු කිරීම සඳහා ද මූල්‍ය පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය උපකාරී වේ.

**(ඈ) මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් ප්‍රකාශන සඳහා දායක වීම**

**මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය:** ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය මුහුණ දෙන අවදානම් සහ දුර්වලතා පිළිබඳ ස්වාධීන ඇගයීමක් ඉදිරිපත් කිරීමට සහ අනුගමනය කර ඇති අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමට, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කරයි. "සාර්ව මූල්‍ය තත්වයන්", "මූල්‍ය වෙළෙඳපොළ","මූල්‍ය ආයතන","ගෘහස්ථ අංශය සහ ආයතනික අංශය" සහ "මූල්‍ය පද්ධති යටිතල පහසුකම්" වශයෙන් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය පරිච්ඡේද 5කින් සමන්විත විය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය -2021 කෙටුම්පත් කර ඇති අතර එය 2022 වසර මුල දී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

**ව්‍යවස්ථාපිත ප්‍රකාශන:** 2020 මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ "මෑත කාලීන ආර්ථික ප්‍රවණතා 2021"හි "මූල්‍ය අංශයේ සංවර්ධන සහ ස්ථායීතාව" යන පරිච්ඡේදය සම්බන්ධීකරණය කිරීම සහ සම්පාදනය කිරීම හරහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශන සඳහා අඛණ්ඩව දායක විය. තවද, මුදල් භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද රහස්‍ය වාර්තාවක් වන සැප්තැම්බර් 15 වාර්තාවේ මූල්‍ය පද්ධතියට අදාළ පරිච්ඡේදය සැකසීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය. මීට අමතරව, මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ උප අංශ පිළිබඳ විශ්ලේෂණ සැපයීම මගින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය.

**(ඉ) ආයතනික අංශය සහ ගෘහස්ථ අංශය විශ්ලේෂණය කිරීම**

කොළඹ කොටස් වෙළෙඳපොළේ මූල්‍ය නොවන ලැයිස්තුගත සමාගම්වලින් එකතු කරන ලද දත්ත මත පදනම්ව ආයතනික අංශයේ කාර්යසාධනය සහ අවදානම් තක්සේරු කිරීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබීය. සාර්ව ආර්ථික හා මූල්‍ය අංශයේ වර්ධනයන් ආයතනික

අංශයේ කාර්ය සාධනය සහ ශේෂ පත්‍ර කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින් ආර්ථික පසුබෑම සහ මූල්‍ය දුර්වලතා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක ලෙස සැලකෙන ආයතනික අංශයේ විචලනයන් තක්සේරු කිරීම කෙරෙහි මෙම විශ්ලේෂණය මගින් අවධානය යොමු කෙරේ. මෙමගින්, ආයතනික ශේෂ පත්‍ර මගින් මූල්‍ය ආයතන මත ඇති කරන බලපෑම් හඳුනා ගැනීම සඳහා ආයතනික නුබුන්වත්භාවය තක්සේරු කිරීම සිදු කරන ලදී.

මූල්‍ය පද්ධතිය තුළ ගොඩනැගිය හැකි පද්ධතිමය අවදානම හඳුනා ගැනීම සඳහා ගෘහ හා ආයතනික අංශයේ ණය පිළිබඳ ආවේක්ෂණය කිරීම සාර්ව විචක්ෂණතා නිරීක්ෂණ ක්ෂේත්‍රයේ වැදගත් අංගයකි. ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් දත්ත භාවිතා කරමින් ආයතනික හා රාජ්‍ය අංශවල සහ ගෘහස්ථ අංශයේ මූල්‍යමය ගැටලු තක්සේරු කිරීම මෙම විශ්ලේෂණය මගින් සිදු කරනු ලබයි. මෙම විශ්ලේෂණය සඳහා ණය තොරතුරු කාර්යාංශය මගින් සමස්ත පදනම මත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ අංශයේ ණය පිළිබඳ කාර්තුමය දත්ත සපයයි.

**(ඊ) මූල්‍ය පද්ධති ස්ථායීතාවය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය කිරීම**

**මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව (Financial System Stability Committee)**: මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය සඳහා පිහිටුවා ඇති මහ බැංකුවේ අන්තර් දෙපාර්තමේන්තු සංසදයක් වන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2021 වර්ෂය තුළ මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම් අටක් පවත්වන ලදී. සාමාජිකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම්වල දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් එහි කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඉදිරිපත් කරන ලද අතර මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු සාමාජිකයින් විසින් අනුමත කරන ලද සහ යෝජනා කරන ලද නිර්දේශ සමඟින් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව (Financial System Stability Consultative Committee)**: ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ හවුල්කරු ආයතනවල ප්‍රධානීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුවේ ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව ප්‍රතිසංවිධානය කරන ලද අතර එහි දී නව සාමාජිකයින් පත් කිරීම සහ පෙර සිටි ඇතැම් සාමාජිකයින් කමිටුවෙන් ඉවත් කිරීම සිදු කරන ලදී. වසර තුළ මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටු රැස්වීම් හයක් පවත්වන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශක කමිටුව විසින් සපයනු ලබන ප්‍රතිපත්ති යෝජනා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලයට දැනුම් දෙනු ලැබීය.

**මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය (Financial System Oversight Council)**: බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අන්තර් නියාමන කමිටුවක් වන මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි යොමු කිරීම් අනුදේශ (Terms of Reference) සඳහා සාර්ව විචක්ෂණශීලී අංග ඇතුළත් කරමින් සංශෝධනය කරන ලද බැවින් 2021 වසරේ අග භාගයේ දී මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. ඒ අනුව ඉදිරියේ දී මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ලේකම් කාර්යාල සේවා සපයනු ඇත.

**(උ) ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය**

සාර්ව විචක්ෂණතා සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කාණ්ඩයේ සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කරන ලදී. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව තිරසාර මූල්‍ය මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC), ලෝක බැංකු තිරසාර බැංකු ජාලය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සමඟ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද සංවර්ධනය කිරීමේ මූලික ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කරන ලදී. 2021 වසර තුළ දී පාර්ශ්වකරුවන්ගේ රැස්වීම් සංවිධානය කිරීම සහ හරිත මූල්‍ය ප්‍රශ්නාවලිය සඳහා ප්‍රතිචාර ලබා ගැනීම හරහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව පාර්ශ්වකරුවන්, තිරසාර සංවර්ධන මූල්‍ය විශේෂඥයින් සහ තිරසාර මූල්‍ය වර්ගීකරණ ක්‍රමවේද පිළිබඳ තාක්ෂණික විශේෂඥයන් සම්බන්ධීකරණය කිරීම සඳහා පහසුකම් සැලසුවේය.

## 22. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62අ වගන්තිය යටතේ අරමුදල් හුවමාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීමට, ගෙවීම සඳහා වන වගකීම් පියවීමට සහ සහභාගීත්ව ආයතනවලට පද්ධති රීති නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාවය, තරගකාරීත්වය සහ ස්ථායීතාවය ඇති කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය කිරීමට සහ ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හරහා සිදු කරන ලදී.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) හරහා සිදු කරන සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම,

ගෙවීම් යටිතල පහසුකම් සංවර්ධනයට පහසුකම් සැලසීම සහ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සිදු කළ ප්‍රධාන කාර්යයන් වේ. 2021 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්වල සාරාංශයන් පහත දැක්වේ.

## 22.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගීත්ව ආයතන අතර කාල සංවේදී සහ අන්තර් සාමාජිකයින්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු තවදුරටත් සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම් සිදු කරන සහභාගීත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබා දීමට පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු 24, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 7, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

2021 වර්ෂය තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 294,602ක වටිනාකමින් යුතු ගනුදෙනු 449,828ක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවීම් සිදු කරන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 1,867ක් සහ රුපියල් බිලියන 1,222ක් විය. සහභාගීත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 208.5ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙන් සහ ලංකාසෙක්‍යු පද්ධතියෙන් සමන්විත ලංකාසෙට්ල් පද්ධතියෙහි උපයෝගීතාවය වර්ෂය තුළ දී සාමාන්‍ය වශයෙන් සියයට 99.9ක ඉහළ තත්ත්වයකින් පවත්වාගෙන යනු ලැබීය.

## 22.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

### (අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

2021 වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළෙඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනුම්/විකුණුම් ගනුදෙනු 9,712කට අදාළ පියවීම් සිදු කරන ලද අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 163.05ක් විය.

### (ආ) විවට වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

වෙළඳපොළ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ විවට වෙළඳපොළ මෙහෙයුම් ආශ්‍රිත ගනුදෙනු පියවීම සිදු කරන ලදී. ඒ අනුව, වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 1,576.8ක් වටිනා ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 387ක්ද, රුපියල් බිලියන 29,297.06ක් වටිනා ප්‍රතිවිකුණුම් 1,797ක් ද රුපියල් බිලියන 14.35ක් වටිනා ස්ථිර පදනම මත මිලදී ගැනීම් ගනුදෙනු 14ක් ද සිදු කිරීම සහ පහසුකම් සැලසීමද සිදු විය.

## 22.3 ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සියලුම පරිශීලකයින් වෙනුවෙන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය කරනු ලබන අතර පාලන විධිවිධාන, ක්‍රියාපටිපාටීන්, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයන් සහ පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් ජාලය විසින් නියම කර ඇති ක්‍රියාදාමයන්ට අනුකූලව එම පද්ධතිය පවත්වාගෙන යනු ලබයි. මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යෑම සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ස්විෆ්ට් නෙට් පද්ධතිය සඳහා සම්බන්ධතාවය ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම හරහා ලබා ගෙන ඇත. 2021 වර්ෂය තුළ දී, ස්විෆ්ට් සේවය භාවිතා කරන්නන් හට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වඩාත් ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම සේවාවක් සැලසීම සඳහා ස්විෆ්ට් සේවාව ශක්තිමත් කිරීම සඳහා වාර්ෂිකව සහ කාර්තුමය වශයෙන් නව අනිවාර්ය යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී. තවද, ස්විෆ්ට් පද්ධතිය MT සිට MX කාණ්ඩය දක්වා පණිවිඩ ආකෘතිය සඳහා වන ISO20022 අනිවාර්ය අවශ්‍යතා ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

## 22.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2021 වර්ෂයේ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළඳ සහ වෙළඳ ආශ්‍රිත ගනුදෙනු, බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් පදනම මත එක්සත් ජනපද ඩොලර් මගින් පියවීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී.

ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා, රුපියල් බිලියන 714.4ක වටිනාකමින් යුතු ගනුදෙනු 6,307ක් සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම් වල වටිනාකම රුපියල් බිලියන 581.9ක් විය. ආසියානු නිෂ්කාශන සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ 49 වන රැස්වීම සහ නිත්‍ය තාක්ෂණික කමිටු රැස්වීම ඉන්දියානු සංචිත බැංකුවෙහි සංවිධානත්වයෙන් 2021 වර්ෂයේ මැයි මාසයේ දී මංගත ක්‍රමයට පැවැත්විණි.

## 22.5 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව නව ගෙවීම් තාක්ෂණයන් හඳුන්වා දීම සඳහා පහසුකම් සලසන ලද අතර විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම සඳහා නියාමන සහ අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2021 වර්ෂය තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

(අ) සුළු පරිමාණ ගෙවීම් සඳහා LANKAQR ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අනුග්‍රහය දැක්වීමට 2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස 25 වන දින එහි ජනගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව LANKAQR භාවිතය ප්‍රචලිත කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් සංවිධානය කරන ලද වැඩසටහන් සඳහා සහභාගී විය. LANKAQR සඳහා වෙළෙඳ ආයතනවල සහභාගීත්වය උනන්දු කිරීමේ අවශ්‍යතාවය සලකා බලා ඒ සඳහා අදාළ උපරිම වෙළෙඳ වට්ටම් අනුපාතය ලෙස සියයට 0.5ක අඩු කරන ලද අනුපාතය 2021 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

(ආ) 2021 වර්ෂයේ පෙබරවාරි මස 01 වන දින සිට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන අඩු වටිනාකම් සහිත ගෙවීම් සඳහා ජංගම යෙදුම් පදනම් කරගත් ගෙවීම් ක්‍රමවේදයක් වන ජස්ට්පේ (JustPay) ගනුදෙනුවක උපරිම වටිනාකම රු. 50,000 දක්වා වැඩි කරන ලදී.

(ඇ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ මූල්‍ය ආයතන මගින් ඉදිරිපත් කළ අයදුම්පත් ඇගයීමෙන් අනතුරුව ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස හරපත් නිකුත් කිරීමට මූල්‍ය ආයතන දෙකකට බලපත්‍ර ලබා දෙන ලදී. මීට අමතරව, ජංගම දුරකතන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන් විසින් ඉදිරිපත් කරන ලද සේවා වැඩිදියුණු කිරීම්වලට අනුමැතිය ලබා දෙන ලදී.

(ඈ) ඔබගේ ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයට අදාළ බ්ලොක්චේන් මත පදනම් වූ ක්‍රමවේදය සඳහා සංකල්ප සාධනය නිර්මාණය කරන ලද අතර එම සංකල්ප සාධනය පරීක්ෂා කිරීමට කැමැත්ත පල කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ සම්බන්ධ වී සංකල්ප සාධනය පරීක්ෂා කිරීම සාර්ථකව නිම කරන ලදී. 2021 ඔක්තෝම්බර් මාසයේ දී එහි අවසාන වාර්තාව අධිපතිතුමා වෙත පිළිගන්වන ලදී.

(ඉ) ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව තුළ ඩිජිටල් බැංකුකරණය, කෘතිම බුද්ධිය (Artificial Intelligence) සහ මහ බැංකු ඩිජිටල් මුදල් පිළිබඳව අධ්‍යයනය කිරීමට පත් කරන ලද අභ්‍යන්තර කමිටු තම අධ්‍යයනයන් අවසන් කරන ලද අතර ඒවාට අදාළ වාර්තා අධිපතිතුමා වෙත භාර දෙන ලදී.

(ඊ) මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සැපයුම්කරුවන් නියාමනය සහ අධීක්ෂණය සඳහා නියෝග කෙටුම්පත් කරන ලද අතර මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග අමාත්‍යවරයාගේ අත්සන ලබා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

(උ) මූල්‍යමය වෙළෙඳපොළ යටිතල පහසුකම් සඳහා වන මූලධර්මවලට තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි අනුකූලතාවය පරීක්ෂා කිරීම සඳහා ස්වයං ඇගයීමක් සිදු කරන ලද අතර එය ස්වාධීන ඇගයීමක් සඳහා ලෝක බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී.

(ඌ) හදිසි අවස්ථාවක දී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සාමාජිකයින් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 22.6 ජාතික ගෙවීම් කවුන්සිලය

ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය රැස්වීම් වාර 6ක් 2021 වර්ෂය තුළ දී පැවැත් වූ අතර ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි ලේකම් කටයුතු සිදු කරන ලදී. 2021 වර්ෂයේ දී, 2020-2022 සඳහා වන පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ ඩිජිටල් ගෙවීම් වේදිකාව, අතත්‍ය මුදල් සහ විවෘත බැංකුකරණය වැනි නව තාක්ෂණයන් සහ සංකල්පයන්, සහ ඩිජිටල් වර්ෂය වැඩසටහන පිළිබඳ තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට පත් කරන ලද කමිටුවල ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී. අතත්‍ය මුදල් සහ විවෘත බැංකුකරණය සඳහා පත් කරන ලද කමිටුවල වාර්තා ජාතික ගෙවීම් කවුන්සිලය වෙත භාර දෙන ලදී. ඩිජිටල් ගෙවීම් අවකාශය තුළ මූල්‍ය සමාගම්වල වැඩිවන දායකත්වය සැලකිල්ලට ගනිමින් බැංකු නොවන මූල්‍ය අංශය ජාතික ගෙවීම් කවුන්සිලය තුළ නියෝජනය කිරීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් දෙකකට සාමාජිකත්වය ලබා දෙන ලදී. මීට අමතරව, බැංකු නොවන මූල්‍ය අංශය නියාමනය කරන්නා ලෙස බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ජාතික ගෙවීම් කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

### 22.7 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන 'කාර්තුමය විවරණිකාව' ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, අවශ්‍යතාව මත පදනම්ව, ගෙවීම් ක්‍රම සහ වෙනත් ආශ්‍රිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුම්වත් කිරීමේ අදහසින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

## 23. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා දෙපාර්තමේන්තුවල කටයුතු පෙළ ගස්වමින් ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියට අදාළ කටයුතු සිදු කරයි. ඒ අනුව, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරි වසර සඳහා වන දෙපාර්තමේන්තුමය ක්‍රියාමාර්ගික සැලසුම් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන අතර, අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ දැනුවත්භාවය උදෙසා විද්‍යුත් ප්‍රකාශනයක් ලෙස නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම පිළියෙල කරයි. වාර්ෂික සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීම සඳහා කාලීන සමාලෝචනයන් ද සිදු කරනු ලබයි. මේ සඳහා වාර්ෂික උපායමාර්ගික කතිකාවත හා දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ගික සැලසුම් සඳහා කාලීන ප්‍රගති සමාලෝචන

රැස්වීම් පවත්වනු ලබයි. දෙපාර්තමේන්තුවල ක්‍රියාමාර්ගික සැලසුම්හි ප්‍රගතිය ආයතන කළමනාකාරිත්ව කමිටුවේ සමාලෝචනයට ද ඉන් අනතුරුව අවශ්‍ය මාර්ගෝපදේශන සඳහා මුදල් මණ්ඩලයට ද වාර්තා කරනු ලබයි.

තව ද තත්කාලීන ගැටලු සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන්ට සම්බන්ධව කළමනාකාරිත්වය විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ඵලදායිතාව ස්වාධීනව අධ්‍යයනය කිරීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයනයන්/සමීක්ෂණයන් ද සිදු කරනු ලබයි.

### 23.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2021 සඳහා වන උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම 2021 වර්ෂය සඳහා වන ඉලක්කයන්ගෙන් සමන්විත වූ අතර එය 2021 ජනවාරි 01 දින පැවැත් වූ නව වසර සඳහා වැඩ ඇරඹීමේ උත්සවයේ දී දියත් කරන ලදී.

### 23.2 ප්‍රගති නිරීක්ෂණය හා සමාලෝචනය

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව එක් එක් ප්‍රධාන කාර්යසාධන දර්ශක යටතේ, ඒවාට අදාළ සැලසුම්ගත ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමේ මට්ටම අනුව දෙපාර්තමේන්තුමය ක්‍රියාමාර්ගික සැලසුම්හි ප්‍රගතිය ඇගයීම සඳහා කාර්තුමය පදනමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විය. එම ප්‍රගතිය කළමනාකාරිත්වයට සහ මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

### 23.3 ප්‍රතිපත්ති සමාලෝචනය

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව කොවිඩ්-19 වසංගත කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තියේ ඵලදායීතාව සහ මධ්‍යගත දැනුම් කේන්ද්‍රයක් වශයෙන් පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයේ ඵලදායීතාව මැනීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයනයන් දෙකක් (2) වර්ෂය තුළ දී සිදු කරන ලදී.

### 23.4 "අභියෝගාත්මක කාලවලදී මහ බැංකුකරණය" - මාර්ගගත විද්වත් සාකච්ඡාව

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව "අභියෝගාත්මක කාලවලදී මහ බැංකුකරණය" යන තේමාව යටතේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් කීර්තිමත් වෘත්තීමය විද්වතුන් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් මාර්ගගත විද්වත් සාකච්ඡාවක් පවත්වන ලදී. වසංගත කාල වකවානුවේ දී තම රටේ ආර්ථික කටයුතු සහ රජයේ වියදම් මූල්‍යනය කිරීමේ මහ බැංකු කාර්යභාරය සහ එහි සීමාවන්, සාර්ථක මූල්‍ය අන්තර්ගතභාවයක අවශ්‍යතාව, වේගවත් ලෙස නව තාක්ෂණය කරා නැඹුරුවීම සහ වසංගත කාල තුළ දී අන්තර්ජාතික මූල්‍ය සංවිධානවල කාර්යභාරය යනාදි කාලීන හා මහ බැංකුවල අවධානයට යොමු වුණු තේමාවන් මෙහි දී සාකච්ඡා කෙරුණි. තවද විනිමය අනුපාතය සහ බාහිර සංචිත ස්ථාවරව පවත්වාගැනීම, අඩු පොලී අනුපාතිකයක් සහ අඩු උද්ධමන මට්ටමක් පවත්වා ගැනීමේ වැදගත්කම ද පුළුල් ලෙස සාකච්ඡා කෙරුණි.

### 23.5 ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා කටයුතු කිරීම

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය පථයට අදාළ වන තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීමේ දී තිරසාර සංවර්ධන ඉලක්කයන් නිරීක්ෂණය කිරීම සඳහා අභ්‍යන්තර ව පත් කරන ලද සම්බන්ධීකරණ හා නිරීක්ෂණ කමිටුව වෙත අවශ්‍ය සහය ලබා දුනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ විෂය ක්ෂේත්‍රයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්කයන් පිළිබඳ තොරතුරු තිරසාර සංවර්ධන සභාව වෙත යොමු කිරීම ද සිදු කරන ලදී. එමෙන්ම, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම පිළිබඳ දෙවන ස්වේච්ඡා ජාතික සමාලෝචනයේ උපදේශන වැඩමුළුව සඳහා 2021 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් සම්බන්ධ විය.

## 24. රාජ්‍ය ණය

රජයේ නියෝජිතයා වශයෙන්, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාරව මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටුකරයි. ඒ අනුව, 1950 අගෝස්තු මස 28 වන දින මහ බැංකුව ආරම්භ කිරීමත් සමගම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ද පිහිටුවන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙහි උපායමාර්ගික ප්‍රමුඛතාවය වනුයේ, විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගනිමින් මැදි කාලයේ සිට දිගු කාලීනව අවම පිරිවැයක් යටතේ, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළේ පවතින ප්‍රශස්ත ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහතික කිරීමයි.

මෙම උපායමාර්ගික ප්‍රමුඛතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් පහත දැක්වෙන අතර, දෙපාර්තමේන්තුවේ කටයුතු එම කාර්යයන්ට පමණක් සීමා නොවේ;

(i) වඩා යහපත් රාජ්‍ය ණය ව්‍යුහයක් ඇති කිරීම සඳහා විධිමත් ණය කළමනාකරණ උපාය මාර්ගයක් සකස් කර ක්‍රියාත්මක කිරීම;

(ii) විසර්ජන පනත හෝ වෙනත් අදාළ නීති රීති/බලතල යටතේ රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතාවයට අනුකූලව දේශීය වෙළඳපොළ සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ යන දෙකටම ප්‍රවේශ වෙමින්, හිතකර වෙළඳපොළ තත්ත්වයන් සහ මුදල් අමාත්‍යාංශයේ එකඟතාව මත සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් අරමුදල් රැස් කිරීම;

(iii) මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි, නිවැරදිව හා නියමිත වේලාවට රජයේ ණය සේවාකරණය සිදු කිරීම.

(iv) රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම හරහා රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය කිරීම සහ එමගින් රජයේ සුරැකුම්පත් සඳහා ඇති ඉල්ලුම වැඩි කිරීම;

(v) රජයේ සුරැකුම්පත්වල වෙළඳපොළ ගනුදෙනු පියවීම සුමටව සිදුකිරීමට පහසුකම් සලසනු ලබන රාජ්‍ය සුරැකුම්පත්වල හිමිකම් ලේඛනය කළමනාකරණය සිදු කරනු ලබන ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය පවත්වාගෙන යාම;

(vi) මධ්‍යම රජයේ ණය කළඹේ අවදානම් කළමනාකරණය කිරීම සඳහා ණය කළඹෙහි හැසිරීම පිළිබඳ විශ්ලේෂණ සිදු කොට අදාළ පාර්ශ්වකරුවන්ට නිසි ලෙස සන්නිවේදනය කිරීම.

## 24.1 රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා අරමුදල් රැස් කිරීම

(අ) 2021 වර්ෂයේ දී, රජයේ අරමුදල් අවශ්‍යතාව මූල්‍යනය කිරීම මූලික වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතුව මගින් සිදු කෙරිණි.

(ආ) කෙටිකාලීන සුරැකුම්පත් කෙරෙහි ආයෝජකයින් වැඩි වශයෙන් නැඹුරු වීම සහ රාජ්‍ය මුදල් ප්‍රවාහ විචලනයන් පවතින අවස්ථාවල දී රජයට සහය වීම නිසා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ සාපේක්ෂව කෙටිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් හේතුවෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ණය උපකරණ තුනෙහිම පරිණතවීමේ සාමාන්‍ය කාලය සුළු වශයෙන් පහත වැටුණි.

(ඇ) 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් දෙගුණ කිරීමත් එමගින් විදේශ ණයවලින් කොටසක් අඩුකර ගැනීමටත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සමත් විය.

(ඈ) අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන් පැවතියද, විශාල වශයෙන් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම නිසා ඇති වූ බලපෑම සමනය කර ගැනීමට, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රජයේ මූල්‍ය අවශ්‍යතාව සපුරාගැනීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළ අතර, එමගින් 2021 වර්ෂයේ දී, රාජ්‍ය ණය කළඹෙහි පරිණතවීමේ සාමාන්‍ය කාලය ප්‍රශස්ත මට්ටමකින් පවත්වාගත හැකි විය.

(ඉ) එක් එක් අරමුදල් ප්‍රභවය යටතේ සංක්ෂිප්ත ක්‍රියාකාරකම් 11-16 සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

## 24.2 රජයේ ණය සේවාකරණය

2021 වර්ෂය තුළ දී, රුපියල් බිලියන 2,375.6ක දේශීය ණය සේවාකරණ ගෙවීම් සහ රුපියල් බිලියන 1,590.1ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඇතුළුව, රුපියල් බිලියන 785.5ක සමස්ත රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීමට පහසුකම් සලසන ලදී.

2021 වසරේ දී දේශීය ව්‍යවහාර මුදල් ණය සඳහා පොලී සහ කල් පිරීමේ වටිනාකම් ගෙවීමේ දී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක 224ක් සඳහා ණය සේවාකරණය කරන ලද අතර විදේශ ණය 1,836ක් සේවාකරණය කරන ලදී. එම අගයන් පිළිවෙළින් 2020 වසරේ දී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක 215ක් සහ විදේශ ණය 1,894ක් විය.

**II-16 සංඛ්‍යා සටහන**
**2020 සහ 2021 වසරේ ණය උපකරණ සහ නිකුතු ක්‍රියාකාරිත්වය**

| උපකරණය | 2020 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | නිකුත් කිරීම් (රු. බිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (රු. බිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් (අ) | 2,590.5 | 5.82 | 0.60 | 52 | 3,821.4 | 6.09 | 0.48 | 53 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,332.1 | 7.39 | 5.27 | 15 | 1,762.0 | 8.70 | 5.12 | 22 |
| | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් (එ.ජ.ඩො. මිලියන) | බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ) | සාමාන්‍ය පරිණත කාලය (වසර) | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 507.0 | 6.24 [4.22] | 1.70 | 7 | 1,041.3 | 7.34 | 1.47 | 5 |

(අ) මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්

(ආ) [ ] තුළ ඇති අගයන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල විචල්‍ය අනුපාතිකයන්හි බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික ව්‍යාප්තිය පිළිබිඹු කෙරේ. 2021 වර්ෂයේ දී විචල්‍ය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම් සිදු නොකරන ලදී.

## 24.3 රාජ්‍ය සුරැකුම්පත් හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය නිර්ලේඛිත සුරැකුම්පත් හිමිකම් ලේඛනය, මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තා වන අතර, එමගින් රජයේ සුරැකුම්පත්වල සුරක්ෂිතභාවය තහවුරු කෙරේ. 2021 දෙසැම්බර් මස අග දී නිර්ලේඛිත සුරැකුම්පත්වල මුළු හිමිකම් ප්‍රමාණයෙහි මුහුණත වටිනාකම රුපියල් බිලියන 9,238.6ක් විය. මෙය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,270.7ක් සහ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 6,967.9කින් සමන්විත විය. 2021 දෙසැම්බර් අවසානය වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 96,825ක් ලෙස සටහන් විය.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට ඔවුන්ගේ හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශන යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදු විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ විද්‍යුත් තැපැල මගින් විද්‍යුත් ප්‍රකාශන 1,458ක් සහ සාමාන්‍ය තැපැල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 15,270ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 35,452ක් සහ ගෙවීම් ප්‍රකාශන 14,320ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් සඳහා 2019 වසරේ දී හඳුන්වා දෙන ලද තත්කාලීන දැනුම් දීමේ පහසුකම මගින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි හා තත්කාලීන දැනුම් දීමේ පහසුකම ලබා ගත් ගිණුම් හිමියන් වෙත එක් එක් නිර්ලේඛිත සුරැකුම්පත් ගිණුම් හරහා සිදු කරනු ලබන සියලුම හර හා බැර වාර්තා වීම් කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපැල මගින් තත්කාලීන දැනුම් දීම් වශයෙන් ලබා දෙන ලදී. මෙම වසර තුළ දී, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් විද්‍යුත් තැපැල් පණිවුඩ 147,744ක් සහ කෙටි පණිවුඩ 47,561ක් තත්කාලීන දැනුම් දීම් ලෙස යවා ඇති අතර, 2020 වසර දී එම අගයන් පිළිවෙළින් 129,941ක් සහ 40,063ක් විය.

මීට අමතරව, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම සුරැකුම්පත් ගිණුම්වල යාවත්කාලීන තොරතුරු අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ද ලබා දී ඇත.

## 24.4 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර නඩත්තු කරනු ලබන ලංකාසෙක්‍යු පද්ධතිය, මධ්‍යම තැන්පතු පද්ධතියකින් හා නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියකින් සමන්විත වේ. නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය මඟින් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සඳහා පියවීම් සේවා සපයනු ලබයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවල ලංකාසෙක්‍යු පද්ධතියෙහි මෙහෙයුම් අඛණ්ඩව හා තත්කාලීනව සිදුවන බව සහතික කරමින්, රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

2021 වසර අවසාන වන විට ලංකාසෙක්‍යු පද්ධතිය, තමන් වෙනුවෙන් සහ තමන්ගේ ගනුදෙනුකරුවන් වන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති ආයෝජකයින් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු අලෙවි සහභාගීකරුවන් 31 දෙනෙකු (බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 7ක්) සහ තමන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන ඍජු සහභාගීකරුවන් 3 දෙනෙකුගෙන් (ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොළ සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත විය.

## 24.5 ණය කළමනාකරණ මූලපිරිම් සහ වෙළඳපොළ සංවර්ධනයන්

යෝග්‍ය මූලාශ්‍ර හරහා අවශ්‍ය සම්පත් සපුරාලන අතරම, කොවිඩ්-19 රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සංවර්ධනය කිරීමේ අරමුණින් එහි කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂය තුළ දී, පහත සඳහන් පියවර අනුගමනය කරන ලදී.

### (අ) විචක්ෂණශීලී ණය කළමනාකරණ උපායමාර්ගය

ණය වගකීම් කාලානුරූපීව සේවාකරණය කරන අතරම කොවිඩ්-19 වසංගතය අතරතුර අත්‍යවශ්‍ය රාජ්‍ය සේවාවන්හි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම නිසා ඉහළ ගිය රජයේ මූල්‍ය ප්‍රවාහ අවශ්‍යතාවයට පහසුකම් සැලසීමට වසංගත කාල සීමාව තුළ භාණ්ඩාගාර බිල්පත් මත වැඩි වශයෙන් රඳා පැවතීමට සිදුවීම හේතුවෙන්, වර්ෂයක් තුළ කල් පිරෙන ණය ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 2021 වර්ෂයේ සුළු වශයෙන් ඉහළ ගිය අතර, ණය වගකීම් නියමිත කාලයේ දී සේවාකරණය කරන ලදී.

රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ රජයේ නියෝජිතයා ලෙස සිය වගකීම් ඉටු කිරීමේ දී, ණය සේවාකරණ ගෙවීම් සම්බන්ධයෙන් වැඩි වන අභියෝග පිළිබඳව, විශේෂයෙන්ම, මෑදි කාලයේ දී විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ප්‍රවේශ වීමේදී ඇති වූ අහිතකර තත්ත්වයන්, සංවර්ධනය වෙමින් පවතින රටවල් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත් සඳහා පවතින අඩු ද්‍රවශීලතාව, ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙලීම සහ ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ඉහළ යෑම යනාදිය සම්බන්ධව, රජය සහ ප්‍රතිපත්ති බලධාරීන් දැනුම්වත් කිරීමට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගත් අතර, වෙළඳපොළ තත්ත්වයන් නැවත වැඩිදියුණු වන තුරු විශ්වාසය තැබිය හැකි පියවර සහ මූලාශ්‍ර පිළිබඳව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බලධාරීන්ව නිරන්තරයෙන් දැනුම්වත් කරන ලදී.

2021 වර්ෂය තුළ දී දේශීය මූලාශ්‍රවලට සාපේක්ෂව විදේශ මූලාශ්‍රවලින් රජයේ මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගැනීම කෙරෙහි අඩු නැඹුරුතාවයක් දැක්වීම හේතුවෙන්, 2020 වර්ෂය අවසානයට සාපේක්ෂව, 2021 වර්ෂය අවසානය වන විට විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණයවල පරිණතවීමේ සාමාන්‍ය කාලය ප්‍රශස්ත මට්ටමකට ළඟා විය. මෙමගින් 2021 වර්ෂයේ අභියෝගාත්මක තත්ත්වයන් පැවතියද, විදේශීය මුදල් ණය සඳහා වූ නිරාවරණය අඩු කර ගැනීමට හැකි විය.

**(ආ) වෙළඳ වාර්තාකරණය හඳුන්වාදීම**

රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ගණුදෙනුවලට අදාළ හුරු පුරුදු වැඩි දියුණු කර ශක්තිමත් කිරීම සහ ගනුදෙනුවල විශ්වසනීයත්වය වැඩිදියුණු කොට ආයෝජකයින්ගේ ආරක්ෂාව සහ විශ්වාසය ඉහළ නැංවීම සඳහා රජයේ සුරැකුම්පත්වල සියලුම ද්විතීයික වෙළඳපොළ වෙළඳාම් වෙළඳ දිනයේදීම වාර්තා කිරීමට පියවර ගන්නා ලදී.

ඒ අනුව, 2021 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීකරුවන් සියලුම ගනුදෙනු පිළිබඳ විස්තර වෙළඳ දිනයේදීම මහ බැංකුව වෙත වාර්තා කළ යුතුය.

**(ඇ) භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවීම**

කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ දී ආර්ථික වර්ධනය නංවාලීම සඳහා අඩු පොලී අනුපාතිකයක් පවත්වාගෙන යන අතරතුර ණය ගැනීමේ පිරිවැය අවම කර ගනිමින් ආර්ථික වර්ධනය නංවාලීමට රජයට පහසුකම් සපයා දීම පිණිස, මුදල් මණ්ඩලයේ එකඟතාව ඇතිව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින්, 2020 මැයි 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල සියලුම පරිණත කාලයන් සඳහා උපරිම ඵලදා අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, ප්‍රාථමික වෙන්දේසිවල පොලී අනුපාතිකය ඉහළ මට්ටමක තිබුණද, පොලී අනුපාතික පහළ දැමීම සහ ලංසු අර්ධ වශයෙන් පිළිගැනීම සැලකිල්ලට ගනිමින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම 2021 සැප්තැම්බර් 22 සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ක්‍රමයෙන් අඩු කිරීමට සහ ධනාත්මක මූර්ත ආයෝජන ප්‍රතිලාභ සමඟ අරමුදල් සපයා ගැනීම සඳහා ද පියවර ගන්නා ලදී.

**(ඈ) භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී තෙවන අදියරෙහි අනිවාර්ය වෙන් කිරීම් සිදු කිරීම සඳහා පළමු අදියරේ පිළිගතයුතු අවම බැඳුම්කර ප්‍රමාණය ඉහළ නැංවීම**

භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම ආරම්භ වීමත් සමඟම, භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසිවල අදියර I සහ අදියර II අවසන් වීමෙන් පසුව ප්‍රාථමික වෙන්දේසියේ පිළිගත් බැඳුම්කර ප්‍රමාණයේ යම් අඩුපාඩුවක් වේතොත් අනිවාර්ය පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියේ තුන්වන අදියර ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදී. උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය අත්හිටුවීමත් සමඟ මෙය නැවත ක්‍රියාත්මක කරන ලද අතර, අදියර III ක්‍රියාත්මක කිරීම සඳහා අදියර I හි දී පිළිගත යුතු අවම බැඳුම්කර ප්‍රමාණය සියයට 70 සිට සියයට 80 දක්වා ඉහළ නංවන ලදී. ඉහත සඳහන් වැඩි වීමත් සමඟ, III අදියරේ දී ප්‍රාථමික අලෙවිකරුවන් අතර අනිවාර්ය බැඳුම්කර වෙන් කිරීම සඳහා වෙළඳපොළ මඟින් තීරණය වූ මිලක්/ඵලදා අනුපාතිකයක් ස්ථාපිත කිරීම තවදුරටත් තහවුරු විය.

**(ඉ) පරිණත කාලය උපරිම වසර 5ක් වන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පමණක් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියක දී තෙවන අදියර ක්‍රියාත්මක කිරීම සීමා කිරීම**

භාණ්ඩාගාර බැඳුම්කරවල ද්විතීයික වෙළඳපොළ තවදුරටත් ක්‍රියාකාරී හා ශක්තිමත් කිරීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසියක දී තෙවන අදියර ක්‍රියාත්මක කිරීම, පරිණත කාලය වසර 5 හෝ ඊට අඩු භාණ්ඩාගාර බැඳුම්කරවලට පමණක් සීමා කරන ලදී. මෙම හඳුන්වාදීම මගින්, දිගු කාලීන පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර වෙත ද්විතීයික වෙළඳපොළ තුළ ඉල්ලුම විතැන්ව පවතින අවස්ථාවක දී, III අදියරේ දී අනිවාර්ය පදනමින් වෙන් කරන ලද දිගුකාලීනව පරිණත වන භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳාම් කිරීමට අවස්ථාව ලබා ගැනීම සම්බන්ධව වෙළඳපොළ සහභාගීවන්නන්ගේ පැවැති කැමැත්ත ඉටු කිරීමට ද අපේක්ෂා කරන ලදී. 2021 වසරේ පවත්වන ලද භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවලදී අදියර III ක්‍රියාත්මක නොකරන ලදී.

**(ඊ) භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළුවක් හඳුන්වා දීම**

මහා භාණ්ඩාගාරයේ මුදල් අවශ්‍යතා ප්‍රාථමික වෙන්දේසි තුළින්ම සපුරා ගැනීම තවදුරටත් තහවුරු කර ගැනීමේ අරමුණින්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා සෘජු නිකුතු කවුළු හඳුන්වා දෙන ලදී. 2021 වසරේ ජුලි 29 වන දින පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසියේ සිට බලපැවැත්වෙන පරිදි භාණ්ඩාගාර වෙන්දේසියට ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩයක් අදියර I දී සම්පූර්ණයෙන්ම පිළිගන්නා විටක දී, අදියර I දී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ එම භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය සඳහා සෘජු නිකුතු කවුළුවක් ක්‍රියාත්මක වේ. මෙම සෘජු නිකුතු කවුළුව හරහා නිකුත් කරනු ලබන වටිනාකම, වෙන්දේසියේ දී ඉදිරිපත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ සියල්ලම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණයට අතිරේකව වන අතර, සෘජු නිකුතු කවුළුව තුළින් පිළිගත හැකි භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම අදාළ එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය යටතේ වෙනදේසියට ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් සියයට 20ක වටිනාකමට සීමා වේ. 2021 ජනවාරි මස 15 වන දින සිට 19 වන දින දක්වා පැවැත් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසියේ සිට ක්‍රියාත්මක වන පරිදි, සෑම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසියකටම පසුව, වෙන්දේසියට ඉදිරිපත් කළ මුළු වටිනාකම දක්වා වෙන්දේසියේ දී එක් එක් පරිණත කාල සඳහා තීරණය වූ අදාල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය අනුව සෘජු නිකුතු කවුළුවක් විවෘත කරන ලදී.

**(උ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ආයෝජන කවුළුවක් හඳුන්වා දීම**

2021 දෙසැම්බර් 23 දින සිට භාණ්ඩ හා සේවා අපනයනයෙන් ආදායම් උපයන්නන් සහ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් ද ඇතුළු විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා ආයෝජන කවුළුවක් හඳුන්වා දෙන ලදී. විදේශ මුදල් උපයන්නන් සඳහා ආයෝජන මාර්ග පුළුල් කිරීමට අමතරව,

දේශීය වෙළඳපොළ විදේශ විනිමය තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් මෑත කාලීනව ගනු ලැබූ ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීමද, මෙම ක්‍රියාමාර්ගය මගින් අපේක්ෂා කරනු ලැබේ.

**(ඌ) භාණ්ඩාගාර මෙහෙයුම් කළමණාකරණ පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමණාකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදී**

විදේශීය ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සඳහා දැනට පවතින පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමණාකරණ පද්ධතිය යටතේ නව පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී. මෙම පද්ධතියේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. මෙය 2022 ජනවාරි 01 වෙනිදා සිට ක්‍රියාත්මක වේ.

**(එ) ප්‍රාග්ධන වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය**

දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය (Capital Market Development Project) යටතේ, යෝජිත අති නවීන යටිතල පහසුකම් භාවිතය මගින්, මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු සිදු කිරීම සහ ඒවායේ පියවීම් ක්‍රියාවලියෙහි වෙනසක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ පවතින සමස්ත ආයෝජන හැසිරීම්, ජාත්‍යන්තරව පිළිගත් ඉහළ ප්‍රමිතීන් සමඟ ගැලපීමට අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ ස්ථාපිත බී.ටී.ඒ. කන්සල්ටින්ග් ලිමිටඩ් ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයමින් සිටියි. නවීන විද්‍යුත් වෙළඳ පද්ධතියක්, මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතියකින් සමන්විත නිශ්කාෂණාගාරයක්, වැඩිදියුණු කළ මධ්‍යම සුරැකුම්පත් පද්ධතියක් සහ වෙළඳපොළ ආවේක්ෂණ පද්ධතියක් මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. 2021 වර්ෂය තුළ, යටිතල පහසුකම් ව්‍යුහයේ මෙහෙයුම් ආකෘතිය සහ එහි තාක්ෂණික පිරිවිතර සකස් කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීති ප්‍රතිසංස්කරණ සකස් කිරීමද සිදු කෙරිණි.

## 24.6 ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම

2021 වර්ෂයේ දී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල (ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය, මූඩීස් ආයෝජක සේවාව, එස්. ඇන්ඩ් පී. ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය) ශ්‍රේණිගත කිරීමේ කටයුතුවලට අනුකූලව, ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම් සමාලෝචන සඳහා පහසුකම් සපයන ලදී. තවද, මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු හා මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව එම ශ්‍රේණිගත කිරීමේ නිවේදන සමාලෝචනයකට ලක් කරන ලද අතර, ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාවන්ගෙන් පැන නගින අහිතකර බලපෑම් හුවා දක්වමින් වරින් වර මහජන නිවේදන ද නිකුත් කරන ලදී.

# 25. ප්‍රාදේශීය සංවර්ධන

කොවිඩ්-19 වසංගතය හමුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට 2021 වසර බොහෝ අභියෝගාත්මක කාලවකවානුවක් වුවත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙනු ලැබූ විවිධ ණය යෝජනා ක්‍රමයන්ට අදාළව, ණය සහන ජනතාවට ලබා දුන් අතරතුරම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහන පොලී අනුපාත යටතේ ණය ලබා දීම් අඛණ්ඩව කරගෙන යන ලදී. තවද, මහජනතාව දැනුම්වත් කිරීමේ හා ධාරිතාවය ගොඩනැංවීමේ වැඩසටහන්ද 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

"උසස් ජීවන තත්ත්වයක් උදෙසා මූල්‍ය අන්තර්ගතභාවයක්" යන දැක්මෙන් යුතුව ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛයා ලෙස 2021 වසර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට සුවිශේෂී වසරක් විය.

මේ අතරම, රට තුළ තිරසාර වෙළඳපොළක් මත පදනම් වූ වටිනාකම් දාම සංකල්පය ස්ථාපිත කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන ලද අතර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ලබා දෙනු ලැබූ ණය මුදල් වෙනුවෙන් වූ ඇප ආවරණ යෝජනා ක්‍රම හරහා ණය අවදානම බෙදා ගැනීම මගින් සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත අඛණ්ඩ සහයෝගයක් ලබා දෙන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ප්‍රතිමූල්‍යකරණ සහ පොලී සහනාධාර ක්‍රම යටතේ නව ණය යෝජනා ක්‍රම කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

පැවති වසංගත තත්ත්වය හමුවේ භෞතිකව පවත්වන රැස්වීම් සීමා කිරීමේ අරමුණින් මූල්‍ය අන්තර්ගතභාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපෘති මූල්‍යකරණය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව මහජනතාව ඇතුළු පාර්ශ්වකරුවන් සමඟ වූ සන්නිවේදන කටයුතු සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය භාවිතය වැඩි කරන ලදී.

## 25.1 සහනදායී ණය ක්‍රමවේද පුළුල් කිරීම

ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ අරමුදල් සපයනු ලබන ආයතන මගින් ලද අරමුදල් භාවිතයට ගෙන ප්‍රතිමූල්‍යකරණ, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 20ක් පමණ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. මෙම යෝජනා ක්‍රමවල සාරාංශයක් II-17 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම 14ක් සහ පොලී සහනාධාර ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 6ක් යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් 80,899 ආවරණය වන පරිදි රුපියල්

මිලියන 27,268.13ක් ලබා දෙන ලදී. මෙසේ ලබා දෙනු ලැබූ මුළු ණය මුදල්වලින් සියයට 57.6ක් ම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම තුළින් ආවරණය වූ අතර ඉතිරි සියයට 42.4 පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම තුළින් ආවරණය විය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රමවල අරමුදල් ප්‍රභවයන් සැලකිල්ලට ගැනීමේ දී සියයට 48.6 ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය මැදිහත් වී ක්‍රියාත්මක කළ යෝජනා ක්‍රම වන අතර පිළිවෙළින් ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් අරමුදල් සපයන ආයතන මගින් සියයට 49.4ක හා සියයට 2ක දායකත්වයක් ලබා දෙන ලදී.

**II-17 සංඛ්‍යා සටහන**

**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම**

| අරමුදල් මූලාශ්‍ර | ණය යෝජනා ක්‍රමයේ තොරතුරු/සහනදායී ණය යෝජනා ක්‍රම | | | | | |
|---|---|---|---|---|---|---|
| | ණය යෝජනා ක්‍රමය | අරමුණ | ප්‍රතිමූල්‍ය/පොලී සහනාධාරය | 2021 දී මුදාහරින ලද අරමුදල් ප්‍රමාණය (රුපියල් මිලියන) | වසර අවසානයේ ණයකරු වෙත පැවරෙන වාර්ෂික පොලී අනුපාතය | වෙනත් |
| ශ්‍රී ලංකා රජය | දිළිඳුකම පිටුදැකීම සඳහා වූ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල (PAMP-RF) | ආදායම් උත්පාදන වැඩසටහන් හරහා දිළිඳුකම පිටුදැකීම ප්‍රවර්ධන සහ අඩු ආදායම්ලාභී ජන කොටස් විධිමත් බැංකු පද්ධති හා සම්බන්ධ කිරීම | ප්‍රතිමූල්‍ය | 31.20 | 12.0% | |
| | 'ස්වශක්ති' ණය යෝජනා ක්‍රමය | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නියුතු සහ නව ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා බිහි කිරීම | ප්‍රතිමූල්‍ය | 1,433.50 | 5.5% | |
| | ස්වයං රැකියා උත්පාදන ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය දෙවන අදියර (SEPI - Ph II) | පිළිගත් වෘත්තීය පුහුණු ආයතන හරහා පුහුණුව, තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම | ප්‍රතිමූල්‍ය | 5.35 | 7.0% | |
| | SAPP - RF ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය | කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම දුරලීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය නිෂ්පාදන සහ වාණිජ පද්ධති වල අගය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | 34.64 | 6.5% | |
| | SAPP - RF කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 11.98 | 6.5% | |
| | SAPP - RF තුරුණු ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 132.26 | 6.5% | |
| | සැපයුම් දාම පුනර්ජීවන ණය යොජනා ක්‍රමය | තේ සැපයුම්කරුවන්ගේ අගයදාම ශක්තිමත් කරමින් ව්‍යාපාර යලි නගා සිටුවීම | ප්‍රතිමූල්‍ය | 39.00 | 3.5% | |
| | 'සරුසාර' නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | වී සහ කෙටිකාලීන බෝග වගාවේ නියුතු ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම | පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ | 9,576.68 | 4.00% | සහභාගිත්ව මූල්‍ය ආයතන වල අරමුදල් සහ රජය මඟින් ලබාදෙන පොලී සහනාධාර |
| | කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර වැඩසටහන | නව වගාවන් හරහා නිෂ්පාදනය ජනනය වනතුරු කුඩා තේ හා රබර් වගාකරුවන්ට ස්වයං රැකියා උත්පාදනයට හෝ කෙටි කාලීන ආදායම් ජනනයකිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම. | පොලී සහනාධාර | 107.82 | 6.5% | සහභාගිත්ව මූල්‍ය ආයතන වල අරමුදල් සහ රජය මඟින් ලබාදෙන පොලී සහනාධාර |
| | ශ්‍රී ලංකාවේ ඉස්සන් ගොවිපල තීව්‍ර කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය | ඉස්සන් වගාකරුවන්ගේ ගොවිපල පහසුකම් ඉහල නැංවීමට සහය ලබාදීම | පොලී සහනාධාර | | පළමු මාස 18 තුල 4.5% ඊළඟ මාස 6 තුල 8.5% | සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් සහ රජය මඟින් ලබාදෙන පොලී සහනාධාර |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ස්වභාවික ආපදා හමුවේ හානියට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ගොඩනැංවීම සහ දියුණු කිරීම සඳහා | ප්‍රතිමූල්‍ය | 5,008.50 | 6.00% | |
| | සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර I | කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම | ප්‍රතිමූල්‍ය | 5,029.11 | 4.00% | |
| | SCRF අදියර II | | ප්‍රතිමූල්‍ය | 3,416.90 | 4.00% | |
| | සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර III | කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම | පොලී සහනාධාර හා ණය ඇප ආවරණ | 1,891.09 | 4.00% | |
| | SCRF අදියර IV | කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ රජය සතු ආයතනවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ ව්‍යවස්ථාපිත බැදීම් පියවීම සඳහා | ප්‍රතිමූල්‍ය | | 4.00% | |
| | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය | ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමට අරමුදල් සපයන සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ණය ඇප ආවරණ ලබාදීම | ණය ඇප ආවරණ | | වෙළඳපොල පවතින පොලී අනුපාතිකය | ශ්‍රී ලංකා මහ බැංකුව - ණය ඇප ආවරණය සහභාගීත්ව මූල්‍ය ආයතන අරමුදල් සැපයීම |
| | දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය | දේශීය කෘෂිකර්මික අංශය සංවර්ධනය කිරීම සහ කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම | ප්‍රතිමූල්‍ය | | රු. මිලියන 1<4%<br>රු. මිලියන 1 සිට 25 දක්වා 5% | |
| ආධාර සපයන නියෝජිත ආයතන | SAPP - 4P කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය | කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම පිටුදැකීම, තරගකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය පද්ධති වල අගය ඉහළ නැංවීම | ප්‍රතිමූල්‍ය | 234.92 | 6.5% | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් අරමුදල් සැපයේ. |
| | SAPP - 4P තුරුණු ණය යෝජනා ක්‍රමය | | ප්‍රතිමූල්‍ය | 256.33 | 6.5% | |
| | SAPP මූල්‍ය අතරමැදි තොග ණය | | ප්‍රතිමූල්‍ය | 58.85 | 6.5% | |

### 25.1.1 රජයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, රජයේ නියෝජිතයෙකු ලෙස ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 4ක් සහ පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 7කින් සමන්විතව රජයේ අරමුදල් තුළින් යෝජනා ක්‍රම 11ක් ක්‍රියාත්මක කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, මෙම ණය යෝජනා ක්‍රම මගින් 2021 වසර තුළ දී රුපියල් මිලියන 13,263.52 ප්‍රමාණයක් (මුළු ණය මුදාහැරීම් වලින් සියයට 48.6) ප්‍රතිලාභීන් 68,613ක් සඳහා මුදා හරින ලදී.

**(අ) රජය විසින් සපයන ලද අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම**

පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් වන, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) යටතේ මෙම වසර තුළ ගොවීන් 61,397ක් සඳහා කෙටි කාලීන භෝග වර්ග 34ක් ආවරණය වන පරිදි, කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ණය මුදල් ලබා දෙන ලදී. රජය විසින් අරමුදල් සපයන ලද යෝජනා ක්‍රම යටතේ සියයට 72.2ක ප්‍රමාණයක් නියෝජනය කරමින් සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් රුපියල් මිලියන 9,576.68ක මුදල් ප්‍රමාණයක් මෙම යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද අතර පොලී සහනාධාරය ආවරණය කිරීම සඳහා මෙම වසර තුළදී ද රජය විසින් රුපියල් මිලියන 207.9ක මුදලක් ලබාදෙන ලදී.

මේ අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමග සම්බන්ධ වී කුඩා පරිමාණ තේ සහ රබර් වතු හිමියන් සඳහා වන පුනර්ජීවන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, එමගින් ප්‍රතිලාභීන් 485ක් සඳහා රුපියල් මිලියන 107.87ක මුදලක් මුදාහරින ලදී. මෙම වැඩසටහන 2021 ඔක්තෝබර් මස 31 වන දින අවසන් වීමට නියමිතව තිබුණ ද, ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභීන්ට අත්වන ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ව්‍යාපෘති කාලය තවත් වසරකින් දීර්ඝ කිරීමට පියවර ගන්නා ලදී.

තවද, ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව තීව්‍ර කිරීම සඳහා එහි නිෂ්පාදනය අනුක්‍රමිකව දෙගුණයක් දක්වා ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් නව පොලී සහනාධාර ක්‍රමයක් ද 2021 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී.

**(ආ) රජයේ අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිළිඳු බව පිටු දැකීම සඳහා වූ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයේ චක්‍රීය අරමුදල, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා

ක්‍රමය - අදියර II, ස්වශක්ති ණය යෝජනා ක්‍රමය, සැපයුම් දාම නැවත සක්‍රීය කිරීමේ ණය යෝජනා ක්‍රමය, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ රජයේ අරමුදල් සංරචකය යටතේ ආදායම් උත්පාදන (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, කෘෂි ව්‍යාපාර (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, තුරුණු (චක්‍රීය අරමුදල්) ණය යෝජනා ක්‍රමය, යන යෝජනා ක්‍රම 7, අඛණ්ඩව 2021 වසර තුළ ද ක්‍රියාත්මක කරන ලදී.

### 25.1.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තුළින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ මූල්‍ය අවශ්‍යතා සපයා ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණය පුළුල් කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසර තුළදී ද ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ ශක්තිමත් ව්‍යාපාරික පරිසරයක් පවත්වා ගැනීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සහන කාලයන් ලබා දෙන අතර සංචාරක කර්මාන්තය සඳහා ද විශේෂ අවධානයක් යොමු කරන ලදී.

2021 වර්ෂයේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 5,008.5ක ණය ප්‍රමාණයක්, ප්‍රතිලාභීන් 5,660ක් ආවරණය වන පරිදි ලබා දී ඇත. රජය සතු ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමේ අරමුණින් රුපියල් මිලියන 10,000ක ප්‍රතිපාදන යටතේ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයේ IV වන අදියර හඳුන්වා දෙන ලදී. තවද, වී මෝල් හිමියන් වෙත ණය ලබා දීමේ දී සිදු විය හැකි ණය අවදානම අවම කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී නව ණය ඇප ආවරණ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම ණය යෝජනා ක්‍රමයේ දී සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් ණය අයදුම්කරුවන්ට වී මිලදී ගැනීමට අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලැබෙන අතර මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ණය අයදුම්කරුවකු වීම සඳහා වාර්ෂික ආදායම රුපියල් මිලියන 750කට වඩා අඩු විය යුතුය.

වෙළඳපොළ මත පදනම් වූ වටිනාකම් අගය දාම ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අවස්ථා සහ බාධක හඳුනා ගැනීම අරමුණු කරගෙන ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී දේශිය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ එළවළු, කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ කුළුබඩු යන අගයදාම තුන ආවරණය වන අතර ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන වෙන්කොට ඇත.

### 25.1.3 විදේශ ආයතන මගින් සපයන අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම

විදේශීය ආයතන විසින් ලබා දෙනු ලැබූ අරමුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන 2021 වසරේදී ද ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් අරමුදල් සපයන ලද අතර මේ යටතේ රාජ්‍ය, පෞද්ගලික, නිෂ්පාදක සහයෝගීත්ව කෘෂි ව්‍යාපාර යන ක්ෂේත්‍ර හතර ආවරණය වන පරිදි තරුණ ප්‍රජාව සඳහා ණය යෝජනා ක්‍රමය සහ තොග ණය යෝජනා ක්‍රමය යන යෝජනා ක්‍රම දෙකක් ක්‍රියාත්මක විය. මෙම ණය යෝජනා ක්‍රම හරහා රුපියල් මිලියන 550.1ක ණය මුදලක් ප්‍රතිලාභීන් 2,431 දෙනෙකු වෙත මෙම වසර තුළ දී ලබා දී ඇත.

ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකාර්මික අගයදාම මූල්‍යනය වැඩසටහන මගින් ගොවීන්, ගොවි කණ්ඩායම් සහ තරුණ ව්‍යවසායකයින් කෘෂිකාර්මික අගය දාම සඳහා සහභාගි කර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රවේශය ලබා දීමට කටයුතු කෙරේ.

## 25.2 ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය

දරිද්‍රතාවයෙන් මිදීමට සහ ආර්ථික වර්ධන ක්‍රියාවලියට සක්‍රියව දායකවීමට පුද්ගලයින් සහ ආයතනයන් විසින් දරන ප්‍රයත්නයන්ට සහය වීම සඳහා, රජයේ බොහෝ මුල පිරීම් වල කේන්ද්‍රීය අංගයක් වී ඇත්තේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංකල්පයයි.

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා වඩා විස්තීරණ හා සාමූහික ප්‍රයත්නයක ඇති කාලීන වැදගත්කම හඳුනාගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමග එක්ව 'උසස් ජීවන තත්ත්වයක් උදෙසා අන්තර්ගතභාවයක්' යන දැක්මෙන් යුතුව මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපාය මාර්ගික සැලැස්ම සකස්කොට, 2021 මාර්තු මස 03 දින එළිදක්වන ලදී.

මෙම උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාකාරී ප්‍රධාන අංශ හතරක් ඔස්සේ එනම් ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායි මූල්‍ය, පාරිභෝගික ආරක්ෂණය සහ මූල්‍ය සාක්ෂරතාව හා ධාරිතා වර්ධනය කේන්ද්‍ර කරගනිමින්, අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ඇතිව ක්‍රියාත්මක වේ.

එහිදී, මූල්‍ය අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ප්‍රමුඛ ලෙස හඳුනා ගැනීමත් සමඟ එහි ප්‍රධාන අංශ හඳුනා ගැනීම සඳහා 2021 වසර තුළ දීප ව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් සාර්ථකව නිම කිරීමට හැකිවිය. එම සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කර ගනිමින්, රටේ මූල්‍ය සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට අපේක්ෂා කෙරේ. තවද, 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා පාසල් විෂය මාලාවට මූල්‍ය අධ්‍යාපනය අනිවාර්ය විෂයක් ලෙස ඇතුළත් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව අධ්‍යාපන මොඩියුල සහ අනෙකුත් අධ්‍යාපනික මාධ්‍ය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි.

උපාය මාර්ගයේ ක්‍රියාකාරී සැලැස්මේ අඛණ්ඩ ප්‍රගතිය නිරීක්ෂණය කරමින්, මෙම සැලසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම අදාළ ආයතන සියල්ල අඛණ්ඩව සම්බන්ධීකරණය කිරීම හා සහය දැක්වීම සඳහා ලේකම් කාර්යාලයක් ශ්‍රී ලංකා

මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කරන ලදී. තවද, උපාය මාර්ගයට අදාළව අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම පිණිස ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ කවුන්සිලය, කළමනාකරණ කමිටුව සහ ක්‍රියාකාරී කමිටු සහිත ඉතා පැහැදිලි පාලන ව්‍යූහයක් මෙම ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මකව පවතී.

## 25.3 මූල්‍ය සාක්ෂරතාවය

ජනතාව අතර මූල්‍ය සාක්ෂරතාවය සහ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමේ අරමුණින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් 2021 වසරේ දී පුද්ගල සහ මාර්ගගත වශයෙන් මූල්‍ය සාක්ෂරතා සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ගණනාවක් අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී.

එසේ සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ සාරාංශයක් II-18 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-18 සංඛ්‍යා සටහන**

**2021 වර්ෂයේ දී සිදු කරන ලද දැනුමවත් කිරීමේ සහ විශේෂ වැඩසටහන්**

| | වැඩසටහනේ ස්වභාවය | වැඩසටහන් ගණන |
|---|---|---|
| 1. | මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කුසලතා සංවර්ධනය | 334 |
| 2. | පුහුණුකරුවන් පුහුණු කිරීමේ සාකච්ඡාවන් | 08 |
| 3. | ගුවන් විදුලි සහ රූපවාහිනී | 17 |
| 4. | දැනුම හුවමාරු කරගැනීම | 07 |
| | එකතුව | 366 |

## 25.4 ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය

ප්‍රාදේශීය කාර්යාල, ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රාදේශීය මට්ටමින් නියෝජනය කරන අතර එමගින් රටේ අඩු පහසුකම් සහිත ජන කොටස් හඳුනා ගැනීම, මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ව්‍යාපෘති කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ සහ ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ණය කඳවුරු, සහ වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම වැනි බොහෝ අංශ සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය නියෝජනය තවදුරටත් පුළුල් කරලීමට කටයුතු කරන ලදී. 2021 වසර තුළ මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල හය මගින් සේවක අර්ථසාධක අරමුදලට අදාළ සාමාජිකයන් 86,800කට වඩා වැඩි ප්‍රමාණයකට සෘජුවම සේවය ලබා දී ඇති අතර විවිධ අංශයන්ට අදාළව මහජන පැමිණිලි 434ක් පමණ මෙහෙයවා ඇත. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු මගින් සිදු කරන ලද සමීක්ෂණ සඳහා දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි සාම්පල් 731ක් සමීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට ද ප්‍රාදේශීය කාර්යාල සමත් විය. 2021 දෙසැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විධිමත් ක්‍රමවේදයන් ඔස්සේ විදෙස් ශ්‍රමිකයන්ගේ මුදල් ප්‍රේෂණය කිරීම සඳහා විදෙස් ශ්‍රමිකයන් දිරිමත් කිරීමේ ක්‍රමෝපායක් ක්‍රියාත්මක කළ අතර එම ප්‍රයත්නයට සමගාමීව ක්‍රියාත්මක කරන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවට අදාළ වැඩසටහන් 27ක් සාර්ථකව නිම කරන ලද අතර ඒ සඳහා 3,000කට අධික පිරිසකගේ සහභාගිත්වය ලබා ගැනීමට සමත් විය.

## 25.5 අනෙකුත් හඳුන්වාදීම්

### 25.5.1 හරිත ගම්මාන වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී හරිත ගම්මාන වැඩසටහන හඳුන්වා දෙන ලද්දේ 'හරිත ක්‍රමවේදයන්ට අනුගත වීම' යන සංකල්පය ඔස්සේ ස්වභාවික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීමට දිරිමත් කිරීමත්, පාරිසරික හානිය අවම කිරීමත්, හරිත නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෘහස්ථයන් දිරිගැන්වීමත් ඒ තුළින් කුටුම්භවල ජීවන තත්ත්වය ඉහළ නැංවීමත් යන කරුණු අපේක්ෂා කරගෙනයි.

### 25.5.2 ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමටත් නව ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතාය වර්ධනය කර ගැනීමටත් අපේක්ෂාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මූල්‍ය ඇතුළත් කිරීම සඳහා වූ සංවිධානය, ආසියානු ණය පරිපූරක ආයතන සම්මේලනය හා ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකර්මාන්ත ණය සංගමය සමග ඉතා කිට්ටු සබඳතාවයකින් කටයුතු කරන ලදී. මේ තුළින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය අතර දැනුම බෙදා ගැනීමත්, ජාත්‍යන්තර ආයතනවල ක්‍රියාත්මක වන ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබාගැනීමටත්, එම දැනුම ආයතනයේ ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීමටත් හැකියාව ලැබේ.

## 25.6 ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රකාශන තුළට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු අන්තර්ග්‍රහණය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද නවීකරණ වැඩසටහන යටතේ ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2001 වසරේ දී පිහිටුවන ලදි. දශක දෙකකට වැඩි කාලයක් පුරා, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රට තුළ කලාපීය මට්ටමේ විෂමතා අවම කිරීම සහ රැකියා උත්පාදනය සඳහා සහාය වන අතරම, ස්වයං රැකියාලාභීන් ඇතුළු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ඔවුන්ගේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා බොහෝ ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කර පවත්වාගෙන යන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රජයේ අරමුදල් සහිත යෝජනා ක්‍රම පුළුල් ලෙස ක්‍රියාත්මක කළ අතර ඊට අදාළ ගිණුම් කටයුතු ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තුළම පවත්වාගෙන යන ලදී. මෙසේ වෙන්ව පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති ගිණුම්

ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, රජය සහ වෙනත් අංශ වෙත ගෙවිය යුතු හිමිකම් හැරුණු විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වෙනම පවත්වාගෙන යනු ලබන අනෙකුත් සියලු අරමුදල් 2021 දෙසැම්බර් 31 දිනට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අන්තර්ග්‍රහණය කරන ලදී. එසේ ශ්‍රී ලංකා මහ බැංකු ගිණුම් වලට අන්තර්ග්‍රහණය කරන ලද ණය යෝජනා ක්‍රමවල සාරාංශයක් II-19 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-19 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට අන්තර්ග්‍රහණය කරන ලද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශේෂයන්**

| මූලාශ්‍රය | මුදල (රුපියල් මිලියන) |
|---|---|
| ආයෝජන කළඹ | 5,380 |
| සහභාගිත්ව මූල්‍ය ආයතන වලින් ලැබිය යුතු ප්‍රතිමූල්‍ය නිකුතු | 9,144 |
| ශේෂයන් | 1,954 |

1 ප්‍රතිමූල්‍ය ආපසු ලැබීම් ශේෂයේ බහුතර ප්‍රතිශතයක් පෙන්නුම් කරනු ලබන්නේ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙනු ලැබූ ප්‍රතිමූල්‍ය වන අතර එම ණය යෝජනා ක්‍රමය නිර්මාණය වී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද වෙනත් ණය යෝජනා ක්‍රමවල ඉතිරි වී තිබූ ආයෝජන ආදායම් ශේෂයන්, පරිපාලන ගාස්තු සහ අනෙකුත් ශේෂයන් මාරු කිරීම තුළින්ය. ඒ අනුව, දෙවන බහු වාර්ෂික භෝග වගා ව්‍යාපෘතිය, සබරගමුව පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය ව්‍යාපෘතිය, මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘතිය, වැවිලි අංශයේ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය, සුරතුර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය අරමුදල, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහකාර ව්‍යාපෘතිය, බස්රථ මිලදී ගැනීමේ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, දෙවන බහු වාර්ෂික බෝග වගා ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල, තේ සංවර්ධන ව්‍යාපෘතිය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, කුඩා වතු හිමියන්ගේ තේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වූ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය, තේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වූ ප්‍රතිචක්‍රීය අරමුදල, වියළි කලාපීය පරිභෝජනය ඉහළ නැංවීමේ ණය යෝජනා ක්‍රමය සහ හවුල් වැඩසටහන් ණය යෝජනා ක්‍රමය, වියළි කලාපීය ජීවනෝපාය ඉහළ නැංවීමේ සහ හවුල්කාරිත්ව වැඩසටහන යටතේ වූ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, යුරෝපා ආයෝජන බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් B යටතේ ලබාදුන් ණය යෝජනා ක්‍රමය, මාතලේ ප්‍රාදේශීය ආර්ථික අභිවෘද්ධි ව්‍යාපෘතියේ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය, කෘෂි නවෝද්‍යා කාලීන ණය වැඩසටහන, ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, ප්‍රතිපත්ති උත්තේජක අරමුදල, උතුරු පළාත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීමේ ණය යෝජනා ක්‍රමය සඳහා වූ චක්‍රීය අරමුදල, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ණය ලබා දීම සඳහා වූ චක්‍රීය අරමුදල, සබරගමුව ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති දෙවන අදියර සඳහා වූ ණය යෝජනා ක්‍රමය, ස්වයං රැකියා ප්‍රවර්ධනය සඳහා වූ ණය යෝජනා ක්‍රමය, පශ්චාත් සුනාමි වෙරළ පුනරුත්ථාපන හා සම්පත් කළමනාකරණ වැඩසටහන, පුබුදමු උතුර ණය යෝජනා ක්‍රමය - චක්‍රීය අරමුදල - II අදියර සහ උතුරු හා නැගෙනහිර හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිචක්‍රීය ණය යෝජනා ක්‍රමය වැනි විවිධ වූ ණය යෝජනා ක්‍රම යටතේ පැවති ශේෂයන් මාරු කිරීම තුළින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ප්‍රතිමූල්‍ය සැපයීම පිණිස සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවන ලදී.

2 මුදල් මාරු කිරීම් : කෘෂි අංශය සඳහා වන විශේෂිත ණය යෝජනා ක්‍රමය (විස්කම්), උතුරු හා නැගෙනහිර පළාත්වල විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ආරම්භ කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය, ප්‍රතිපත්ති උත්පාදක අරමුදල, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය, මැද රට බහුවාර්ෂික වගාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන ණය ඇප ආවරණ ව්‍යාපෘතිය, කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘතිය, කුඩා තේවතු හිමියන් සංවර්ධනය කිරීම සඳහා වන ඇප ආවරණ ව්‍යාපෘතිය, කුඩා හා මධ්‍ය පරිමාණ කාර්මික අංශය සඳහා ඇප ආවරණ යෝජනා ක්‍රමය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහන සැලසීම සඳහා වන ඇප ආවරණ ව්‍යාපෘතිය, බස්රථ මිල දී ගැනීම සඳහා වන ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය සහ උකස් අත්තිකාරම් සඳහා ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය ආදී ගිණුම්වල පැවති මුදල් ශේෂයන් මේ යටතට අයත් වේ.

# 26. නිරාකරණ හා බලගැන්වීම්

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා අරමුදල කාර්යක්ෂමව මෙහෙයවීමෙන් ද, 1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තිය යටතේ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමෙන් ද, අර්බුදයන්ට මුහුණ දුන් මූල්‍ය ආයතන සම්බන්ධ නිරාකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් පුළුල් නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමෙන් ද දායකත්වය සපයන ලදී.

ඒ අනුව 2021 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

## 26.1 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම.

2021 වසර තුළ දී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට අදාළව රෙගුලාසීන් දෙකක් පහත පරිදි නිකුත් කරන ලදී.

I. 2021 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි නිකුත් කිරීම මගින් බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටුවනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන්ට රුපියල් ලක්ෂ හයක් (රු. 600,000) වූ වන්දි මුදල රුපියල් ලක්ෂ එකොළහක් (රු. 1,100,000) දක්වා 2021.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩිකරන ලද අතර එම රක්ෂණාවරණය වැඩිවීම 2021.04.01 දිනට පෙර බලපත්‍ර අවලංගු කරන ලද හෝ තහනම් කරන ලද සියලුම බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලට ද අදාළව සිදු කරන ලදී.

II. එතෙක් බලාත්මකව පැවති රෙගුලාසි අවලංගු කර 2021.08.06 දින සිට බලපැවැත්වෙන පරිදි 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම නව රෙගුලාසියේ අරමුණ වූයේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් සහ කළමනාකරණ වැඩිදියුණු කිරීමයි. ඒ සඳහා අදාළ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව සහ යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීමේ දින සිට ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් අත්දැකීම් මත පදනම්ව මෙම නව රෙගුලාසි ක්‍රියාත්මක කරන ලදී.

2021 වර්ෂය අවසාන දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන සංඛ්‍යාව 69ක් වූ අතර ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුදල් රුපියල් බිලියන 67.9 විය. එම අරමුදල පිළිබඳ විශේෂ මූල්‍ය තොරතුරු II-20 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-20 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය තොරතුරු සාරාංශය**

| අයිතමය | අගය (රුපියල් මිලියන) | |
|---|---|---|
| | 2020.12.31 දිනට | 2021.12.31 දිනට |
| අරමුදලේ ප්‍රමාණය | 51,322.1 | 67,887.3 |
| මුළු ආදායම | 20,814.0 | 19,298.9 |
| මුළු වියදම | 31,964.4 | 96.6 |
| වාර්ෂික අතිරික්තය (බදුවලට පෙර) | (11,150.4) | 19,202.3 |
| මුළු වත්කම් | 73,559.1 | 74,443.9 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 67,877.8 | 69,529.2 |
| ණය සහ ලැබිය යුතු මුදල් (වෙන්කිරීම්වලට පසු) | 682.1 | 381.9 |
| අනෙකුත් විස්තීරණ ආදායම් සංචිත | 7,778.2 | (2,103.0) |

### 26.2 අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම් වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම.

අර්බුදයන්ට මුහුණ දුන් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීම ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමයට අදාල රෙගුලාසින්ට යටත්ව තවදුරටත් අඛණ්ඩව 2021 වර්ෂය තුළ දී ද සිදු කරන ලදී. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් සහ ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් සහ ටී. කේ. එස්. ෆිනෑන්ස් ලිමිටඩ් හි තැන්පතුකරුවන් සඳහා වන්දි මුදල් ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අභ්‍යන්තර ගෙවීම් පටිපාටියට යටත්ව සෘජුව ම ද, ද ෆිනෑන්ස් කම්පැණි පි.එල්.සී., ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. හි තැන්පතුකරුවන් සඳහා වන්දි ගෙවීමේ කටයුතු නියෝජිත බැංකුව වන මහජන බැංකුව හරහා එකඟ වූ කොන්දේසි සහිත ගිවිසුමකට යටත්ව ද අඛණ්ඩව සිදු කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් බලපත්‍ර අවලංගු කරන ලද සහ අත්හිටුවන ලද මුදල් සමාගම් හයේ (06) තැන්පතුකරුවන් 70,827 දෙනෙකු සඳහා රුපියල් මිලියන 29.2ක මුදලක්, රක්ෂණ වන්දි වශයෙන් 2021.12.31 දින වන විට II -21 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි ගෙවා අවසන් කරන ලදී.

### 26.3 තහනම් යෝජනා ක්‍රම සම්බන්ධ විමර්ශන කටයුතු සිදු කිරීම

නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුවට සැලකිය යුතු ප්‍රමාණයකින් තහනම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකරන ලෙස ඉල්ලීම් සමාජ මාධ්‍ය, ලිඛිත පැමිණිලි, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය හරහා සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගෙන් ලද අතර ඒ සම්බන්ධයෙන් මූලික පියවර වශයෙන් තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන බව කියන ආයතන හඳුනා ගැනීම සඳහා මූලික පරීක්ෂණ සිදුකිරීම ද ඉන් අනතුරුව පුළුල් ලෙස පරීක්ෂණ සිදුකිරීම ද 1988 අංක 30 දරන බැංකු පනතේ 83 ඇ වගන්තියේ විධිවිධානවලට අනුව සිදු කරන ලද අතර ස්ථාපිත මූලික පරීක්ෂණ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන ආරම්භ කරන ලදී.

තවද, නීතිමය පියවර ගැනීම සඳහා දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද විමර්ශන පිළිබඳ සම්බන්ධීකරණය සහ පසු විපරම් කටයුතු නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සිදු කරන ලදී. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණයෙන් සංවිධානය කළ අතර තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආදී වංචනික ක්‍රියා සම්බන්ධයෙන් මහජනතාවට අවබෝධයක් ලබා දීම සහ ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම එම වැඩසටහන් මගින් අරමුණු කරන ලදී.

### 26.4 අර්බුදයන්ට මුහුණදුන් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් වූ නිරාකරණ ප්‍රතිපත්ති රාමුව සැකසීම

නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පවත්නා නීති රාමුව තුළ අර්බුදයන්ට මුහුණ දුන් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සම්බන්ධ නිරාකරණ කටයුතු සිදු කිරීමට අදාළ නිරාකරණ ප්‍රතිපත්ති රාමුව සැකසීම තවදුරටත් අඛණ්ඩව සිදු කරන ලදී.

**II-21 සංඛ්‍යා සටහන**

**2021.12.31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් රක්ෂණ වන්දි ගෙවීම්**

| ආයතනයේ නම | රක්ෂණ මුදල් ගෙවූ තැන්පතුකරුවන් ගණන | ගෙවූ වන්දි මුදල (රුපියල් මිලියන) |
|---|---|---|
| සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පී.එල්.සී. | 3,451 | 1,802.2 |
| ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් පී.එල්.සී. | 2,509 | 1,193.7 |
| ටී.කේ.එස්. ෆිනෑන්ස් ලිමිටඩ් | 1,788 | 964.5 |
| ද ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී. | 34,192 | 12,029.8 |
| ඊ.ටී.අයි ෆිනෑන්ස් ලිමිටඩ් | 26,280 | 12,212.8 |
| ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී. | 2,607 | 1,048.6 |
| **එකතුව** | **70,827** | **29,251.6** |

## 27. අවදානම් කළමනාකරණ

සිය ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍යමය හා මූල්‍යමය නොවන විවිධ අවදානම් වලට මුහුණ දීමට සිදු වේ. මෙවැනි අවදානම් ඇති වීම තුළින්, බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, බැංකුවේ මූල්‍ය තත්වයට හා කීර්තිනාමයට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි බැවින්, මනා ලෙස පිළියෙල කළ අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීම ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව පිළියෙල කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ (Risk Management Policy Statement)

දක්වා ඇති පරිදි, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුවම ආවරණය කරමින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති සකස් කරයි. මෙම ක්‍රියාවලියේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පිළිගත් ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ අවදානම් කළමනාකරණය සඳහා නිසි භාවිතයන් අනුගමනය කරන අතර, අවදානම්වල හිමිකාරිත්වය සහ එහි කළමනාකරණය පිළිබඳව පැහැදිලි වගවීමක් අදාළ පාර්ශ්වකරුවන් වෙත පවරා දී ඇත.

## 27.1 මෙහෙයුම් අවදානම

අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යාවත්කාලීනව තබා ගැනීම සහ මෙහෙයුම් සඳහා වන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මෙහෙයුම් අවදානම් වර්ගීකරණය සමාලෝචනය කළ අතර, මේ සඳහා අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරන ලදී.

දෙපාර්තමේන්තු අවදානම් තක්සේරු කිරීම් සඳහා සපයනු ලබන පහසුකම් අඛණ්ඩව පවත්වා ගනිමින්, දෙපාර්තමේන්තු අවදානම් ලේඛන පිළියෙල කිරීමට සහාය වීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග සමීපව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අදහසින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වසර මුළුල්ලේම ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවතින අවදානම් සංස්කෘතිය සහ දැනට භාවිතා වන මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පවතින අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ දැනුවත් මට්ටම තීරණය කිරීම පිණිස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයුම් අවදානම් පිළිබඳ ද්විවාර්ෂික සමීක්ෂණය පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සිදුවීම් වාර්තාකරණ පද්ධතිය හරහා වාර්තා වූ සිදුවීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, සිදුවීම්වල කේන්ද්‍රීය ගබඩාවක් නිර්මාණය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදුකරන ලදී. මෙම ක්‍රමය හරහා රැස්කරගත් තොරතුරු, අවදානම් ප්‍රවණතා හා අවදානම් සහිත කලාප හඳුනා ගැනීමට මෙන්ම, ඒ හා සම්බන්ධ අවදානම් ප්‍රතිකර්ම වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

## 27.2 මූල්‍ය අවදානම

දෙවන පෙළ ආරක්ෂක ක්‍රියාදාමය ලෙස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය අවදානම යටතේ ණය, වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය, විශ්ලේෂණය, ඇගයීම සහ වාර්තා කිරීම ස්වාධීනව සිදු කරනු ලැබේ. තවද, ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ (Employee's Provident Fund) අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩිදියුණු කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට අදාළ දෙපාර්තමේන්තුවල අනුකූලතාවය සහතික කිරීමද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර සංචිත සඳහා උපායමාර්ගික වත්කම් විභජනයන් (Strategic Asset Allocation), සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් (Investment Policy Statement), අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ සේවක අර්ථසාධක අරමුදල සඳහා ආයෝජන මාර්ගෝපදේශයන් (Investment Guidelines) අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරමින් සංස්කරණය කරන ලදී. ණය අවදානම් කළමනාකරණය සඳහා වූ බාසල් III සම්මත ප්‍රවේශයට අනුව නිකුත් කරන්නන්ට හා ප්‍රති පාර්ශ්වයන් සඳහා නිරාවරණ සීමා ගණනයන්ට අදාළ වන්නා වූ නව ආකෘතියක් හඳුන්වා දීම මගින් ප්‍රති පාර්ශ්ව ණය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයන් (Counterparty Credit Risk Management Guidelines) යාවත්කාලීන කිරීමටත් එසේ යාවත්කාලීන කළ මාර්ගෝපදේශයන් අදාළ ආයෝජන මාර්ගෝපදේශයන් වෙත ඇතුළත් කිරීමටත් පියවර ගන්නා ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ අවදානම් සහ ණය අවදානම් දර්ශක විශ්ලේෂණය කිරීම නිරන්තරයෙන් සිදු කරනු ලබන අතර, ඉහත සඳහන් අරමුදල් සඳහා අදාළ උපායමාර්ගික වත්කම්, විභජනයන්, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් සහ ආයෝජන මාර්ගෝපදේශයන්හි දක්වා ඇති සීමා රාමු පිළිපැදීම නිරීක්ෂණය කරයි. මෙම සියලු අවදානම් තක්සේරු කිරීම් සහ අනුකූල නොවීම් අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු (Investment Oversight Committees) රැස්වීම්වල දී මාසිකව ඉදිරිපත් කරන ලදී.

2021 වර්ෂය තුළ දී ජාත්‍යන්තර සංචිත සඳහා නව සංචිත කළමනාකරණ පද්ධතියක් (Reserve Management System) ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ද සම්බන්ධ විය. එමගින් වෙළඳපොළ සහ ණය අවදානම් තක්සේරු කිරීම සඳහා සිදු කරනා අධීක්ෂණයන්ගෙන් යම් ප්‍රමාණයක් හා සංචිත කළමනාකරණ සඳහා වන අනුකූලතාවයන් අධීක්ෂණය, ස්වයංක්‍රීයව සිදුවන තත්වයට පත්කර ගැනීමට අවකාශ ලැබුණි.

මහ බැංකුවේ සියලුම මෙහෙයුම් සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම්, ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාර්තුමය වශයෙන්, මෙහෙයුම් අවදානම් පිළිබඳ වාර්තාවන්, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (Non-Financial Risk Management Committee) වෙත වාර්තා කිරීම සහ සියලුම මෙහෙයුම් හා මූල්‍යමය අවදානම් පිළිබඳ වාර්තාවන් මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) සහ මුදල් මණ්ඩලය වෙත දැනුම් දීම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 28. ලේකම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකක් වන ලේකම් දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, වත්කම් බැහැර කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම සහ අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම ප්‍රධාන වේ.

### (අ) සමස්ත ආයතනික පරිපාලනය

2021 වර්ෂය තුළදී ද, බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය, පාලන රෙගුලාසි, වග විම, අවදානම් කළමනාකරණය සහ වෙනත් ප්‍රධාන යහපාලන ගුණාංගවලට අනුකූලව කරගෙන යන ලදී. පසුගිය වසර තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපල සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. තවද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කළමනාකරණ සේවාව මගින් එන සහ යන ලිපි සම්බන්ධ අවශ්‍ය කටයුතු කිරීම ද, බැංකුවේ ලිපි ද්‍රව්‍ය ගබඩා කළමනාකරණය කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායක ලෙස කරගෙන යෑම ද, බැංකුව සම්බන්ධ විශේෂ උත්සව සංවිධානය කිරීම ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ඉටු කරන ලද කාර්යභාරයන් විය. මීට අමතරව, වර්ෂය තුළ බැංකුව සඳහා සේවා සපයන ආයතන සමඟ මුදල් මණ්ඩලය වෙනුවෙන් මහ බැංකුවේ ලේකම් විසින් ගිවිසුම් වලට එළඹීමද සිදු කරන ලදී.

### (ආ) ප්‍රසම්පාදන කළමනාකරණය

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2021 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2021 වර්ෂය තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන ලදී. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල ලෙස සකස් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට අනුව ටෙන්ඩර් පටිපාටිය මෙන්ම ටෙන්ඩර් නොවන ක්‍රමවේද යටතේ ද මෙකී භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. ඊට අමතරව, ඉතා කෙටි කාල සීමාවක් තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවාවන් ගණනාවක් ප්‍රසම්පාදනය කිරීමට ද ලේකම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ලෝක බැංකුව විසින් ක්‍රියාත්මක කරන මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී.

### (ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

දෙදහස් තුන්සිය දොළහක ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළදී ද අඛණ්ඩව කරගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම, මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීතිරීති වලට අනුව ජීවන සහතික ලබා ගැනීමත්, විශ්‍රාම ප්‍රතිලාභීන්ගේ නොයෙකුත් අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සමඟ ලිපි ගනුදෙනු ගණනාවක් සිදු කිරීමත් වසර පුරා ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

### (ඈ) විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැලසීම

මහ බැංකු සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ රාජකාරි විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී අඛණ්ඩව පහසුකම් සලසන ලදී. මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට සහ ඉහත කටයුතු සඳහා විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සහ රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා සහාය වීම ද සිදු කරන ලදී. කෙසේ වුවද, පසුගිය වසරවලට සාපේක්ෂව මෙම වසර තුළ සිදු කළ විදෙස් සංචාර ප්‍රමාණය, පැවති COVID-19 වසංගතය හේතුවෙන් අඩු අගයක් ගනු ලැබීය.

### (ඉ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම

සමීක්ෂණ මණ්ඩලය යනු මහ බැංකුව විසින් එහි ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේදයයි. ඒ අනුව, 2021 වර්ෂය තුළ දී යල්පිනු, හානි වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

### (ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම

2021 සැප්තැම්බර් 23 වන දින අධිපති ලේකම් දෙපාර්තමේන්තුව පිහිටුවන තුරු මහ බැංකු අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය සහ සන්ධාන සේවා ලේකම් දෙපාර්තමේන්තුවට අනුබද්ධිත අධිපති ලේකම් කාර්යාලය විසින් සපයන ලදී. ඒ අනුව, අධිපතිතුමාගේ නිල හමුවීම් සහ රැස්වීම් සංවිධානය දේශන හා ලිපි සඳහා කෙටුම්පත් සකස් කිරීම, අධිපතිතුමාගේ දේශීය නිල සංචාර සංවිධානය කිරීම, අධිපතිතුමාගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ මහ බැංකුවේ සහ අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම ඉටු කරන ලදී.

## 29. ආරක්ෂක සේවා

කොවිඩ්-19 වසංගත තත්ත්වය මත ඇති වූ විවිධ අභියෝග ජය ගනිමින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ එහි අනෙකුත් ස්ථාපිත ආයතනයන් ද ඇතුළුව සේවකයින්, අමුත්තන්, දේපළ සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතුවල අඛණ්ඩව වසර පුරා නිරත වෙන ලදී. එසේම, හදිසි තත්ත්වයන් යටතේ මුදල් ප්‍රවාහන කටයුතුවල දී ශ්‍රී ලංකා පොලීසිය සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සඳහා විශේෂ ආරක්ෂාව සැපයීම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී දායකත්වය සපයන ලදී.

**(අ) පද්ධතිය වැඩිදියුණු කිරීම**

වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සහ මහ බැංකු පරිශ්‍රයන්හි පිහිටුවා ඇති සියළුම ගිනි නිවීමේ උපකරණයන්හි මෙහෙයුම් යෝග්‍යතාවය නිරන්තරයෙන් පරීක්ෂා කරමින්, නඩත්තු කිරීම සහ ප්‍රතිස්ථාපනය සිදු කරන ලදී. ගමන් මලු පරීක්ෂණ යන්ත්‍ර, භාණ්ඩ පරීක්ෂා කිරීමේ යන්ත්‍රය ඇතුළු අනෙකුත් සියළුම ආරක්ෂක උපකරණ නඩත්තුව අදාළ සේවා සපයන්නන් සමග සේවා ගිවිසුම් ප්‍රකාරව වසර පුරා සිදු කරන ලදී. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් නිසි බලධාරීන් සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සම්බන්ධව අඛණ්ඩව යාවත්කාලීන කරන ලදී.

**(ආ) නිරීක්ෂණ කටයුතු**

අදාළ වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව, මහ බැංකු මූලස්ථානයට පැමිණි අමුත්තන් 13,478 දෙනෙකුගේ සහ ප්‍රාදේශීය කාර්යාලවලට පැමිණි සියළුම අමුත්තන්ගේ ආරක්ෂාවන් තහවුරු කරන ලදී. වර්ෂය තුළ දී මුදල් පෙට්ටි හුවමාරු කිරීම් 28,309ක් නිරීක්ෂණය කිරීම් සඳහා පහසුකම් සලසා ඇත.

**(ඉ) කොවිඩ්-19 වැළැක්වීම**

සෞඛ්‍ය බලධාරීන් විසින් හඳුන්වාදුන් මාර්ගෝපදේශ ප්‍රකාරව, කොවිඩ්-19 වැළැක්වීම සඳහා මහ බැංකු පරිශ්‍රයට ඇතුළුවීමට පෙර කාර්ය මණ්ඩලයේ සහ අමුත්තන්ගේ ශරීර උෂ්ණත්වය මැනීම, දර්ශනගත කිරීම හා තොරතුරු ලේඛනගත කිරීම යනාදී විවිධ ක්‍රියාමාර්ග සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සේවය ලබා දිය නොහැකි කාර්ය මණ්ඩලය වෙත ලිපිලේඛන කළමනාකරණ කටයුතු සඳහා සහාය වන ලදී. එසේම වැඩිදුරටත් බැංකු පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩලය අතර සම්බන්ධතා අවම කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා නව රාජකාරී වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

**(ඊ) ආරක්ෂක සේවා පාලනයේ ගුණාත්මකභාවය ඇගයීම**

ආරක්ෂක සේවා කටයුතුවල ඇගයීම මත පදනම්ව ආරක්ෂක සැලැස්ම යාවත්කාලීන කළ අතර ඒ අනුව, බැංකු විදුපියස හා සේවක අර්ථසාධක අරමුදල යන දෙපාර්තමේන්තු සඳහා ගමන්මලු ස්කැනර් යන්ත්‍ර දෙකක් සපයන ලදී. ඉහත ඇගයීම අනුව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා ජංගම සන්නිවේදන පද්ධතිය ඇනලොග් සිට ඩිජිටල් දක්වා ප්‍රතිෂ්ඨාපනය කර ඇත. ඒ සමගම ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ජංගම පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීමේ යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.

**(උ) මානව සම්පත ශක්තිමත් කිරීම හා නිපුණතා ඉහළ නැංවීම**

ඉහළ යන සේවා අවශ්‍යතා මත නව සහකාර ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීම සඳහා ක්‍රියා කරමින් සිටින අතර නව තාක්ෂණය පිළිබඳ කුසලතා ඔප් නැංවීම සඳහා තෝරාගත් ආරක්ෂක නිලධාරීන් සඳහා ස්ථාපනය කරන ලද නව CCTV පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## 30. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා කාර්යක්ෂම, සෞඛ්‍යසම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යහපැවැත්මට පහසුකම් සැලසීම කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එබැවින් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සුබසාධන පහසුකම් සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ගේ යහපත් කායික හා මානසික සෞඛ්‍යය පෝෂණය කිරීම සඳහා වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව තුල සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් ප්‍රවර්ධනය කරනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුබසාධන ණය ක්‍රමය යටතේ ණය ලබාදීම, සේව්‍යදායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් හා ආපනශාලා පහසුකම් සැපයීම යනාදිය දැක්විය හැකිය. කාර්යමණ්ඩලයේ නිවාස, වාහන, වෛද්‍ය සහ අනෙකුත් සුභසාධන අවශ්‍යතා ආවරණය වන මෙම සේවාවන් සේවකයින් ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වන අතර, ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවකින් යුතුව වැඩ කළ හැකි අභියෝගාත්මක සහ අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක් ඇතිකරනු ලබයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යැපෙන්නන්ගේ මෙන්ම විශ්‍රාමිකයන්ගේ වෛද්‍ය අවශ්‍යතා ද වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ආවරණය වනු ලැබේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයෙහි වුවද කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව සුබසාධන පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලබාදීම 2021 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව කාර්යමණ්ඩලයට අවශ්‍ය නව සේවාවන් සඳහා පහසුකම් සැලසීමට විශේෂ පියවර ගන්නා ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පුද්ගලික රෝහල්

තුනක සහයෝගය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී පී. සී. ආර්. පරීක්ෂණ සිදු කිරීමේ වැඩසටහන් අටක් 2021 වසර තුළ සංවිධානය කරන ලදී. මීට අමතරව, කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා වෙන්වූ එන්නත් මධ්‍යස්ථාන තුනක දී කොවිඩ් 19 සඳහා එන්නත් ලබා ගැනීමට සේවකයින්ට පහසුකම් සම්පාදනය කරන ලද අතර 2021 දෙසැම්බර් මස ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දී බූස්ටර් එන්නත ලබා ගැනීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව කාර්යමණ්ඩලය වෙත නිවාස සහ අනිකුත් සුබසාධන ණය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලද අතර වසර තුළ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සියලුම ප්‍රතිලාභීන් විසින් දරන ලද වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරන ලදී. 2021 වසර අවසාන වන විට සේවා නියුක්තියන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් සහ ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 10,837ක් පමණ විය. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් මහ බැංකු සේවා නියුක්තියන් වෙත කාර්යාල වේලාවන් තුළ දී වෛද්‍ය පහසුකම් සපයන ලද අතර සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් ලබා ගැනීමට පහසුකම් සලසන ලදී. 2021 අප්‍රේල් මාසයේ දී, වරලත් වාස්තු විද්‍යාඥ ඊ. ඒ. ටී. සුරේෂ් මහතා විසින් "ලස්සන නිවසක් සොඳුරු කැදැල්ලක්" නමින් සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී.

කාර්යමණ්ඩලය වෙත කාර්යාල වේලාවන් තුළ දී ආපනශාලා පහසුකම් සැපයීම බාහිරින් ලබාගත් සේවා සපයන්නෙකු හරහා සිදු කරන ලදී. කාර්යමණ්ඩලයට සාධාරණ මිලකට ගුණාත්මක ආහාර පාන සැපයීම සහතික කිරීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව ආපනශාලා කටයුතු නිරන්තරව අධීක්ෂණය කරන ලදී.

## 31. සංඛ්‍යාන

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේදී ද සිය මෙහෙයුම් කටයුතුවල ඵලදායී ලෙස නිරත වෙමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු වන 'ආර්ථික සහ මිල ස්ථායීතාව' සහ 'මූල්‍ය පද්ධති ස්ථායීතාව' පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව දායකත්වය සපයන ලදී. වසංගත තත්ත්වය හේතු කොටගෙන පනවන ලද සංචරණ සීමා සහ වසර පුරා පැවති අභියෝගාත්මක සේවා පරිසරය මධ්‍යයේ වුව ද, සිය සේවා කටයුතු නවීන තාක්ෂණය භාවිත කරමින් සැලසුම් කළ පරිදි අඛණ්ඩව සිදු කිරීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවට හැකි විය.

### 31.1 සමීක්ෂණ පැවැත්වීම සහ දර්ශක සම්පාදනය කිරීම

(අ) ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණ

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක (PMI) පිළිබඳ සමීක්ෂණ, 2021 වසර තුළ දී ද මාසිකව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ නිෂ්පාදන, ඉදිකිරීම් සහ සේවා කටයුතු ආවරණය වන පරිදි ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ කේන්ද්‍රගතව ඇති විශාල සමාගම් ඉලක්ක කොටගෙන සිදු කරනු ලබයි.

මෙම සමීක්ෂණ වලින් ලබාගන්නා තොරතුරු ආර්ථිකයේ අදාළ අංශයන්හි මාසික ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සඳහා මෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීමේ පූර්ව දර්ශක ලෙස ද භාවිත කරන ලදී. තවද, සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව කරන ලද විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. ආර්ථික විශ්ලේෂකයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයන්හි ප්‍රතිඵල මාධ්‍ය නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල ව්‍යාපාර අංශයේ වෘත්තිකයන්, ආර්ථික විශ්ලේෂකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ඒ ඒ ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය සහ ආර්ථික තත්ත්වය තක්සේරු කිරීමේ දී බහුලව භාවිත කරනු ලැබේ.

ආර්ථිකයේ පවත්නා සහ අපේක්ෂිත ප්‍රවණතාවන් පිළිබඳව ආයතනික අංශයේ මතය විමසන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය (BOS) 2021 වසර තුළ දී ද කාර්තුමය වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා කටයුතු ආවරණය වන පරිදි මහා පරිමාණ ව්‍යවසායයන් ඉලක්ක කොට ගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණවල සමස්ත ප්‍රතිඵල සහ අනෙකුත් විශ්ලේෂණ මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලද අතර, සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංඛ්‍යාන ක්‍රමවේද භාවිත කරමින් ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන සිදු කරන ලදී. තවද මෙම සමීක්ෂණයේ ප්‍රධාන දර්ශක සහ සාරාංශගත තොරතුරු, බාහිර පරිශීලකයින්ගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

ණය වෙළඳපොලේ ඉල්ලුම් සහ සැපයුම් අංශවල ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය 2021 වසරේ දී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය, ආර්ථිකයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක (SMEs) ඉලක්ක කර ගනිමින්, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සමඟ එක්ව වාර්ෂික සමීක්ෂණයක් ලෙස සිදු කරන ලදී. විශේෂයෙන් 2021 වසර තුළ පැවති වසංගත තත්ත්වය හමුවේ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක විසින් සිය මූල්‍යකරණ අවශ්‍යතා සපුරාගැනීමේ දී මුහුණ දුන් ගැටළු සහ අනෙකුත් ප්‍රවණතා හඳුනාගැනීම ද මෙම සමීක්ෂණය මගින් අපේක්ෂා කරන ලදී. මේ අතර, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු ආවරණය වන පරිදි ණය සැපයුම් වෙළඳපොළෙහි මෑත කාලීන ප්‍රවණතා සහ අනාගත අපේක්ෂා පිළිබඳව කාර්තුමය වශයෙන් අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සිදු කරනු ලබයි. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන

ක්‍රියාවලියේ දී උපකාරී කරගන්නා ලද අතර, ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල බාහිර පරිශීලකයන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සිල්ලර වෙළඳාම් අංශයේ ප්‍රවණතා කල්තියා හඳුනාගැනීමේ අරමුණින්, සාමාන්‍ය සිල්ලර වෙළඳාම් අංශය සඳහා 'සිල්ලර විකුණුම් පරිමා සමීක්ෂණය' මාසිකව ද, නවීන වෙළඳාම් අංශය සඳහා 'සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳ කටයුතු සමීක්ෂණය' කාර්තුමය වශයෙන් ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල අනුව සිල්ලර වෙළඳාම් අංශයේ විචලන කල්තියා හඳුනාගැනීමට හැකි විය. එමෙන්ම ප්‍රවාහන අංශයේ ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින්, ගොඩබිම් ප්‍රවාහන සේවා, ගුවන් ප්‍රවාහන සේවා, වරාය සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩාකරණ සේවා ආවරණය කෙරෙන ප්‍රවාහන සේවා පිළිබඳ සමීක්ෂණය 2021 වසර තුළදී ද මාසික සමීක්ෂණයක් වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (IT & BPM) අංශයට අදාළ 2021 වසරේ ප්‍රවණතා සහ 2022 වසර සඳහා වන අපේක්ෂා හඳුනා ගැනීමට ද සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල, විශේෂයෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීම ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා භාවිත කරන ලදී.

කුටුම්භ අංශයේ, මාස හයකට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව ආර්ථික තත්ත්වය, රැකියා ලබා ගැනීමේ හැකියාව, පවුලේ ආදායම, පවුලේ වියදම, ඉතුරුම් මට්ටම පිළිබඳ වත්මන් තත්ත්වය සහ එම විචල්‍ය පිළිබඳව ඉදිරි මාස හය සඳහා කුටුම්භ අංශයේ අපේක්ෂා අනාවරණය කර ගැනීම සඳහා මාර්ගගත සමීක්ෂණයක් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී ආරම්භ කරන ලදී. මහ බැංකුව විසින් පවත්වනු ලබන විවිධ මාර්ගගත වැඩසටහන් සඳහා ලියාපදිංචි වූවන්ගේ සංචිතයකින් අහඹු ලෙස තෝරා ගන්නා ලද නියැදියක් යොදා ගනිමින් සමීක්ෂණය සිදු කරන ලද අතර මාසිකව සමීක්ෂණ ප්‍රතිචාර 100 ක සාමාන්‍යයක් වාර්තා විය. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල භාවිත කරමින්, ජාත්‍යන්තර ක්‍රමවේදයකට අනුව, පාරිභෝගික විශ්වසනීයත්වය පිළිබඳ දර්ශකය (CCI) මාසිකව සම්පාදනය කරන ලද අතර, දර්ශකයේ සාරාංශගත වාර්තාවක් කළමනාකාරිත්වයට ඉදිරිපත් කරන ලදී. ආර්ථිකය පිළිබඳ කුටුම්භ අංශයේ මතය කෙරෙහි උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිරියේ දී කාර්තුමය වශයෙන් වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

මූල්‍ය පද්ධති ස්ථායීතාවට අදාළ දර්ශක ලෙස, දේපළ වෙළඳපොළේ වර්ධනයන් තක්සේරු කිරීම සඳහා 2021 වසරේ දී ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉඩම් තක්සේරු දර්ශකය (LVI) සම්පාදනය කිරීම සහ සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය (CMS) පැවැත්වීම අඛණ්ඩව සිදු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් අර්ධ වාර්ෂික පදනමින් ඉඩම් තක්සේරු දර්ශකය (පදනම් කාලය: 2017 පළමු භාගය) සම්පාදනය කරන ලද අතර, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම් පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන ලද අගයන් මත පදනම්ව, නේවාසික, වාණිජ සහ කාර්මික ඉඩම් වෙන් වෙන් වශයෙන් ආවරණය වන පරිදි සකස්කරනු ලබන උප දර්ශක තුනකින් මෙම ඉඩම් තක්සේරු දර්ශකය සමන්විත වේ. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මෙම අර්ධ වාර්ෂික, ඉඩම් තක්සේරු දර්ශකය පිළිබඳ තොරතුරු ඇතුළත් මාධ්‍ය නිවේදන දෙකක් මහජනතාවගේ දැනුවත් වීම උදෙසා 2021 වසරේ දී නිකුත් කරන ලදී.

සහාධිපත්‍ය අංශයේ වර්ධනයන් පිළිබඳ දත්ත එක්රැස් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද සහාධිපත්‍ය වෙළෙඳපොළ සමීක්ෂණය 2021 වසරේ දී කාර්තුමය පදනමින් අඛණ්ඩව පවත්වන ලදී. මෙම සමීක්ෂණය යටතේ ප්‍රධාන පෙළේ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ තථ්‍ය විකුණුම් මිල, ඉල්ලුම, මිල වෙනස්වීම් සඳහා හේතු, පවත්නා සහ ඉදිරියේ දී ඉදිවන නිවාස ඒකක සංඛ්‍යාව, එක් එක් ව්‍යාපෘතිවල දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක සංඛ්‍යාව සහ ගැණුම්කරුවන් පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. කොවිඩ්-19 වසංගතය සමඟ ඇතිවූ අහිතකර තත්ත්වයත් සමඟ, මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම අංශයේ ඉදිරි පැවැත්ම පිළිබඳ තත්ත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා සහාධිපත්‍ය ඉදිකරන්නන්ගේ ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු ද 2021 වසරේ දී රැස් කරන ලදී. 2020 වසරේ තුන්වන කාර්තුවේ සිට, මෙම සමීක්ෂණයේ ප්‍රතිඵලවල සාරාංශගත වාර්තාවක් මහ බැංකු නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණයේ තොරතුරු මත පදනම්ව, ප්‍රාථමික සහාධිපත්‍ය වෙළඳපොළේ මිල වෙනස්වීම් නිරීක්ෂණය කිරීම සඳහා කාර්තුමය දර්ශකයක් සම්පාදනය කරන ලදී. ඊට සමගාමීව, දේපළ වෙළඳාම් වෙබ් අඩවිවල දත්ත උපයෝගී කර ගනිමින් මාසික පදනමින් ද්විතීයික සහාධිපත්‍ය වෙළඳපොළ සඳහා දේපළ මිල දර්ශකයක් ද සම්පාදනය කරන ලදී. මීට අමතරව අන්තර්ජාල වෙළඳ දැන්වීම්වල දත්ත උපයෝගී කර ගනිමින් ඉඩම් සහ නිවාස සඳහා මිල දර්ශක සම්පාදනය කිරීම ද සිදු කරන ලදී. මෙම දර්ශක සම්පාදන ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා 2021 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහය ලබා ගැනීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

**(ආ) උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය**

තෝරා ගත් ආර්ථික නියෝජිත කාණ්ඩ දෙකක, එනම් ආයතනික අංශයේ සහ කුටුම්භ අංශයේ, උද්ධමන අපේක්ෂා පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා මාසිකව උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය 2021 වසරේ දී ආයතනික අංශය සඳහා, විද්‍යුත් තැපැල හරහා සිදු කළ අතර, කුටුම්භ අංශය සඳහා මාර්ගගත ක්‍රමයට අමතරව විද්‍යුත් තැපැල හා දුරකථන මාර්ග හරහා සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතලේ, අනුරාධපුරය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශ තුළ පිහිටි තෝරාගත් රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයන් පිරිසක් සම්බන්ධ කර ගනිමින් අදාළ ප්‍රාදේශීය කාර්යාලවල

සහය ද ඇතිව මෙම මාර්ගගත සමීක්ෂණ පවත්වන ලදී. තවද, උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ කුටුම්භ අංශයේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා සමීක්ෂණයට සහභාගීවූවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ ද පවත්වන ලදී. මීට අමතරව දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙලට අයත් ගුරු සමීක්ෂකවරුන්ගෙන් ද කුටුම්භ අංශය නියෝජනය කෙරෙන උද්ධමන අපේක්ෂා පිළිබඳ තොරතුරු මාසිකව එක් රැස් කරන ලදී. සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

**(ඇ) දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල**

2021 වසරේ දී ද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල, ගුරු සමීක්ෂකවරු 53කගේ සහභාගිත්වයෙන් කොවිඩ්-19 වසංගත තත්ත්වය විසින් ඇතිකළ අභියෝග හමුවේ වුව ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ හරහා ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ භාණ්ඩ පැසට සමාන භාණ්ඩ පැසක සිල්ලර මිල ගණන් මෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදක මිල, අවිධිමත් අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරා ගත් භාණ්ඩවල සිල්ලර විකිණුම් පරිමා පිළිබඳ දත්ත රැස් කළ අතර, එමගින් මහ බැංකුවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා උපකාරී වන තත්කාලීන තොරතුරු ලබා දීමට හැකි විය. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළට අදාළ පරිගණක පද්ධතිය වැඩිදියුණු කරමින් වාර්තා ජනනය කිරීම සඳහා ටැබ්ලු (Tableau) මෘදුකාංගය දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පරිගණක පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලද අතර දත්ත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහය ඇතිව, ගුරු සමීක්ෂකවරුන් විසින් දත්ත එක්රැස් කිරීම පිළිබඳව එතැන් අධීක්ෂණ මෙන්ම දත්ත පිළිබඳව විතැන් අධීක්ෂණ සිදු කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ගුරු සමීක්ෂකවරුන්ගෙන් දත්ත රැස් කිරීමේ දී සිදු වන පොදු අඩුපාඩු පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීම සහ දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන් මුහුණ දෙන ගැටළු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා පවත්වන වාර්ෂික සම්මන්ත්‍රණ, 2021 වසරේ දී මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. මීට අමතරව, පාරිභෝගික කටයුතු අධිකාරියේ ඉල්ලීම පරිදි, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ මිල දත්ත එක් රැස් කරනු ලබන අයිතම අතුරින් තෝරා ගත් අයිතමවල මිල ගණන් ඔවුන් වෙත සතිපතා ලබාදීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

මීට අමතරව ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන් හරහා පිටකොටුව වෙළඳපොළ, මරදගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මත්ස්‍ය වෙළඳසැල් වලින් තොග සහ සිල්ලර මිල ගණන්/තොරතුරු දෛනිකව එක් රැස් කරන ලදී. මෙම තොරතුරු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වත්මන් මිල විචලන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා මෙන්ම උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබයි. තවද, මෙම මිල දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සාරාංශ වශයෙන් සකසනු ලබන වාර්තාවක් දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. දත්තවල ගුණාත්මකබව සහ තත්කාලීනබව තහවුරු කරගැනීම සඳහා දත්ත සමීක්ෂකවරුන් විසින් දත්ත රැස්කරන ආකාරය පිළිබඳව එතැන් අධීක්ෂණ සිදු කිරීම මෙන්ම ඔවුන් විසින් එවනු ලබන දත්තවල නිරවද්‍යතාව පිළිබඳව නිරන්තර අධීක්ෂණයට ලක්කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මේ අයුරින් කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව පවත්වා ගැනීමට හැකිවිය.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සුපිරි වෙළඳසැල් තුනක වෙබ් අඩවි වලින් ලබාගත් ආහාර මිල ගණන් යොදා ගනිමින් පූර්ව දර්ශක (leading indicators), සකස් කළ අතර කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ උද්ධමන පුරෝකථන වල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීමට එම දර්ශක යොදා ගන්නා ලදී. මෙහිදී කොළඹ පාරිභෝගික මිල දර්ශකයට අදාළ ආහාර පැසෙහි අඩංගු අයිතම වල මිල ගණන් දිනපතා අදාළ සුපිරි වෙළඳසැල්වල වෙබ් අඩවි වලින් ලබාගෙන ආහාර කාණ්ඩයේ සියලුම අයිතම සඳහා මාසික මිල වෙනස්වීම් ගණනය කරන ලද අතර, එය කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළව උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා පූර්ව දර්ශකයක් ලෙස භාවිත කරන ලදී.

**(ඈ) රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය සහ ශ්‍රම බලකාය පිළිබඳ තොරතුරු**

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ප්‍රවණතා හඳුනා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ සියලුම ආයතන, එනම් මධ්‍යම රජය සහ පළාත් සභා යටතේ ඇති ආයතන ආවරණය වන පරිදි පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබද සමීක්ෂණය 2021 වසරේ දී ද අඛණ්ඩව පවත්වන ලදී. මීට අමතරව, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව මෙන්ම අනෙකුත් දත්ත සපයන්නන්ගේ දත්ත සහ තොරතුරු මත පදනම්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකාය, සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට අදාළව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

ආර්ථිකයේ වැටුප් හා වේතන පිළිබඳ විචලන තක්සේරු කිරීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශය, විධිමත් පෞද්ගලික අංශය සහ අවිධිමත් පෞද්ගලික අංශය ආවරණය වන පරිදි වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරන ලදී. තවද, රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශයන්හි වැටුප් විචලන වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණය කිරීම ද සිදු කරන ලදී. මීට අමතරව කලින් කලට නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ පදනම් කරගෙන රාජ්‍ය අංශය සඳහා නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක මාසිකව සම්පාදනය කරන ලදී. එමෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන පඩිපාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව, විධිමත් පෞද්ගලික අංශයේ

මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ද සම්පාදනය කරන ලදී. තවද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල මගින් ලබා ගන්නා දත්ත පදනම් කරගෙන, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කිරීම සඳහා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය සම්පාදනය කරන ලදී. මීට අමතරව, වැටුප් ප්‍රමාණ දර්ශක, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ දත්ත බෙදා හැරීමේ පද්ධතිය (SDDS) සඳහා මාසිකව ලබාදීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

## 31.2 කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) සඳහා කෙටිකාලීන උද්ධමනය සහ ආර්ථික වර්ධන වේගය පිළිබඳව පුරෝකථන අඛණ්ඩව ලබාදෙමින් ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා දායක විය. ඒ සඳහා විවිධ මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු භාවිත කරමින් සංඛ්‍යාන ආකෘති සහ දර්ශක පදනම් කරගත් පුරෝකථන සිදු කරන ලදී. කෙටිකාලීන ආර්ථික වර්ධන වේගය පිළිබඳව පුරෝකථන කිරීමේ දී ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයෙහි උප දර්ශක ආශ්‍රිතව ප්‍රධාන සංරචක විශ්ලේෂණ ක්‍රමවේදය (Principal Component Analysis - PCA) භාවිතා කරමින් 2021 වසර තුළ දී සංඛ්‍යාන ආකෘති මත පදනම් වූ පුරෝකථන තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙසේ වැඩි දියුණු කල පුරෝකථන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වල දී සවිස්තරාත්මකව සාකච්ඡා කර ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී කරගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ කෙටි කාලීන උද්ධමන පුරෝකථන සිදුකිරීම සඳහා වෙළඳපොළ ආශ්‍රිත මෑත කාලීන මිල ප්‍රවණතා සහ අපේක්ෂිත මිල විචලන මෙන්ම අර්ථමිතික ක්‍රමවේද පදනම් කර ගන්නා ලදී. උද්ධමන පුරෝකථනවල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා සැපයුම සහ ඉල්ලුම යන දෙඅංශයෙන්ම උද්ධමනය මත ඇතිවන බලපෑම පෙන්නුම් කරනු ලබන නව විචල්‍ය පිළිබඳව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් අධ්‍යයනය කරන ලදී. මීට අමතරව, කාල ශ්‍රේණි ක්‍රමවේද (time series techniques) සහ යන්ත්‍ර ඉගෙනුම් ක්‍රමවේද (machine learning techniques) උපයෝගී කර ගනිමින් උද්ධමන පුරෝකථන සඳහා වඩා සුදුසු ආකෘති හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

## 31.3 ප්‍රාදේශීය සංඛ්‍යාන සම්පාදනය කිරීම

### (අ) ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය (SLPI)

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු රටේ විවිධ සමාජ හා ආර්ථික පැතිකඩවල සාධනීය තත්ත්වය තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන බහුමාන දර්ශකයකි. ජන ජීවිතයේ බොහෝ අංශ නියෝජනය කෙරෙන පළාත් දර්ශක භාවිතයෙන් මෙම සෞභාග්‍යතා දර්ශකය වාර්ෂිකව සම්පාදනය කරනු ලබන අතර, ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ-ආර්ථික යටිතල පහසුකම් යන උප දර්ශක තුනකින් සමන්විතය. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී විචල්‍ය 41ක් භාවිත කර 2020 වසර සඳහා වූ ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කරන ලද අතර, 2021 දෙසැම්බර් මාසයේ දී සෞභාග්‍යතා දර්ශකයට අදාළ තොරතුරු ඇතුළත් මාධ්‍ය නිවේදනයක් නිකුත් කරන ලදී.

### (ආ) පළාත් දළ දේශීය නිෂ්පාදිතය (PGDP)

2020 වර්ෂය සඳහා නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය, ඉහළ සිට පහළට ගලා ඒමේ ක්‍රමවේදය (top-down methodology) භාවිත කරමින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලදී. ඒ අනුව, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ක්‍රියාකාරකම් යටතේ සුදුසු විචල්‍යයන් යොදා ගනිමින් පළාත්වලට බෙදා වෙන් කරන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ බාධා මධ්‍යයේ වුව ද 2020 වසරට අදාළ නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු සකස් කිරීමටත් 2021 දෙසැම්බර් මාසයේ දී ඊට අදාළව මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීමටත් සංඛ්‍යාන දෙපාර්තමේන්තුවට හැකි විය. මෙම ඇස්තමේන්තු මගින් රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් පළාතෙන් සිදු කළ දායකත්වය පිළිබඳ දත්ත සැපයෙන අතර ඒවා පළාත් අතර සම්පත් බෙදාහැරීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය බලධාරීන්ට වඩාත් ප්‍රයෝජනවත් වේ.

## 31.4 ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවට හිමිවන ස්ථානය ඉහළ නැංවීමට අදාළ කටයුතු

### (අ) 'ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව' පිළිබඳ ශ්‍රේණිගත කිරීම ('Ease of Doing Business' Ranking)

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපාරික ප්‍රජාවට, අනාගත ව්‍යවසායකයින්ට, විදේශ ආයෝජකයින්ට සහ ආයෝජන ප්‍රවර්ධන ආයතනවලට අවශ්‍ය වන තොරතුරු ඇතුළත් 'A step-by-step Guide to Doing Business in Sri Lanka' ප්‍රකාශනය යාවත්කාලීන කොට එහි නවවන සංස්කරණය 2021 වසරේ දී නිකුත් කරන ලදී.

මෙම ප්‍රකාශනයෙහි 'ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව' පිළිබඳ ශ්‍රේණිගත කිරීමට යොදා ගනු ලබන, ව්‍යාපාරයක් ආරම්භ කිරීම, ඉදිකිරීම් බලපත්‍ර ලබාගැනීමට අදාළ කරුණු, විදුලිය ලබා ගැනීම, දේපල ලියාපදිංචි කිරීම, ණය ලබා ගැනීම, සුළු පරිමාණ ආයෝජකයින් ආරක්ෂා කිරීම, බදු ගෙවීම, ජාත්‍යන්තර වෙළඳාම, ගිවිසුම් බලාත්මක කිරීම සහ බංකොලොත් බවින් මිදීම යන අංශ 10 ට අදාළ තොරතුරු ඇතුළත් වේ.

## 31.5 සංඛ්‍යාන තොරතුරු බෙදා හැරීම

දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ වුව ද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී මුද්‍රිත සහ විද්‍යුත් යන මාධ්‍ය ද්විත්වයෙන්ම නිල දත්ත බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී. 'ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2021 - XLIII වෙළුම' සහ 'ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2021 - XLIV වෙළුම' පිළිවෙළින් 2021 ජූලි සහ සැප්තැම්බර් මාසවල දී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව 2021 වසරේ දී ද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ප්‍රධාන

වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ පරිච්ඡේද දෙකක් සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා පිළිබඳ වාර්තාව සම්පාදනය කිරීමට මෙන්ම මහ බැංකුවේ මාසික විවරණිකාව සඳහා දත්ත සැපයීමට ද අඛණ්ඩව දායක විය.

තවද, තෝරාගත් පාරිභෝගික භාණ්ඩ පිළිබඳ දෛනික මිල වාර්තාව, දිනපතා ආර්ථික දර්ශක, සතිපතා ආර්ථික දර්ශක සහ මාසික ආර්ථික දර්ශක යන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන වාර්තා ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. ඊට අමතරව තවත් විවිධ තොරතුරු, මාධ්‍ය නිවේදන වශයෙන් මහජනතාව වෙත බෙදා හරින ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගගත දත්ත ගබඩාව වන දත්ත පුස්තකාලය පර්යේෂකයන්ගේ සහ අනෙකුත් බාහිර පාර්ශවයන්ගේ දත්ත අවශ්‍යතා සපුරාලන පරිදි යාවත්කාලීන කොට පවත්වාගෙන යෑමටත් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී අඛණ්ඩව කටයුතු කරන ලදී.

## 32. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි දක්වා ඇති විධිවිධානයන් යටතේ පිළිවෙළින් බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරී ඇත. මීට අමතරව 2009 අංක 01 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග හා 2009 අංක 01 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී/ලියාපදිංචි සමාගම්වල ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) හා අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම ඇතුළත් වන අතර නියාමන කාර්යයන් යටතට බලපත්‍ර/ලියාපදිංචි සහතික නිකුත් කිරීම, විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා නියාමන අනුමැතීන් ලබා දීම සහ බලපත්‍රයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු සිදු කරන ආයතන පිළිබඳ විමර්ශනය කිරීම ඇතුළත් වේ. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා මැදිහත්වීම සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම වැනි විවිධ කාර්යයන්වල ද නිරත වේ.

2021 වසර අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 39ක්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 3ක්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 4ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 7ක් දෙපාර්තමේන්තුවේ නියාමනය යටතේ පැවතුණි. මීට අමතරව, කල්බදු මූල්‍යකරණ පනත යටතේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 3ක් ද ඇතුළත්ව, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 58ක් ඇත. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල නාම ලේඛණය මෙම කොටසේ අවසානයේ දක්වා ඇත. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී සිදු කරන ලද කාර්යයන් හි සාරාංශය පහත දක්වා ඇත.

### 32.1 ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

වත්මන් වෙළඳපොළ සහ ජාත්‍යන්තර විශිෂ්ඨ භාවිතයන්ට අනුකූලව බැංකු නොවන මූල්‍ය ආයතනවල පවතින නියාමන රාමුව විධිමත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන සහ මෙම අංශයේ අදාළ ඇල්මැති පාර්ශවයන්ගේ උපදෙස් ද ලබා ගනිමින් වසර තුළ විචක්ෂණ නියාමනයන් කිහිපයක් නිකුත් කරන ලදී. කොවිඩ්-19 ව්‍යසනයේ පැතිර යාමත් සමඟ ගන්නා ලද සුවිශේෂ ක්‍රියාමාර්ග ද ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත වසර තුළ නිකුත් කරන ලද විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසේ දැක්වේ. එම ප්‍රධාන විචක්ෂණ නියාමනයන්ගේ සාරාංශයක් පහතින් දක්වා ඇත.

(අ) නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී.

(ආ) වටිනාකම් මත ණය අනුපාතය විධානය සංශෝධනය කර බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

(ඇ) කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ මඟී ප්‍රවාහන සේවාවන්හි නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින්ට ණය සහන ලබා දෙන ලෙස ඉල්ලමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(ඈ) 2020 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය යටතේ සංචාරක අංශය සඳහා ලබා දී ඇති ණය සහන කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(ඉ) 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය විධානය ක්‍රියාත්මක කිරීම කල් දැමීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් දැනුවත් කරන ලදී.

(ඊ) 2020 සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානය යටතේ ලබා දුන් ලිහිල් කිරීම 2021 ජූනි 30 දින දක්වා තවත් මාස තුනක කාල සීමාවකට දීර්ඝ කරන ලදී.

(උ) විදේශීය ව්‍යවහාර මුදල් ණය පිළිබඳ විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

(ඌ) බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පෙර නිකුත් කරන ලද විදේශීය ව්‍යවහාර මුදල් ණය පිළිබඳ විධානයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශීය ව්‍යවහාර මුදල් ණය ගැනීම් සඳහා පහසුකම් සලසන බව තවදුරටත් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.

(එ) කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා සහන ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(ඒ) වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වූ ගනුදෙනුකරුවන් ලබා ගෙන ඇති ණය පහසුකම් වලට අදාළ වාහන අත්පත් කර ගැනීම සහ නැවත ලබා ගැනීම අත්හිටුවන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලින් ඉල්ලා සිටින ලදී.

(ඓ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය විධානය බලාත්මක වන දිනය තවදුරටත් කල් දමන ලදී.

(ඔ) අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳව ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී.

(ඕ) කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් සහන තවදුරටත් දීර්ඝ කරන ලෙස ඉල්ලා 2021 ජූනි 09 දිනැති චක්‍රලේඛය සඳහා සංශෝධනයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

(ඖ) ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් ආයතනය අනුමත ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් බව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දන්වමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(සෘ) කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් සහන කාලය සහ ණය ආපසු අයකර ගැනීම අත්හිටුවීම 2022 මාර්තු 31 දින දක්වා දීර්ඝ කරන ලෙස ඉල්ලා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

(සෲ) විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ දිරිමත් කිරීමේ අරමුණින් රට තුළට පැමිණෙන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා අමතර දිරි දීමනාවක් ගෙවීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත ඉල්ලීමක් කරන ලදී.

(ක) ඉහළ යන භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකවලට අනුකූලව වසර 2, 3 සහ 5 කාල සීමාවන්ට අදාළ කාලීන තැන්පතු වල පවතින පොලී ආන්තිකය සංශෝධනය කරන ලදී.

(ග) බලපත්‍රලාභී මුදල් සමාගම් හි ද්‍රවශීල වත්කම් තුළ ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම ඇතුළත් කරන ලදී.

(ච) ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීමේ විධානය බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

(ජ) ආයතනික යහපාලනය පිළිබඳ විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

(ට) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා, ආයෝජනය කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිලාභ ඉහළ නැංවීමේ අරමුණින් වසර 5 හි කාලීන තැන්පතු සහ වසර 5 හි ණය උපකරණයන් හි පවතින පොලී ආන්තික සංශෝධනය කරන ලදී.

## 32.2 බලපත්‍රලාභී සමාගම් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) පැවැත්වීම**

i. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2021 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් 18ක සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 3ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කරන ලදී. වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම, ණය කළඹ සංකේන්ද්‍රණය වීමේ අවදානම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව යහපාලන ආකෘතීන්වල පවතින දුර්වලතා, අවදානම් කළමනාකරණයේ දුර්වලතා, අභ්‍යන්තර විගණන හා අනුකූලතා කාර්යයන්හි දුර්වලතා, නියාමන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම සහ මූල්‍ය අතරමැදි කටයුතුවල අඩු කාර්යක්ෂමතාව පිළිබඳ ගැටලු මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයාගැනීම් විය.

ii. පසුගිය වසරේ දී පවත්වන ලද පරීක්ෂණවලට අදාළව මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් සහ නිර්දේශයන් අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල අවධානය සඳහා දැනුම් දෙන ලදී. අදාළ සමාගම් විසින් එකඟ වූ කාල රාමුව තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කරන අංශය විසින් නිරතුරුව අධීක්ෂණය කරනු ලබයි.

iii. තවද, අක්‍රමිකතා පිළිබඳ තෙවන පාර්ශ්වයන්ගෙන් ලැබුණු තොරතුරු විමර්ශනය කිරීම සඳහා සහ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විශේෂ විධාන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් 3ක ස්ථානීය පරීක්ෂණ පවත්වන ලදී.

**(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම**

i. සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්/ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ

පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කර ගනිමින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ඇතුළුව වෙනත් මූල්‍ය තොරතුරු ද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරන ලදී. මෙම සමාලෝචනයන් මගින් පූර්ව අනතුරු කල්තියා හඳුනා ගැනීමේ දර්ශකයන් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය හරහා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය, ණය අලාභ වෙන්කිරීම් ආදී බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

ii. මීට අමතරව, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ලබා දෙන මූල්‍ය තොරතුරු පදනම් කර ගනිමින් සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. එසේම, විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ඇතුළුව වෙනත් මූල්‍ය තොරතුරු පදනම් කරගෙන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරනු ලබයි.

iii. අඛණ්ඩ පරීක්ෂණයන් තුළින් හෙළිදරව් වූ ප්‍රමුඛතාව සහ බරපතලභාවය පිළිබඳ ඇගයීම පදනම් කොටගෙන පැහැදිලිව නියම කර ඇති කාල රාමුවක් තුළ අධීක්ෂණ අවශ්‍යතා නිවැරදි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී. තවද, මෙම අංශයේ ඇතිවන නව වර්ධනයන් සම්බන්ධව ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ කාර්යසාධනය මුදල් මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී.

iv. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට, නව ආයෝජනයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, සාංසමික ව්‍යවස්ථාවලීන් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට, ව්‍යාපාර හිමිකම පැවරීමට අනුමැතීන් ලබා දෙන ලදී.

v. බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ දුර්වලතා සහ අවදානම් නිරාවරණයන් මඟ හරවා ගැනීම සඳහා බැංකු නොවන මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙළ (ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ) 2020 වසරේ දී හඳුන්වා දෙන ලදී. 2021 වසර තුළ හඳුනාගත් බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 13ක යථායෝගී පරීක්ෂණ, තොරතුරු ලේඛන සහ ව්‍යාපාර තක්සේරු කිරීම් අවසන් කර උනන්දුව දක්වන පාර්ශ්වයන් වෙත ලබා දෙන ලදී. ඒ හා සමානව, සාකච්ඡා සඳහා අවශ්‍ය මැදිහත්වීම් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. 2021 වසර තුළ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ගනුදෙනු 6ක් සඳහා මුදල් මණ්ඩලය විසින් මූලික අනුමැතිය ලබා දෙන ලදී.

vi. තවද, ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය, ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය සමඟ 2021 වසර තුළ දී ඒකාබද්ධ කරන ලදී. එබැවින් ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය සහ කල්බදු මූල්‍යකරණ ලියාපදිංචිය අවලංගු කරන ලදී.

vii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව ලැබී ඇති විශාල ප්‍රමාණයක පැමිණිලි සඳහා මැදිහත් වී ඇත. මෙම පැමිණිලි ප්‍රධාන වශයෙන්ම ප්‍රතිපත්තිමය කරුණු සහ බලපත්‍ර අවලංගු කළ මුදල් සමාගම් මෙන්ම නීත්‍යානුකූල නොවන මුදල් ව්‍යාපාර කටයුතු වලට අදාළ වේ.

**(ඇ) නිරාකරණ ක්‍රියාමාර්ග**

පසුගිය වසර කිහිපය තුළ දිගුකාලීන ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දුන් බුන්වත් ස්වභාවය හේතුවෙන් බලපත්‍රය අවලංගු කරන ලද හෝ අත්හිටුවන ලද සමාගම් සඳහා, කඩිනම් ආකාරයෙන් තවදුරටත් නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අවධානය ප්‍රධාන වශයෙන් 2021 වසර තුළ දී යොමු විය. ඒ අනුව, මේ සම්බන්ධව පහත පියවර ගනු ලැබිණි.

i. "ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී" ආයතනය ගණන් බේරා වසා දැමීමේ අයදුම්පත 2021.02.16 දින කොළඹ වාණිජ මහාධිකරණයේ දී ගොනු කරන ලදී.

ii. ඉතිරිව පවතින තැන්පතු වලින් සියයට 50ක් නැවත ගෙවීමට පහසුකම් සැලසීම සඳහා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කරන ලද ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ නියෝගය, 2021.01.13 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තෙමසක කාලයක් සඳහා ඉවත් කරන ලදී. ඉතිරිව පවතින තැන්පතු වලින් සියයට 50ක් නැවත ගෙවීම සාර්ථකව අවසන් කිරීම මත, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී හි ව්‍යාපාර කටයුතු 2021.04.12 දින සිට නැවත අත්හිටුවන ලදී. කෙසේ වෙතත්, මෙම සමාගම ව්‍යාපාර ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අන්තර්ග්‍රහණය කර ගැනීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී හි ව්‍යාපාර කටයුතු 2021.10.13 දින සිට මාස හයක සීමිත කාලයක් සඳහා නැවත ආරම්භ කරන ලදී. ඉහත සඳහන්

ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී හි ආයෝජන දේපල 3ක් එස්එම්බී ලීසිං පීඑල්සී වෙත විකිණීමට අවශ්‍ය මූලික අනුමැතිය 2021.12.08 දින ලබා දෙන ලදී. ඉහතින් සඳහන් කළ ගනුදෙනු අවසන් වීමත් සමඟ ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී හි ඉතිරිව පවතින තැන්පතු සම්පූර්ණයෙන්ම ආපසු ගෙවීමට එම ආයතනයට හැකියාව ඇත.

iii. 2021 වසරේ දී, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීම දීර්ඝ කිරීම 2021.01.05 සහ 2021.07.05 යන දින ද්විත්වයෙහි සිදු කරන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන විමර්ශන අඛණ්ඩව ක්‍රියාත්මක කර ගෙන යෑම සඳහා 2022.01.05 දින සිට එම අත්හිටුවීම තවදුරටත් මාස හයක කාලයක් සඳහා අඛණ්ඩව බලපැවැත්විණි.

iv. ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල නොවන බලපත්‍රලාභී මුදල් සමාගම් වෙනුවෙන් ව්‍යාපාර ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුව ඒකාබද්ධ කිරීමේ යෝජනා කිහිපයක් ආරම්භ කරන ලදී.

v. බලපත්‍රය අවලංගු කර හෝ අත්හිටුවා ඇති සමාගම් තුළ පවත්නා ගැටලුවලට අදාළව එම සමාගම්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ කළමනාකරණ මණ්ඩල සමඟ ද රැස්වීම් පවත්වන ලදී.

**(ඈ) මහජනයා දැනුම්වත් කිරීම සහ ශක්‍යතාව වැඩිදියුණු කිරීම.**

**i. මහජනයාට අනාවරණය කිරීම**

විචක්ෂණශීලී ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සහ නියාමන සීමාවන්ට යටත්ව ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී. තවද, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය ප්‍රකාරව ආරම්භ කරන ලද විමර්ශනවල ප්‍රගතිය අනාවරණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් පුවත්පත් නිවේදන පළ කරන ලදී.

**ii. ශක්‍යතාව වැඩිදියුණු කිරීම**

දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් බැංකු විදු පියසේ පැවති පුහුණු වැඩමුළු ද ඇතුළුව පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය අඛණ්ඩව ලබා දෙන ලදී.

**iii බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ පැවති රැස්වීම්**

ආර්ථිකමය කරුණු සහ නියාමන වර්ධනයන් සම්බන්ධව අදහස් හුවමාරු කිරීම සඳහා අවස්ථාවක් සැලසීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් ත්‍රිත්ත්වයක් පවත්වන ලදී. මීට අමතරව, සමස්තයක් ලෙස දෙපාර්තමේන්තුව විසින් එක් එක් බලපත්‍රලාභී ආයතනයට/අංශයට අදාළ ගැටලු සාකච්ඡා කිරීමට සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළව පවතින ගැටලු සාකච්ඡා කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ෆිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් (Finance House Association), ලීසිං ඇසෝසියේෂන් (Leasing Association), බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන සමඟ අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

**iv. මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි වෙනත් දෙපාර්තමේන්තු වෙතින් ලද ඉල්ලීම් අනුව අවශ්‍ය වූ විට ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී. මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණැතිව මාධ්‍ය නිවේදන ද නිකුත් කරන ලදී.

## 32.3 අනවසර මූල්‍ය ආයතන සම්බන්ධව සිදු කරන විමර්ශන

නීත්‍යානුකූල නොවන තැන්පත් රැස් කිරීම සහ මුදල් ව්‍යාපාර කටයුතු සම්බන්ධ විමර්ශනයන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරීමෙන් අනතුරුව ලද පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව, 2021 වසර අවසානය වන විට දෙපාර්තමේන්තුව විසින් විමර්ශන 97ක් ආරම්භ කර ඇත. අධිපතිවරයා මගින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ඉල්ලීමක් මත පදනම්ව, නීත්‍යානුකූල නොවන තැන්පතු රැස් කිරීම සහ මුදල් ව්‍යාපාර කටයුතු සම්බන්ධ විමර්ශන සිදු කිරීමට දෙපාර්තමේන්තුවට සහාය ලබා දීම සඳහා ශ්‍රී ලංකා පොලීසියෙහි මූල්‍ය සහ වාණිජ අපරාධ විමර්ශන අංශයෙහි විශේෂ ඒකකයක් ස්ථාපනය කරන ලදී. 2021 වසර තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 42 වන වගන්තිය යටතේ සිදු කරනු ලබන විමර්ශනයන්ට අදාළ පාර්ශ්ව වෙත අත්හිටුවීමේ නියෝග තුනක් නිකුත් කරනු ලැබූ අතර, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම් මත මෙම අත්හිටු වීමේ නියෝග මහාධිකරණය විසින් තහවුරු කර, දීර්ඝ කරන ලදී. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2020 වසරේ දී සිදු කරන ලද අත්හිටුවීමේ නියෝග සඳහා මහාධිකරණයෙන් දීර්ඝ කිරීම් ලබා ගන්නා ලදී. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් විමර්ශන සිදු කිරීමට යටත්ව, ආයතන තුනක සම්බන්ධිත පාර්ශ්වයන්ගේ විදේශ සංචාර වළක්වා ගැනීම සඳහා උසාවි නියෝග ලබා ගන්නා ලදී.

## ඇමුණුම II-4

## බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නියාමනය වන මූල්‍ය ආයතන

(2021 වර්ෂය අවසානය වන විට)

| බලපත්‍රලාභී මුදල් සමාගම් | | | |
|---|---|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී(අ) | 21 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී(අ) |
| 2 | අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්(ආ) | 22 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 3 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී(අ) (ඇ) | 23 | මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 4 | ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්(ඈ) | 24 | මල්ටි ෆිනෑන්ස් පීඑල්සී(අ) |
| 5 | එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී | 25 | යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් |
| 6 | එල්බී ෆිනෑන්ස් පීඑල්සී | 26 | රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 7 | එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 27 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්(ඉ) |
| 8 | එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී | 28 | වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී |
| 9 | එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 29 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්(ඊ) |
| 10 | ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 30 | ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී(අ) |
| 11 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී | 31 | සියපත ෆිනෑන්ස් පීඑල්සී |
| 12 | ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 32 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී |
| 13 | කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්(අ) | 33 | සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී(අ) |
| 14 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 34 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී |
| 15 | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 35 | සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී |
| 16 | ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී | 36 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |
| 17 | නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී(අ) | 37 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් |
| 18 | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 38 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී |
| 19 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 39 | ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 20 | ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී(අ) | | |

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

| (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු | | (ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
|---|---|---|---|
| 1 | අමානා බැන්ක් පීඑල්සී | 1 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 2 | එම්සීබී බැන්ක් ලිමිටඩ් | 2 | ශ්‍රී ලංකා සේවිංස් බැන්ක් ලිමිටඩ් |
| 3 | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | 3 | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 4 | ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී | 4 | සණස සංවර්ධන බැන්ක් පීඑල්සී |
| 5 | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | | |
| 6 | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී | (ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් | |
| 7 | පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී | 1 | ඇසට්ලයින් ලීසිං කම්පැණි ලිමිටඩ් |
| 8 | යුනියන් බැන්ක් ඔෆ් කොළඹ පීඑල්සී | 2 | කෝපරේටිව් ලීසිං කම්පැණි ලිමිටඩ් |
| 9 | ලංකා බැංකුව | 3 | එස්එම්බී ලීසිං පීඑල්සී |
| 10 | සම්පත් බැන්ක් පීඑල්සී | | |
| 11 | සෙලාන් බැන්ක් පීඑල්සී | | |
| 12 | හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී | | |

| (ඈ) බලපත්‍රලාභී මුදල් සමාගම් | | | |
|---|---|---|---|
| 1 | අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී(අ) | 21 | බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී(අ) |
| 2 | අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්(ආ) | 22 | මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 3 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී(අ) (ඇ) | 23 | මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී |
| 4 | ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්(ඈ) | 24 | මල්ටි ෆිනෑන්ස් පීඑල්සී(අ) |
| 5 | එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී | 25 | යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් |
| 6 | එල්බී ෆිනෑන්ස් පීඑල්සී | 26 | රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 7 | එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 27 | ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ්(ඉ) |
| 8 | එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී | 28 | වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී |
| 9 | එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී | 29 | සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්(ඊ) |
| 10 | ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 30 | ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී(අ) |
| 11 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී | 31 | සියපත ෆිනෑන්ස් පීඑල්සී |
| 12 | ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 32 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී |
| 13 | කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්(අ) (උ) | 33 | සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී(අ) (උ) |
| 14 | කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 34 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී |
| 15 | කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 35 | සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී |
| 16 | ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී | 36 | සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී |

| | | | |
|---|---|---|---|
| 17 | නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී(අ) | 37 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් |
| 18 | පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී | 38 | සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී |
| 19 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 39 | ෆින්ටේ‍රක්ස් ෆිනෑන්ස් ලිමිටඩ් |
| 20 | ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී(අ) | | |

**බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්**

| | | | |
|---|---|---|---|
| 1 | දුම්බර මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ් | 3 | ලක් ජය මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ් |
| 2 | බෙරෙන්ඩිනා මයික්‍රො ඉන්වෙස්ට්මන්ට් කම්පැනි ලිමිටඩ් | 4 | සේජය මයික්‍රො ක්‍රෙඩිට් ලිමිටඩ් |

**ප්‍රාථමික අලෙවිකාර සමාගම්**

| | | | |
|---|---|---|---|
| 1 | ඇකියුට් සෙකියුරිටීස් ලිමිටඩ් | 5 | පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්(එ) |
| 2 | එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ් | 6 | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |
| 3 | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී(ඌ) | 7 | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී |
| 4 | කැපිටල් එලායන්ස් ලිමිටඩ් | | |

(අ) 2021.12.31 දිනට අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා හෝ 2022.01.01 දිනට අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා නොමැති ආයතන වේ. මෙම ආයතන, මුදල් මණ්ඩලය විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට හඳුන්වා දී ඇති ව්‍යාපාර ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි අවශ්‍යතාවන්ට නියමිත කාල රාමුව තුළ දී අනුකූල විය යුතුය.

(ආ) 2022.01.28 දින සිට බලපැවැත්වෙන පරිදි අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.

(ඇ) 2021.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී ආයතනය සමඟ ඒකාබද්ධ කරන ලදී.

(ඈ) 2020.07.13 දින සිට මුදල් මණ්ඩලය මගින් ව්‍යාපාර කටයුතු අත්හිටුවා ඇත. ආයතනය ගණන් බේරා වසා දැමීම සඳහා නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත බලය ලබා දීමට 2021.01.06 දින මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

(ඉ) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.21 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ඊ) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.06 දින සිට බලපැවැත්වෙන පරිදි සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(උ) නව කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සම්බන්ධව මුදල් මණ්ඩලය විසින් සීමා පැනවීම සිදු කර ඇත.

(ඌ) 2017.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරැකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවා ඇත.

(එ) 2017.07.06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යාම අත්හිටුවා ඇති අතර මෙම අත්හිටුවීම 2022.07.05 දින දක්වා ක්‍රියාත්මක වේ.